328 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 328 - இல. 10
Volume 328 - No. 10

2026 අගෝස්තු 05වන බදාදා
2026 ஓகஸ்ட் 05, புதன்கிழமை
Wednesday, 05th August, 2026

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:
කථානායකතුමාගේ සහතිකය [තීරුව 1715]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරුව 1718]

ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න [තීරු 1719 - 1731]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තීරු 1732 - 1739]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
කාති අධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම සහ පරිපාලන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම [තීරුව1739]
රාජ්‍ය බැංකුවල මහා පරිමාණ අක්‍රිය ණය මුදල් අය කර ගැනීම සඳහා ගෙන ඇති පියවර [තීරුව 1741]

වී මිලදී ගැනීම සහ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා රජයේ වැඩ පිළිවෙළ:
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1744]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය:
විගණකාධිපතිගේ වැටුප [තීරු 1754 - 1756]

කල් තැබීමේ යෝජනාව:
ඕස්ට්‍රේලියාව වෙත එ.ජ. ඩොලර් මිලියන 2.5ක ණය පියවීමේ ගනුදෙනුවේදී සිදුවූ සයිබර් අපරාධය ආශ්‍රිත වංචාව සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තීරු 1757 - 1884]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:
சபாநாயகரது சான்றுரை [ப: 1715]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1718]

மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள் [ப: 1719 - 1731]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1732 - 1739]

தனி அறிவித்தல் மூல வினா:
காதி நீதிமன்ற முறைமையை வலுப்படுத்தலும் நிருவாகச் செயற்றிறனை மேம்படுத்தலும் [ப: 1739]
அரச வங்கிகளின் பாரிய அளவிலான அறவிடமுடியாக் கடன்களை அறவிடுவதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகள் [ப: 1741]

நெல் கொள்முதல் மற்றும் உற்பத்தியின் கொள்ளளவை அதிகரித்தல் தொடர்பான அரசாங்கத்தின் உத்திகள்:
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று [ப: 1744]

அரசியலமைப்பின் கீழான தீர்மானம்:
கணக்காய்வாளர் தலைமையதிபதியின் சம்பளம் [ப: 1754 - 1756]

ஒத்திவைப்புப் பிரேரணை:
அவுஸ்திரேலியாவிற்கான 2.5 மில்லியன் அமெரிக்க டொலர் கடன் திருப்பிச் செலுத்தலில் இடம்பெற்ற இணையக் குற்றத்துடன் தொடர்புடைய மோசடி தொடர்பிலான அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1757 - 1884]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 1715]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1718]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 1719-1731]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1732-1739]

QUESTION BY PRIVATE NOTICE:
Strengthening of Quazi Court System and Improving Administrative Efficiency [Col. 1739]
Measures Taken to Recover Large Non-Performing Loans of State Banks [Col. 1741]

GOVERNMENT STRATEGY ON PURCHASING PADDY AND INCREASING PRODUCTION CAPACITY:
Statement by Minister of Agriculture, Livestock, Land and Irrigation [Col.1744]

DETERMINATION UNDER THE CONSTITUTION:
Salary of Auditor-General [Cols.1754-1756]

ADJOURNMENT MOTION:
Report of the Committee on Public Finance Concerning the Fraud Linked to Cybercrime in Relation to US Dollars 2.5 million Debt Repayment to Australia [Cols. 1757-1884]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 අගෝස්තු 05වන බදාදා
2026 ஓகஸ்ட் 05, புதன்கிழமை
Wednesday, 05th August, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, මවිසින් 2026 අගෝස්තු 04 දින "මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන), මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත්හි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the Regional Development Bank for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Report on the observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the National Audit Office in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 සහ 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඌව පළාත් සභාව සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ නැගෙනහිර පළාත් සභාව සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, 2025 වර්ෂය සඳහා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව තීරණය සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, කළුතර දකුණ, අල්විස් පෙදෙස, අංක 71/ඒ යන ලිපිනයෙහි පදිංචි වීරසිංහ ලිනට් සිල්වා මහතා සහ වෙනත් හතර දෙනෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)

ගරු කථානායකතුමනි, ඇලබඩගම, හම්සියා වත්ත, පෙර පාසල් වීදිය, අංක 427/03 යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්.ඒ. ලතීෆ් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)

ගරු කථානායකතුමනි, ජා-ඇල, වැවල, අංක 70 යන ලිපිනයෙහි පදිංචි යූ.එල්.එෆ්. නිමල් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු මංජුල සුගත් රත්නායක මහතා
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)

ගරු කථානායකතුමනි, අම්පාර, දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය යන ස්ථානයෙහි සේවයේ නියුතු ටී.බී. දසනායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
QUESTIONS POSED TO HON. PRIME MINISTER

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

ගරු කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කරන ප්‍රශ්නය මෙයයි.

සාම්ප්‍රදායික අධ්‍යාපනයෙන් මිදී දැනුම පදනම් කර ගත් ආර්ථිකයක් දෙසට ගමන් කිරීමට නවෝත්පාදන දිරි ගැන්වීම අත්‍යවශ්‍ය වේ. තරුණ පරපුරේ හා පර්යේෂකයන්ගේ නව අදහස් වාණිජමය ව්‍යාපාර බවට පත් කිරීමට රජය රාජ්‍ය අනුග්‍රහය ලබා දෙමින් සිටී.

(I) මෙරට නවෝත්පාදකයන්ගේ සොයා ගැනීම් වාණිජ නිෂ්පාදන බවට පත් කිරීමට රජය ස්ථාපිත කර ඇති අරමුදල් සහ තාක්ෂණික උපකාරී පද්ධති - incubation centres - මොනවාද?

(II) නවෝත්පාදන ව්‍යවසායකයන් - startups - වෙනුවෙන් සහනදායී ආරම්භක ප්‍රාග්ධනය - seed funding - සහ ණය පහසුකම් ලබා දීමට ගෙන ඇති පියවර කවරේද?

(III) විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන සහ පෞද්ගලික අංශය අතර සබඳතා - industry-academia partnerships - තර කරමින්, පර්යේෂණ හා සංවර්ධන - R & D - ප්‍රතිපාදන ඉහළ නැංවීමට කටයුතු කරන්නේද?

(IV) නවෝත්පාදකයන්ගේ බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිත කිරීමට සහ නිපැයුම් ජාත්‍යන්තර වෙළෙඳ පොළට යොමු කිරීමට ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය හරහා සපයන පහසුකම් විධිමත් කර ඇත්තේ කෙසේද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

(I) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, ජාතික නව්‍යකරණ නියෝජිතායතනය - NIA, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව - SLIC - යන ආයතන රාජ්‍ය විශ්වවිද්‍යාල සමඟ එක්ව නව්‍ය ව්‍යවසායකත්වය සහ තාක්ෂණ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික උපකාරක පද්ධති - incubation centres - ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව මඟින් ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - NERDC, යාපනය විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය සහ රුහුණ විශ්වවිද්‍යාලය ආශ්‍රිතව Technology Incubation Centres ස්ථාපිත කර ඇති අතර, නව නිපැයුම් මූලාකෘති සංවර්ධනය, නිෂ්පාදන සැලසුම්කරණය, ව්‍යාපාර සංවර්ධනය සහ බුද්ධිමය දේපළ කළමනාකරණය පිළිබඳ උපදේශන එම මධ්‍යස්ථාන මඟින් සපයනු ලබයි.

තවද, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විද්‍යාත අංශය විසින් University-linked Incubation Centre ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර, මේ යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා තාක්ෂණික සහාය ලබා දීම නිෂ්පාදන තත්ත්ව පරීක්ෂණ සිදු කිරීම, පුහුණු වැඩසටහන්, ව්‍යාපාර උපදේශන සේවා ලබා දීම සහ නවෝත්පාදන ප්‍රවර්ධනය සිදු කිරීමට නියමිතය.

2026 වර්ෂය තුළදී දැනට,

- වවුනියාව විශ්වවිද්‍යාලයේ,
- රුහුණ විශ්වවිද්‍යාලයේ සහ
- නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ (මඩකලපුව)

මෙම මධ්‍යස්ථාන සාර්ථකව ආරම්භ කර පවත්වාගෙන යනු ලබන අතර, එම මධ්‍යස්ථාන මඟින් දැනට ප්‍රධාන වශයෙන්ම ව්‍යවසායකයන්ට අවශ්‍ය නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තත්ත්ව පරීක්ෂණ සිදු කිරීම, ව්‍යවසායක අවශ්‍යතාව සහ කාලීන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් තාක්ෂණ පැවරුම් වැඩසටහන් පැවැත්වීම සහ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දීම සිදු කරනු ලබන අතර, මේ සඳහා ප්‍රතිපාදන විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ විද්‍යාත අංශය හා ජාතික තත්ත්ව යටිතල පහසුකම් - NQI - පද්ධතිය යටතේ ලබා දී ඇත. ඌව වෙල්ලස්ස, රජරට හා කැලණිය යන විශ්වවිද්‍යාලයන්හි තාක්ෂණික උපකාරී පද්ධති - incubation centres - ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.

(II)

- ජාතික නව්‍යකරණ නියෝජිතායතනය - NIA - නව්‍යකරණයන්ගේ වාණිජකරණය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් Innovation Voucher Scheme - IVS - ක්‍රියාත්මක කරයි. මෙම වැඩසටහන මඟින් පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ ව්‍යවසායකයන් අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කරමින් නව්‍ය නිෂ්පාදන සහ සේවා සංවර්ධනය සඳහා මූලික මූල්‍ය සහාය ලබා දීමට අවස්ථාව සලසා ඇත.

- එමෙන්ම ජාතික නව්‍යකරණ නියෝජිතායතනය, ආයෝජකයන්, මූල්‍ය ආයතන සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සමඟ සම්බන්ධතා ගොඩ නඟා ගනිමින්, නව්‍ය ව්‍යවසායකයන්ට seed funding, venture capital සහ වෙනත් ආයෝජන අවස්ථා වෙත ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය සහාය ලබා දීමට කටයුතු කරයි.

- ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව - SLIC - මඟින් "ඉනෝවා බිස් ණය සහනදායී සේවාව" - InnovaBiz Interest Relief Programme - යනුවෙන් නව ව්‍යාපෘතියක් අලුතින් ආරම්භ කර ඇති අතර, එහිදී නවෝත්පාදකයින්ට අඩු පොලී ප්‍රතිශතයක් යටතේ ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු පද්ධතිය හා සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීමට කටයුතු කරයි.

- මෙයට අමතරව SLIC එකෙන් නවෝත්පාදන ව්‍යවසායකත්ව - startups - ආරම්භ කරන නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ව්‍යාපෘතියක් සැලසුම් කර ක්‍රියාත්මක කරන අතර, ඒ සම්බන්ධවම අය වැය යෝජනාවක් ද සකස් කර විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය මඟින් ජාතික අය වැය දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කර ඇත.

- එම නවෝත්පාදන ව්‍යවසායකත්ව - startups - ව්‍යාපෘතිය යටතේ ආරම්භක ප්‍රාග්ධනය ලෙස විධිමත් ඇගැයීමකින් පසුව රුපියල් මිලියනයක් දක්වා ප්‍රදානයක් ලෙසත්, වැඩිදුර ප්‍රතිපාදන සඳහා බැංකු පද්ධතිය වෙත යොමු කර අවශ්‍යතාව ඉටු කර දීමට කටයුතු කරයි.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

(III) • **කර්මාන්ත අංශයේ සම-මූල්‍යකරණය සහ විශේෂඥතාව සපයා ගැනීම:**

ජාතික පර්යේෂණ සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව වැඩසටහන - NRC Private-Public Partnership Programme - යටතේ, විශ්වවිද්‍යාල සහ රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන ආයතන, කර්මාන්ත ක්ෂේත්‍රය හා සම්බන්ධ කරමින් අගය එකතු කිරීම - value addition - හා අපනයන සහ ආනයන ආදේශනය සඳහා සහාය වන නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය අරමුණු කර ගනිමින් අවශ්‍යතාව මත පදනම් වූ පර්යේෂණ සිදු කිරීම, පිරිවැය, විශේෂඥතාව සහ පහසුකම් බෙදාගැනීම සිදු කෙරේ. ජාතික විද්‍යා පදනම - NSF - විසින් ද කර්මාන්ත මූලික කර ගත් පර්යේෂණ හා සංවර්ධන ආධාර ක්‍රමවේදයක් - Industry-driven R&D Support Scheme - ආරම්භ කර ඇති අතර, තාක්ෂණික ඇගැයීම් සහ අදාළ ප්‍රතිපත්තිවලට යටත්ව, ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 30-50 අතර ප්‍රමාණයක් සඳහා කර්මාන්ත පාර්ශ්වකරුවන් විසින් දායකත්ව දැක්වීම මෙහිදී අපේක්ෂා කෙරේ.

• **ජාත්‍යන්තර පර්යේෂණ සහ කර්මාන්ත හවුල්කාරිත්වය ගොඩනැඟීම:**

ඉන්දියානු රජයේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ එක්ව ක්‍රියාත්මක කරන ලද, 2024 ඉන්දියා-ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ සහ වැඩමුළු වැඩසටහන -India-Sri Lanka Joint Research and Workshop Programme 2024 - යටතේ ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති 16ක් සහ වැඩමුළු 22ක් තෝරා ගන්නා ලද අතර, ඊට අදාළ ගිවිසුම් 2026 ජූලි මස 01වන දින අත්සන් කරන ලදී. මෙම වැඩසටහන මඟින් ශ්‍රී ලාංකික පර්යේෂණ ආයතනවලට ඉන්දියානු පර්යේෂණ ආයතන සමඟ එකතුව කටයුතු කිරීමටත්, විශේෂඥ දැනුම සහ පර්යේෂණ පහසුකම් ලබා ගැනීමට මෙන්ම දැනුම හුවමාරු කර ගැනීමටත්, තාක්ෂණික තහවුරු කිරීමට සහ වාණිජකරණය සඳහා අදාළ කර්මාන්ත සම්බන්ධ කර ගැනීමටත් අවස්ථාව හිමි වේ.

• **ජාත්‍යන්තර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණවලට බලපාන බාධාවන් ඉවත් කිරීම:**

ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයන් ලබා ගැනීමේදී සහ කළමනාකරණය කිරීමේදී ඇති වන ගැටලු හඳුනා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල, පර්යේෂකයන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා පවත්වා එම ගැටලු විසඳීම සඳහා පියවර ගනිමින් තිබෙනවා. එහිදී හඳුනා ගත් ගැටලු පදනම් කර ගනිමින්, ජාත්‍යන්තර අරමුදල් යටතේ ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති යටතේ ලැබෙන හෝ මිලදී ගනු ලබන පර්යේෂණ උපකරණ, විද්‍යාත්මක මෙවලම් සහ පර්යේෂණ ද්‍රව්‍ය - consumables - ආනයනය කිරීම පහසු කිරීම සඳහා අදාළ බලධාරීන් හා සම්බන්ධ වී පියවර ගෙන ඇත. සුදුසුකම් ලබන බදු සහ තීරු බදු නිදහස් කිරීම් පහසු කිරීම මෙන්ම ඊට අදාළ අනුමැතීන් සහ නිෂ්කාසන - clearance - ක්‍රියාවලින් විධිමත් කිරීම මෙයට ඇතුළත් වේ. පර්යේෂකයන් මුහුණ දෙන ප්‍රමාදයන් සහ අතිරේක පිරිවැය අඩු කිරීම, ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයන් වඩාත් ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම සහ අන්තර්ජාතික පර්යේෂණ හවුල්කරුවන් ලෙස ශ්‍රී ලාංකික පර්යේෂණ ආයතනවල ආකර්ෂණීය බව ඉහළ නැංවීම මෙම පියවරයන්හි අරමුණයි.

ජාතික නවෝත්පාදන නියෝජිතායතනය කටයුතු කරන්නේ රජය, විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර සහයෝගීතාව මත පදනම් වූ ත්‍රිත්ව හෙලික්ස් - Triple Helix - ආකෘතිය අනුවයි. ඒ හරහාත් මේ සම්බන්ධීකරණය සිදු කරමින් යනවා. ඒ අනුව, එම ආයතනය, විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන සහ කර්මාන්ත අතර සම්බන්ධතා ශක්තිමත් කරමින් පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිඵල වාණිජකරණය කිරීම සහ නවෝත්පාදනයන් වෙළෙඳ පොළට ප්‍රවේශ කිරීම සඳහා පහත සඳහන් පියවර ගෙන ඇත.

- National Technology Transfer Platform - NTTP - සංවර්ධනය කිරීම.
- තාක්ෂණ සහ නව නිපැයුම් සහාය මධ්‍යස්ථානය - TISC - සහ ජාතික නවෝත්පාදන නියෝජිත ආයතනය - NIA - මඟින් බුද්ධිමය දේපළ, පේටන්ට් තොරතුරු සහ තාක්ෂණ හුවමාරුව සම්බන්ධ සේවා සැපයීම.
- පර්යේෂණ ප්‍රතිඵල වාණිජකරණය, තාක්ෂණ හුවමාරුව සහ බුද්ධිමය දේපළ කළමනාකරණය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම.
- විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතන, රාජ්‍ය ආයතන සහ කර්මාන්ත අතර ආයතනික සම්බන්ධතා සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.

(IV) අන්තර්ජාතික පේටන්ට් ක්‍රමය - International Patent System - ලෙස ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ පේටන්ට් සහයෝගීතා ගිවිසුම - Patent Cooperation Treaty of World Intellectual Property Organization - හඳුනාගෙන ඇති අතර, එම ක්‍රමය යටතේ අයදුම්පතක් ඉදිරිපත් කිරීම මඟින් නව නිපැයුම්කරුවන්ට රටවල් 155ක පමණ පේටන්ට් අයිතිය ඉල්ලා සිටීමේ අවස්ථාව ලැබෙන අතර අවශ්‍ය රටක පේටන්ට් අයිතිය ඉල්ලා සිටීමට ඇති කාල සීමාව මුල් ගොනු කිරීමේ සිට උපරිම මාස 30ක කාලයක් දක්වා ලැබේ. (පැරිස් සම්මුතිය යටතේ හිමි වන කාලය මාස 12කි.)

තවද, අන්තර්ජාතික පරීක්ෂණ අධිකාරයක් වෙතින් නව නිපැයුම පිළිබඳ අන්තර්ජාතික සෝදිසි වාර්තාවක් සහ ලිඛිත නිරීක්ෂණයන්ද ලබා ගත හැක. මෙරට නව නිපැයුම්කරුවන්ට මෙම ක්‍රමය හරහා අයදුම් කරන විට ලෝක බුද්ධිමය දේපළ කාර්යාලයේ වෙබ් අඩවිය හරහා එහි අන්තර්ජාතික කාර්යාංශය වෙත අයදුම් කිරීම සිදු කළ යුතුව ඇත. ඉදිරියේදී බුද්ධිමය දේපළ කාර්යාලය හරහා එම අයදුම්පත් ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීමට බලාපොරොත්තු වේ.

2014 වසරේ සිට ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සංකල්පයක් මත තාක්ෂණික තොරතුරු වෙත පිවිසීම අරමුණු කර තාක්ෂණ සහ නවෝත්පාදන ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර, මේ වනවිට තාක්ෂණ සහ පර්යේෂණ ආයතන මෙන්ම විශ්වවිද්‍යාල 25ක පමණ සංඛ්‍යාවක මෙය ස්ථාපිත කර ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිරි පියවරක් ලෙස වාණිජකරණය හඳුනාගෙන ඇති අතර බුද්ධිමය දේපළ කාර්යාලයේ නව බඳවා ගැනීම් සිදු කිරීම සිදුව ඇති බැවින් මෙම ව්‍යාපෘතිය ඉදිරියේදී වඩාත් ඵලදායී ලෙස පවත්වාගෙන යාමට අදහස් කෙරේ. එමඟින් දේශීයව හා ජාත්‍යන්තරව නව නිපැයුම්කරුවන්ට පේටන්ට් අයදුම් කිරීමට හා ඔවුන්ගේ පේටන්ට් ආරක්ෂා කර ගැනීමට සහාය හෝ උපදෙස් ලබා දීම සිදු කිරීමට බලාපොරොත්තු වේ.

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, අපේ රටේ බොහෝ දෙනා උනන්දුවකින් ව්‍යවසායකත්වය සඳහා එළඹුණත්, ව්‍යවසායකත්වයන් ආරම්භ කරලා කෙටි කාලයකින් ඒවා අසාර්ථක වන අවස්ථා බොහෝ විට අපි දකිනවා. මේ ව්‍යවසායකත්වය විෂය නිර්දේශයට ඇතුළත් කිරීම සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ සූදානමක් පැවතුණා. එහි වත්මන් ප්‍රගතිය, එහි තත්ත්වය කෙසේද කියා මම දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ කරන curriculum reform එකේ 6 ශ්‍රේණියේ සිට හඳුන්වා දී තිබෙනවා, මූල්‍ය සාක්ෂරතාව - Financial Literacy - කියන මොඩියුලය. අපි ඒක 6 ශ්‍රේණියේ සිටම පාසල් මට්ටමින් හඳුන්වා දෙනවා. ඒ වාගේම, innovation hubs, innovation clubs වාගේ දේවල්, entrepreneurship ගැන වැඩසටහන් පාසල් මට්ටමින් අපි පවත්වනවා.

නමුත් මෙතැනදී අපි ඒවා තාක්ෂණය මූලික කරගෙන විතරක් නොවෙයි සිදු කරන්නේ, ගරු කථානායකතුමනි. ඇත්තවශයෙන්ම financial literacy කියන එක ව්‍යවසායකත්වයටත් එහා ගිහිල්ලා තිබෙනවා. ඒ හේතුවෙන් තමන්ගේ එදිනෙදා ජීවිතය තුළදී වුණත් ඒ දැනුම තිබිය යුතුයි කියලා අපි අදහස් කරන නිසා 2027 වසරේ සිට 6 ශ්‍රේණියේ ඉඳන්ම මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව හඳුන්වා දෙන්න අප සැලසුම් කර තිබෙනවා.

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

පිළිතුරු ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට අදාළව විනාඩියක කාලයක් අරගෙන පොඩි විස්තරයක් කරන්න මම කැමැතියි. එක පැත්තකින් අපේ රට තුළ දැවෙන ප්‍රශ්න ගොඩක් තිබෙනවා. තව පැත්තක researchersලා, innovations කරන අය ඉන්නවා. අනෙක් පැත්තෙන් market එක සහ ප්‍රතිපත්ති සම්පාදනය තිබෙනවා. බොහෝ කාලයක් මේ කාරණා තුන අතර gaps දෙකක් තිබුණා. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තීන්දු තීරණ ගැනීමට වාගේම අපි සම්පාදනය කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමටත් නවෝත්පාදන සහ පර්යේෂණ - research and development - වැදගත් වෙනවා. Global Innovation Index - GII - 2025 කියන්නේ ජාතික පර්යේෂණ සහ නවෝත්පාදන කාර්ය සාධනය පිළිබඳව ලෝක මට්ටමේ තිබෙන ප්‍රධාන මිම්මක්. ඒ මිම්මට අනුව රටක් විධියට, ආර්ථිකයක් විධියට ගත්තාම ලෝකයේ රටවල් 139ක් අතුරින් අපි ඉන්නේ 93වැනි ස්ථානයේ. ලෝකයේ දියුණු රටවල් ප්‍රධාන ස්ථානවල ඉන්නවා. අපේ රටේ හොඳ විභවයක් - potential එකක් - තිබෙනවා; හොඳ innovation output එකක් තිබෙනවා. නමුත්, ඒකේ input එක අඩුයි. ඒ කියන්නේ, අපේ investment එක අඩුයි. සියයට දශම එකක් වාගේ තමයි GDP එකෙන් R & Dවලට දෙන්නේ.

ඒ වුණත් 2024 වර්ෂයේ දත්තවලට අනුව අපේ රටේ රාජ්‍ය විශ්වවිද්‍යාල 17ක, පීඨ 120ක් තුළ ඉන්න උපාධි අපේක්ෂකයන් 150,000කුත්, පශ්චාත් උපාධි අපේක්ෂකයන් 50,000කුත්, academic staff එකේ 7,000ක් විතර පිරිසකුත් අවුරුද්දකට research publications 5,000ක් විතර ඉදිරිපත් කරනවා. ඒ වාගේම, අවුරුද්දකට Masters සහ PhD thesis 2,500ක් විතර කරනවා.

මේ research සහ innovations ගත්තාම, මේවා අපේ ප්‍රතිපත්තිවලට අදාළ වන විධියට, රටේ තිබෙන ගැටලුවලට අදාළ වන විධියට කරගැනීම අවශ්‍ය වෙනවා. උදාහරණයක් විධියට 2ක්, 3ක් කිව්වොත්, National Genomic Surveillance Research on SARS-CoV-2 කොවිඩ් කාලයේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළා. ඒක ලෝක මට්ටමින්ම ගොඩක් වැදගත් දෙයක් වුණා, pandemic decision-makingවලට. ඊළඟට, biodiesel production technology එකක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් එළිදැක්වූවා. ඒ වාගේම, thermal conductivity තිබෙන graphite incorporated latex rubber technology එකක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන්ම ඉදිරිපත් කළා. මේ වාගේ CKDu සම්බන්ධව විශාල researches ප්‍රමාණයක් කරලා තිබෙනවා. මේ වාගේ තවත් දැවෙන ප්‍රශ්න අපට තිබෙනවා, කසළ කළමනාකරණය, ආපදා කළමනාකරණය, prediction වාගේ දේවල් සම්බන්ධව. මේ researchersලාව ඒකට guide කරන්න අදාළ guidance එකක්, අපේ රටට අවශ්‍ය researches මොනවාද, research topics මොනවාද කියලා තෝරාගන්න අදාළ මඟ පෙන්වීමක් ප්‍රතිපත්තිමය පැත්තෙන් කරන්න අදාළ මාර්ගෝපදේශයක් සකස් කිරීම සම්බන්ධව තිබෙන තත්ත්වය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඇත්තවශයෙන්ම සමාජයේ දැවෙන ප්‍රශ්න මොනවාද කියලා හඳුනාගන්න එකත්, ඒවා වෙනුවෙන් පර්යේෂණ - research - කරන එකත් පර්යේෂකයාගේ වගකීම. ඒක හඳුනාගෙන, ඒ guidance එක දීලා විශ්වවිද්‍යාල හෝ පර්යේෂණ ආයතනවලින් තමයි ඒක කළ යුත්තේ.

ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන්නේ රජය විසින් ඒ මාර්ගෝපදේශ සකස් කරන්න කියලා නම්, මම හිතන්නේ ඒක සුදුසු නැහැ කියලායි. ඇත්තටම ඒක පර්යේෂකයාගේ සහ පර්යේෂණ ආයතනවල වගකීමක්. පර්යේෂණයක් සිදුවිය යුත්තේ සමාජයේ, එහෙම නැත්නම් අපේ භෞතික පද්ධතිය තුළ තිබෙන ප්‍රශ්නයකට උත්තරයක් සෙවීම සඳහා නේ. පර්යේෂණයක අරමුණ ඒක නේ. එතකොට, රජයක් හැටියට අපට කරන්න වෙන්නේ, ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයන එකයි. යටිතල පහසුකම්, මූල්‍යමය සහයෝගය, ආයතන අතර සම්බන්ධීකරණය වාගේ දේවල් සපයන එක තමයි රජයක් හැටියට වගකීම විය යුත්තේ. Research කරන්න ඕනෑ කොහොමද, මොන මාතෘකා මතද යන්න තෝරා ගැනීමේ නිදහස researcherට තිබෙන්න ඕනෑ. ඒ පිළිබඳව යම් කිසි guidance එකක් කරන එක, නැත්නම් මොන වාගේ ප්‍රශ්නවලටද අපි ප්‍රමුඛතාව දිය යුත්තේ කියන එක පර්යේෂකයාත්, පර්යේෂණ ආයතනත් සාකච්ඡා කරලා තීරණය කළ යුතුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ ප්‍රශ්නය, ගරු චන්දන තෙන්නකෝන් මහතා.

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

ගරු කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කරන ප්‍රශ්නය මෙයයි.

පළාත් සභා සහ පළාත් පාලන ආයතන යනු, රටේ සංවර්ධනයේ ප්‍රධාන පුරුකක්. පසුගිය කාලයේ වෙන් වූ මුදල්වලින් වැඩි කොටසක් මෙම ආයතනවල සේවකයින්ගේ

[ගරු චන්දන තෙන්නකෝන් මහතා]

වැටුප් සඳහා වැය වූ අතර, ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණවත් ලෙස ලැබුණේ නැහැ. වත්මන් රජය 2025 සහ 2026 අය වැය මඟින් ඍජු සංවර්ධන කටයුතු සඳහා විශාල මුදලක් වෙන් කර ඇත.

(I) 2025 සහ 2026 අය වැය මඟින් සියලුම පළාත් සභා සඳහා වැටුප් හැර සංවර්ධන හා ප්‍රාග්ධන කටයුතු වෙනුවෙන් වෙන් කළ ප්‍රතිපාදන පළාත් සභාවෙන් සභාවට වෙන් වෙන්ව ඉදිරිපත් කරන්නේද?

(II) පළාත් සභා යටතේ ඇති මහ නගර, නගර සහ ප්‍රාදේශීය සභා වෙත මෙම ප්‍රාග්ධන ප්‍රතිපාදන බෙදා හැර ඇත්තේ කෙසේද?

(III) 2025 වසරේ වෙන් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන අතුරින් සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදවා ඇති මුදල සහ එහි ප්‍රගතිය ලබා දෙන්නේද?

(IV) 2026 අය වැයෙන් ග්‍රාමීය යටිතල පහසුකම් සඳහා වෙන් කළ ප්‍රතිපාදන දේශපාලන භේදයකින් තොරව භාවිත කිරීම තහවුරු කිරීමට ඇති අධීක්ෂණ යන්ත්‍රණය කුමක්ද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

(I) මුදල් කොමිෂන් සභාව විසින් 2025 හා 2026 අය වැයෙන් පළාත් සභා නවය වෙනුවෙන් (වැටුප් හැර) සංවර්ධන කටයුතු සඳහා;

- පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන
- උපමාන පාදක ප්‍රතිපාදන
- පාසල් දරුවන්ගේ පෝෂණ වැඩසටහන
- භෞතික සම්පත් නඩත්තු කටයුතු

යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, 2025 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන රුපියල් මිලියන 127,350ක් වශයෙන්ද, 2026 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන රුපියල් මිලියන 138,000ක් වශයෙන්ද වෙන් කර ඇත. එම ප්‍රතිපාදන පළාත් සභා 09 සඳහා වෙන් වූ ආකාරය වෙන් වෙන් වශයෙන් ඇමුණුම 1 සහ 2 ලෙස පහත දැක්වේ.

ඇමුණුම 01

2025 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

පළාත	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන	උපමාන පාදක ප්‍රතිපාදන	භෞතික සම්පත් නඩත්තු කටයුතු සඳහා	පාසල් දරුවන්ගේ පෝෂණ වැඩසටහන	එකතුව
බස්නාහිර	5,894	585	3,449	6,600	**16,528**
මධ්‍යම	7,360	730	3,624	4,300	**16,014**
දකුණු	6,976	692	2,322	3,600	**13,590**
උතුරු	7,328	727	2,568	1,900	**12,523**
වයඹ	6,835	678	2,383	4,000	**13,896**
උතුරු මැද	7,014	696	2,894	2,400	**13,004**
ඌව	7,688	763	2,045	2,550	**13,046**
සබරගමුව	7,584	753	3,100	3,000	**14,437**
නැගෙනහිර	7,321	726	2,615	3,650	**14,312**
එකතුව	**64,000**	**6,350**	**25,000**	**32,000**	**127,350**

ඇමුණුම 02

2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

පළාත	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන	උපමාන පාදක ප්‍රතිපාදන	භෞතික සම්පත් නඩත්තු කටයුතු සඳහා	පාසල් දරුවන්ගේ පෝෂණ වැඩසටහන	එකතුව
බස්නාහිර	6,425	650	4,360	6,640	**18,075**
මධ්‍යම	8,075	800	4,120	4,440	**17,435**
දකුණු	7,680	770	2,585	4,235	**15,270**
උතුරු	8,000	800	2,670	1,990	**13,460**
වයඹ	7,615	760	2,515	4,215	**15,105**
උතුරු මැද	7,900	790	2,990	2,700	**14,380**
ඌව	8,320	830	2,131	2,569	**13,850**
සබරගමුව	8,090	810	3,484	3,216	**15,600**
නැගෙනහිර	7,895	790	2,645	3,495	**14,825**
එකතුව	**70,000**	**7,000**	**27,500**	**33,500**	**138,000**

(II) පළාත් සභා යටතේ ඇති මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වෙත ප්‍රාග්ධන ප්‍රතිපාදන විමධ්‍යගත කර ඇති ආකාරය ඇමුණුම් මඟින් ඉදිරිපත් කරමි.

අනු අංකය	පළාත	ඇමුණුම
1	බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 3
2	දකුණු පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 4
3	වයඹ පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 5
4	මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 6
5	උතුරු පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 7
6	ඌව පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 8
7	සබරගමුව පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 9
8	උතුරු මැද පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 10
9	නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත	ඇමුණුම 11

(III) 2025 වසරේ වෙන් කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන අතරින් සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදවා ඇති මුදල සහ එහි ප්‍රගති සමාලෝචනය ඇමුණුම 12 මඟින් ඉදිරිපත් කරමි.

ඇමුණුම් 3 සිට 12 දක්වා **සභාගත*** කරමි.

(IV) එක් එක් විෂයයන් යටතේ වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාව විසින් ලබා දී ඇති උපදෙස් අනුව පළාත් සභා විසින් පිළියෙල කර ක්‍රියාත්මක කරනු ලබයි.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභාවලට බලය විමධ්‍යගත කර ඇති බැවින්, එම විෂයයන් ක්‍රියාත්මක කිරීම සඳහා වර්තමානයේදී පූර්ණ බලය ඇත්තේ ගරු පළාත් ආණ්ඩුකාරවරුන්ට සහ පළාත් සභා යන්ත්‍රණයටයි. ප්‍රමුඛතා අනුව ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පළාත් සභා විසින් අනුමත කරගෙන ඇති මූල්‍ය ප්‍රඥප්තිවල තිබෙන උපදෙස් අනුව පළාත් සභා විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, කිසිදු දේශපාලන භේදයකින් තොරව ව්‍යාපෘති ප්‍රමුඛතාවන් අනුව හඳුනා ගෙන යහපාලන සංකල්ප අනුව ක්‍රියාත්මක කිරීම ගරු පළාත් ආණ්ඩුකාරවරුන් ඇතුළු පළාත් සභා යන්ත්‍රණයේ වගකීමකි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ඇත්තටම පසුගිය කාලයේ අපි දැක්කා, පළාත් පාලන ආයතන සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් ලැබුණේ නැහැ කියලා. හැබැයි, මෙම ආයතනවලට විශාල කාර්යභාරයක් පැවරිලා තිබුණා; දෛනිකව ග්‍රාමීය මාර්ග විශාල ප්‍රමාණයක් නඩත්තු කිරීමේ වුවමනාව තිබුණා. ඒ සඳහා රජය විසින් වර්තමානයේ විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් එම ආයතන වෙත මුදා හැර තිබෙනවා. ඒ වාගේම යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ලබා දෙන්න කටයුතු කරලාත් තිබෙනවා. අක්‍රිය වෙලා තිබුණු පළාත් පාලන ආයතන නැවත සක්‍රිය වෙමින් ජනතා අවශ්‍යතා ඉටු කරමින් පවතිනවා. මම ඔබතුමියගෙන් දැනගන්න කැමැතියි, ඉදිරියටත් මෙම ආයතන මේ විධියට අඛණ්ඩව ශක්තිමත් කිරීම සඳහා මෙවැනි ප්‍රතිපාදන ලබා දෙමින්, රජයේ සෘජු දායකත්වය ලබා දෙමින් කටයුතු කරනවාද කියලා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අනිවාර්යයෙන්ම ඒක තමයි අපේ රජයේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ. ගරු ජනාධිපතිතුමා මේ දවස්වල 2027 වර්ෂයේ අය වැය සඳහා සාකච්ඡා පවත්වමින් යනවා, සියලු අමාත්‍යාංශ සමඟත්, පළාත් සභා ආයතන සහ පළාත් නියෝජිතයන් සමඟත්. ඒ හැම වෙලාවේම ඇමතිවරුන් වන අපට එතුමා උපදෙස් දීලා තිබෙන්නේ ක්‍රියාත්මක කිරීමේ - implementation - වැඩ පිළිවෙළ සඳහා පළාත් සභාවලට සෘජුවම මූල්‍යමය දායකත්වය දෙන්න කියලායි. ඒ විධියට කළොත් තමයි ක්‍රියාත්මක කිරීම පහසු වන්නේ. ඇත්ත වශයෙන්ම අමාත්‍යාංශවලින් වැඩි බර තියන්න ඕනෑ ප්‍රතිපත්තිමය කාරණාවලටයි කියන එක ගරු ජනාධිපතිතුමා නිතර අපට කියන දෙයක්. ඒ නිසා ඉදිරියටත් එම ව්‍යාපෘති කාර්යක්ෂමව කරගෙන යෑම සඳහා දිය යුතු සහයෝගය අපි විශේෂයෙන්ම ලබා දෙනවා. ඒ ගැන කිසිම සැකයක් තබා ගත යුතු නැහැ. බඳවා ගැනීම් ආදිය කරමින් මානව සම්පත දියුණු කිරීම, අවශ්‍ය යන්ත්‍රෝපකරණ ලබා ගැනීම, කාර්යාල පිහිටුවීම, කාර්යාල අලුත්වැඩියා කිරීම ආදි සියල්ල වෙනුවෙන් 2025 සහ 2026 අය වැය මඟිනුත් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ඉදිරියටත් -2027 අය වැයෙනුත්- මුදල් වෙන් කරන්න නියමිතයි.

ගරු චන්දන තෙන්නකෝන් මහතා
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

බොහොම ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමියනි. Clean Sri Lanka වැඩසටහන යටතේ දැකුම්කලු දිවයිනක් සහ සොම්නසින් පිරි ජනතාවක් බිහි කිරීමේ අරමුණින් රාජ්‍ය, පෞද්ගලික සහ මහජන හවුල්කාරිත්ව සංකල්පය යටතේ "පවිත්‍ර දේශයක් සඳහා පුරවැසි මෙහෙවර" යන්න තේමා කරගෙන වර්තමානයේ ආරම්භ කර තිබෙනවා, "අත්තම" නමින් අලුත් වැඩසටහනක්. ගරු අග්‍රාමාත්‍යතුමියනි, මම දැන ගන්න කැමැතියි, එම වැඩසටහන සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සහ නගර සභාවල කාර්යභාරය කෙබඳුද, එම වැඩසටහන ඉදිරියේදී ක්‍රියාත්මක වන්නේ කොයි විධියටද කියන එක ගැන.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා Clean Sri Lanka වැඩසටහනේ ප්‍රධානම අරමුණක් වෙලා තිබෙන්නේ ජනතා සහභාගිත්වය ලබා ගැනීමයි කියන එක. ඒ කියන්නේ, ethical society එකක් ගොඩනැඟීම සඳහාත්, ආකල්පමය වර්ධනය සඳහාත් වන ක්‍රියාවලිය තුළම අපගේ මූලික අරමුණ හා අභිලාෂය වෙලා තිබෙන්නේ ජනතා සහභාගිත්වය ලබා ගැනීමයි. එය සංවර්ධන ක්‍රියාවලිය වෙනුවෙන් වෙන්න පුළුවන්, පරිසරය සුරක්ෂිත කිරීම වෙනුවෙන් වෙන්නත් පුළුවන්. මේ වැඩසටහනත් ඒ අරමුණින් දියත් කරලා තිබෙන එකක්. ඒ අනුව තමයි උපදෙස් ලබා දීලා තිබෙන්නේ. මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ඒ අදාළ වෙනත් ආයතන, පෞද්ගලික ආයතන මැදිහත් වී කටයුතු කළ යුතු වෙනවා. විශේෂයෙන්ම ජනතාවගේ සහයෝගය ඇතිව තමන්ගේ ප්‍රදේශයේ ස්වේච්ඡාවෙන්ම කළ හැකි වැඩසටහන් හඳුනා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට තමයි අප බලාපොරොත්තු වන්නේ. ගරු කථානායකතුමනි, මේ වැඩසටහන යටතේ අපගේ ප්‍රධානම බලාපොරොත්තුව තමයි රටේ පරිවර්තනය, රටේ දියුණුව, රටේ සංවර්ධනය වෙනුවෙන් ජනතා සහභාගිත්වය ලබා ගැනීමට යම් අවස්ථාවක් සපයා දෙන එක සහ ජනතාව ඒ සඳහා සහභාගි කරවා ගන්න එක.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ ප්‍රශ්නය, ගරු ගයන්ත කරුණාතිලක මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමිය වෙත යොමු කරන ප්‍රශ්නය මෙයයි.

01. දකුණු පළාතේ ප්‍රධානතම සංචාරක ආකර්ෂණීය ව්‍යාපෘතියක් ලෙස, 2001 වසරේදී සැලසුම් කර, ඊට අදාළ ඉඩම් අත්පත් කරගෙන, වන්දි ගෙවා අරඹන ලද බෙන්තොට දෙද්දුව සංචාරක කලාපය ක්‍රියාත්මක වෙමින් පැවැති බව පිළිගන්නේද?

02. දෙස් විදෙස් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමට යෝජිත දෙද්දුව සංචාරක කලාපයේ සැලසුම් කර තිබූ ප්‍රධාන ව්‍යාපෘති මොනවාද?

03. "දෙද්දුව සංචාරක ව්‍යාපෘතිය" ලෙස නම් කර ඇති මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් කොපමණ ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබේද? එසේ අත්පත් කර ගැනීම් සිදු කර ඇත්තේ කුමන වර්ෂවලදීද? ඒ සඳහා කොපමණ පිරිසකට වන්දි ගෙවා ඇත්ද? එසේ ගෙවා ඇති වන්දි මුදල් කොපමණද?

04. මෙම ව්‍යාපෘතිය බෙන්තරටත්, දකුණු පළාතටත්, සමස්ත රටටත් සංචාරක ආකර්ෂණයක් ගත හැකි සහ ජාතික ආර්ථිකයට සුවිශේෂී දායකත්වයක් ලබා ගත හැකි සංචාරක ව්‍යාපෘතියක් ලෙස, වත්මන් රජය විසින් ජාතික සංචාරක ප්‍රතිපත්තිය තුළ පිළිගෙන තිබේද? එසේ නම් එය ඉදිරියට ගෙන යෑමට වත්මන් රජය බලයට පත් වූ දින සිට මේ දක්වා ගෙන ඇති පියවර මොනවාද?

05. නොඑසේ නම් ඒ මන්ද?

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

01. ඔව්.

02. බෙන්තොට වෙරළ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රසිද්ධ බැවින්, දෙද්දුව අභ්‍යන්තර විල් සහිත පරිසරය පදනම් කරගත් ඒකාබද්ධ විල් ආශ්‍රිත සංචාරක නිවාඩු නිකේතනයක් - integrated lake resort එකක් - සංවර්ධනය

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කිරීමට සුදුසු ස්ථානයක් ලෙස හඳුනා ගෙන ඇති අතර, යෝජිත සංවර්ධනය පරිසර හිතකාමී හා තිරසාර සංචාරක සංවර්ධනයක් ලෙස සැලසුම් කර ඇත.

එහි ප්‍රධාන යෝජිත අංග ලෙස,

- පරිසර හිතකාමී නවාතැන් පහසුකම්
- බෝට්ටු සවාරි හා බෝට්ටු නිවාස ඇතුළු විල් ආශ්‍රිත ක්‍රියාකාරකම්
- ජල ක්‍රීඩා සහ අනෙකුත් විනෝදාත්මක ක්‍රියාකාරකම්
- ස්වාභාවික හා ත්‍රාසජනක සංචාරක ක්‍රියාකාරකම්
- ප්‍රාදේශීය සංස්කෘතිය හා සම්ප්‍රදායයන් ප්‍රවර්ධනය කරන ප්‍රජාපාදක සංචාරක වැඩසටහන්
- කෘෂි සංචාරක අත්දැකීම්
- ස්වාභාවික පරිසරයට ගැළපෙන අනෙකුත් විනෝදාත්මක පහසුකම් යනාදිය ඇතුළත් වේ.

03.

- මෙම ව්‍යාපෘතිය සඳහා හෙක්ටෙයාර 694.54ක පමණ භූමි ප්‍රමාණයක් අත්පත් කරගෙන ඇත.
- ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2005 වර්ෂය පමණ වන විට බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ආරම්භ කර ඇත.
- ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 2017 වසර අවසානය වන විට අවසන් කර අදාළ ඉඩම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - SLTDA - වෙත භාර දී ඇත.
- වන්දි ලැබූ ඉඩම් හිමියන්ගේ සංඛ්‍යාව 1,068කි.
- ගෙවා ඇති වන්දි මුදල රුපියල් එකසියහතළිස්හත් මිලියන තුන්සියවිසිඅටදහස් තුන්සියදොළහයි ශත හැටඅටකි. (පරිපාලන වියදම් රහිතව)
- ගෙවා ඇති වන්දි පොලී මුදල රුපියල් අසූඅටමිලියන අටසිය හතළිස්හතරදහස් එකසියහැත්තෑතුනයි ශත දහසයකි. (පරිපාලන වියදම් රහිතව)

04. ඔව්.

- දේදූව සංචාරක ව්‍යාපෘතිය බෙන්තොට සංචාරක කර්මාන්තය විවිධාංගීකරණය කිරීමට සහ ජාතික සංචාරක ආර්ථිකයට දායක විය හැකි විභවතාවක් සහිත වැදගත් සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස තවදුරටත් හඳුනාගෙන ඇත.
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - SLTDA - විසින් දෙද්දූව, විල් ආශ්‍රිත සංචාරක නිවාඩු නිකේතන - lake resort - සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත.
- මූලික පියවරක් ලෙස, ගාලු පාරෙන් අභ්‍යන්තරයේ පිහිටි මෙම ව්‍යාපෘති ප්‍රදේශයට ප්‍රවේශ මාර්ගය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - SLTDA - විසින් හඳුනා ගෙන ඇත.
- ප්‍රධාන ප්‍රවේශ මාර්ගය ඉදි කිරීම සඳහා අමතර අක්කර 27-30ක භූමි ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දී ඇති අතර, එම කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී.
- 2022 වසරේ අනුමත කළ ආයෝජන යෝජනාව අවලංගු කිරීමෙන් පසු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අභිලාෂ කැඳවීම් සහ යෝජනා සඳහා ඉල්ලීම් 2026 වර්ෂයේදී නැවත කැඳවනු ලැබ ඇත.
- යෝජනා දෙකක් ලැබුණු නමුත් අවශ්‍ය මූල්‍ය හැකියාව තහවුරු කරන ප්‍රමාණවත් මූල්‍ය සාක්ෂි කිසිදු ආයෝජකයකු විසින් ඉදිරිපත් නොකළ බැවින්, සංවර්ධන යෝජනා ඇගයීම් කමිටුව කිසිදු යෝජනාවක් නිර්දේශ කර නොමැත.
- වර්තමානයේදී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය බෙන්තොට ප්‍රදේශීය ලේකම් කාර්යාලය සහ අනෙකුත් අදාළ ආයතන සමඟ එක්ව සීමා මායිම් නිර්ණය කිරීම හා අනවසර ඉඩම් අල්ලා ගැනීම් සම්බන්ධ ගැටලු නිරාකරණය කරමින් සිටින අතර, දෙද්දූව සංචාරක ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා නැවතත් අභිලාෂ කැඳවීමට අපේක්ෂා කරයි.

05. අදාළ නොවේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධව ගරු අග්‍රාමාත්‍යතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ආයෝජකයන් සොයා ගන්නා අවස්ථාව දක්වා මේ ව්‍යාපෘතිය දැන් ඇවිල්ලා තිබෙනවා. ගරු අගමැතිතුමියනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය හැටියට මම ඔබතුමියගෙන් මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. 2025 ඔක්තෝබර් 10 වැනිදා සංචාරක නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවට දැනුම් දුන්නා, වයෝවෘද්ධ පිරිස් වෙනුවෙන් සපයන නේවාසික, සෞඛ්‍ය, විනෝදාස්වාද සේවා සඳහා ලෝකයේ ලොකු වෙළෙඳ පොළක් තිබෙනවා, දෙද්දූව සංචාරක ව්‍යාපෘතියට දැවැන්ත ජර්මානු ආයෝජනයක් ලබා ගැනීම සඳහා සාකච්ඡා කරමින් පවතිනවා කියලා. නමුත් පිළිතුර අනුව බලනකොට ඒක ඉදිරියට යාමක් නැති බව පෙනෙනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, Expressions of Interest call කළා කියලා තමයි තිබෙන්නේ. ඒ දෙකට -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

තවම නැහැ.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

තවම නැහැ. ඒ දෙක reject වෙලා තිබෙනවා, financial possibility එක නැති නිසා. හැබැයි, දිගින් දිගටම මේ ව්‍යාපෘතියට investorsලා ලබා ගන්න කටයුතු කරනවා කියලා තමයි අපට අමාත්‍යාංශයෙන් දැනුම් දීලා තිබෙන්නේ. ඒක අත්හැරලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා දන්නවා, 2001දී විතර - *[බාධා කිරීමක්]* මෙය හොඳ ව්‍යාපෘතියක් ලෙස අපිත් හඳුනාගෙන තිබෙනවා. Investorsලා හොයමින් තමයි ඉන්නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට ඔබතුමා මට මිනිත්තු කීයක්ද දෙනවාද? මිනිත්තු දෙකක් තුනක්වත් දෙනවා නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය තුළින් මම ප්‍රශ්නයක් අහනවාට වඩා ඉල්ලීමක්, යෝජනාවක් කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, මේක සද්භාවයෙන් අහන කාරණයක් නිසා. ශ්‍රී ලංකාවේ මුලින්ම සංචාරක ව්‍යාපාරය ආරම්භ වුණේ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා රාජ්‍ය ඇමති හැටියට සිටියදී, 1960 දශකයේදී බෙන්තර පුරවරය මුල් කරගෙන. ඒ කාලයේ සංචාරක ව්‍යාපාරයට හුහක් විවේචන එල්ල වුණා. නමුත් අද වෙද්දී, සියලු රජයන් සහ ඒ හැම කෙනෙකුම පිළිගන්නවා, ලංකාවේ ආර්ථිකයට සංචාරක ව්‍යාපාරය අත්‍යවශ්‍යයි කියන එක. අග්‍රාමාත්‍යතුමිය කිව්වා වාගේ මේ වෙනකොට ලෝකයේ හොඳම සංචාරක ගමනාන්ත අතරට ශ්‍රී ලංකාව අවස්ථා ගණනාවකදී පත් වෙලා තිබෙනවා. මට මතකයි, 2001දී රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වෙලා ආණ්ඩුවක් පිහිටුවලා, පළාතේ මන්ත්‍රී හැටියට මට දුන් උපදේශය තමයි බෙන්තර මුල්කරගෙන සංචාරක සැලැස්මක් හදන්න කියන එක. සංචාරක අමාත්‍යාංශයයි, ඒ අංශයේ ප්‍රවීණයන් ඔක්කෝම එකතු කරගෙන එය ඉක්මනට හදන්න කිව්වා. ලෝකයේ ධනවත්ම ප්‍රධාන පෙළේ සංචාරකයන් ආකර්ෂණය කර ගන්නත්, ඔවුන් වැඩි කාලසීමාවක් රට තුළ රඳවා ගන්නත් පුළුවන් ව්‍යාපෘති ගෙනෙන එක තමයි අපි ඒ වෙලාවේ ඉලක්ක කළේ, අගමැතිතුමියනි. ඒක නිසා තමයි ජල ක්‍රීඩා ආදියට මුල් තැන දුන්නේ. ඉතින්, මේකට රජයේ ප්‍රමුඛතාවක් දෙන්න කියලා තමයි මම ඉල්ලන්නේ. මොකද, හොඳම උදාහරණය තමයි මේ ප්‍රදේශය. අපි ඉන්න පාර්ලිමේන්තු සංකීර්ණ භූමිය පිහිටි මේ ප්‍රදේශය, ජයවර්ධනපුරය නව නගරයක් කරන්න ඉස්සෙල්ලා - 1977ට කලින් - එතරම් වටිනාකමක් තිබුණේ නැහැ. පාර්ලිමේන්තු සංකීර්ණය ඉදි කරලා, ජයවර්ධනපුර රෝහල ඉදි කරලා, සෙත්සිරිපාය, ඉසුරුපාය වාගේ ඒවා එන්න පටන් ගත්තාම මිනිස්සුන්ට ලොකු පහසුවක් වුණා. ඒ වාගේම භූමියේ වටිනාකම දෙතුන් ගුණයකින් නොවෙයි විශාල ගුණයකින් වැඩි වුණා. ඒ නිසා අපේ දකුණු පළාතටත් - ඔබතුමියත් සම්බන්ධ පළාතට - මේ කටයුත්ත බොහොම ආකර්ෂණීය එකක් වෙයි. ඒ නිසා මේකට මුල් වෙච්ච කෙනෙකු හැටියටත්, මේක යථාර්ථයක් වෙනවා දකින්න කැමැති කෙනෙකු හැටියටත් මම ඉල්ලීමක් කරනවා, මේකට ප්‍රමුඛතාවක් දීලා පුළුවන් තරම් ආයෝජකයන් ගෙන්වා ගැනීමට ඔබතුමියත්, රජයත් මැදිහත් වෙන්න කියලා. කොයි ආණ්ඩුවක් යටතේ වුණත් අපට කමක් නැහැ, මේ සිහිනය යථාර්ථයක් කර ගන්න අපි කටයුතු කරමු කියන ඉල්ලීම මා කරනවා.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ එම යෝජනාව පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. අපි ඒක භාර ගන්නවා. සංචාරක ව්‍යාපාරය ඒ විධියට ගුණාත්මකභාවයෙන් දියුණු වෙන එක තමයි අපටත් ඕනෑ කරන්නේ. විශේෂයෙන්ම දකුණු පළාත කියන්නේ දැනටත් සංචාරකයන්ට ඉතාම ආකර්ෂණීය ප්‍රදේශයක්. සංචාරකයන්ට එන්න පුළුවන් ස්ථාන සහ ඒ අත්දැකීම් වැඩි කරන එක තමයි අපට අවශ්‍ය. ඒ වෙනුවෙන් අමාත්‍යාංශය වැඩ කරනවා; මැදිහත් වෙනවා. එතුමාටත් පුළුවන් ඒ සඳහා සහයෝගය දෙන්න. අනිවාර්යයෙන්ම එතුමාත් කියන විධියට අපට මේක කරන්න පුළුවන්, ගරු කථානායකතුමනි. ඒක තමයි අපේත් අරමුණ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමියත් එය හොඳ බව කිව්වා. මට මතකයි, අනුර බණ්ඩාරනායක මැතිතුමා ඇතුළු සියලු රජයන්වල හිටපු සංචාරක ඇමතිවරු මේක අගය කළ බව. ඒ නිසා අපි මේක හොඳින් ඉස්සරහට ගෙනයන්න උත්සාහ කරමු.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -660/2025-(1), ගරු රෝහණ බණ්ඩාර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -985/2025- (1), ගරු කිංස් නෙල්සන් මහතා.

ගරු කිංස් නෙල්සන් මහතා
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පොදු සමා කාලයන් තුළ සේවයෙන් ඉවත් වූ ත්‍රිවිධ හමුදා සාමාජිකයින්: විසතර
பொது மன்னிப்புக் காலப்பகுதியில் சேவையிலிருந்து விலகிய முப்படையினர்: விபரம்
TRI-FORCE PERSONNEL RESIGNED UNDER AMNESTIES GRANTED: DETAILS

1634/2025

3. **ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) ත්‍රිවිධ හමුදාව තුළ ස්ථිර සහ තාවකාලික සේවයේ යෙදී සිටින හමුදා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

(ii) පසුගිය වර්ෂ 05 තුළ ඔවුන්ට නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වීම සඳහා පොදු සමා කාලයක් ලබා දුන් වාර ගණන කොපමණද;

(iii) එම පොදු සමා කාල තුළ නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වූ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முப்படையினுள் நிரந்தர மற்றும் தற்காலிக சேவையில் ஈடுபட்டுள்ள இராணுவ வீரர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) கடந்த 05 ஆண்டுகளுக்குள் அவர்களுக்கு இராணுவ சேவையிலிருந்து சட்டரீதியாக விலகு வதற்கு பொதுமன்னிப்புக் காலம் வழங்கப்பட்ட தடவைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) அப்பொதுமன்னிப்புக் காலங்களில் சட்ட ரீதியாக இராணுவ சேவையிலிருந்து விலகிக் கொண்ட இராணுவ வீரர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Defence:

(a) Will he inform this House the number of -

(i) military personnel engaged in permanent and temporary service in the Tri-forces, separately;

(ii) occasions on which general amnesties have been granted for personnel to legally resign from military service during the last five years; and

(iii) military personnel who have legally resigned from military service during the aforementioned amnesty periods?

(b) If not, why?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ත්‍රිවිධ හමුදාව තුළ 2026.05.18 දිනට සේවයේ යෙදී සිටින හමුදා සාමාජිකයන් සංඛ්‍යාව පහත පරිදි වේ.

අනු අංකය	ආයතනය	සේවා ගණය	නිලධාරීන් සංඛ්‍යාව		
			නිත්‍ය	ස්වේච්ඡා	එකතුව
01.	යුද්ධ හමුදාව	නිලධාරි	6,545	1,766	8,311
		සෙසු නිල	80,690	41,850	122,540
		එකතුව	87,235	43,616	130,851
02.	නාවික හමුදාව	නිලධාරි	2,754	313	3,067
		සෙසු නිල	28,025	3,898	31,923
		එකතුව	30,779	4,211	34,990
03.	ගුවන් හමුදාව	නිලධාරි	2,105	35	2,140
		සෙසු නිල	16,614	8,545	25,159
		එකතුව	18,719	8,580	27,299

(ii) පසුගිය වසර 05 තුළ ඔවුන්ට නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත්වීම සඳහා පොදු සමා කාලයක් ලබා දුන් වාර ගණන පහත පරිදි වේ.

අනු අංකය	ආයතනය	වාර ගණන	දින සිට	දින දක්වා
01	යුද්ධ හමුදාව	02	2022.11.15 2024.04.20	2022.12.31 2024.05.20
02	නාවික හමුදාව			
03	ගුවන් හමුදාව			

(iii) එම පොදු සමා කාලය තුළ නීත්‍යානුකූලව හමුදා සේවයෙන් ඉවත් වූ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව පහත පරිදි වේ.

අනු අංකය	ආයතනය	නිලධරින්		නිලධාරීන්		එකතුව
		නිත්‍ය	ස්වේච්ඡා	නිත්‍ය	ස්වේච්ඡා	
01	යුද්ධ හමුදාව	25	13	23,497	7,553	31,088
02	නාවික හමුදාව	05	-	2,092	404	2,501
03	ගුවන් හමුදාව	14	-	902	478	1,394

(ආ) අදාළ නොවේ.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ නැති නිසා අපේ සෞඛ්‍ය අමාත්‍යතුමා උත්තර දුන්නා. අතුරු ප්‍රශ්න ඇහුවොත් ගරු ඇමතිතුමාට ඒවා භාර ගන්න පුළුවන්ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

භාර අරගෙන යොමු කරන්නම්.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, 2023 ආර්ථික අර්බුදය වෙලාවේ රජයේ සේවකයන්ට චක්‍රලේඛයක් නිකුත් කළා, රැකියා සඳහා විදේශගත වෙන්න කැමැති අයට විදේශගත වෙන්න පුළුවන්

කියලා. ඒ වෙලාවේ හමුදාවේ අධිකාරි ලත් නිලධාරින් පශ්චාත් උපාධිය ලබා ගැනීමට සහ රැකියාවලට යන්න කියලා අවුරුදු 5ක් නිවාඩු ඉල්ලුවා. හැබැයි, එම චක්‍රලේඛය අනෙකුත් රාජ්‍ය නිලධාරින් සම්බන්ධයෙනුත් වෙනසක් වුණේ නැහැ. හමුදාවටත් පොදු, එකම චක්‍රලේඛයක් තිබුණේ.

මේ වනකොට අධිකාරි ලත් නිලධාරින් විශාල ප්‍රමාණයක් එක එක රැකියා සඳහා අවුරුදු පහකට විදේශගත වෙලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, ඊට පසුව 2024දී එලෙස විදේශගත වූ අයට සහ යුද හමුදාවේ සේවය කරන අයට ඉවත් වෙන්න පොදු සමා කාලයක් දුන්නා. නමුත් එවකට හිටපු ආරක්ෂක ලේකම්, විදේශගත වුණු අයට එම අවස්ථාව දුන්නේ නැහැ. ඔවුන්ගේ නිවාඩු අවලංගු කරලා තිබුණා. දැන් ඒගොල්ලන්ට ප්‍රශ්නයක් මතුවෙලා තිබෙනවා. මොකද, දැන් ඒගොල්ලෝ ඉන්නේ විදේශ රටවල. එවකට හිටපු ආරක්ෂක ලේකම් තමයි එලෙස කටයුතු කළේ. එවකට හිටපු ආරක්ෂක ලේකම් විදේශගත වුණු අයගේ නිවාඩු අවලංගු කිරීම නිසා ඔවුන්ගේ රැකියා සම්බන්ධව ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. එලෙස විදේශගත වුණු අය විශාල පිරිසක් ඉන්නවා. ඔබතුමන්ලාගේ NPP ආණ්ඩුව බලයට එන්න කලින් අරුණ ජයසේකර මහතා එක්ක මේ රටේ සිටින ඒ අයගේ දෙමව්පියන් ඒ ගැන කියා තිබෙනවා. එතුමා ඒ සඳහා සාකච්ඡාවකුත් දීලා තිබෙනවා. ඒ සාකච්ඡාවේදී අරුණ ජයසේකර මහත්මයා කියා තිබෙනවා, එතුමන්ලාගේ ආණ්ඩුවක් යටතේ ඒ අයට පොදු සමාව දීලා නැවත රැකියා අවස්ථාව දෙනවා කියලා. මේ වනකොට අධිකාරි ලත් නිලධාරින් දහස් ගණනක් විදේශ රටවල රැකියා කරමින් ඉන්නවා. ඒ කියන්නේ Second Lieutenant, Lieutenant තනතුරුවල ඉඳලා ඉහළ නිලධාරින්. නමුත්, ඒ අය විදේශ රටවල අසරණ වෙලා ඉන්නවා. තවම ඒ අයට පොදු සමාවක් දීලා නැහැ, ගරු ඇමතිතුමනි. ලංකාවේ ඉන්න ඒගොල්ලන්ගේ දෙමව්පියෝ ඉල්ලීමක් කරනවා, එක්කෝ ඒ අයව මේ රටේ යුද හමුදාවට බඳවා ගන්න, එහෙම නැත්නම් ඒගොල්ලන්ට පොදු සමාව දීලා නීත්‍යනුකූලව සේවයෙන් ඉවත් කරලා විදේශ රටවලම රැකියාවල යෙදෙන්න අවස්ථාව ලබා දෙන්න කියලා. ඒ සම්බන්ධයෙන් තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන එක තමයි තමයි මගේ අතුරු ප්‍රශ්නය, ගරු ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, 2024.04.20 සිට 2024.05.20 දක්වා ලබා දුන් පොදු සමා කාලය පිළිබඳව මෙතුමා සඳහන් කළා. මෙතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය මම ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා හරහා එයට පිළිතුරක් ඔබතුමාට ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නයක් නැහැ, ගරු කථානායකතුමනි. මම කියපු කාරණය ගරු ඇමතිතුමාට හොඳින් පැහැදිලි වුණා. ගරු ඇමතිතුමනි, මෙය එච්චර ලොකු දෙයක් නොවෙයි. 2024දී ලබා දුන් පොදු සමා කාලය ඒ අයටත් දුන්නා නම් හරි. ඒ වැරැද්ද කර තිබුණේ එවකට හිටපු ආරක්ෂක ලේකම්. ඒ අය චක්‍රලේඛය අනුව විදේශ රටවල රැකියා සඳහා ගියා, ගරු කථානායකතුමනි. නමුත් එවකට හිටපු ආරක්ෂක ලේකම් ඒ අයගෙන් පළිගත්තා. එහෙම වැඩක් වුණේ. 2024 චක්‍රලේඛය අනුව ඒ අයට පොදු සමා කාලය දුන්නේ නැහැ. විශාල පිරිසක් එක එක රැකියාවලට ගිහින් ඉන්නවා. සමහර අය වෛද්‍ය වෘත්තියේ ඉන්නවා, සමහරු හෙදි වෘත්තියේ ඉන්නවා. ඒ විධියට නොයෙකුත් රැකියා කරන අය ඉන්නවා. ඒ අය මේ රටේ ආර්ථිකයට දායකත්වයක් දෙන අය. ආරක්ෂක ලේකම්තුමා එක්ක කථා කරලා මෙම ප්‍රශ්නය විසඳා දෙන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -2107/2026- (1), ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය.

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -2135/2026- (1), ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය.

ගරු ඔෂානි උමංගා මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஒஷானி உமங்கா)
(The Hon. (Mrs.) Oshani Umanga)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

2015 සිට කිරි නිෂ්පාදනය සහ ආනයනය: විස්තර
2015இலிருந்து திரவப் பால் உற்பத்தியும் இறக்குமதியும்: விபரம்
PRODUCTION AND IMPORT OF MILK SINCE 2015: DETAILS

660/2025

1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහණ බණ්ඩාර මහතා වෙනුවට)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ரோஹண பண்டார சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Rohana Bandara)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ දියර කිරි නිෂ්පාදනය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාල සීමාව තුළ දේශීය කිරි අවශ්‍යතාව, ආනයනය කර ඇති කිරි ප්‍රමාණය සහ ඒ සඳහා වැයකොට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) දියර කිරිවලින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டிலிருந்து இதுவரை இலங்கையின் திரவப் பால் உற்பத்தி ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) அக்காலப்பகுதியில் உள்நாட்டுப் பால் தேவை, இறக்குமதி செய்யப்பட்ட பாலின் அளவு மற்றும் அதற்காகச் செலவிடப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

(iii) திரவப் பாலில் தன்னிறைவடைவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) annual production of liquid milk in Sri Lanka separately from the year 2015 to date;

(ii) local milk requirement, the amount of milk imported and the amount of money spent on that, during the said period; and

(iii) measures that will be taken to make the country self-sufficient in liquid milk?

(b) If not, why?

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකාවේ දියර කිරි නිෂ්පාදනය

වර්ෂය	දියර කිරි නිෂ්පාදනය (ලීටර මිලියන)
2015	403.23
2016	454.63
2017	482.69
2018	494.85
2019	424.13
2020	414.83
2021	412.05
2022	380.00
2023	371.73
2024	402.69
2025	410.16
2026 ජුනි මාසය දක්වා (ඇස්තමේන්තුගත)	201.08

(ii) දේශීය කිරි අවශ්‍යතාව, ආනයනය කර ඇති කිරි ප්‍රමාණය සහ වැයකොට ඇති මුදල් ප්‍රමාණය

වර්ෂය	දේශීය වාර්ෂික කිරි අවශ්‍යතාව (ලීටර මිලියන)	ආනයනය කර ඇති කිරි ප්‍රමාණය (ලීටර මිලියන) **(Liquid Milk Equivalent - LME අනුව)**	වැය කර ඇති මුදල (රුපියල් මිලියන)
2015	765.40	631.60	34,087.85
2016	774.13	727.74	36,338.21
2017	783.03	723.86	48,145.42
2018	790.95	769.01	54,002.35
2019	795.81	723.03	55,646.62
2020	800.04	748.82	61,933.09
2021	808.70	649.04	63,092.78
2022	809.60	396.83	68,330.00
2023	804.35	520.08	88,620.07
2024	799.93	494.03	72,176.05
2025	794.10	626.80	107,528.83
2026 මැයි මාසය දක්වා (ඇස්තමේන්තුගත)	794.10*	301.06	52,362.00

* 2026 වසරේ මධ්‍ය වාර්ෂික ජනගහනය අනුව යාවත්කාලීන විය යුතුය.

(iii) දියර කිරිවලින් රට ස්වයංපෝෂිත කිරීම සඳහා රජය විසින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

1. ජාතික කිරි නිෂ්පාදන වැඩසටහන
2. අභිජනන ගොවිපළ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ නිකවැරටිය කිරි ගොවිපළ සංවර්ධනය.
3. පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු මඟින් විවිධ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීම.

* ජාතික කිරි නිෂ්පාදන වැඩසටහන

- අපේක්ෂිත ඉලක්ක
  - Dairy Hub සමිති 325ක් හරහා කිරි ගොවීන් සංවිධානය කිරීම.
  - කිරි ව්‍යවසායකයින් බිහි කිරීම.
  - වාර්ෂික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 410 සිට ලීටර් මිලියන 1,200 දක්වා ඉහළ නැංවීම
- මෙම වැඩසටහනට 2026 වසර සඳහා ජාතික අය වැයෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කර ඇත.

* අභිජනන ගොවිපළ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ,

- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් නිකවැරටිය කිරි ගොවිපළ සංවර්ධනය කිරීම මඟින් අනාගතයේදී ක්ෂේත්‍රයට අවශ්‍ය එළ ගව සහ මී ගව ගැහැනු හා පිරිමි පැටවුන් නිකුත් කිරීමට හැකි න්‍යෂ්ටික ගොවිපළක් බවට පත් කිරීමට බලාපොරොත්තු වේ.
- මෙම ව්‍යාපෘතියට 2026 වසර සඳහා ජාතික අය වැයෙන් රුපියල් මිලියන 1,000ක් වෙන් කර ඇත.

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු කේ. කාදර් මස්තාන් මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

කාති අධිකරණ පද්ධතිය ශක්තිමත් කිරීම සහ පරිපාලන කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම
காதி நீதிமன்ற முறைமையை வலுப்படுத்தலும் நிருவாகச் செயற்றிறனை மேம்படுத்தலும்
STRENGTHENING OF QUAZI COURT SYSTEM AND IMPROVING ADMINISTRATIVE EFFICIENCY

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி!

கணவன் - மனைவி பிணக்குகள் தொடர்பான ஆயிரக்கணக்கான வழக்குகள் சாதாரண நீதிமன்றங்களில் நீண்டகாலமாக நிலுவையிலுள்ள நிலையில், நீதியை நாடும் தரப்பினர் சட்டத்தரணிகளுக்குப் பெருமளவு கொடுப்பனவு களை மேற்கொள்ள வேண்டிய நிலை காணப்படுகின்றது. 1951ஆம் ஆண்டின் 13ஆம் இலக்க, முஸ்லிம் விவாக மற்றும் விவாகரத்துச் சட்டத்தின்கீழ் நிறுவப்பட்டுள்ள காதி நீதிமன்ற முறைமை, முஸ்லிம் சமூகத்தின் திருமணம் மற்றும் குடும்பத் தகராறுகளை விரைவாகவும் குறைந்த செலவிலும் தீர்ப்பதற்கான முக்கிய நீதிப் பொறிமுறையாகச் செயற்பட்டு வருகின்றது. இந்நீதிமன்றங்கள் மாவட்ட நீதிமன்றங்களின் வழக்குச் சுமையைக் குறைப்பதுடன், நீதியை நாடுவோரின் சட்டச் செலவையும் கணிசமாகக் குறைப்பதில் முக்கிய பங்காற்றுகின்றன.

காதி நீதிபதிகள் பொதுவாக உயர்ந்த பொதுச் சேவை மனப்பான்மையுடன் தமது நீதிப் பொறுப்புகளை நிறைவேற்றி வருகின்றபோதிலும், தற்போதைய நிருவாக ஏற்பாடுகள் மற்றும் கொடுப்பனவு போதாமை தொடர்பில் கவலைகள் எழுந்துள்ளன. மாவட்ட நீதிபதிகள் மாதாந்தம் சுமார் 300,000 ரூபாய் முதல் 400,000 ரூபாய் வரை சம்பளம் மற்றும் கொடுப்பனவுகளைப் பெறுகின்ற நிலையில், காதி நீதிபதிகளுக்கு மாதாந்தம் 7,500 ரூபாய் மட்டுமே கொடுப்பனவாக வழங்கப்படுகின்றது. அவர்கள் வகிக்கும் நீதித்துறைப் பொறுப்பின் முக்கியத்துவத்துடன் ஒப்பிடுகை யில், இது மிகவும் போதாமையாகக் கருதப்படுவதுடன், நீதித்துறையின் சுயாதீனம், சேவையின் தரம் மற்றும் பொதுமக்களின் நம்பிக்கை ஆகியவற்றிலும் பாதிப்பை ஏற்படுத்தக்கூடியதாகும்.

இலங்கையில் சுமார் 23 இலட்சம் முஸ்லிம்களுக்கு நீதிச் சேவையை வழங்கிவரும் காதி நீதிமன்ற முறைமையை மேலும் வலுப்படுத்த வேண்டிய அவசியத்தைக் கருத்திற்கொண்டு, கௌரவ அமைச்சர் அவர்களிடம் பின்வரும் கேள்விகளைக் கேட்கின்றேன்.

(அ) தற்போது இலங்கையில் இயங்கிவரும் காதி நீதிமன்றங்களின் மொத்த எண்ணிக்கை எவ்வளவு? அவற்றில் அரசுக்குச் சொந்தமான கட்டிடங்களில் இயங்கும் காதி நீதிமன்றங்களின் எண்ணிக்கை எவ்வளவு?

(ஆ) நாடளாவிய ரீதியில் தற்போது கடமையாற்றும் காதி நீதிபதிகளின் எண்ணிக்கை எவ்வளவு? அதேவேளை, நிரப்பப்படாமல் உள்ள காதி நீதிபதி வெற்றிடங்களின் எண்ணிக்கை எவ்வளவு?

(இ) காதி நீதிபதிகளுக்கு தற்போது அரசாங்கத்தால் வழங்கப்படும் மாதாந்தக் கொடுப்பனவுகள், வசதிகள் மற்றும் ஏனைய சலுகைகள் யாவை?

(ஈ) காதி நீதிபதிகளுக்குத் தற்போது வழங்கப்படும் கொடுப்பனவுகள், வசதிகள் மற்றும் நிருவாக ஆதரவு ஆகியவை சுயாதீனமான, திறமையான, உயர்தரமான மற்றும் ஊழலற்ற நீதிச் சேவையை வழங்குவதற்குப் போதுமானவை என அரசாங்கம் கருதுகின்றதா?

(உ) காதி நீதிமன்றங்களின் அலுவலக நிருவாகம், பதிவேடுகள் பராமரிப்பு, வழக்கு முகாமைத்துவம் மற்றும் நிறுவன ரீதியான ஆதரவை வழங்குவதற்காக நியமிக்கப்பட்டுள்ள நிருவாக மற்றும் உதவி உத்தியோகத்தர்களின் எண்ணிக்கை எவ்வளவு? மேலும், காதி நீதிபதிகளின் பாதுகாப்பை உறுதிப்படுத்த மேற்கொள்ளப்பட்டுள்ள ஏற்பாடுகள் யாவை?

(ஊ) காதி நீதிமன்ற முறைமையை வலுப்படுத்தவும், அதன் உட்கட்டமைப்பு மற்றும் நிறுவனத் திறனை மேம்படுத்தவும் காதி நீதிபதிகளுக்கான மாதாந்தக் கொடுப்பனவுகள் மற்றும் ஏனைய வசதிகளை அதிகரிக்கவும் அரசாங்கம் மேற்கொள்ளவுள்ள நடவடிக்கைகள் யாவை?

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

(எ) காதி நீதிமன்றங்களை மாவட்ட நீதிமன்ற வளாகங்களுக்குள் அல்லது அவற்றுடன் இணைந்த அரச கட்டிடங்களில் நிறுவுவதன்மூலம் காதி நீதிமன்றங்களின் செயற்றிறன், பாதுகாப்பு, அணுகல் வசதி மற்றும் பொதுமக்களின் நம்பிக்கையை மேலும் உயர்த்த முடியும் என்பதை அரசாங்கம் ஏற்றுக் கொள்கிறதா?

(ஏ) இல்லையெனில், அதற்கான காரணங்கள் யாவை?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

Hon. Speaker, this is a very valid and important Qestion raised by the Hon. Member, but most of this information has to be obtained from the Judicial Service Commission as Quazi Courts are administered by them. Therefore, I ask for a very short time to answer this Question after getting down the information from the Judicial Service Commission.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

II

රාජ්‍ය බැංකුවල මහා පරිමාණ අක්‍රිය ණය මුදල් අය කර ගැනීම සඳහා ගෙන ඇති පියවර

அரச வங்கிகளின் பாரிய அளவிலான அறவிடமுடியாக் கடன்களை அறவிடுவதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகள்

MEASURES TAKEN TO RECOVER LARGE NON-PERFORMING LOANS OF STATE BANKS

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙත මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

සංසන්දනාත්මකව කුඩා ණය පැහැර හැරීම් වෙනුවෙන් සිදුවන ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් සාමාන්‍ය ජනතාවට තම නිවාස, ව්‍යාපාර සහ අනෙකුත් දේපළ අහිමි වන වකවානුවක, ප්‍රධාන පෙළේ ණය පැහැර හරින්නන් විසින් රාජ්‍ය බැංකු වෙත ගෙවිය යුතුව ඇති විශාල මුදල් ප්‍රමාණයන් අය කර ගැනීමට ගෙන ඇති පියවර කවරේදැයි දැන ගැනීමට මහජනතාව තුළ සාධාරණ උනන්දුවක් පවතී. අක්‍රිය ණය - non-performing loans, NPLs - සහ නරක් වූ ණය කපා හැරීම් - bad debt write-offs - හේතුවෙන් රාජ්‍ය බැංකු මුහුණ දී ඇති සැලකිය යුතු අලාභයන් සැලකිල්ලට ගනිමින් ද, පාරදෘශ්‍යභාවය, වගවීම සහ මහජන මුදල් ආරක්ෂා කිරීම උදෙසා ද මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, මේ වනකොට රට තුළ සාමාන්‍ය ජනතාව ක්‍රෙඩිට් කාඩ් පතක බිලක් ගෙව්වේ නැත්නම් බැංකුවෙන් calls 100ක් විතර ගන්නවා කියලා. ඒ වාගේම තමන්ගේ වාහනයක ණය වාරිකය ගෙව්වේ නැත්නම්, ලීසිං වාරිකය ගෙව්වේ නැත්නම් අදටත් ඒ වාහන අරගෙන යනවා. මීට සති දෙකකට පෙර මඩකලපුවේදීත් ලීසිං සීසර්ලා ඇවිල්ලා වාහනයක් අරගෙන ගියා. ඊට පස්සේ ඒ වාහනය නැවත ගන්නවා නම් විශාල මුදලක් දඩයක් විධියට ගහනවා. නිවාස ණයක් ගෙව්වේ නැත්නම් නිවාසයෙන් එළියට දමන තත්ත්වයට සමහර බැංකුවල ක්‍රියා කලාප තිබෙනවා. මෙවන් පසුබිමක තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. මම 2021දී COPE එකේ සාමාජිකයෙකු හැටියට ඉන්නකොට රාජ්‍ය බැංකු දෙකේ non-performing loans පිළිබඳව මුල්වරට තොරතුරු එළිදැක්වූවා. ඒ අවස්ථාවේදී එවකට බැංකුවක හිටපු සභාපතිවරයෙක් මට warning letter එකකුත් එව්වා, මෙවන් තොරතුරු එළියට දෙන්න හොඳ නැහැ කියලා. හැබැයි, ඒ කතිකාව එතැනින් එහාට ඇති වුණා. මම හිතන විධියට, දැනටත් COPE එකෙන් නිර්දේශ කරලා යවනවා, Attorney-Generalට සහ CIABOC එකට. මේ බැංකු සම්බන්ධවත් වහාම උනන්දුවක් දක්වන්න ඕනෑ. මොකද අපි දන්නවා, මේ බැංකුවලින් ණය ගත්ත සමහර අය ඒ බැංකුවලින් ගත්ත මුදල් තමන්ගේ ආයතනය හරහා පොලියට දීලා මුදල් උපයන බව, ලංකා බැංකුවට, මහජන බැංකුවට මුදල් ගෙවන්නේ නැතිව.

මෙවන් තත්ත්වයක් තුළ,

1. පහත සඳහන් එක් එක් රාජ්‍ය බැංකුවල, එනම්
   - ලංකා බැංකුව,
   - මහජන බැංකුව,
   - ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
   - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සහ
   - රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව ආශ්‍රිතව

   (අ) දැනට පවතින විශාලතම අක්‍රිය ණය - NPL - ගිණුම් 20හි; සහ

   (ආ) පසුගිය වසර 15 තුළ නරක් වූ ණය - බොල් ණය - ලෙස කපා හරින ලද විශාලතම ණය 20හි ලේඛනයක් ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන්නේද?

   ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ පැවති රජයන් ඔවුන්ට හිතවත් ව්‍යාපාරිකයන් විශාල ප්‍රමාණයක් විසින් ගෙවන්න තිබුණු ණය, බොල් ණය ලෙස කපා හැරියා කියන එක ඔබතුමා දන්නවා. රටේ ජනතාවගේ මුදල් ඒ රාජ්‍ය බැංකු හරහා ණයට අරගෙන ව්‍යාපාර පටන්ගෙන, ඒ ආයතනවල බොල් ණය කියලා ඒවා කපා හැරියාට පස්සේ ඒගොල්ලන් වෙනත් ආයතන පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා.

2. එකී එක් එක් ණය මුදල සම්බන්ධයෙන්:

   (අ) ණයගැතියාගේ හෝ ණයගැති ආයතනයේ නම;

   (ආ) අය විය යුතු හෝ කපා හරින ලද මුදල;

   (ඇ) ණය මුදල අනුමත කරන ලද වර්ෂය;

   (ඈ) ණය මුදල අක්‍රිය ණයක් බවට පත් වූ හෝ කපා හරින ලද දිනය;

   (ඉ) ලබා දී ඇති ඇපකරය සහ එහි වටිනාකම;

   (ඊ) ණය මුදල ප්‍රතිව්‍යුහගත කර තිබේද, අයකර ගැනීමේ ක්‍රියාවලියේ පවතින්නේද, නැතහොත් කපා හැර තිබේද යන්න;

ගරු කථානායකතුමනි, සමහර ණයවලට legal process එකක් යනවා කියනවා. හැබැයි, සාමාන්‍ය ජනතාවට legal process මුකුත් නැහැ. ගෙවල්වලින් එළියට දමනවා, වාහන ටික උස්සාගෙන යනවා. මේ ණය මුදල ප්‍රතිව්‍යුහගත කරලා තිබෙනවා නම් මොකක්ද date එක, ඒකේ දැන් තිබෙන legally position එක මොකක්ද, ඒකේ delay එකක් තිබෙන්නේ ඇයි කියන කාරණා පිළිබඳවත් මම අහනවා.

(ඪ) අද වනවිට අය කරගෙන ඇති මුදල;

ඒගොල්ලන්ගේ එක company එකක් bankrupt කියලා කියනවා. හැබැයි, තව company එකක assets විශාල ප්‍රමාණයක් තිබෙනවා.

(ඬ) බැංකු නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග, අපරාධ පරීක්ෂණ හෝ විනය පරීක්ෂණ ආරම්භ කර තිබේද යන්න සහ එසේ නම්, ඒවායේ වත්මන් තත්ත්වය ගරු අමාත්‍යතුමා සඳහන් කරන්නේද?

මොකද, රාජ්‍ය බැංකුවලින් ණය ගන්නකොට එම රාජ්‍ය බැංකුවල හිටපු නිලධාරීන් උදවු කරලා තිබෙනවා.

3. එකී සියලුම අක්‍රිය සහ කපා හරින ලද ණය සම්බන්ධයෙන් ගෙන ඇති අය කර ගැනීමේ ක්‍රියාමාර්ග, අය කරගෙන ඇති මුදල් ප්‍රමාණයන් සහ ඒවායේ වත්මන් තත්ත්වය පිළිබඳව විස්තර කෙරෙන ඒකාබද්ධ වාර්තාවක් ගරු අමාත්‍යතුමා විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන්නේද?

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தக் கேள்வி மிக முக்கியமானதொரு கேள்வியாகும். எங்களுடைய நாட்டில் சாதாரண ஒரு பொதுமகன் வங்கியில் சிறு தொகை கடனை எடுத்து, குறித்த திகதிக்குள் மாதாந்தத் தொகையைச் செலுத்தாமல்விட்டால், குறித்த நபருக்கு வங்கியானது அதிகமான தொலைபேசி அழைப்புகளை எடுப்பது, அவருடைய வீட்டுக்கு வந்து அழுத்தம் கொடுப்பது, வாகனத்தைப் பறித்தெடுப்பது என பல சம்பவங்கள் நடக்கின்றன. ஆனால், அரசாங்க வங்கிகளில் இருந்து பெரியளவில் - கோடிக்கணக்கான - நிதியைப் பெற்றவர்கள் அதனை மீண்டும் செலுத்தாமல் இருக்கிறார்கள். அவர்களுள் அரசியல்வாதிகளும் இருக்கிறார்கள். அண்மையில்கூட, ஓர் அரசியல்வாதியின் நிறுவனம் சம்பந்தமான விடயம் நீதிமன்றத்துக்கு வந்தது. அதாவது, ஓர் அரசியல்வாதி வட்டிக்குக் காசைக் கொடுத்து, வட்டிக் காசை எடுத்து அரசியலில் ஈடுபடுகிறார். ஆனால், அவர் இலங்கை வங்கி, மக்கள் வங்கி போன்ற வங்கிகளில் இருந்து பெற்ற கடனைக் கட்டாமல், அதனைக் கழித்துவிடுவதற்கு நடவடிக்கை எடுக்கிறார். இது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகும். இது சம்பந்தமாக அரசாங்கம் எடுத்திருக்கின்ற நடவடிக்கைகள் பற்றித்தான் நாங்கள் கேட்கிறோம். அதாவது, அரச வங்கிகளில் இருந்து பெற்றுக்கொண்ட நிதியை மீளச் செலுத்தாமல் இழுத்தடிக்கின்றவர்களுக்கு எதிராக என்ன நடவடிக்கை எடுத்திருக்கிறீர்கள்? எனக் கேட்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන්, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම කල් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා.

වී මිලදී ගැනීම සහ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා රජයේ වැඩ පිළිවෙළ: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය
நெல் கொள்முதல் மற்றும் உற்பத்தியின் கொள்ளளவை அதிகரித்தல் தொடர்பான அரசாங்கத்தின் உத்திகள்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று
GOVERNMENT STRATEGY ON PURCHASING PADDY AND INCREASING PRODUCTION CAPACITY : STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු කථානායකතුමනි, 2026.07.07වන දින ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා.

1. කන්නය අවසන් වී ක්ෂේත්‍ර සමීක්ෂණ සිදු කර කන්නයට අදාළව නිෂ්පාදන වියදම ගණනය කරන තෙක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් රජයට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ පහසුව තකා කන්නය ආරම්භයේදී තාවකාලික නිෂ්පාදන වියදම් ඇස්තමේන්තුවක් සකස් කරනු ලැබේ.

වී වගාවේ සහතික මිල තීරණය කිරීම සඳහා නිර්දේශ ලබා දීම ආයතන කිහිපයකින් සැදුම්ලත් මිල තීරණය කිරීමේ කමිටුවක් මඟින් සිදු වේ. ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූලිකත්වය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, පසු අස්වනු තාක්ෂණ ආයතනය හා වී අලෙවි මණ්ඩලය සහභාගි වේ. මෙහිදී කන්නය තුළ වී වගාව සඳහා පැවතිය හැකි නිෂ්පාදන වියදම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කමිටුවට ඉදිරිපත් කරන අතර, පසු අස්වනු තාක්ෂණ ආයතනය මඟින් වී සහල් බවට පත් කිරීම සහ වැය වන

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

වියදම් ඇතුළත් කර සාදන මිල සූත්‍රය අනුව සහල් මිලද ගණනය කිරීමක් සිදු කර ගොවියාට ලබා දිය හැකි වී සඳහා අවම මිල අදාළ කමිටුව මඟින් නිර්දේශ කරනු ලැබේ.

<u>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිෂ්පාදන වියදම ගණනය කරන ආකාරය:</u>

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ, ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය මඟින් 1979 වසරේ සිට සෑම කන්නයක් අවසානයේදීම වගාව සඳහා ගොවියාට වැය වූ වියදම ලෙස දිවයින පුරා සිදු කරනු ලබන ක්ෂේත්‍ර සමීක්ෂණ මඟින් ලබා ගන්නා දත්ත මත පදනම්ව අක්කරයක් සඳහා වන වියදම, ක්‍රියාකාරකම් මට්ටමින් සහ ශ්‍රමය, අමුද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර සඳහා වන ආකාරයට ගණනය කරනු ලැබේ. මෙහිදී ගොවියා ලබා ගත් අස්වැන්න මත ඒකක නිෂ්පාදනයක් සඳහා වැය වන විදයම ගණනය කරනු ලැබේ. කන්නයේදී වැය වන පිරිවැය සාමාන්‍යයෙන් රටේ පවත්නා ආර්ථික තත්ත්වය මත කාලානුරූපව ඉහළ යන නමුත් ගොවියා ලබා ගන්නා අස්වැන්නෙහි රට පුරා පවතින විවිධත්වය මත ඒකක පිරිවැය ඉහළ හෝ පහළ යා හැක. නමුත් පවත්නා කන්නයේ සහතික මිල ගණනය කිරීම සඳහා කන්නය අවසන් වීමට පෙර වී වගාවට අදාළ පිරිවැය හා අපේක්ෂිත අස්වැන්න ගණනය කර දිවයිනටම එක් වටිනාකමක් ලබා දීම සිදු කළ යුතුය. එහිදී නාඩු-රතු, නාඩු-සුදු, සම්බා හා කීරි සම්බා ලෙස ඒකක පිරිවැය සාදනු ලැබේ. වී වගාවේ ඒකක පිරිවැය ඇස්තමේන්තු කරන ක්‍රමවේදය විස්තරාත්මකව පහත සඳහන් කර ඇත.

<u>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිෂ්පාදන වියදම ගණනය කරන ආකාරය:</u>

වී වගාවේ ඒකක පිරිවැය ඇස්තමේන්තු කිරීමේදී ක්ෂේත්‍රයේ සිදු කරන පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ශ්‍රමය, යන්ත්‍රෝපකරණ සහ යෙදවුම් සඳහා යන වියදම් සැලකිල්ලට ගෙන අක්කරයකට අදාළව පිරිවැය ගණනය කරනු ලැබේ.

- කුඹුර අවට වනාන්ත පිරිසිදු කිරීම
- රෝද හතරේ ට්‍රැක්ටරයකින් පළමු, දෙවන හා තෙවන සී සෑම
- නියර රැහීම හා බැඳීම
- පෝරු ගෑම හා වැපිරීම
- පොහොර යෙදීම හා ප්‍රවාහනය
- වල්නාශක භාවිතයෙන් වල් මර්දනය
- පලිබෝධනාශක භාවිතයෙන් පලිබෝධ පාලනය
- ජල කළමනාකරණය
- ඒකාබද්ධ අස්වනු නෙළන යන්ත්‍රයකින් අස්වනු නෙළීම
- අමතර වියළීම හා ඇසුරුම් බෑග්වලට දැමීම
- අස්වැන්න ප්‍රවාහනය

දත්ත, මූලාශ්‍ර සහ නිර්දේශ ලබාදුන් ආයතනය හෝ කමිටුව කුමක්ද කියා අසා තිබුණා. එහි විස්තර මෙසේයි.

මිල කමිටුව

නිලධාරියාගේ නම සහ තනතුර	ආයතනය
ඒ.කේ. ජයවර්ධන මිය - අධ්‍යක්ෂ ජනරාල් (කෘෂි තාක්ෂණ)/මිල කමිටු සභාපති	පොහොර අංශය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
මහාචාර්ය එච්.එල්. සන්දික මහතා - අධ්‍යක්ෂ/කමිටු සාමාජික	හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු, පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
ව/ඉංජිනේරු එච්.එම්.ජී.පී. රත්නායක මහතා - අධ්‍යක්ෂ/කමිටු සාමාජික	ජාතික පසු අස්වනු තාක්ෂණ කළමනාකරණ ආයතනය
ටී.එච්. අමරසිංහ මහතා - අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණ)/කමිටු සාමාජික	පොහොර අංශය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
ඒ.එම්.යූ. පින්නලන්ද මහතා - සභාපති/කමිටු සාමාජික	වී අලෙවි මණ්ඩලය
එම්.ජී. අජිත් පුෂ්පකුමාර මහතා - අධ්‍යක්ෂ/කමිටු සාමාජික	කෘෂි ව්‍යාපාර අංශය, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
ආචාර්ය චමිලා චන්ද්‍රසිරි මිය - අධ්‍යක්ෂ/කමිටු සාමාජික	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නෝරුව, පේරාදෙණිය - සමාජ ආර්ථික සැලසුම් අංශය
කෘෂි ආර්ථික විද්‍යාඥ සුධීර නිකපිටිය මහතා - කමිටු සාමාජික	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගන්නෝරුව, පේරාදෙණිය - සමාජ ආර්ථික සැලසුම් අංශය

එම මිල තීරණය ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් නොකළේ කවර හේතුවක් මතද කියාත් අසා තිබුණා.

වී අලෙවි මණ්ඩලයට සහ සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවට ලිඛිතව දැනුම් දී ඇත. ජනමාධ්‍ය හරහා ජනතාව දැනුවත් කර ඇත.

2. පසුගිය වසර 5 තුළ වී අස්වැන්න, වගා භූමි ප්‍රමාණය:

කන්නය	වගා වපසරිය (හෙක්ටෙයාර)	අස්වැන්න (මෙ.ටො.)
2025 යල	541,422	2,308,398
2024/25 මහ	800,463	2,745,298
2024 යල	481,316	1,976,496
2023/24 මහ	806,673	2,721,958
2023 යල	505,076	1,817,391
2022/23 මහ	812,601	2,696,040
2022 යල	481,669	1,461,675
2021/22 මහ	775,846	1,931,230
2021 යල	501,467	2,088,202
2020/21 මහ	770,240	3,061,394

වී ගොවියාගේ නිෂ්පාදන පිරිවැය අවම කිරීම හා දේශීය වී නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා රජය ගෙන ඇති ප්‍රතිපත්තිමය හා මූල්‍යමය පියවර:

- වී වගාවේ නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා රජය විසින් මෙතෙක් පොහොර සහනාධාරය ලෙස හෙක්ටෙයාර එකක් සඳහා ලබා දුන් රුපියල්

25,000ක මුදල 2026 යල කන්නයේ සිට හෙක්ටෙයාර එකක් සඳහා රුපියල් 30,000ක් ලෙස වැඩි කර ඇත.

- වෙළඳ පොළේ රුපියල් 18,000ක් පමණ මිලකට අලෙවි වූ යූරියා පොහොර කිලෝග්‍රෑම් 50ක බෑගයක් රුපියල් 10,200ක මුදලකට ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ලබා දීමට කටයුතු කර ඇත.
- වී වගාවේ නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා 2025/2026 මහ කන්නයේ සිට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් යාය වැඩසටහන ක්‍රියාත්මක කිරීම. මේ යටතේ අස්වනු ඉහළ නැංවීම සඳහා තාක්ෂණික පැකේජයක් හඳුන්වා දී ඇත.

3. ශ්‍රී ලංකාවේ වී වගාව ආසන්නව වසරකට හෙක්ටෙයාර ලක්ෂ 13ක් පමණ වගා කර මේ වන විට වාර්ෂික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 5ක් පමණ ලැබේ. මෙම වී නිෂ්පාදනයෙන් සියයට 70ක් පමණ ලැබෙන්නේ, මහා වාරි ජලාශ යටතේ සහ මහවැලි කලාපවල වගා කරන කුඹුරු ඉඩම්වලිනි. එමෙන්ම ඒවා වැඩි අස්වනු ලබාදෙන කුඹුරු වන අතර, වාණිජ මට්ටමේ ගොවීන් විසින් සිදුකරන වී වගාවයි.

මේවායේ සාමාන්‍ය අස්වැන්න එක් එක් ප්‍රභේදය අනුව පහත පරිදි වන අතර වර්තමාන යෙදවුම් මිල අනුව අක්කරයක් වගා කිරීමට වැය කර ඇති මුදල සහ ඒ අනුව ප්‍රමිතිගත වී කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය ද දක්වා ඇත. ඒ අනුව රතු නාඩු, සුදු නාඩු, සම්බා සහ කීරි සම්බා වී කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය සඳහා පිළිවෙළින් රුපියල් 76, රුපියල් 87, රුපියල් 97 සහ රුපියල් 109 ලෙස වැය වී ඇත. රජයේ ප්‍රකාශිත අවම වී මිලදී ගැනීමේ මිල පිළිවෙළින් රුපියල් 120ක්, රුපියල් 120ක්, රුපියල් 130ක් සහ රුපියල් 140ක් වන බැවින් වී කිලෝග්‍රෑම් එකකින් ගොවියාට පිළිවෙළින් රුපියල් 44ක්, රුපියල් 33ක්, රුපියල් 33ක් සහ රුපියල් 31ක් බැගින් ලාභයක් ලැබෙන අතර අක්කරයක් වගා කිරීමෙන් පිළිවෙළින් රුපියල් 101,860ක්, රුපියල් 66,528ක්, රුපියල් 58,707ක් සහ රුපියල් 49,259ක් ලෙස ලාභයක් ලැබේ.

	රතු නාඩු	සුදු නාඩු	සම්බා	කීරි සම්බා
අක්කරයක වගා වියදම (රුපියල්)	175,943	175,406	172,658	173,264
ලැබෙන අස්වැන්න (අක්කරයට කිලෝ ග්‍රෑම්)	2,315	2,016	1,779	1,589
සියයට 14 තෙතමනය වී කිලෝ ග්‍රෑම් 1 ක නිෂ්පාදන පිරිවැය	76	87	97	109
රජයේ අවම වී මිලදී ගැනීමේ මිල (රුපියල්)	120	120	130	140

	රතු නාඩු	සුදු නාඩු	සම්බා	කීරි සම්බා
වී කිලෝ ග්‍රෑම් 1ට ලාභය (රුපියල්)	44	33	33	31
අක්කරයකට ලාභය (රුපියල්)	101,860	66,528	58,707	49,259

ඉහත මිල ගණන්වලට මිලදී ගනු ලබන වී සහල් බවට පත් කිරීමේදී සහල් කිලෝග්‍රෑම් 1ක් සඳහා වී කිලෝග්‍රෑම් 1.55ක් වැය වන අතර, ඒ අනුව සහල් කිලෝග්‍රෑම් 1ක් නිෂ්පාදනයේදී වැය වන වීවල මිල, සැකසුම් වියදම්, ඇසුරුම් කිරීමේ වියදම්, ප්‍රවාහනය, බෑම සහ පැටවීම, වී මෝල් හිමියාගේ ලාභය, තොග වෙළෙන්දාගේ ලාභය, සිල්ලර වෙළෙන්දාගේ ලාභය ආදිය එකතු කර අවසන් පාරිභෝගිකයාට අලෙවි කිරීමේ රජයේ සහල් පාලන මිල ගණනය කර ඇත. මෙම මිල ගණන් වී සැකසීමට සාධාරණව වැය වන ගාස්තු සලකා බලා ජාතික පසු අස්වනු තාක්ෂණ කළමනාකරණ ආයතනය - NIPHM - විසින් ඉදිරිපත් කර ඇත.

ප්‍රශ්න අංක 4 සහ 5 සඳහා පිළිතුරු මා **සභාගත*** කරනවා.

6.

වර්ෂය	ආනයනය කළ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්)	ඒ සඳහා වැය කළ මුදල රුපියල් (මිලියන)
2025	168,682.9	26,281.3
2026 ජුනි දක්වා	159,000.1	26,799.7

පසුගිය කාල සීමාව තුළ දේශීය වෙළෙඳ පොළේ සම්බා සහ කීරි සම්බා සහල්වල හිඟතාවක් මෙන්ම එම සහල් වර්ගවල මිල අසාමාන්‍ය ලෙස ඉහළ යාමක් දක්නට ලැබුණි. මෙම තත්ත්වය පාලනය කිරීමේ අරමුණින් ආහාර සුරක්ෂිතතා හා ප්‍රතිපත්ති කමිටුවේ තීරණ අනුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව නිශ්චිත කාල සීමාවක් සඳහා ආනයන සීමා ලිහිල් කර සහල් ආනයනය කිරීමට අවසර ලබා දෙන ලදී.

ඒ අනුව දේශීය සම්බා සහල් සඳහා ආදේශකයක් ලෙස පොන්නි සම්බා සහල් ද, කීරි සම්බා සහල් සඳහා ආදේශකයක් ලෙස කීරි/පාල් පොන්නි සහල් ද ආනයනය කරන ලදී.

මෙම ආනයන හේතුවෙන් දේශීය වෙළෙඳ පොළ තුළ සම්බා හා කීරි සම්බා සඳහා වන ආදේශක සහල් සැපයුම ප්‍රමාණවත් ලෙස පවත්වා ගැනීමට හැකි වූ අතර, පාරිභෝගිකයන්ට උපරිම සිල්ලර මිලට යටත්ව සහල් මිල දී ගැනීමේ අවස්ථාව උදා විය. එමෙන්ම, දේශීය වෙළෙඳ පොළ තුළ සහල් මිල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට ද මෙම ක්‍රියාමාර්ගය දායක වී ඇත.

7. ඉහත ප්‍රශ්නයෙන් විමසා ඇති, අපේක්ෂිත අරමුණු අන්තර්ගත වන වර්තමානයේ වී වගා ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක ප්‍රධාන වැඩසටහන වනුයේ වී නිෂ්පාදන යාය වැඩසටහනයි.

**** පිළිතුර අවසානයේ පළ කර ඇත.***
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

වී වගාවේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා 2025/2026 මහ කන්නයේ යාය 500කින් ආරම්භ කර ඇති අතර, 2030 වන විට ඉලක්කය යාය 5,000කි. මේ යටතේ නිෂ්පාදන වියදම අවම කිරීම සඳහා පහත සඳහන් කරුණු යටතේ වී වගාව සඳහා තාක්ෂණික පැකේජයක් හඳුන්වා දී ඇත.

- සහතික කළ බිත්තර වී ලබා දීම
- යාන්ත්‍රීකරණය
- නවීන තාක්ෂණික ක්‍රම භාවිතය (උදාහරණ: වී වැපිරීම, වල්නාශක යෙදීම සඳහා ඩ්‍රෝන භාවිතය)
- ජල කළමනාකරණය සඳහා ඒකාන්තර තෙත් හා වියළි ක්‍රමය - AWD - යොදා ගැනීම
- පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා පස් පරීක්ෂාව, Leaf Colour Chart භාවිතයෙන් පොහොර යෙදීම

    එමඟින් ඉහළ වී අස්වැන්නක් ලබා ගත හැකි සියලු වී වගා ප්‍රදේශ ආවරණය වන පරිදි වී නිෂ්පාදන යාය සමිති පිහිටුවා, ඒ ඔස්සේ නව තාක්ෂණය, යාන්ත්‍රීකරණය හා ගුණාත්මක බිත්තර වී භාවිතය ඇතුළු සියලු අරමුණු වෙනුවෙන් ගොවීන් හුරු කිරීම, පෙළඹවීම හා පහසුකම් සැලසීම සිදු කරනු ලැබේ.

අදාළ වී නිෂ්පාදන සමිති මඟින් පහත කාර්යයන් ඉටු කරනු ලැබේ.

- ගැඹුරට සී සෑම

    අඟල් 9ක් හාන්න - පොළොව කඩන්න - ඕනෑ කියලා තමයි පැකේජයේ තිබෙන්නේ. රොටරියෙන් හාලා හරියන්නේ නැහැ කියන එකයි කියන්නේ.

- ගුණාත්මක බිත්තර වී භාවිතය
- ඒකාබද්ධ පළිබෝධ පාලනය
- ඒකාබද්ධ පාංශු පෝෂක කළමනාකරණය
- පසු අස්වනු තාක්ෂණය භාවිතය මෙම කාර්යයන් වී නිෂ්පාදන යාය සමිති හරහා මෙහෙයවීම සඳහා යාය මට්ටමින් හඳුනා ගත් ස්වේච්ඡා කෘෂිකර්ම පහසු කාරකයින් පත් කර පුහුණුවක් ලබා දී සවිබලගන්වා ඇත. එම වැඩසටහනද තවදුරටත් ක්‍රියාත්මකවේ. \

    මෙම නිෂ්පාදන යාය වැඩසටහන තුළින් ජාතික වී නිෂ්පාදනය හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 4.5 සිට වසර 5ක් තුළ හෙක්ටෙයාරයකට මෙට්‍රික් ටොන් 6ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂිතයි.

සභාමේසය මත තබන ලද ප්‍රශ්න අංක 4 සහ 5 සඳහා පිළිතුරු:

** சபாபீடத்தில் வைக்கப்பட்ட வினா இல. 4 மற்றும் 5க்கான விடை:*

** Answers tabled for Question Nos. 4 and 5:*

4. 2026 යල කන්නයේ වී අලෙවි මණ්ඩලය විසින් වී මිලදී ගැනීමට අපේක්ෂා කරන වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 48,500කි. එය සමස්ත වී අස්වැන්නෙන් ආසන්න වශයෙන් සියයට 2කි.

    ඉතිරි වී සඳහා සාධාරණ වෙළඳපොළක් සහතික කිරීම වෙනුවෙන් වී අලෙවි මණ්ඩලය මඟින් වී මිලදී ගැනීමට අමතරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කෙරෙන ඔඩපණ ණය යෝජනා ක්‍රමය යටතේ 2026 යල කන්නයේ රජය මඟින් රුපියල් මිලියන 10,000ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් පත් කර ඇති මිල කමිටුව මඟින් නිර්දේශිත තෙත වී කිලෝග්‍රෑම් 1ක අවම මිලදී ගැනීමේ මිල රුපියල් 102 බැගින් මෙට්‍රික් ටොන් 98,039 තෙත වී සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හරහා මිලදී ගැනීමට අපේක්ෂිත ය. ඒ අනුව රටේ සමස්ත අස්වැන්නෙන් රජය මැදිහත් වීමෙන් මිලදී ගැනීමට අපේක්ෂිත මුළු වී තොග ප්‍රමාණය මෙට්‍රික් ටොන් 146,539කි. (ප්‍රතිශතයක් ලෙස සියයට 6.6කි).

5. වී තොග අලෙවි කිරීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. එම ක්‍රියාවලිය අවසන් වී නොමැති බැවින් අපේක්ෂිත මූල්‍ය බලපෑම මේ අවස්ථාවේදී ප්‍රකාශ කිරීම දුෂ්කර වේ. නව අස්වැන්න මිලදී ගැනීම සඳහා ගබඩා 143ක් සූදානම් කර ඇති අතර මෙට්‍රික් ටොන් 119,033ක ධාරිතාවකින් යුක්ත වේ. ඒ සඳහා රුපියල් මිලියන 6,000ක මුදලක් වෙන් කර ඇත. ඊට අමතරව පෞද්ගලික ගබඩා කිහිපයක් වී මිලදී ගැනීම සඳහා යොදා ගැනීමට කටයුතු කර ඇත. ඊට අමතරව පෞද්ගලික ගබඩා සොයා ගත නොහැකි තැන්වල ජංගම ලොරි රථ යොදා වී මිලදී ගැනීමට අපේක්ෂා කෙරේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, බොහොම දීර්ඝ, සවිස්තර පිළිතුරක් ලබා දීම ගැන. මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මේ ප්‍රශ්නයට වෙනත් දවසකට පිළිතුරු දෙන්න කියලා ඊයේ මා ඉල්ලීමක් කළේ, ඊයේ කාල වේලාව හුඟක් ගත වෙලා තිබුණු නිසා.

සමහර මාධ්‍ය ඒක වෙනත් විදියකට හුවා දක්වන්න පාවිච්චි කර තිබෙනවා. ඒ ගැන මම කනගාටු වෙනවා. ගරු ඇමතිතුමනි, කෙසේ වෙතත් ඔබතුමා බොහොම දීර්ඝ විස්තරයක් ලබා දුන්නා. මට පැහැදිලි කිරීම් රාශියක් කරවාගන්න තිබෙනවා. හැබැයි ඉතින් එක අවස්ථාවයි තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඔබතුමා කැමැති නම් මට තවත් අවස්ථාවක් දෙන්න. ඒක ඔබතුමාගේ අභිමතය.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා ගොවියාට වී වර්ග සඳහා වෙන් වෙන් වශයෙන් රුපියල් 44ක ලාභයක්, රුපියල් 33ක ලාභයක් සහ රුපියල් 31ක ලාභයක් තිබෙනවා කියලා. හැබැයි, මම බොහොම ගෞරවයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, 2026 ජූනි 24වන දා හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1042හි සඳහන් කාරණයට. එදා ඔබතුමා මෙසේ සඳහන් කරනවා:

> "අපි මාස් කන්නයේ නාඩු ගත්තේ රුපියල් 120ට. සම්බා ගත්තේ රුපියල් 130ට. කීරි සම්බා ගත්තේ රුපියල් 140ට. යල කන්නයේ පිරිවැය වැඩි වෙලා තිබෙනවා. ඒක ඇත්ත. ඒ, කරුණු දෙකක් නිසා. එයින් එක කරුණක් තමයි ගොයම් කපන්න යන වියදම වැඩි වෙලා තිබීම. ඒ කියන්නේ තෙල් මිල වැඩි වීම නිසා කුඹුරු හාන්න ගිය වියදම වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා රුපියල් 137ක් වාගේ මුදලකට මිලදී ගැනීම සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය මේ වෙනකොට ගණන් හදා තිබෙනවා."

මා ඒ කියවූයේ, හැන්සාඩ් වාර්තාවේ සඳහන් වන, ඔබතුමාම කරපු ප්‍රකාශයක්. මට තිබෙන ගැටලුව මේකයි. ඔබතුමාගේම වචනවලින් එදා කියා තිබෙනවා, වී කිලෝවක් නිෂ්පාදනය කරන්නට රුපියල් 137ක් වැය වෙනවා කියලා. අද ඔබතුමා කියනවා, එක්තරා වී වර්ගයකින් රුපියල් 44ක ලාභයක් තිබෙනවා, තවත් වී වර්ගයකින් රුපියල් 33ක ලාභයක් තිබෙනවා, තවත් වී වර්ගයකින් රුපියල් 31ක ලාභයක් තිබෙනවා කියලා. හැබැයි, ඔබතුමන්ලා ලබා දෙන සහතික මිලත් එක්ක සංසන්දනය කළාම, ඇත්ත වශයෙන්ම ඔබතුමා කියපු මේ ලාභය සම්බන්ධ

ගණන්වල බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. මේ වීවලට ලබා දෙන සහතික මිල ගණනය කිරීමේදී ඇත්ත වශයෙන්ම බරපතළ දෝෂයක් තිබෙනවා. මම ඒක අඩුපාඩුවක් හැටියට පෙන්වා දී තිබෙනවා. ඒ වාගේම අපි යෝජනා කරනවා, ඊළඟ කන්නයේ ඉඳලා ඒක නිවැරැදි කර ගන්න පුළුවන් හොඳ, ප්‍රබුද්ධ මිල සූත්‍රයකට යන ක්‍රමවේදයක් සකස් කරන්න කියලා. ඒ අඩුපාඩුව පෙන්වා දීලා මම ඒක විවේචනය කරනවා. හැබැයි, එම විවේචනය වාගේම මම යෝජනාවකුත් කරනවා. මොකද, මේ සූත්‍රය සකස් කිරීමේදී බරපතළ දෝෂයක් අනිවාර්යයෙන්ම සිදු වෙලා තිබෙනවා. එම දෝෂය මම පෙන්වා දුන්නා, 2026 ජූනි 24වන දින හැන්සාඩ් වාර්තාවේ පළ වූ ඔබතුමාගේම ප්‍රකාශයක් තුළින්. එකක්, ඒක නිවැරැදි කර ගැනීම. මොකද, ඇත්ත වශයෙන්ම ගොවි ජනතාව කියන ආකාරයට ඔබතුමා කියන ඔය ලාභය ඒ අයට ලැබෙන්නේ නැහැ.

කථා කරන, කථා කරන හැම ගොවියෙක්ම කියන්නේ මේ සහතික මිල හරහා ඒ අයට බරපතළ පාඩුවක්, අලාභයක් සිදු වෙනවාය කියන කාරණාව. අපි ඇත්ත කථා කරමුකෝ. ඕනෑම ආණ්ඩුවක් මුළු අස්වැන්නෙන් මිලදී ගන්නේ සියයට 6යි, සියයට 7යි, සියයට 8යි, ඕනෑ නම් උපරිම සියයට 9යි. ගොවීන් නිෂ්පාදනය කරන වීවලින් යම් ප්‍රමාණයක් පෞද්ගලික පරිභෝජනය සඳහා තියා ගන්නවා. එතකොට ඉතිරිය සියයට 90ක් කියලා කියමුකෝ. ඉතිරි සියයට 90 මිලදී ගැනීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන් ශක්තිමත් කරන්න ඕනෑ. ඔබතුමා දැන ගන්න ඕනෑ, මේ මොහොත වන විට ඒ අයට pledge loans දෙන්නේ නැහැ කියලා. සහන ක්‍රමයකට loan එකක් දෙනවා ඇති. නමුත්, ඒක ගන්න බැහැ. මොකද, ඒ හැමෝම blacklist කරලා. හැමෝම කියන්නේ අතිමහත් බහුතරයක්. සුළුතරයක් නැති වෙන්න පුළුවන්. නමුත් අතිමහත් බහුතරයක් blacklist කරලා, අසාදු ලේඛනගත කරලා. ඒ නිසා කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන්ගේ ණය ප්‍රතිව්‍යුහගත කරලා, අසාදු ලේඛනවලින් ඉවත් කරලා pledge loans ලබා දෙන්න පුළුවන් නම් ඇත්ත වශයෙන්ම හොඳ මිලකට, ඉහළ සහතික මිලකට ගොවියාට වී ටික විකුණා ගන්නට අවස්ථාව සැලසෙනවා. ආරම්භයේදී මම ඔබතුමාට මෙන්න මේ කරුණු දෙක බොහොම,- *[බාධා කිරීමක්]* සතුටක් තමයි. බොහොම ස්තුතියි, ඔබතුමා සතුටුයි කියන එකට. අවංකව මම මේ කරුණු ඉදිරිපත් කරන්නේ. මොකද, අනිවාර්යයෙන්ම ගොවියා වෙනුවෙන් අපි කථා කරනවා, කෑගහනවා, විවේචනය කරනවා. හැබැයි, ඒ වාගේම විසඳුමක් තිබෙන්නටත් ඕනෑ. කවුරු ආණ්ඩුවේ හිටියත් විසඳුමක් තිබෙන්නට ඕනෑ. හැබැයි, මේ මිල සූත්‍රය අනුව වී මිල ගණනය කිරීම දෝෂ සහිතයි, ගරු ඇමතිතුමා. ඒ නිසා ඒකට වැඩ පිළිවෙළක් යොදන්න. කරුණාකරලා කුඩා හා මධ්‍ය පරිමාණයේ මෝල් හිමියන් අසාදු ලේඛනයෙන් එළියට අරගෙන, ණය ප්‍රතිව්‍යුහගත කරලා හරි pledge loans ලබා දුන්නාම, ඒගොල්ලෝ සාධාරණ සහතික මිලකට වී මිලදී ගනියි. ඒ කියන්නේ ඔබතුමා කියන රුපියල් 120ට, 130ට නොවෙයි. සාධාරණ සහතික මිලකට වී මිලදී ගැනීමේ ක්‍රමයක් සකස් කරන්න පුළුවන්. මම ඔබතුමාට කියනවා සද්භාවයෙන් ඒ යෝජනාව පිළිගන්න කියලා.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ඔබතුමා මේ කරුණු සියල්ල ඉදිරිපත් කළේ සද්භාවයෙන් බව මම පිළිගන්නවා. ඒවාට බොහොම ස්තුතියි. මොකද, ඔබතුමා අපේ විපක්ෂ නායකයා. මේ ගැන කාරණා කිහිපයක් කිව්වොත්, ඇත්තටම ගොවීන්ට දැනට තිබෙන ප්‍රධානම ගැටලුව තමයි, නිෂ්පාදනයේ ප්‍රමාණය පහළ නිසා ඒගොල්ලන්ගේ පිරිවැය ඉහළ යන එක.

නිෂ්පාදනයේ ප්‍රමාණය වැඩි කිරීමෙන් තමයි එක පැත්තකින් ගොවියාට සාධාරණය ඉෂ්ට කර ගන්න අපට පුළුවන් වෙන්නේ. අක්කරයකින් බුසල් 120ක් වාගේ අරගෙන දැන් ලාභ ගන්න බැහැ. ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා අපි ඒක ඊට වඩා වැඩි තැනකටවත් ගෙන යන්න ඕනෑ. එතකොට තමයි වී වගාව ලාභදායක වගාවක් බවට පත් කර ගන්න පුළුවන් වෙන්නේ. ඒ, එක පැත්තක්. මම ඉදිරිපත් කරපු අපේ "යාය" වැඩසටහනෙන් බලාපොරොත්තු වෙන්නේ ඒක. එකක් අස්වැන්න ඉහළ දමා ගන්න එක. අනෙක් එක පිරිවැය අඩු කරන එක. දැන් අපි පොහොර සහනාධාරය වුණත් මෙපමණ ප්‍රමාණයක් - හෙක්ටයාරයකට රුපියල් 30,000ක් - දෙන්නේ, ඇත්තටම පිරිවැය අඩු කිරීමේ පැත්ත ගැන බලලා. ඒ ගැන ඔබතුමාට අදහසක් තිබෙනවා. අපි සාකච්ඡා කරමින් ඉන්නවා, පිරිවැය අඩු කිරීම සඳහා ගොවීන්ට දිය හැකි තවත් සහන එළැඹෙන අය වැයට ඇතුළත් කිරීම වෙනුවෙන්. මේ දිනවල අපි ඒ ගැන සාකච්ඡා කරමින් තිබෙනවා. ඒක එක කාරණයක්. ඒකෙන් තමයි මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වෙන්නේ. නමුත් ගොවීන්ගේ නිෂ්පාදන මිලදී ගැනීමේ කාරණයේදී ඇත්තටම බරපතළ ගැටලු තිබෙනවා. අපි දැන් රුපියල් 120යි, 130යි, 140යි කිව්වාට, අපි ළඟට ගෙනැල්ලා දෙන්නත් ඕනෑ ප්‍රමිතිගත වී. ඒ වාගේම දැනට අපි අරගෙන තිබෙන්නේ වීවලින් සියයට 3ක් විතර. ඔබතුමා කිව්වා වාගේ ඉතිහාසයේ යම් කාලවල සියයට 9ක්, 10ක් වාගේ අරගෙන තිබෙනවා. අපි, වී අලෙවි මණ්ඩලය තවම සියයට 3-4 අතර ඉන්නේ. මේ වෙනකොට මෙට්‍රික් ටොන් 20,000-30,000 අතර තිබෙන්නේ. වී ගනිමින් ඉන්න නිසා මම මේ පරාසයක් කිව්වේ. ඒ අතර තමයි තිබෙන්නේ. අපි මේ කන්නයේ වී ගන්න පටන් ගන්නකොට මෙට්‍රික් ටොන් 20,000කට ටිකක් අඩු වෙලා තිබුණා. මොකද, සතොස මඟින් කොටලා, ගබඩා හිස් කරලා, සතොස හරහා අළෙවි කරන ක්‍රියාවලියකුත් යන නිසා.

ඔබතුමා කියපු ණය ප්‍රශ්නය ඇත්ත. ණය අරගෙන නොගෙවා තිබීම නිසා සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ මෝල් හිමියන් blacklist වෙලා තිබෙනවා. ඒකත් කාලයක් තිස්සේ අපේ රටේ තිබෙන, හැම ආණ්ඩුවක්ම මුහුණ දීපු ප්‍රශ්නයක්. ඒගොල්ලත් දැන් ඒක ක්‍රමයක්, පුරුද්දක් බවට පත් කරගෙන තිබෙනවා. දැන් ඒක සංස්කෘතියක් වෙලා තිබෙනවා. ණය අරගෙන ගෙවන්නේ නැහැ. ඊළඟ ආණ්ඩුවට සිද්ධ වෙනවා, ඒවා පැත්තකට දමලා ආපසු ණය දෙන්න. ඒ නිසා ඒ පිළිබඳවත් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සමඟ අපි කථා කළා; වී මිලදී ගන්න වෙළෙන්දන් එක්කත් කථා කළා. ඒගොල්ලන් ඔබතුමාගේ යෝජනාව තමයි ඉදිරිපත් කළේ.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව,-

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

හරි. ඒගොල්ලෝත් ඔය යෝජනාවම තමයි කරන්නේ. ඇත්තටම අපි මේ වෙනකොට සාකච්ඡා කරමින් තිබෙනවා, ඒක කරන්න පුළුවන්ද කියලා. බොහෝ දුරට, දැනට අපට ලැබෙමින් තිබෙන උත්තරය තමයි ඒක කරන්න බැහැ කියන එක. එතකොට හැබැයි මිලදී ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් එනවා. ඒකෙන් තමයි ගොවීන්ගේ හඬ අවදි වෙලා තිබෙන්නේ. ඇත්තටම මේ ප්‍රශ්නය තවම අවසන් කරලා නැහැ, හරිම උත්තරයට ඇවිල්ලා. නමුත් අපි දැන් තිබුණු නරක තැනින් අයින් වෙලා, වී අලෙවි මණ්ඩලයත් ආරම්භ කරලා, මිලදී ගැනීමත් ආරම්භ කරලා මේ ප්‍රශ්නයට උත්තර හොයන්න පොර බදමින් ඉන්නේ. ඉතින් මේක අතරමැදි

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

කාලයක් නිසා ඒ කාලය තුළ ඔය උද්ඝෝෂණ පැන නඟින එක සාධාරණයි. ඒකේ වැරැද්දක් නැහැ. ගොවීන්ට ප්‍රශ්න, ගැටලු ගොඩක් තිබෙනවා. ඒක අපි පිළිගන්නවා. දේශපාලන හේතු මතත් සමහරු ඒවා කරනවා. එහෙම කරන්න පුළුවන් වෙන්නේත් ප්‍රශ්නයක් තිබෙන නිසා නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ.

ඊළඟ කාරණය, මම පාර්ලිමේන්තුවේදී කියපු, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය පිළිබඳ කාරණය. ඒ වෙනකොට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයෙන් එහෙම එකක් ඇවිල්ලා තිබුණා. මම ඒක පොඩ්ඩක් වනලා තමයි කියනකොටත් කිව්වේ. මේ සභාවට වුණත් කිව්වේ එහෙම. නමුත් වී මිල තීරණය කරන්නේ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනය නොවෙයි. මම එවැනි ආයතන ගොඩක් කිව්වා. ඒ ආයතන සියල්ල එකතු වෙලා, සියලු දත්ත සලකා බලා තමයි ඒක ප්‍රකාශ කරන්නේ. හැබැයි, අපේ රටේ දත්ත පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒකත් ඇත්ත. ඒවාටත් අපි දැන් ක්‍රම හොයාගෙන වැඩ කරමින් යනවා. ඔබතුමාම දන්නවා, සියයට 40ක් කෘෂිකර්ම නිලධාරින් නැහැ. දැන් අපි ඒ අය බඳවා ගනිමින් ඉන්නවා. කෘපනිස නිලධාරින් හරහා තමයි අපට ගොඩක් දත්ත එන්නේ. එක කෘපනිස මහත්මයෙක් එයාගේ වසමට අමතරව තවත් 10ක් විතර බලනවා. එතකොට ඒගොල්ලන්ට ඒක හරියට කර ගන්නත් අමාරුයි. ඒ වාගේ දෝෂසහිත තත්ත්ව තවම තිබෙනවා. ඒවා නිවැරදි කිරීමට අදාළව ඇත්තටම වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරමින් තිබෙන්නේ. මම හිතනවා මේ උත්තරය ප්‍රමාණවත් කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා. ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි,-

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමා,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
විනාඩි 25ක් ඔබතුමා ගත්තා, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
11.30 වෙනකල් කාලය තිබෙනවා නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
11.30 වෙනකල් කියලා එකක් නැහැ. ඕනෑම දෙයකට වෙලාවක් තිබෙනවා නේ, ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමා වෙනම ඇමතිතුමා මුණගැහිලා කථා කරන්න.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාවඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය, විවාදය කල් තබන ලද ප්‍රශ්නය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය: විගණකාධිපතිගේ වැටුප
அரசியலமைப்பின் கீழான தீர்மானம்: கணக்காய்வாளர் தலைமையதிபதியின் சம்பளம்
DETERMINATION UNDER THE CONSTITUTION: SALARY OF AUDITOR-GENERAL

කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.
ඊට අදාළ ප්‍රශ්නය - [අගෝස්තු 04]
ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.
சம்பந்தப்பட்ட வினா - [ஓகஸ்ட் 04]
Order read for resuming Adjourned Debate on Question - [04th August]

> "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) සහ 41ඇ(1) ව්‍යවස්ථා ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය අනුව, 2026.02.05 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එල්.එස්.අයි. ජයරත්න මහත්මිය විගණකාධිපති වශයෙන් පත් කර ඇති හෙයින්ද;
>
> ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ කාර්යය හා කර්තව්‍යයන් නිශ්චය කර ඇති අතර, වැටුප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන හෙයින්ද;
>
> ජනාධිපතිවරයා විසින් 2026.06.20 වැනි දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව අංක අමප/26/1258/801/020 හා 2026.07.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විගණකාධිපති, එල්.එස්.අයි. ජයරත්න මහත්මියට පහත පරිදි වැටුප් ගෙවීමට අනුමැතිය ලබා දී ඇති හෙයින්ද:-

(ඈ) විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය එම තනතුරට පත් කළ 2026.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව SL-4 වැටුප් කේතයේ (175,000-12x5,300-238,600) 5 වන වැටුප් පියවරෙහි පිහිටුවා, ඒ අනුව එම චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 196,200/-ක වැටුප් පියවරට අනුරූපීව උපලේඛන III ට අනුව රු. 170,528/- වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවීමට; සහ

(ආ) එම වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට සහ උක්ත චක්‍රලේඛයේ කලින් කල සිදු කරනු ලබන සංශෝධනයන්ට යටත්ව වැටුප පරිවර්තනය කිරීමට.

ඊට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපති එල්.එස්.අයි. ජයරත්න මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් පරිදි මාසික වැටුප් ගෙවීම කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී." - [ගරු බිමල් රත්නායක මහතා]

"இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் அரசிய லமைப்பின் 153(1) மற்றும் 41இ(1)ஆம் உறுப்புரைகளின் பிரகாரம், அரசியலமைப்புப் பேரவையின் அங்கீகாரத்துக்கமைய, 2026.02.05ஆம் திகதியிலிருந்து செயல்வலுப் பெறும் வகையில் திருமதி எல்.எஸ்.ஐ. ஜயரத்ன அவர்கள் கணக்காய்வாளர் தலைமையதிபதியாக நியமிக்கப் பட்டுள்ளதாதலாலும்;

அரசியலமைப்பின் 154ஆம் உறுப்புரையின் பிரகாரம் கணக்காய்வாளர் தலைமையதிபதியின் பணிகளும் கடமை களும் நிர்ணயிக்கப்பட்டுள்ளதுடன், சம்பளம் அரசியல மைப்பின் 153(2) உறுப்புரையின் பிரகாரம், பாராளு மன்றத்தால் தீர்மானிக்கப்பட்டு அரசாங்க திரட்டு நிதியத்தில் பொறுப்பிக்கப்பட வேண்டியுள்ள தாதலாலும்;

சனாதிபதியவர்களால் சமர்ப்பிக்கப்பட்ட 2026.06.20ஆம் திகதிய அமைச்சரவை விஞ்ஞாபனத்துக்கான அமப/26/1258/801/020ஆம் இலக்க மற்றும் 2026.07.06ஆம் திகதிய அமைச்சரவை தீர்மானத்துக்கமைய, கணக்காய்வாளர் தலைமையதிபதி, திருமதி எல்.எஸ்.ஐ. ஜயரத்ன அவர்களுக்கு பின்வருமாறு சம்பளத்தைச் செலுத்துவதற்கு அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதாதலாலும்:-

(அ) கணக்காய்வாளர் தலைமையதிபதி, திருமதி எல்.எஸ்.ஐ. ஜயரத்ன அவர்களை குறித்த பதவிக்கு நியமித்த 2026.02.05ஆம் திகதி முதல் அமுலுக்கு வரும் வகையில், அரசாங்க நிருவாக சுற்றறிக்கை இலக்கம் 10/2025இன் பிரகாரம், SL-4 சம்பள அளவுத்திட்டத்தின் (175,000-12x5,300 -238,600) 5ஆவது சம்பளப் படிநிலையில் நிறுவி, அதற்கமைய குறித்த சுற்றறிக்கையின் அட்டவணை IIக்கு அமைவாக ரூபா 196,200 அளவான சம்பளப் படிநிலைக்கு ஒத்ததாக, அட்டவணை IIIக்கு அமைவாக ரூபா 170,528 சம்பளப் படிநிலையில் நிறுவி சம்பளத்தைச் செலுத்து வதற்கும்;

(ஆ) அச்சம்பள அளவுத்திட்டத்தில் குறிப்பிடப்பட்டுள்ளவாறு வருடாந்த சம்பள ஏற்றங்களைச் செலுத்துவதற்கும், மேற் குறித்த சுற்றறிக்கையில் அவ்வப்போது மேற்கொள்ளப்படும் திருத்தங்களுக்கு உட்பட்டு சம்பள மாற்றத்தை மேற்கொள்வதற்கும்.

அதற்கேற்ப, இலங்கை சனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பின் 153(2) உறுப்புரையின் பிரகாரம், கணக்காய் வாளர் தலைமையதிபதி, திருமதி எல்.எஸ்.ஐ. ஜயரத்ன அவர்களுக்கு அரசாங்கத் திரட்டு நிதியத்தில் பொறுப்பிக்கப் படுமாறு மேலே குறிப்பிடப்பட்ட மாதாந்தச் சம்பளம் செலுத்தப்பட வேண்டுமென இப்பாராளுமன்றம் தீர்மானிக்கின்றது" எனப் பிரேரணை கொண்டுவரப்பட்டு எடுத்தியம்பப்பெற்றது." [மாண்புமிகு பிமல் ரத்நாயக்க]

"Whereas Mrs. L. S. I. Jayarathna has been appointed as the Auditor-General with effect from 05.02.2026, as per the approval of the Constitutional Council in terms of Articles 153(1) and 41C(1) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka;

And whereas the duties and functions of the Auditor-General have been determined in terms of Article 154 of the Constitution, and the salary shall be determined by Parliament and shall be charged on the Consolidated Fund of the Government in terms of the Article 153(2) of the Constitution;

And whereas the approval of the Cabinet of Ministers has been granted, according to the Cabinet Decision No. අමප/26/1258/801/020 and dated 06.07.2026 pursuant to the Cabinet Memorandum of 20.06.2026 submitted by the President to pay salaries to Mrs. L. S. I. Jayarathna, Auditor-General as follows:-

(a) To place Auditor-General, Mrs. L. S. I. Jayarathna, on the 5th salary step of the SL-4 salary scale (175,000 - 12x5,300 - 238,600) in accordance with the Public Administration Circular No. 10/2025 with effect from the date of her appointment on 05.02.2026, and accordingly to pay the salary placing at the salary step of Rs. 170,528/- in terms of Schedule III compatible to the salary step of Rs. 196,200/- under Schedule II of the said circular; and

(b) To pay annual salary increments as indicated in the said salary scale and make salary conversion subject to the amendments made from time to time in the above circular.

Accordingly, that this Parliament determines that Mrs. L. S. I. Jayarathna, Auditor-General be paid the aforesaid monthly salary to be charged on the Consolidated Fund of the Government in terms of Article 153(2) of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka." - [The Hon. Bimal Rathnayake.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.
வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.
Question again proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සඳහා සභාවේ එකඟත්වය?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ අනුව, අද දිනය න්‍යාය පත්‍රයේ විෂය අංක 1 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුයි"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. You have five minutes.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, අපට දැනගන්නට ලැබී තිබෙන පරිදි, දන්වා තිබෙන පරිදි මේ කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට නියමිතව තිබෙන්නේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා. ඒක වෙනස් වුණාද, කොහොමද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාගේ පියාගේ අභාවය නිසා ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාට එය ඉදිරිපත් කරන ලෙස එතුමා ලිපියකින් දන්වා තිබෙනවාලු.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඔබඔබතුමාට ලිපියකින් ලබා දීලා තිබෙනවා නම් හරි. මොකද, අපට ස්ථාවර නියෝග 40(1) සහ 40(2) අනුව කටයුතු කරන්න වෙනවා. අපි දන්නවා හර්ෂ ද සිල්වා මැතිතුමාට අද දින විශේෂ හේතුවක් නිසා පැමිණීමට නොහැකි බව. මෙම කල් තැබීමේ යෝජනාව පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් මෙය ඉදිරිපත් කිරීම ස්ථාවර නියෝග අනුව විය යුතු නිසා තමයි මම ඒ ප්‍රශ්නය මතු කළේ.

ඕස්ට්‍රේලියාව වෙත එ.ජ. ඩොලර් මිලියන 2.5ක ණය පියවීමේ ගනුදෙනුවේදී සිදුවූ සයිබර් අපරාධය ආශ්‍රිත වංචාව සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

அவுஸ்திரேலியாவிற்கான 2.5 மில்லியன் அமெரிக்க டொலர் கடன் திருப்பிச் செலுத்தலில் இடம்பெற்ற இணையக் குற்றத்துடன் தொடர்புடைய மோசடி தொடர்பிலான அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

REPORT OF COMMITTEE ON PUBLIC FINANCE, CONCERNING THE FRAUD LINKED TO CYBERCRIME IN RELATION TO US DOLLARS 2.5 MILLION DEBT REPAYMENT TO AUSTRALIA

[පූ.භා. 11.05]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ඕස්ට්‍රේලියාව වෙත එක්සත් ජනපද ඩොලර් මිලියන 2.5ක ණය පියවීමේ ගනුදෙනුවේදී සිදු වූ සයිබර් අපරාධය ආශ්‍රිත වංචාව සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාවේ සඳහන් වන හෙළිදරවු කිරීම් සහ නිර්දේශ අනුව මෙම සිදුවීම තුළ බරපතළ මූල්‍ය අපරාධයක් සිදු වී ඇති බව පැහැදිලි වේ.
>
> එම කාරක සභාවේ විමර්ශනය තුළින් අනාවරණය කර ගන්නා ලද කරුණු අනුව මුදල් අමාත්‍යාංශය, ඒ යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හා ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතනවල වගකීම සහ වගවීම පිළිබඳව වහාම අවධානය යොමුකොට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
>
> එම කාරක සහා වාර්තාවේ නිගමන ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුවේ මග පෙන්වීම හා තීරණ අතිශයින්ම වැදගත් වේ. එසේම, වාර්තාවේ නිගමන මත පදනම්ව සුදුසු විමර්ශන සහ නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගරු කථානායකතුමාට කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කරලීම සඳහා අවශ්‍ය සහාය රාජ්‍ය මූල්‍ය පාලනය පිළිබඳ වගකීම ඇති පාර්ලිමේන්තුවේ වගකීම සහ වගවීම වේ. ඒ සඳහා අවශ්‍ය සහාය සහ ක්‍රියාමාර්ග ගැනීම සඳහා සුදුසු පියවර පාර්ලිමේන්තුව විසින් ලබා දිය යුතු යැයි මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා වුණත්, එතුමාගේ පියාගේ හදිසි අභාවය හේතුවෙන් එතුමාට අද දින පැමිණීමට නොහැකි බවට අපට දැනුම් දුන්නා. ඒ අනුව අපි ඊයේ ඔබතුමාගේ අවසරය අරගෙන තමයි මේක අද දිනයේ ඉදිරිපත් කරන්නේ.

මා විපක්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ මේ යෝජනාව ස්ථිර කරමින් විවාදයේ ආරම්භක කථාව ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා මෙතැන් පටන් සිදු කරනවා ඇති.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. Kabir Hashim. You have 12 minutes.

[පූ.භා. 11.08]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷிம்)
(The Hon. Kabir Hashim)

ගරු කථානායකතුමනි, මෙම යෝජනාව ස්ථිර කරමින්, හර්ෂ ද සිල්වා මැතිතුමා ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ යෝජනාව වෙනුවෙන් මුදල් කාරක සභාවේ නිර්දේශ පදනම් කරගෙන කථා කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය කළමනාකරණ පද්ධති ඉතිහාසයේ පෙර නොවූ විරූ මට්ටමේ ආරක්ෂක බිඳ වැටීමක් සිද්ධ වුණේ 2026 වසරේයි.

රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාවේ අවසන් නිගමනවල, නැත්නම් Conclusionsවල තිබෙනවා, "ප්‍රබල සාක්ෂි තිබෙනවා" - "damning evidence is available" - කියලා. මේක මහා පරිමාණයේ වංචාවක් කියලා එම වාර්තාවේ සහතික කරනවා. ඒ කියන්නේ, ඒක fraud එකක් හැටියට පෙන්වා දෙනවා. මෙහි වැදගත්කම තමයි මේ රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාව, ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය එකතු වෙලා එකඟතාවකින් අත්සන් කර තිබීම. ඒ නිසා මේකේ වාද විවාද නැහැ. ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය දෙගොල්ලන්ම එහි නිගමනවලට එකඟයි.

Sir, I quote from paragraph No. 7 I in page 20 of the Report of the Committee on Public Finance:

> "A fraud linked to cybercrime has clearly taken place. USD 2.5 million public funds have been stolen."

"A fraud has taken place" කියලා කියනවා; ඒ කියන්නේ වංචාවක් සිදු වුණු බවට සියලුදෙනාම එකඟයි. So, the Committee on Public Finance's findings say that a fraud has taken place. Criminal liability is not within the scope of the Committee on Public Finance. Therefore, criminal investigation must determine if officials were ignorant,

incompetent or had deliberate involvement. ඒ කියන්නේ, එම නිලධාරින් දැනුවත්වද, නොදැනුවත්වද, වෙන කවුරු හරි ඒකට සම්බන්ධද කියන එක. Cybercrime එක ක්‍රමවේදයක් පමණයි. හැබැයි, කවුරු හරි මේක මෙහෙයවූවාද කියන එක සොයා බලන්න ඕනෑ. ඒක රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වගකීමක් නොවෙයි කියලා කියනවා.

Report එකේ Conclusionsවල No. 7 II අහි මෙසේ කියනවා:

"At the overall governance level, senior officials at the level of Secretary to Treasury and Governor of the Central Bank bear responsibility for several lapses."

All the Government and Opposition Members of Parliament of the Committee had agreed and come to a consensus that the Secretary to the Treasury and the Governor bear responsibility for these lapses; they had agreed that the Secretary and the Governor have been responsible.

රාජ්‍ය ණය කළමනාකරණ පනත දැන් අවුරුදු දෙකක් විතර පරණයි. 2024ට පෙර ආණ්ඩුව කාලයේ ජුනි මාසයේ එය පටන් ගත්තා. එයට අදාළ නීති රීති, රෙගුලාසි සම්පූර්ණයි. හැබැයි, මහ බැංකු අධීක්ෂණය යටතේ භාණ්ඩාගාරය විසින් විදේශ ණය ගෙවීම් තිබුණත්, භාණ්ඩාගාරය සහ මහ බැංකුව අතර සම්බන්ධතාව නිසි ලෙස සිද්ධ නොවුණු නිසා මේක අයාලෙ ගිහිල්ලා තිබෙන බව අපට පෙනී යනවා. විශේෂයෙන්ම මුදල් නියෝජ්‍ය ඇමතිවරයා මේ අවස්ථාවේ සභාවේ නැහැ, මට ඒ ප්‍රශ්නය අහන්නවත්. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ සාමාන්‍යයෙන් ඒ වාගේ transition stage එකක, there should be a secondment of officials from the Central Bank to the Treasury to ensure smooth transition, especially when there is a huge responsibility towards the running of the Public Debt Management Office. I do not know whether that had happened. I would like to ask the Government where there were secondments done from the Central Bank to the Treasury in regard to running the Public Debt Management Office.

ගරු කථානායකතුමනි, clearly the responsibility of protecting institutional credibility and structure rests on the Chief Accounting Officers of the two institutions, being the Secretary to the Ministry of Finance and the Governor of the Central Bank.

Now, the question that arises is, why did they suspend four middle-level officers? ගරු කථානායකතුමනි, ප්‍රධාන ප්‍රශ්නය මතු වෙන්නේ මෙහෙමයි. කනිෂ්ඨ නිලධාරින් හතර දෙනෙකුගේ වැඩ තහනම් කරන්නේ ඇයි? ඔවුන් මේකට වග කියන්නේ කොහොමද? මොන පදනමින්ද ඒගොල්ලන්ව ඉවත් කළේ? එක නිලධාරියෙක් සියදිවි නසා ගත්තාය කිව්වා. හැබැයි, සියදිවි නසා ගත්තාය කිව්වාට සමහර අය කියනවා ඒක සාපරාධී ක්‍රියාවක් වෙන්න පුළුවන් කියලා. එම කනිෂ්ඨ නිලධාරි රංග රාජපක්ෂ මහතාගේ මරණය පිළිබඳව ඔහුගේ පවුලේ සියලුදෙනාටම විපක්ෂය වෙනුවෙන් මේ අවස්ථාවේ අපේ කනගාටුව සහ ශෝකය ප්‍රකාශ කරනවා. එම සියදිවි නසා ගැනීම බරපතළ සිද්ධියක්.

රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාවේ, in the Report of the Committee on Public Finance, රජයේ මන්ත්‍රීවරු සහ විපක්ෂයේ මන්ත්‍රීවරු එකඟතාවයෙන් අත්සන් කරපු එම වාර්තාවේ නිගමන අනුව පැහැදිලිව කියනවා, භාණ්ඩාගාර ලේකම් සහ මහ බැංකු අධිපති මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් පැහැර හැරීම් කිහිපයකට වගකීම් දැරිය යුතුයි කියලා; basically, at the overall governance level, senior officials at the level of Secretary to the Treasury and the Governor of the Central Bank bear responsibility for several lapses. එතකොට, මෙහෙම කෙළින්ම එතැනට තමයි මේගොල්ලෝ වාර්තාවේ නිගමනයට එන්නේ. ගරු කථානායකතුමනි, එහෙම නම් මම අහන්නේ මේකයි. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපනය කරන්නේ පෙර රජය විසින්. හැබැයි, ඒක කරන්නේ සමස්ත ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ කොටසක් හැටියට. එතැනින් ආරම්භ කළාට, එහි සැබෑ සංක්‍රාන්ති ක්‍රියාවලිය සිදුවන්නේ වත්මන් රජය යටතේ. රජය පත් වෙලා නොවැම්බර් මාසයේ සිට ඒක ක්‍රියාත්මක වෙනවා.

ඒ වාගේම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විශේෂිත නියෝජිතායතනයක් බවට පත් කරන්න කියලා පෙර රජය කියනවා. ඒකට විශේෂ බලතල සහිත, විශේෂ නිලධාරින් පත් කරන්න කියලා පෙර රජය සැලසුම් කරනවා. හැබැයි, වත්මන් රජය බලයට ආ පසු රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලයෙන් පමණක් බඳවා ගැනීම් කරන්නත්, එය මුදල් අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවක් ලෙස තබා ගන්නත් තීරණය කරනවා. එය විශේෂ බලතල සහිත, විශේෂ නිලධාරින්ගෙන් යුතු, විශේෂිත ආයතනයක් හැටියට ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන යෝජනාව තිබුණත්, වත්මන් රජයම තමයි ඒ යෝජනාව ප්‍රතික්ෂේප කරලා මුදල් අමාත්‍යාංශය යටතේ රජයේ දෙපාර්තමේන්තුවක් හැටියට එය පවත්වාගෙන යන්න තීරණය කරන්නේ. එතකොට එහි වගකීම සම්පූර්ණයෙන්ම මේ රජය ගන්න ඕනෑ.

2026 අප්‍රේල් මුල් කාලයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් missing වුණා කියලා දැනගන්න කලින්, එහෙම නැත්නම් ඒ cybercrime එක සිදු වෙන්න කලින්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ මහ බැංකුවේ අධිපතිවරයාව ගෙන්වලා සාකච්ඡාවක් කළා. එහිදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු හර්ෂ ද සිල්වා මහතා සහ විපක්ෂයේ සාමාජික මන්ත්‍රීවරුන් කෙළින්ම කිව්වා, "The coordination mechanism between the Ministry of Finance and the Central Bank on the Public Debt Management Office is very weak, and there are issues. You should correct it" කියලා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඒ ගැන අවධානය යොමු කරලා අවධාරණය කරනවා, මේකේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා, මේක විසඳිය යුතුයි, සම්බන්ධීකරණයේ යන්ත්‍රණයක් නැහැ කියලා. එතකොට ඒකට දුන් උත්තරය මොකක්ද? මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයායි, මහ බැංකුවේ අධිපතිවරයායි සම අත්සන් කරලා - co-sign කරලා - ලිපියක් යවනවා, "දැනට තිබෙන mechanism එක බොහොම ප්‍රමාණවත්, කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා සහතික කරනවා" කියලා. The Secretary to the Ministry of Finance and the Governor of the Central Bank gave assurance that the existing mechanism for coordination is adequate. That is on record at the Committee on Public Finance.

ඊළඟට, භාණ්ඩාගාරයේ වත්මන් ලේකම් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියට සිටි කාලයේ - එතුමා පාර්ලිමේන්තුවේ සිටි කාලයේ - රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජික විපක්ෂ මන්ත්‍රීවරුන්, ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කමිටුවේදී රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට විශේෂිත කාර්ය මණ්ඩලයක් අවශ්‍ය බවත්, එය කළමනාකරණය කරන්න විශේෂිත කාර්ය මණ්ඩලයක්

[ගරු කබීර් හෂීම් මහතා]

පත් කළ යුතුයි කියලා යෝජනා කරද්දිත්, ඒ ගැන අනතුරු අඟවනකොටත් ඒ වෙලාවේදී රජය ඒක නොසලකා හැරියා. නමුත් එය රජයේ වගකීමක් වන බව මේ අවස්ථාවේ විපක්ෂය හැටියට අපි කියන්න ඕනෑ. ඒ කියන්නේ, අහිමි වුණු ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක වගකීම අනිවාර්යයෙන්ම රජය භාර ගත යුතුයි. එහෙම නැතුව එක එක නිලධාරින්ගේ වැඩ තහනම් කරලා ඒ වගකීමෙන් බේරෙන්න බැහැ.

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාවේ 21වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

> "b. At the procedural level, the Directors General of the ERD and PDMO have displayed an absolute dereliction of duty..."

This is what the Report states, and the Members from the Government has signed that. "ක්‍රියා පටිපාටික මට්ටමේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරුන් තමන් සතු රාජකාරිය සම්පූර්ණයෙන් පැහැර හැර ඇති බව පෙනී යයි" කියා එහි සඳහන් වනවා. ඒ නිගමනය රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාවේ තිබෙනවා. එම වාර්තාව අනුමත කරලා තිබෙනවා, රජයේ මන්ත්‍රීවරුන් හා ඇමතිවරුන්. භාණ්ඩාගාරයේ ලේකම්වරයා, මහ බැංකුවේ අධිපතිවරයා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේ අධ්‍යක්ෂ ජෙනරාල්වරුන් අතින් බරපතළ අඩුපාඩු සිදු වෙලා තිබෙන බව වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා නම්, මෙම වාර්තාව සියලු මන්ත්‍රීවරුන් අත්සන් කර තිබෙනවා නම්, වංචාවකුත් සිදු වෙලා තිබෙනවා කියලා සහතික කරනවා නම්, මීට වැඩිය තව මොකක්ද කියන්නේ? මේක වංචාවක්. මේක සිදු වුණේ කොහේදීද කියලාත් වාර්තාවේ තිබෙනවා.

ගරු කථානායකතුමනි, එහෙම නම් ඔබතුමාට දැන් ලොකු වගකීමක් පැවරෙනවා, මේ සම්බන්ධ පරීක්ෂණ විධිමත් කරලා ක්‍රියාත්මක වන්න. එහෙම තියෙද්දි කනිෂ්ඨ නිලධාරින් හතරදෙනෙකුගේ වැඩ තහනම් කළේ කොහොමද කියලා තමයි අපි අහන්නේ. ලොකු තෝරු, මෝරු ඉන්දෙද්දි කුඩා මසුන් අල්ලා දඬුවම් දීමේ වැඩක් වාගේ දෙයක් තමයි මෙතැන සිද්ධ වන්නේ. කනගාටුයි කියන්න, ඒකේ ප්‍රතිඵලය වුණේ නිලධාරියෙකුගේ ජීවිතය නැති වීම. මම දැක්කා, "Daily FT" පුවත් පතේ පළ වෙලා තිබුණු හොඳ ලිපියක්. ගරු කථානායකතුමනි, කේ.කේ.එස්. පෙරේරා කියන්නේ, ප්‍රසිද්ධ මාධ්‍යවේදියෙක්. එතුමා කියනවා, "සිය දිවි නසාගැනීම සඳහා අනුබල දීම, සමාජය තුළ හෝ සේවා ස්ථානයේ යම් බලපෑම්වලට ලක් වෙලා ඒක අනුබල දීමක් බවට පරිවර්තනය වුණාම එය දණ්ඩ නීති සංග්‍රහය යටතේ ලොකු අපරාධයක්" කියලා.

අද සමාජය පුරා දක්නට ලැබෙන දෙයක් තමයි, සේවා ස්ථානවල පීඩනය මත බොහෝදෙනෙකුට සිය දිවි නසා ගැනීමට අනුබල දීම වක්‍රව හෝ සෘජුව සිදු වීම. මේක බරපතළයි. යම් යම් අනුබල දීම් හරහා තමයි කෙනෙකුට මේක සිද්ධ වන්නේ. ඒ යටතේ බලනකොට, හර්ෂ ද සිල්වා මැතිතුමා මෙම කමිටුවේ සභාපතිවරයා හැටියට තමන්ගේ වාර්තාවේ මේක සඳහන් කරනවා. Under the Sri Lankan Criminal Law, the abetment of suicide is a severe criminal offence governed by Section 299 of the Penal Code. Section 299 dictates that if any person commits suicide, whoever abets the commission of such suicide shall be punished.

So, there was one officer who committed suicide. Did somebody push him to do that? Was his suspension necessary? Was that right? According to the Report of the Committee on Public Finance, there is no direct accusation on those officials. It is not they who had done wrong. All of these MPs who had signed this Report clearly say that errors had occurred from the top, from the Secretary to the Ministry of Finance and from the Governor of the Central Bank. Then, they should have been stopped from work; they should have been suspended. Why were only the four junior officials suspended? දැන් මේක තමයි ලොකුම ගැටලුව. ගරු කථානායකතුමනි, මේ පිළිබඳව සොයා බැලිය යුතුයි. As a country trying to come out of its 2022 sovereign default and still rebuilding international confidence in us, these findings have repercussions far beyond the US Dollar 2.5 million.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
He can take one more minute, Sir.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
I got one more minute, Sir.

It raises fundamental questions about this Government's ability to safeguard billions of dollars that move through the sovereign debt repayment system. The ordinary taxpayer now has a doubt whether the taxes he pays are in safe hands. The US Dollar 2.5 million Treasury scam directly undermines the structural integrity of Sri Lanka's financial system, severely damaging international investor confidence by exposing critical gaps in regulatory oversight, governance and institutional trust. When a country's sovereign debt or the Treasury mechanism is compromised, foreign investors shift from evaluating market risk fearing operational and systemic fraud.

ගරු කථානායකතුමනි, ඇමෙරිකානු ඩොලර් මිලියන දෙකහමාරේ වංචාව පිළිබඳව හර්ෂ ද සිල්වා මැතිතුමා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව අනුව නිගමන 11ක් දීලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කළ යුතුයි කියලා විපක්ෂය හැටියට අපි යෝජනා කරනවා. ඒ අතර තවදුරටත් අපේ යෝජනාව තමයි, ස්වාධීන ජාත්‍යන්තර පාර්ශ්වයක් මාර්ගයෙන් වෝහාරික විගණනයක් සිදු කළ යුතුයි කියන එක. There must be a forensic audit done by an external agency. ගරු කථානායකතුමනි, මම ඉල්ලීමක් කරනවා, මේක තව තවත් ප්‍රමාද නොකර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්, විගණනයක් සිදු කිරීමටත් අදාළ ආයතන වෙත අද දිනම යොමු කරන ලෙස. ඊළඟට අපි විපක්ෂයක් හැටියට යෝජනා කරනවා, මේ ගැන සොයා බලන්න පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් වහාම පත් කරන්න කියලා.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The Hon. Chathuranga Abeysinghe. You have 12 minutes.

[පූ.භා. 11.22]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක ණය පියවීමේ ගනුදෙනුව සයිබර් අපරාධයක් ආශ්‍රිතව සිදු වූවක් කියලා පක්ෂ, විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විශේෂයෙන් පැහැදිලිව වාර්තාවක් දීලා තිබියදී, ඒ වාර්තාවේ අර්ථ කථනය විකෘති කරන්න සමහර මන්ත්‍රීවරුන් උත්සාහ කිරීම ඉතාම කනගාටුදායක කාරණයක් කියන එක මම මේ වෙලාවේ කියන්න කැමැතියි. මොකද, මේ විවාදය පටන් ගනිද්දීම විපක්ෂය මේ වාර්තාවේ නොමැති අර්ථ කථන මේ සභාවට ගෙන හැර දක්වන්න උත්සාහ කළා. අපි දන්නවා, අපේ රටේ මහා භාණ්ඩාගාරය බැඳුම්කර නිකුත් කරනකොට ඒක වංචා කරලා, ලංකාවට විදේශ ආයෝජන නැති කළේ 2016දී පැවති මෙතුමන්ලාගේ ආණ්ඩුව බව. සමස්ත පද්ධතියේ තිබුණු දුර්වලතාවක් නිසා මෙහිදී සයිබර් අපරාධයක් සිද්ධ වෙලා තිබෙනවා කියලා මේ වාර්තාවේ පැහැදිලිව ලියලා තිබෙනවා.

Delegation of power කියලා දෙයක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ කියන්නේ, වගකීම් පහළට-පහළට පැවරීම. ඕනෑම ආයතනයක නිලධාරින්, ආයතන ප්‍රධානීන් ඒ දේ කරනවා. ඒ වගකීම් පහළට-පහළට පැවරුවාම එක් එක් නිලධාරියාගේ වගකීම තමයි, තමන්ට පැවරිලා තිබෙන කාර්යය විචක්ෂණශීලිව සිදු කිරීම. දැන් මේ කාරණය සම්බන්ධයෙන් මේ වාර්තාවේ ඉතාම පැහැදිලිව තිබෙනවා, මේක සිදු වෙච්ච ආකාරය, සිදු වෙච්ච විධිය යනාදිය පිළිබඳව. මම ඒක යම් ප්‍රමාණයකින් අද පැහැදිලි කරන්නම්. ඇත්තටම අද මේ විවාදය ගන්න ඕනෑ රටේ තිබෙන ව්‍යුහාත්මක ගැටලු, රාජ්‍ය ආයතනවල තිබෙන ව්‍යුහාත්මක ගැටලු, තාක්ෂණික ගැටලු, සේවකයින්ගේ ගැටලු, පද්ධතිවල ගැටලු දියුණු කරගෙන යන්න මේ රජය ගන්නා වූ ඉතාම වෙහෙසකර කාර්යභාරය ගැන සාකච්ඡා කරන්නයි. විශේෂයෙන්ම මේ සාකච්ඡාව අපි එතැනට ගෙනෙන්න ඕනෑ. මොකද, රාජ්‍ය සේවය අකර්මණ්‍ය කරලා තිබෙනවා. මේ කියන අවස්ථාවේදීත් අපේ රාජ්‍ය ආයතනවල ඩිජිටල් පද්ධති, නැත්නම් ඊ-මේල් පද්ධති upgrade කර ගන්න බැරිව තිබෙනවා. ඒ අකර්මණ්‍ය වෙච්ච රාජ්‍ය සේවය ගොඩ නගන්න තමයි අපි මේ උත්සාහ කරන්නේ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඉතිහාසයේ ශක්තිමත්ම ආර්ථික තත්ත්වය 2025දී අත් කරගෙන, 2026දී මුදල් පිළිබඳව ඉතාම ශක්තිමත් ආර්ථික විනයක් පවත්වාගෙන යන මුදල් අමාත්‍යාංශයටත්, එහි ලේකම්තුමාටත්, රටේ මුළු මූල්‍ය පද්ධතියම කළමනාකරණය කරන මහ බැංකුවටත් අනවශ්‍ය චෝදනාවක් එල්ල කරන්න මේ අවස්ථාව යොදා ගත නොහැකියි කියන එකයි මගේ අදහස වන්නේ.

මොකද, විශේෂයෙන්ම මේ Public Debt Management Act එක 2024 අවුරුද්දේදී ආවාට පස්සේ සංක්‍රාන්ති කාලයක් ලැබෙනවා. ඒ කියන්නේ, මීට කලින් විදේශ ණය කළමනාකරණය, ණය ගෙවීම කියන මේ සියල්ල සිද්ධ වුණේ මහ බැංකුව හරහා. මේ අලුත් පනතට අනුව ණය කළමනාකරණ ක්‍රියාවලිය මුදල් අමාත්‍යාංශයට පැවරෙනවා. එකඟ වෙනවා, 2024 නොවැම්බර් ඉඳලා මාස 18ක සංක්‍රාන්ති කාලයක් සඳහා. මේ සංක්‍රාන්ති කාලය තුළ තමයි මේ ක්‍රියාවලියට මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් පුහුණු කර ගනිමින්, මහ බැංකුවේ සහාය ලබා ගනිමින් මේ ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ. එතකොට මෙන්න මේ ක්‍රියාවලිය ඉතාම පැහැදිලිව, සද්භාවයෙන් සිදු කරන්නේ, ගරු කථානායකතුමනි. පක්ෂ, විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් ඉතාම දීර්ඝ විශ්ලේෂණයකින්, විශේෂ තොරතුරු කැඳවීම්වලින්, භාණ්ඩාගාර ලේකම්තුමාගේ, මහ බැංකු අධිපතිතුමාගේ සියලුම තොරතුරු සහාගත කර තිබෙනවාද? මම හිතන්නේ මේක මෑත ඉතිහාසයේ සිද්ධ වෙච්ච ඉතාම ප්‍රබුද්ධ, එහෙම නැත්නම් ඉතාම දියුණු, අපේ වපසරියට ගැළපෙන, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාවක්. මේ ක්‍රියාදාමය සිද්ධ වුණේ කොහොමද, මේ ක්‍රියාදාමයට බාහිර පාර්ශ්වයක් මැදිහත් වුණේ කොහොමද කියන සියලුම තොරතුරු පැහැදිලිව මේ වාර්තාවේ තිබෙනවා.

විශේෂයෙන්ම මේ ක්‍රියාවලියට පාදක වෙන්නේ External Resources Department - ERD - කියන කොටස. එතකොට මේ External Resources Department - ERD - කියන එක මීට කලින් පද්ධතියේත්, වර්තමාන පද්ධතියේත් වෙනස් වෙලා තිබුණේ නැහැ. ඒ කියන්නේ, විදේශ ණය හිමියන් පිළිබඳ ඔවුන්ගේ තොරතුරු හුවමාරු කර ගන්නේ ERD එක. එතකොට ERD එකට ලැබෙන තොරතුරු තමයි ඔවුන් විවිධාකාරයෙන් මේ ගෙවීම් සඳහා ඉදිරියට ඉදිරිපත් කරන්නේ. ඒ නිසා අපට පෙනී ගිය කාරණය මේකයි. මේ ERD එකේ process එක හරහා අදාළ තොරතුරු ලබා ගැනීම, තොරතුරු අධීක්ෂණය කිරීම, විශ්ලේෂණය කිරීම සහ ඉදිරියට ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීම කියන කාර්යභාරය ඇතුළේ විශාල ගැටලු ප්‍රමාණයක් අපි හඳුනා ගත්තා. ඒක තමයි විශේෂයෙන්ම මේකට පාදක වෙන්නේ.

විශේෂයෙන්ම මේක හිතාමතා කරපු දෙයක්ද, අත්වැරදීමක්ද, negligence එකක්ද කියන එක සම්බන්ධයෙන් සොයා බලන්න ඒ පරීක්ෂණ සිදු කරන්න දෙපාර්තමේන්තුවලට, එහෙම නැත්නම් විශේෂඥ කමිටුවලට භාර දීලා තිබෙනවා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාවලියක් නොවෙයි, මේ වංචාව පිළිබඳව ඒ ප්‍රමාණයෙන් විශ්ලේෂණයක් කරන එක. පද්ධතියට මොකද වෙලා තිබෙන්නේ, මේ පද්ධතිය ශක්තිමත් කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳවයි අපි සොයා බැලුවේ. මේ ප්‍රශ්නගත ගෙවීම සිදු වෙන්නේ 2025 නොවැම්බර් මාසයේ. මේ transaction සම්බන්ධයෙන් මෙවැනි ප්‍රශ්නයක් තිබෙනවා කියලා දැනගන්න ලැබෙන්නේ 2026 ජනවාරි මාසයේ. ඒ අවස්ථාවේදී ඉන්දියානු එක්සිම් බැංකුවට ගෙවීමක් කරනකොට ඒක JPMorgan Chase ආයතනයේ, global fraud protection අංශය අපේ මහ බැංකුවට දැනුම් දෙනවා, මේ ගෙවීම කරන්න එපා, මේක සුදුසු නැහැ කියලා. අන්න ඒ හරහා තමයි මෙන්න මේ වාගේ සයිබර් අපරාධයක් මේ ක්‍රියාවලිය ඇතුළේ සිද්ධ වෙලා තිබෙනවාද, ඒවා මොනවාද කියලා භාණ්ඩාගාර ලේකම්තුමාට දැනගන්න ලැබෙන්නේ, ඉහළ නිලධාරින්ට දැනගන්න ලැබෙන්නේ. ඒ පිළිබඳව දැනගත්ත වහාම විශේෂයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව - CID එක - සහ cybercrime සම්බන්ධ SLCERT ආයතනය දැනුවත් කරනවා, මෙන්න මෙහෙම ප්‍රශ්නයක් වෙලා තිබෙනවා, මේක වළක්වන්න අපට උදවු කරන්න කියලා. ඒ තුළින් පෙනෙනවා, මේ ප්‍රශ්නය හඳුනා ගත් මොහොතේදීම කොච්චර සද්භාවයකින් ඉහළ නිලධාරින් වැඩ කරලා තිබෙනවාද කියන එක. මොකද, අපිට ඒ සම්බන්ධයෙන් වැඩක් කරන්න එවැනි දෙයක් අපට දැනගන්න ලැබෙන්න එපායැ.

[ගරු චතුරංග අබේසිංහ මහතා]

විශේෂයෙන්ම බ්‍රිතාන්‍යයට මිලියන 1.2ක්, ජර්මනියට මිලියන 4ක්, බෙල්ජියමට ඩොලර් 60,000ක් යන මේ වාගේ වරදක් වෙන්න තිබුණු අවස්ථා අවම කර ගන්නවා, මෙන්න මේ ක්‍රියාවලිය හරහා, මේ මැදිහත්වීම තුළදී. ඒ අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා දැනුම් දෙනවා, මීට කලින් සිදු වුණු සියලුම payments ගැන සොයා බලන්න කියලා. අන්න ඒ ක්‍රියාවලිය තුළ තමයි 2026 මාර්තු 23වැනි දා මේ Export Finance Australia කියන ආයතනයට කරපු ගෙවීම් ලැබිලා නැහැ කියලා ඒ ආයතනය කියන්නේ. ගරු කථානායකතුමනි, මේ ක්‍රියාවලිය මේ විධියට ඇවිල්ලා, මෙන්න මෙතැනදී තමයි ඇත්තටම වංචාවක් හෝ දූෂණයක් වෙලා තිබෙනවා කියන තොරතුර එන්නේ. ඒ හරහා තමයි මේ සියල්ලම ක්‍රියාත්මක වෙන්නේ. ඒ සඳහා අවශ්‍ය කරන ඊ-මේල් ගනුදෙනු වෙච්ච ආකාරය, මේ සඳහා මහ බැංකුව මැදිහත් වෙච්ච ආකාරය ඇතුළු සියල්ලම පිළිබඳව මේ වාර්තාවේ පැහැදිලිව සඳහන්ව තිබෙනවා.

ඉතාම විනිවිදභාවයෙන් මේ සියලු තොරතුරු එහි ඇතුළත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මහ බැංකුවට මැදිහත් වෙන්න එක් අවස්ථාවක් හිමිව තිබුණා. නොවැම්බර් මාසයේ කරපු payments හයෙන් දෙකක් reject වුණා. Payments දෙකක් reject වුණාම මහ බැංකුවට යම්කිසි සැකයක් ඇති වුණා. නමුත් ඒක මේ වාගේ බරපතළ තත්ත්වයක් කියලා මහ බැංකුව එතැනින් එහාට investigate කළේ නැහැ. එහෙම investigate කළා නම් සමහර වෙලාවට මේ payments ඔක්කොම බේරා ගන්න තිබුණා. නමුත් එතැනින් ඉස්සරහට ගිහිල්ලා, මේ ක්‍රියාවලිය හරහා අදාළ payments ටික සිදු වෙලා තිබෙනවා.

මේකේදී අපට වැදගත් වෙන්නේ ආයතනයක් විධියට මේකේ තිබුණු දුර්වලතා මොනවාද කියන එකයි. මේ Report එකේ පැහැදිලිව කියා තිබෙනවා, මේ කියන lapses, මේ කියන දුර්වලතා කාලාන්තරයක් තිස්සේ සිදු වුණු දේවල් කියලා. එහෙම නැතිව මේවා මේ ආණ්ඩුව ආවාට පස්සේ සිද්ධ වුණු දේවල් කියලා මේ වාර්තාවේ කොහේවත් සඳහන් වෙලා නැහැ. මොකද, internal controls කියන්නේ කාලයක් තිස්සේ develop වන දේවල්. විශේෂයෙන් මේ ERD එකට තොරතුරු එනවා, ගිණුම් අංක මාරු කරන්න කියලා. ගිණුම් අංක මාරු කරන්න කියලා තොරතුරක් ආවාම ඒ ගිණුම් අංක verify කර ගන්න හැටි, ඒක third party එකකින් verify කර ගන්න හැටි, ඒකට ක්‍රියාත්මක වෙන්නේ කොහොමද කියන එක පිළිබඳව කාර්ය පටිපාටියක් තිබිලා නැහැ කියන එක තමයි අපට ඒකෙන් ගම්‍ය වුණේ. ඒක අද ඊයේ නොවෙයි, මීට කලින් තිබිලාත් නැහැ. නමුත්, අවාසනාවන්ත විධියට මේ සයිබර් අපරාධය සිද්ධ වෙන්නේ පසුගිය අවුරුද්දේ ඔය කියන කාලය ඇතුළත. මුදල් අමාත්‍යාංශය ඒක දැනගත්ත ගමන් ක්ෂණිකව ඒ වෙනුවෙන් විවිධ උපක්‍රම සහ අලුත් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒක රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට දන්වා තිබෙනවා. අපි Report එකෙත් විශේෂයෙන් සඳහන් කරලා තිබෙනවා, ERD එකේ function එක PDMO එකට ගන්න කියලා. ඒ කියන්නේ, External Resources Department එකේ වැඩකටයුතු ටික රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය යටතට ගන්න කියන එක. ඊළඟට formal channels හදා ගෙන මෙතෙක් කල් emails හරහා සිදු වුණු ගනුදෙනු පිළිබඳව සැබෑ නීත්‍යානුකූල මාර්ගවලින් - විශේෂයෙන්ම තානාපති කාර්යාල හරහා - තොරතුරු ලබා ගන්න. ඒ වාගේම ඉදිරියේදී මේ වාගේ ගෙවීම් කරනකොට දවස් 10කට කලින් එය භාණ්ඩාගාර ලේකම්තුමාගේ අත්සනට යටත් කරන්න. මොකද, මේවා මීට කලින් තිබුණු දේවල් නොවෙයි. ඊළඟට, ToD verification සඳහා වෙනම transaction unit එකක් හදලා ඒ හරහා transactions දිහා බලන්න.

ගරු කථානායකතුමනි, ඒ වාගේම NRM System එකේ තිබුණු දත්ත වෙනස් කරන්න තිබුණු හැකියාව පිළිබඳව නව පිරිවිතරයන් සකස් කර තිබෙනවා. මේ තොරතුරු වෙනස් කරන්න කාටද අයිතිය තිබෙන්නේ, කොහොමද ඒවා කරන්නේ කියන එක පිළිබඳව හොඳ internal control system එකක් හදලා තිබෙනවා. මේ මහත්වරු මේ රට පාලනය කරපු කාලයේදීත් internal control system එකක් තිබිලා නැහැ. ඒක තමයි යථාර්ථය. කාලයක් තිස්සේ තිබුණු internal control failure එකක් නිසා තමයි අපට ඩොලර් මිලියන 2.5ක් නැති වුණේත්, අවාසනාවන්ත විධියට නිලධාරියෙකුට ජීවිතය අහිමි වෙලා තිබෙන්නේත්. ඒ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සිදු කළ අභ්‍යන්තර පරීක්ෂණයක් අනුව තමයි ඒ ක්‍රියාවලියට සෘජුවම දායක වුණු පිරිස තාවකාලික වැඩ තහනමකට ලක් කරලා තිබෙන්නේ. ඒ, මේ පරීක්ෂණය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වපසරිය හදා ගන්නයි.

ගරු කථානායකතුමනි, මේ රටේ ආර්ථිකය ශක්තිමත්ව ඉදිරියට යනවා. ඒ වාගේම හැම ක්ෂේත්‍රයකින්ම රට වර්ධනය වන බව අපට පෙනෙනවා. මේ මහත්වරුන්ට අවුරුදු 70ක් රට පාලනය කරලා කර ගන්න බැරි වෙච්ච, විශේෂයෙන්ම 2015 - 2019 කාලයේ අටවපු බිම් බෝම්බ තමයි මේ තැනින් තැන පුපුරන්නේ. ඒවාටත් මුහුණ දෙමින් තමයි මේ රට සංවිධිත ආර්ථිකයක් බවට පත් කරලා, හොඳ systems ගෙනැල්ලා, තාක්ෂණය ගෙනැල්ලා, ඩිජිටල් ක්ෂේත්‍රයේ ආයෝජනය කරලා තිබෙන්නේ. 2016 අවුරුද්දේ ඉඳලා server එක update කරලා නැහැ නේ. 2016-2019 කාලයේ ඔබතුමන්ලා නේ, නායකත්වය ලබා දුන්නේ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව - CoPF එක - තුළ අපට තිබෙන වපසරිය අනුව අපි මේ ක්‍රියාවලිය සිදු කළා. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම සභාපතිතුමාටත්, සියලුම මන්ත්‍රීවරුන්ටත් මම ස්තුතිවන්ත වනවා.

ඒ වාගේම අපි මේක හරහා recommendations 11ක් දීලා තිබෙනවා. ඔබතුමාටත් අපි දැනුම් දීමක් කර තිබෙනවා, අපේ වපසරිය ඇතුළේ ඉඳගෙන මේකට ඉදිරියට ගන්න ඕනෑ ක්‍රියාමාර්ග පිළිබඳව. ඒ recommendations ටික විශේෂයෙන් මුදල් අමාත්‍යාංශයත්, Central Bank එකත් පිළිගෙන තිබෙනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකු පනතේ මුදල් අමාත්‍යාංශයේ මේ ගනුදෙනු පිළිබඳව, මහ බැංකුවේ වගකීම පිළිබඳව යම්කිසි වෙනස් වීමක් සිද්ධ වෙන්න ඕනෑ කියලා අපි පොදුවේ විශ්වාස කරනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මේකයි. මේ වාර්තාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, මේක කාලයක් තිස්සේ තිබුණු අභ්‍යන්තර controlsවල ගැටලුවක්, බාහිරෙන් ආපු තර්ජනයක්, බාහිරෙන් ආපු හොරකමක මූලයක් කියලා. නමුත් ඒ පරීක්ෂණ කටයුතු අවසන් වනතුරු අපට නිගමනවලට එළඹෙන්න බැහැ, කවුද වග කියන්න ඕනෑ, කොහොමද වග කියන්න ඕනෑ කියන එක සම්බන්ධයෙන්. අපි ස්තුතිවන්ත වෙනවා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ඇතුළු නිලධාරින් සියලු දෙනාටම, වෘත්තීය මට්ටමේ සේවාවක් ඉටු කරමින් පාර්ලිමේන්තුව වෙනුවෙන් මේ වාර්තාව ඉදිරිපත් කිරීම පිළිබඳව. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Leader of the Opposition. You have nine minutes.

Order, please! The Hon. Deputy Speaker will now take to the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.35]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය සඳහන් කරපු ආකාරයට, වෘත්තීයමය ආකාරයට වපසරිය තුළ ලබා දුන් මේ වාර්තාවේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා, මේක ඇත්තවශයෙන්ම සයිබර් අපරාධයක් වාගේම පාලන - governance - ප්‍රශ්නයක්, ක්‍රියා පටිපාටි - procedural - ප්‍රශ්නයක්, මෙහෙයුම් -operational - ප්‍රශ්නයක් කියලා.

ඇත්තවශයෙන්ම මේ රටේ විදේශ ණය ගෙවීමේ ක්‍රියාවලිය තුළ දුර්වල පාලනයක් තිබුණා කියන එක ඉතාම පැහැදිලිව සඳහන් වෙනවා. දැන් බලන්න, බංකොලොත්භාවයෙන් පෙළෙන රටක, බදු බර පටවලා, ජීවන බර පටවලා, දුප්පත්කම වැඩි වෙලා, විරැකියාව වැඩි වෙලා, කර්මාන්ත කඩා වැටෙන යුගයක, ඩොලර් ලක්ෂ 25ක ණය වාරිකය ගෙවන්න බැරි ආණ්ඩුවක් තමයි අද රට පාලනය කරන්නේ. ඇත්තටම රජයේ පාර්ශ්වයෙන් ඇත්ත කථාව කියැවුණේ නැහැ. මේ ණය ආපහු ගෙවීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වුණේ මහ බැංකුව කේන්ද්‍ර කරගෙන Public Debt Department එකෙන්. ඒක වෙනස් වුණා, Public Debt Management Act එකෙන්. Public Debt Management Act එකෙන් මේ වගකීම ආවා, Public Debt Management Office - PDMO - එකට. මේ සංක්‍රාන්තික කාලය තුළ රජයට බැරි වුණා, ඒ අන්තර්කාලීන විධිවිධාන, standard operating procedures ටික හදා ගන්න. Terms of Reference නැහැ, Key Performance Indicators නැහැ, වගකීම් පැහැදිලිව ලේඛනගත වෙලා තිබුණේ නැහැ. ඇත්තවශයෙන්ම සංක්‍රාන්තික කාලය අවසානයේ තමයි Central Bank එකයි, PDMO එකයි MoU එකක් අත්සන් කරලා තිබෙන්නේ. ඉතින් පැහැදිලිවම මේක cyber attack එකක් පමණක් හැටියට හඳුන්වා දීම ඉතාම වැරදියි.

ඇත්තවශයෙන්ම මේ ප්‍රශ්නය ගැන මහා භාණ්ඩාගාරයටයි, මහ බැංකුවේ ප්‍රධානියාටයි - අධිපතිතුමාටයි - එක මතයක් නැහැ. මහ බැංකුවේ අධිපතිතුමා බෝලය පාස් කරනවා, මහා භාණ්ඩාගාරයට; මහා භාණ්ඩාගාරය බෝලය පාස් කරනවා, මහ බැංකු අධිපතිතුමාට. එතකොට රටේ fiscal policy එකයි, monetary policy එකයි ක්‍රියාත්මක කරන ආයතන දෙකට ඒකාග්‍රතාවයෙන් යුක්තව එක තැනක ඉඳගෙන වැඩ කරන්න බැරි නම් අපේ රටේ ආර්ථික ප්‍රතිපත්තියට, ආර්ථික අනාගතයට මොකක්ද වෙන්නේ කියන එක ගැන මම අමුතුවෙන් විග්‍රහ කරන්න අවශ්‍ය නැහැ. පැහැදිලිවම මේ සම්බන්ධයෙන් ERD එකේත් වගකීමක් තිබෙනවා. මොකද, Microsoft Exchange Server 2016 පද්ධතියම ක්‍රියාත්මක කිරීම තුළත් අඩුපාඩුකම් සිද්ධ වෙලා තිබෙනවා. SLCERT එක සහ KPMG එක විසින් සිදු කරන ලද විගණනවලදී multi-factor authentication එක නොමැති වෙලා තිබෙනවා. දුර්වල passwords භාවිත කර තිබෙනවා. වගකීම් පැහැදිලි නැති වෙලා තිබෙනවා. ඒ නිසාම තමයි cyber security අවදානම නිර්මාණය වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මේ වංචාවේ මූලික ක්‍රමවේදය වෙලා තිබෙන්නේ ව්‍යාජ email domains භාවිතය. ඒ වාගේම, ඒ අඩුපාඩුකම්වලින් මිදීමට අවශ්‍ය නිර්දේශ ටික ක්‍රියාත්මක කරලා නැහැ. ණය ගිවිසුම් පරීක්ෂා කිරීම, නිල සන්නිවේදන මාර්ග තහවුරු කිරීම, බැංකු ගිණුම් තොරතුරු තහවුරු කිරීම යනාදී කිසිවක් සිදු වෙලා නැහැ කියන එක, CoPF එක අර තිබෙන වපසරිය තුළ වෘත්තීමය වශයෙන් බොහොම හොඳ පරීක්ෂණයක් කරලා, පක්ෂ භේදයකින් තොරව පෙන්වා දී තිබෙනවා. 2026 ජනවාරි මාසයේ ඉන්දියාවේ Exim Bank එකට අදාළ ගෙවීමකදී මේ වාගේ සැක සහිත ප්‍රශ්නයක් ඇති වෙලා CID එකත්, SLCERT එකත් ඒ පිළිබඳව දැනුවත් කරලා තිබෙනවා. ඒ වාගේම, UAEවල - United Arab Emiratesවල - ගිණුමක් සම්බන්ධයෙනුත් සැක පහළ වෙලා තිබෙනවා. ඒ නිසා මේ සිදු වුණු ක්‍රියාදාමය තුළ අපේ international partnersලා තුළ, ඒ ණය ගෙවීමේ කටයුතු ක්‍රියාත්මක විය යුතු රටවල යම්කිසි අවිනිශ්චිතතාවක්, රට බංකොලොත්භාවයේ තිබෙන මොහොතක නිර්මාණය වීම රටට ඉතාම අහිතකරයි කියන එක මේ අවස්ථාවේ මා කියන්න කැමැතියි. විශේෂයෙන්ම මමත් පිළිගන්නවා, ඒ වපසරිය තුළ ඉතාම වෘත්තීමය ආකාරයෙන් හොඳම හොඳ වාර්තාවක් දීලා තිබෙනවා කියලා. හැබැයි, මේ සභාව තුළ ඒ වාර්තාව පිළිබඳව අරික්කාලක් පෙන්වා දෙන්නේ නැතුව ඒ වාර්තාවේ සම්පූර්ණයෙන්ම අන්තර්ගත වූ කරුණු-කාරණා පිළිබඳව අපි පෙන්වා දෙන්නට ඕනෑ. බංග්ලාදේශයේ cyber වංචාවක් සිදු වුණා. ඉක්වදෝරය, වියට්නාමය, රුසියාව, ඉන්දියාව, නයිජීරියාව, තායිවානය, මෙක්සිකෝව, මැලේසියාව ඇතුළු රටවල් ගණනාවකම මේ වාගේ දේවල් සිදු වෙලා තිබෙනවා. ඒ රටවලිනුත් ගත්ත ඒ ආරක්ෂක පියවර පිළිබඳව යම් කිසි පාඩමක් ඉගෙන ගෙන කටයුතු කරන්න කියලා මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

මගේ කථාව අවසන් කරන්නට පෙර විශේෂයෙන්ම කාරණයක් කියන්නට ඕනෑ. මේ සභාවේ කියැවුණා, බිම් බෝම්බයක් ගැන. දැන් තිබෙන ලොකුම බිම් බෝම්බය තමයි IMF එක කියනවාටත් වඩා වැඩියෙන් බදු ගහන එක. ඒක තමයි ලොකුම බිම් බෝම්බය. IMF එක කියනවා, ප්‍රාථමික ශේෂය සියයට 2.3 වුණාම ඇති කියලා. නමුත්, IMF එක සතුටු කරන්නට කටයුතු කිරීම තුළ, ජනතාවගේ කරපිට බදු බර පටවලා ඒක සියයට 5.4 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඇත්තවශයෙන්ම වර්තමාන රජය IMF එකේ සුවච කීකරු ගෝලබාලයෝ කොට්ඨාසයක් බවට පත් වීම ඉතාම කනගාටුදායකයි. මොකද, මේ අය විපක්ෂයේ ඉන්නකොට කථා කළේ නිර්ධන පන්තිය ගැන, දුප්පත් ජනතාව ගැන, සාමාන්‍ය ජනතාව ගැන. නමුත්, දැන් මේගොල්ලෝ අනුගමනය කරන්නේ IMF එකේ ඉලක්කවලටත් වැඩිය එහා ගිය ඉලක්කයක්. මම දන්නේ නැහැ, ඉලක්කයටත් එහා ලොකු ඉලක්කයකට ගියාම මේ රටේ ජීවන බර අඩු වෙනවාද කියලා. මොකද, රටේ ජීවන බර ප්‍රශ්නය, උද්ධමන ප්‍රශ්නය බොහොම ඉහළ මට්ටමකයි තිබෙන්නේ. හැබැයි, රජයේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කියනවා, එක පුද්ගලයෙකුට දින 30ක් ජීවත් වෙන්න රුපියල් 17,000ක් ඇතිලු. මේ වාගේ බොරු දත්ත මත පදනම් වෙලා කටයුතු කරන ආණ්ඩුව ඇත්තවශයෙන්ම ජනතාවට දිනපතාම බිම් බෝම්බ දමනවා, දිනපතාම ජන ජීවිත විනාශ කරනවා කියලා මම කියන්න කැමැතියි.

අද වනකොට දුප්පත්කම තුරන් කිරීමට කිසිම වැඩ පිළිවෙළක් නැහැ. දුප්පත්කම සියයට 30ත්, සියයට 40ත් අතර ප්‍රමාණයක් වෙනවා. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්ත කඩා වැටෙනවා. ඒ අයගේ ඉඩකඩම්, ඒ අයගේ දේපළ තරගෙට වෙන්දේසි වෙනවා. අද මේ රජය සූර්ය බලශක්තිය විනාශ කරන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවා. ඒ අයට ගෙවන්න ඕනෑ ගණන්

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ටික ගෙවන්නේ නැහැ. හැබැයි, ඉන්ධන මාෆියාවට ගෙවන්න තිබෙන ගණන් ටික ඉතාම ඉක්මනින් - high speed - ගෙවනවා. මේක තමයි රටේ තත්ත්වය.

ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට 13.9ක් වශයෙන් ප්‍රමාණවත් කියලා IMF එක කියනකොට, මොන පිස්සුවකටද ඒක සියයට 15.4 කරන්නට මේ රජය කටයුතු කරන්නේ; ඒ තරම් බදු ගහන්නේ? බදු බර පටවනකොට ව්‍යවසායකත්වය කඩාගෙන වැටෙනවා. කවුරුත් new businesses - startups - පටන් ගන්නේ නැහැ. ඒක සංචාරක ක්ෂේත්‍රයට බලපානවා, කෘෂිකාර්මික ක්ෂේත්‍රයට බලපානවා, සේවා ක්ෂේත්‍රයට බලපානවා, ස්වයං රැකියා ක්ෂේත්‍රයට බලපානවා. නූපන් දරුවාගේ ඉඳලා, ගර්භිණී මවගේ ඉඳලා ජන සමාජයේ සෑම පුරවැසියෙකුටම මේ බදු බර ඉතාම අසීමිත පීඩනයක්, අසහනයක් නිර්මාණය කරනවා. ඒක තමයි ඇත්ත කථාව.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන් තවත් කාරණයක් කියන්න කැමැතියි. IMF එකේ බදු ඉලක්කයටත් වඩා ගිහිල්ලා බදු ගහලා, බදු බර පටවලා, වැඩි බදු පටවලා, ජනතාවගේ හිස මත පීඩනය පටවලා කවදාවත් ඔබ පොරොන්දු වුණු "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" නිර්මාණය කරන්නට බැරි වෙයි කියන කාරණාව මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. මහ පොළොවේ පය ගහලා ජීවත් වෙන මේ රටේ ලක්ෂ 220ක් වූ ජනතාවට සත්‍යවාදී, යථාර්ථවාදී සේවාවක් කරන්නට රජයට දැන්වත් ප්‍රඥාව පහළ වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne. The Floor is yours and you have 12 minutes.

[පූ.භා. 11.45]

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය (ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன - வெகுசன ஊடக பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne - Deputy Minister of Mass Media)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරපු වාර්තාව ගැන විවාද කරන මේ අවස්ථාවේදී මට කලින් කථා කරපු විපක්ෂ නායකතුමාගේ කථාවේදී කියැවුණු කාරණා දෙකකට මා එකඟ වෙනවා. එකක් තමයි, මේ Report එකේ අතරින්පතර කියවන්නේ නැතිව ඔක්කෝම කියවන්න කියපු එක. මම හිතන විධියට ඒක හැමෝටම අදාළයි.

අනෙක් කාරණය තමයි, ලෝකයේ හැම තැනකම සයිබර් අපරාධ සිද්ධ වෙනවා කියන කාරණය එතුමා කිව්වා. ඔව්, මමත් ඒක කියන්න තමයි උත්සාහ කරන්නේ. මම අද උදේ කියෙව්වා, FBI ආයතනයේ Internet Crime Complaint Center කියන එකේ report එක. ලෝකය පුරා සිද්ධ වෙමින් යන අතිවිශාල ප්‍රමාණයක අන්තර්ජාල අපරාධ සහ ඒ හා බැඳුණු මුදල් වංචා ගැන එහි සාකච්ඡා කරනවා.

විශේෂයෙන් ඇමෙරිකාව 2024දී පමණක් ඩොලර් බිලියන 16ක වාර්තා ගැන කියනවා. එක්සත් රාජධානිය, එක්සත් ජනපදය සහ ඕස්ට්‍රේලියාව එකතු වෙලා මේ වෙනුවෙන්ම "Tri-lateral sanctions against bulletproof hosting services" නමින්, සමස්ත අහිමිවීම් පිළිබඳව ක්‍රියා කරන යන්ත්‍රණයක් හදලා තිබෙනවා. ඒ වාගේම, 2024 ඕස්ට්‍රේලියානු වාර්තාවක විතරක් එක් ගනුදෙනුවක් ගැන කියනවා, M&S එකේ ඩොලර් බිලියන 2.3ක් සයිබර් අපරාධ නිසා අහිමි වෙලා තිබෙනවා කියලා. ඉන්දියාවේත් මේ වාගේම සයිබර් අපරාධ අතිවිශාල ප්‍රමාණයක් සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සයිබර් අපරාධ කියන්නේ අද අලුතින් අපේ ලංකාවට විතරක් වෙන දෙයක් හෝ අලුත් දෙයක් නොවෙයි. මෙය ලෝකය පුරා තර්ජනයක් වෙමින් පවතින, රාජ්‍යයන්ට විශාල අභියෝගයක් වෙමින් පවතින නව තත්ත්වයක්. ලංකාව කුඩා රටක් ලෙස පළමු වතාවට මෙවැනි අතිවිශාල ප්‍රමාණයක සයිබර් අපරාධයක් අත් දැක්කාට, ලංකාවේ කාලයක් තිස්සේ පැවැතෙමින් තිබුණු පරිපාලනමය සහ ක්‍රියාපටිපාටික දුර්වලතා නිසා මේ අවස්ථාවේ විශාල අභියෝගයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා කියන එක තමයි මා ද සාමාජිකාවක ලෙස සිටින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා වුණේ.

මෙතැනදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වගකීම මොකක්ද? මට හිතෙන හැටියට විපක්ෂයට ඒ ගැන පැහැදිලි කරලා දෙන්න අවශ්‍යයි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව කියන්නේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවවත්, FBI එකවත් නොවෙයි - අපරාධ පරීක්ෂණ සිදු කරන යන්ත්‍රණයක් තිබෙන තැනක් නොවෙයි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඇත්තටම මෙම විශේෂ පරීක්ෂණය සහ ඒ කැඳවීම් කළේ, රජයේ මුදල් බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට වන නිසා ඒ සිදුවීම වටා පැවැති කාර්ය පටිපාටික අඩු ලුහුඬුකා හඳුනාගැනීම සඳහායි. මම ස්තුතිවන්ත වෙනවා එම කාරක සභාවේ ගරු සභාපතිතුමාට, මේ වාර්තාව අංග සම්පූර්ණව ලබා දෙන්න කටයුතු කළාට. ඒ වාගේම, අදාළ ගරු මන්ත්‍රීවරුන්ට සහ කාර්ය මණ්ඩලයටත් මම ස්තුතිවන්ත වෙන්න කැමැතියි, මේ පිළිබඳ අංග සම්පූර්ණ වාර්තාවක් ලබා දෙන්න සහාය ලබා දුන්නාට.

මේ කියන සයිබර් අපරාධය ඇති වුණේ කොයි කාලයේද? 2025 නොවැම්බර් සිට මෙවැනි අපරාධයක් වී ඇතැයි 2026 මාර්තුවලදී අනාවරණය කර ගැනීම දක්වා කාලය තුළ ඇත්තටම ලංකාවේ තිබුණේ ණය ගෙවීම පිළිබඳ සංක්‍රාන්තික කාලයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, 2024 ජූනි මාසයේදී 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත - Public Debt Management Act- ආවාම, මීට කලින් දශක ගණනාවක් ලංකාවේ ණය ගෙවීම සම්බන්ධව වගකීම තිබුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වාගේම මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවත් මේකට සම්බන්ධ වුණා. මෙසේ ආයතන කිහිපයකට තිබුණු ණය ගෙවීම පිළිබඳ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය -PDMO- වෙත පැවරීමක් තමයි සිදු වුණේ. එතැනදී මේ ණය ගෙවීමේ කාර්යය යම් විධියකට සංක්‍රාන්තික කාලයක තමයි පැවැතුණේ.

එහිදී සාමාන්‍යයෙන් කෙරුණු ක්‍රමවේදය මේකයි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව - Department of External Resources -ERD - ණය හිමියන්ගෙන් invoices ලබාගෙන ඒවා ණය කළමනාකරණ අංශයට දාලා ඒවා verify කර ගැනීම ආදියට අදාළ ක්‍රියාවලිය සිදු කරනවා. ඊට පසුව, ඒ අනුමත කළ invoices ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත යොමු වුණා. ඊට පසුව, ඒ සෑම ගෙවීමකටම අවශ්‍ය ගෙවීම් තොරතුරු

ඇති බවට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් දෙපාර්තමේන්තුව විසින් verify කරගෙන තමයි, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුමේ තැන්පත් කර තිබෙන විදේශ විනිමය භාවිත කර ඒ මුදල් ගෙවීම සිදු වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා මේ සම්පූර්ණ ණය ගෙවීමේ කර්තව්‍යය තුළ විවිධ අංශ යම් ආකාරයකින් මැදිහත් වෙලා තිබුණා කියා. එහිදී පාවිච්චි කරපු අන්තර්ජාල මෘදුකාංග -software, invoices සත්‍යාපනය -verify- කර ගැනීමේ කාර්ය පටිපාටිය, මුදල් ගෙවීමෙන් පසු අපි ඒක තහවුරු කර ගන්නේ කොහොමද යනාදි විශේෂ කාර්ය පටිපාටි ගණනාවක් කාලයක් තිස්සේ establish වෙලා තිබුණා. නමුත් මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ, ඒ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට -PDMO එකට- පැවරුණාට, මේ ක්‍රියාවලිය -process එක- ඒ කියන්නේ මෙච්චර කාලයක් ණය ගෙවීමේ කර්තව්‍ය සිදු කරපු process එක කිසිසේත් වෙනස් වෙලා තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ process එක තමයි දිගටම පාවිච්චි කරපු process එක. ඉතින්, ඒ process එක සිදු වන අතරේ ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අවස්ථා තුනකදී PDMO එකේ නිලධාරින් මෙන්න මේ කියන මාස 18 සංක්‍රාන්ති කාලය තුළ පුහුණු කරමින් ගියා. ඒ වාගේම, ඒ පුහුණු කාලය අතරතුර in-service training එකක් තමයි ලබා දුන්නේ. ක්‍රමයෙන් තමයි ඒ වගකීම් පැවරුණේ. උදාහරණයක් හැටියට කිව්වොත්, 2025 මාර්තු මාසයේ තමයි ණය පුහුණු කිරීම් ආරම්භ කළේ. 2025 ඔක්තෝබර්වල එහි මෙහෙයුම් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත භාර දෙනවා. ඔක්තෝබර් මාසයේ විදේශ ණය පද්ධති සඳහා PDMO එකට access එක අරගෙන දෙනවා. ඒ වාගේම 2025 දෙසැම්බර් 31 තමයි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව නිල වශයෙන් වසා දමන්නේ. නමුත්, 2026 මැයි 22 තමයි, අර සංක්‍රාන්තික මාස 18ක කාලය නිල වශයෙන් අවසන් වන්නේ. ඒ කියන්නේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරපු වගකීම් තාක්ෂණිකව අවසන් වෙලා තිබුණත්, නිල වශයෙන් අවසන් කළ බවට ගැසට් එක එන්නේ 2026 මැයි 22. එම නිසා, ණය ගෙවීම සම්බන්ධව, විශේෂයෙන් විදේශ ණය ගෙවීම සම්බන්ධව, අන්තර්ජාල අපරාධ සම්බන්ධව, අන්තර්ජාල වංචා සම්බන්ධව මනා පුහුණුවක් සහ දැනුමක් තිබූ ශ්‍රී ලංකා මහ බැංකුව ඒ පිළිබඳ සැකයක් පැමිණි අවස්ථාවේ කිසියම් හෙයකින් තව ටිකක් vigilant වුණා නම්, එය වළක්වා ගැනීමේ හැකියාවක් තිබුණා කියලා අපි හිතනවා. කොහොම වුණත්, ඒක සිද්ධ වුණේ නැහැ. මෙන්න මේ process එකේ තිබෙන අඩු පාඩු නිසා තාක්ෂණිකව ගැටලුවක් ඇති වෙනවා කියන එක පිළිබඳව අපි මුදල් කමිටුවේදී විශාල වශයෙන් සාකච්ඡා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය සිදු වුණාටත් වඩා වැදගත්ම දේ තමයි, මේක සිදු වුණාට පස්සේ මොනවාද කළේ කියන එක. මොකද, මේ පිළිබඳව අපරාධ පරීක්ෂණයක් කරලා වාගේ මේකේ අවසන් වගකීම මහා භාණ්ඩාගාරයේ ලේකම් දැරිය යුතුයි, එහෙම නැත්නම් ඇමතිතුමා දැරිය යුතුයි කියලා කියන්න මෙතැනදී දිගින් දිගටම උත්සාහ කරනවා. එහෙම දෙයක් නොවෙයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සිද්ධ වුණේ. එහිදී සිද්ධ වුණේ මේ process එකේ අඩු පාඩු හඳුනා ගැනීමක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය දැනගත් පසුව අපි මොනවාද කළේ? 2026 ජනවාරි 09 සහ 2026 මාර්තු 07 යන දිනවල SLCERT එකට e-mails යවලා තිබුණා. ඒ වාගේම, 2026 මාර්තු 24වන දින ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර කණ්ඩායම් වෙත ලිපියක් යොමු කරමින් ඒ පිළිබඳව දැනුම් දුන්නා. ඒ වාගේම, මූල්‍ය බුද්ධි ඒකකයටත් අවශ්‍ය පරිදි ඒ තොරතුරු දැනුම් දීලා තිබෙනවා. එමෙන්ම, 2026 මාර්තු 24වන දින මේ වංචනික අපරාධයට සම්බන්ධ වූ ගෙවීම් පිළිබඳව සොයන්න තාක්ෂණික විමර්ශන කමිටුවක් වහාම පත් කළා. මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ඒ.එන්. හපුගල මහතා සහ තවත් නිලධාරි කණ්ඩායමකින් සමන්විතව පත් කළ කමිටුව විසින් මූලික විමර්ශනයක් සිදු කිරීමෙන් පසුව 2026 අප්‍රේල් 10 දින විමර්ශන වාර්තාව ඉදිරිපත් කළා. ඒ අනුව තමයි ඒ නිලධාරින් 4දෙනාගේ වැඩ තහනම් කළේ. ඇත්තටම මෙතැනදී විපක්ෂයේ සමහරු කියන්න උත්සාහ කරනවා, එම නිලධාරින් 4දෙනා ඒ වැරැද්දට අල්ලලා ආණ්ඩුව නිදහස් වෙන්න හදනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම එකක් නොවෙයි ඇත්තටම සිද්ධ වුණේ. ඔවුන්ට ඒ පරිගණක පද්ධති වෙත ප්‍රවේශය තිබුණු නිසා ඒ පරීක්ෂණය අවසන් වන තෙක් ඔවුන්ගේ වැඩ තහනම් කිරීමයි සිද්ධ වුණේ. ඇත්තටම අපි බලවත් ලෙස කනගාටු වෙනවා, සිය දිවි හානි කර ගත් ඒ නිලධාරි මහත්මයා ගැන. ඒක කිසිසේත් නොවිය යුතු දෙයක් කියලායි මා හිතන්නේ. එම නිසා ඒ සම්බන්ධයෙන් අපේ කනගාටුව පළ කරනවා.

ඒ වාගේම එයින් පසුව මොනවාද කළේ? මොකද, අපේ වාර්තාව තුළින් අපි බලවත් ලෙස නිර්දේශ කරන්නේ, මේ ක්‍රියාවලිය යථාවත් කරන්න, process එක හරියට හදන්න කියන එකයි. ඇත්තටම මේකෙන් පස්සේ ණය සේවාකරණය -debt servicing- සම්බන්ධයෙන් ණය හිමියන් සමඟ තිබෙන coordination part එක දැන් සම්පූර්ණයෙන්ම PDMO එකට අරගෙන තිබෙනවා. ඒ වාගේම විධිමත් සන්නිවේදන මාර්ග ස්ථාපනය කරලා අවම වශයෙන් dual verification එකක්, ඒ කියන්නේ දෙපැත්තකින් verify කර ගන්න පුළුවන් ක්‍රමයක් දැන් හදලා තිබෙනවා. ඒ වාගේම පළමු ගෙවීමට අවම වශයෙන් දින 10කට පෙර මාසික ණය සේවාකරණ පුරෝකථනය ගෙවීම් අනුමැතිය සඳහා ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, you have two minutes left.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
Thank you, Hon. Deputy Speaker.

ඒ වාගේම, බැංකු තොරතුරු නිසි අවසරය සහිතව - ඒ කියන්නේ ගෙවන්න තිබෙන account numbers වෙනස් කරන්න තිබෙන හැකියාව පිළිබඳව ලොකු අඩු පාඩුවක් අපි දැක්කා - එය නිසි අවසරයකින් සහ verification එකකින් තොරව වෙනස් කරන්න බැහැ කියන එක දැන් තහවුරු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැදගත්ම කාරණය තමයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහායත් ලබාගෙන, ඒ වාගේම SLCERT එකත් එක්ක එකතු වෙලා එය දැන් යථාවත් කරමින් තිබෙනවා. 2016දී තමයි ඒ පද්ධතිය -ඒ software එක- expire වෙලා තිබෙන්නේ.

ඒක දැන් යථාවත් කරමින් ශක්තිමත් මෘදුකාංග පද්ධතියක් හදන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මුදල් අමාත්‍යාංශය සහ PDMO එක විසින් අවශ්‍ය පියවර දැන් ගනිමින් ඉන්නවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ වාගේ අපරාධ ඉදිරියේදී වළක්වා ගන්න හැකියාව ලැබෙයි කියලා. ඒ වාගේම ගෙවීමක් කළ වහාම ඉතාම ඉක්මනින් කුවිතාන්සිය ලබා ගැනීමේ ක්‍රමයේත් අඩුපාඩු අපි දැක්කා. ඒ සඳහාත් පියවර ගනිමින් ඉන්නවා. ගොඩක් අය අහනවා, මෙතැනදී තාක්ෂණික වශයෙන් ණය ගෙවීම පැහැර

[ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය]

හැරීමක් - technical default - සිද්ධ වෙලා තිබෙනවාද කියලා. මම අවධාරණය කරනවා, එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ කියලා. මොකද, අපි ණය ගෙවලා තිබෙනවා. මේ සිදුවීම වූ වහාම Embassy එක හරහා ණය හිමියා සමඟ සම්බන්ධතාව පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. ඊළඟ ණය වාරිකය ජූනි මාසයේදී ගෙවන්න තිබුණා. අපි එම ණය හිමියාටම එය ගෙවා තිබෙනවා. ඒ නිසා තාක්ෂණික වශයෙන් ණය පැහැර හැරීමක් - technical default - මෙතැනදී සිදුවෙලා නැහැ කියන එක මම අවධාරණය කරන්න කැමැතියි.

සමහරු කියනවා, IMF එක සතුටු කරන්න අපි වැඩ කරනවා කියලා. IMF එක සතුටු කරන්න නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි අපි වැඩ කරන්නේ. අපි වැඩ කරන්නේ අපේ රටේ ජනතාව වෙනුවෙන්. අපේ රටේ ජනතාව අපට වගකීමක් දීලා තිබෙනවා, දැඩි ලෙස බංකොලොත් වෙච්ච ආර්ථිකය, රට හදලා ගන්න කියලා. ඒ වෙනුවෙන් තමයි අපි වැඩ කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne, you have exhausted your time.

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) கௌஷல்யா ஆரியரத்ன)
(The Hon. (Dr.) (Ms.) Kaushalya Ariyarathne)
I will wind up, Hon. Deputy Speaker.

2015-2019 කාලයේ තමයි ලංකාව වැඩිම පොලී සහිත ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රමාණයක් අරගෙන තිබෙන්නේ. ඒ, ඩොලර් බිලියන 12.5ක්. ඒ නිසා යහපාලන ආණ්ඩුව අපට ණය ගැන කියලා දෙනකොට අපට ඒකත් මතක් කරන්න සිද්ධ වෙනවා. එහෙම නම් මගේ කථාව මෙයින් අවසන් කරන්නම්. මම නැවතත් අවධාරණය කරන්නේ, අපි දීර්ඝ කාලීනව අපේ ආර්ථිකය ශක්තිමත් කරමින්, ණය බරක් නොදරන ලෝකයේ ධනවත්, දියුණු වෙන රටක් බවට ලංකාව පත් කරන්න අපි මේ වෙනකොට සියලු කටයුතු කරගෙන යමින් තිබෙනවා කියලායි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chathura Galappaththi. You have 12 minutes to speak on the ongoing Adjournment Debate.

[පූ.භා. 11.58]

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව මඟින් පාර්ලිමේන්තුවට සපයා ඇති වාර්තාව පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ ඒ සඳහා අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මේ මොහොත වන විට ආණ්ඩුවට අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. ආණ්ඩුව බලයට එන්න කලින් ජනතාවට පොරොන්දු ගණනාවක් ලබා දුන්නා. විශේෂයෙන්ම මේ රටේ ගෘහිණියට, තරුණයාට, ගොවියාට, ධීවරයාට වාගේම රාජ්‍ය සේවකයා ඇතුළු සමස්ත ජනතාවටම විශාල බලාපොරොත්තු ප්‍රමාණයක් ලබා දීලා මේ මොහොත වන විට ඒ කිසි දෙයක් ඉටු කරගන්න බැරිවීම නිසා මේ ආණ්ඩුව පව ආණ්ඩුවක් විධියට මේ රටේ ජනතාව හඳුන්වන්න කටයුතු කර තිබෙනවා. පව මදිවට හොරු ඉන්න ආණ්ඩුවක් බවටත් මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ලංකා ඉතිහාසයේ සිද්ධ වුණු අති දැවැන්ත - මහා පරිමාණ - වංචා, දූෂණ ගැන මේ වෙනකොට හෙළිවෙමින් තිබෙනවා.

උදාහරණ විධියට ගත්තොත්, කන්ටේනර් 323 සිද්ධිය, බාල ගල්අඟුරු වංචාව, අද සාකච්ඡාවට භාජන කරන භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5ක් අතුරුදහන්වීම - ලංකාවේ මුදලින් ගත්තොත් රුපියල් කෝටි 70කට වඩා වැඩි මුදලක් - තැපෑලේ ඩොලර් ලක්ෂ 6ක මුදලක් අතුරුදහන් වීම - ලංකාවේ මුදලින් ගත්තොත් කෝටි 18කට වඩා වැඩි මුදලක් - වාගේම RDA එකෙන් රුපියල් කෝටි 51කට වඩා වැඩි මුදලක් ගෙවීමේ සිද්ධි ගන්න පුළුවන්. මේ ආකාරයට මේ ආණ්ඩුවේ කෙරුවාව හෙළිවෙමින් තිබෙනවා. මේ සියල්ල අතරේ අද සාකච්ඡාවට භාජන වෙන්නේ භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5ක අතුරුදහන් වීම පිළිබඳවයි.

වර්තමාන රජය පවසන විධියට මේ කාරණාව ඔවුන් දැනගන්නේ 2026 මාර්තු 23වැනි දා. හැබැයි, අපේ විපක්ෂය විසින් මේ කාරණය රටට, පාර්ලිමේන්තුවට හෙළි කරනතුරු දැනගන්න ලැබුණේ නැහැ. මේ රටේ මුදල් සම්බන්ධ වගකීම තිබෙන මේ පාර්ලිමේන්තුව ඇතුළු මේ රටේ ජනතාවට මේ සම්බන්ධව දැනගන්න ලැබෙන්නේ 2026 අප්‍රේල් 22වැනි දා. මාසයක් වාගේ කාලයක් මේක මේ රටේ ජනතාවට වසන් කරනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කියනවා, මේ පිළිබඳව දැනුවත් නොකළේ පරීක්ෂණ කරනවා කියලා දැනගත්තොත් මේක කරපු හැකර්වරු හංගෙන්න ඉඩ තිබෙනවා කියලා. ඒ වාගේ විහිළු සහගත ප්‍රකාශයක් කළා. ඉතින් එතුමාගේ දැනුම් මට්ටම පිළිබඳව අපට ගැටලුවක් තිබෙනවා. වර්තමාන රජය මේ කාරණාව වෙච්ච වෙලාවේ ඉඳන්ම මේක හැකර්වරුන්ගේ සිද්ධියක් විධියට තමයි හංවඩු ගහන්න හදන්නේ.

හැබැයි, හැකර්වරයෙක් කියන්නේ කවුද? හැකර්වරයෙක් කියන්නේ යම් system එකකට අනවසරයෙන් ඇතුළු වෙලා එහි තිබෙන data වෙනස් කරන, එක්කෝ data හොරා ගන්න, එහෙමත් නැත්නම් ඒ මුදල් වෙන account එකකට transfer කරන කෙනෙක්.

අන්න ඒවාගේ කටයුත්තක් තමයි හැකර්වරයෙක් කරන්නේ. නමුත් මේ සිද්ධිය ගත්තොත්, මෙතැන හැකර්වරයෙකුගේ එහෙම ක්‍රියාදාමයක් වෙලා නැහැ. ඉතින් හැකර්වරයෙකුටත් අවනම්බුවක් මේ කියන කාරණාව. මේකේ ඇත්ත සිද්ධිය ගත්තොත්, මෙතැන වෙලා තිබෙන්නේ ව්‍යාජ ලෙස පෙනී සිටීමක්. ව්‍යාජ ලෙස පෙනී සිටීමක් මහා cybercrime එකක් විධියට පෙන්වන්න හදනවා.

මෙතැන වෙලා තිබෙන්නේ මොකක්ද? එක පැත්තක ලංකාවේ මහ භාණ්ඩාගාරය තිබෙනවා. අනෙක් පැත්තෙන් ඕස්ට්‍රේලියානු සමාගම තිබෙනවා. ඒ අතර, අතරමැදියෙක් ඉඳගෙන ඔහු ඕස්ට්‍රේලියානු සමාගම විධියට භාණ්ඩාගාරයේ අය ඉදිරියේ පෙනී ඉන්නවා. ඕස්ට්‍රේලියානු සමාගමට ඔහු ශ්‍රී ලංකා භාණ්ඩාගාරයේ කෙනෙකු විධියට පෙනී ඉන්නවා. මෙතැන තිබෙන්නේ email ගනුදෙනුවක්. එහෙම නැතිව system එකට ඇතුළුවෙලා hack කරපු කථාවක් නොවෙයි. Email ගනුදෙනුවක්

හරහා ඔහුගේ ගිණුම්වලට දසවතාවක් මුදල් දමාගන්නකම් මේ රටේ ආණ්ඩුව බලාගෙන ඉඳලා තිබෙනවා. ඇත්තටම ආණ්ඩුව ලජ්ජා වෙන්න ඕනෑ මේ කාරණාවට. හැකර්වරු ගැන කියනවා නම්, මේ ආණ්ඩුව ඇවිල්ලා දවස් කිහිපයක් යන්න කලින් මේ රටේ රාජ්‍ය ආයතන ගණනාවක් hack කළා. උදාහරණයක් විධියට පසුගිය අවුරුද්දේ විතරක් Pensions Department එක hack කළා; National Water Supply and Drainage Board එකේ SMS portal එක hack කළා; මේ රටේ බැංකු ගණනාවක් hack කළා. ඒවා තමයි, "hacking" කියන්නේ. නමුත් මෙතැන, "hacking" එකක් වෙලා නැහැ. මෙතැන තිබෙන්නේ ව්‍යාජ ලෙස පෙනී සිටීමක්. මේ ආණ්ඩුව නිතරම උත්සාහ කරනවා මේක මහා සයිබර් අපරාධයක් විධියට හුවා දක්වන්න. මේක ආණ්ඩුවේ දුර්වලතාවක්.

ඒ වාගේම මීට පෙර මේ කාරණාව ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරනකොට මේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා මේක බොහොම සැහැල්ලුවට ගත්තා. එතුමන්ලා කිව්වා මේ වාගේ දේවල් වෙලා තිබෙනවා, මේවා අතීතයේත් වෙලා තිබෙනවා, ඉදිරියේදීත් වෙයි කියලා. නමුත් මේක පළමුවෙනි වතාවට වෙච්ච දෙයක්. මම ආණ්ඩුවට අභියෝග කරනවා, මේ වාගේ කාරණාවක් මීට පෙර ශ්‍රී ලංකාවේ භාණ්ඩාගාරය තුළ වෙලා නැහැ කියලා. උදාහරණයක් විධියට ද්විපාර්ශ්වයක් අතර ගිවිසුමක් ගහලා ණය ගත්තාම, අදාළ පාර්ශ්වය ණය ගෙවන්නේ නැත්නම් ඒ පාර්ශ්වය දැනුවත් නොකර ඉන්නේ නැහැ නේ. "ලංකාව පව්, මේක තියාගන්න" කියලා කියන්නේ නැහැ නේ. අද ආණ්ඩුවේ ඇතැම් අය උත්සාහ කරනවා, මේවා ඉස්සරත් වෙලා තිබෙනවා කියලා සාමාන්‍ය දෙයක් විධියට හුවා දක්වන්න. නමුත් ලංකාවේ පළමුවැනි වතාවට තමයි මේවාගේ දෙයක් වෙලා තිබෙන්නේ.

ඒ වාගේම ලංකාවේ පළමුවැනි වතාවට තමයි භාණ්ඩාගාරයේ ලේකම්වරයා හැටියට දේශපාලනඥයෙක් පත් කරන්නේ. මීට පෙර භාණ්ඩාගාරයේ ලේකම්වරු විධියට පත් කළේ කවුද? මහ බැංකුවේ සිටි අධිපතිවරු, නියෝජ්‍ය අධිපතිවරු, ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, රාජ්‍ය පරිපාලන සේවයේ ඉන්න ආර්ථික විද්‍යාව පිළිබඳ ඉහළ මට්ටමේ අය තමයි මේ තනතුරට පත් කළේ. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට මේ ආණ්ඩුව දේශපාලනඥයෙක් පත් කරනවා භාණ්ඩාගාරයේ ලේකම් විධියට. ඒ නිසා මොකක්ද වුණේ? මේ රජයට අවස්ථා ගණනාවකදී මේ අනතුර අඟවා තිබෙනවා.

ආණ්ඩු පාර්ශ්වය මොනවා කිව්වත්, මේ කාරණාව පිළිබඳව අනතුරු ඇඟවීම් තුනක් කරනවා. පළමුවැනි එක තමයි 2025 නොවැම්බර් මාසයේ මේ මුදල් Dubai account එකකටයි, USA account එකකටයි දමන්න යනකොට මහ බැංකුවේ මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් යම් අනතුරු ඇඟවීමක් කරනවා, සැකයක් පළ කරනවා. ඒක තමයි පළමුවැනි කාරණාව. දෙවැනි එක, 2026 ජනවාරි 06වැනි දා ඉන්දියාවේ Exim Bank එකට කරන ගනුදෙනුවේදී ඉන්දියාවෙන් ලංකාව දැනුවත් කරනවා, මෙන්න මේවාගේ දෙයක් වෙන්න යනවා කියලා. මේ සේරටම කලින් රාජ්‍ය ආයතනවල තිබෙන outdated systems නිසා වෙන්න පුළුවන් අනතුරු ගැන SLCERT එක මේ රාජ්‍ය ආයතන දැනුවත් කරලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තුළ තමයි මේ වාගේ කරණා සිද්ධ වෙලා තිබෙන්නේ.

මේ email server එක ගැන මෙතුමන්ලා කිව්වා. ඔව්, අපේ ආණ්ඩුව වෙලාවේ තමයි ඒ email server එක දාලා තිබෙන්නේ. ඒ කියන්නේ 2016 වර්ෂයේ තමයි Microsoft Exchange Server එක දාලා තිබෙන්නේ. මේ ආණ්ඩුව ඇවිල්ලා මේ ගනුදෙනුව වෙන්න මාසයකට කලින් තමයි ඒ security updates service ගිවිසුම අවසන් වෙලා තිබෙන්නේ. මේ ගැන alert එකක් තිබෙනවා නම්, අඩුම තරමේ මේ ගැන දැනුමක් තිබෙනවා නම් ඔබතුමන්ලා ඒ ගිවිසුම දීර්ඝ කරගන්න හරි කටයුතු කරන්න ඕනෑ. අද ගෙදරක තිබෙන lap top එකක් ගත්තත්, සාමාන්‍ය පොඩි එක්කෙනෙක් පවා ඒක up to date තියාගන්නවා. ඉතින්, භාණ්ඩාගාරයක මේවාගේ දෙයක් වීම විහිළුසහගත දෙයක්.

ඒ විතරක් නොවෙයි, අවම ආරක්ෂිත පියවර අනුවවත් කටයුතු කරලා නැහැ. උදාහරණයක් විධියට අපේ Facebook account එකක් ගත්තොත්, එහෙම නැත්නම් Gmail account එකක් ගත්තොත් two-factor authentication එකක් තිබෙනවා. ඒ කියන්නේ දෙවතාවක් නිවැරදි ද කියලා බලනවා. Facebook මෙන්ම emailවලත් එහෙම තිබියදී මේවාගේ ආයතනයක එවැනි අවම දෙයක්වත් නැහැ.

අඩුම තරමේ, multi-factor authentication එකක්වත් තිබුණේ නැහැ. ඒ තරම් කොච්චර දුර්වල කටයුත්තකද නියැළිලා තිබෙන්නේ? මේ වාගේ කාරණා ගොඩාක් තිබෙනවා. තොරතුරු තහවුරු නොකිරීම, email domain එක පරීක්ෂා නොකිරීම ආදී වශයෙන් කාරණා ගොඩාක් තිබෙනවා.

මේ ආණ්ඩුව එනකොටම ඩිජිටල්කරණය ගැන වැඩි අවධානයක් යොමු කළා. Budget එකෙන් වැඩිම මුදල ඩිජිටල්කරණය සඳහා වෙන් කරලා තිබෙනවා. ගිය අවුරුද්දේත් වෙන් කළා. හැබැයි, ඒ මුදල්වලින් සැලකිය යුතු ගණනක් ආපස්සට භාණ්ඩාගාරයට ගියා. මේ අවුරුද්දේ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට විශාල මුදලක් වෙන් කළා. එයින් කොච්චර මුදලක් වියදම් කරලා තිබෙනවාද කියලා මම අහනවා. දැන් අවුරුද්දෙන් භාගයක් විතර ගෙවිලා තිබෙනවා. සියයට 20ක්වත් වියදම් කරලා නැහැ. මේ system එක update කරලත් නැහැ. පම්පෝරි ගහනවා. නමුත් ආර්ථික මර්මස්ථානයක් වාගේ තිබෙන භාණ්ඩාගාරයේ system එක update කරන්නේ නැතුව මොන ඩිජිටල්කරණයක්ද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේකේ පැහැදිලි වෙන ප්‍රධාන කාරණාවක් තිබෙනවා. මේගොල්ලන් මේක තාක්ෂණික දුර්වලතාවක් විධියට කොච්චර හඳුන්වන්න උත්සාහ කළත්, වගකිව යුත්තන්ගේ නොසැලකිල්ල තමයි මේකට හේතු වුණු ප්‍රධානම කාරණාව. විශේෂයෙන්ම මේ කාරණය ගැන මම මෙතැනදී කියන්න ඕනෑ. මේ කාරණාව සම්බන්ධයෙන් මීට පෙර සභා වාරයකදී මා විසින් අසන ලද සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයකට ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමා පිළිතුරු දුන්නා. මේ අවස්ථාවේදී මම එය **සභාගත*** කරනවා.

මොකද, මට කාලය ප්‍රමාණවත් නැහැ, මෙහි තිබෙන කාරණා පැහැදිලි කරන්න. මෙහි තිබෙන කාරණා පැහැදිලි කළොත්, විශේෂයෙන්ම මේ කියන කතන්දරය සම්පූර්ණයෙන්ම වෙනස්. උදාහරණයක් විධියට මට කලින් කථා කරපු ගරු කෞශල්‍යා ආරියරත්න නියෝජ්‍ය ඇමතිතුමිය කිව්වා, මේ සිද්ධිය වුණාට පස්සේ ගත්ත ක්‍රියාමාර්ග ගැන හිතන්න කියලා. එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. රාජ්‍ය සේවකයෝ ඇතුළු මේ සියලුදෙනාම කටයුතු කරන්න ඕනෑ මුදල් රෙගුලාසිවලට අනුව. මෙහිදී මුදල් රෙගුලාසි අමු-අමුවේ උල්ලංඝනය කරලා තිබෙනවා. මේ වාගේ කටයුත්තක් සිදු වුණාම සාමාන්‍යයෙන් කරන්න ඕනෑ පළමුවැනි දේ තමයි ඒ සම්බන්ධයෙන් කමිටුවක් පත් කරන එක. ඒක කරන්න ඕනෑ කවුද? ප්‍රධාන වගකීම් දරන නිලධාරියා. ඒ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චතුර ගලප්පත්ති මහතා]

කියන්නේ භාණ්ඩාගාර ලේකම්තුමා. කමිටුවක් පත් කරලා සතියක් ඇතුළත ප්‍රාරම්භක වාර්තාවක් හදන්න ඕනෑ. මාස තුනක් ඇතුළත පූර්ණ වාර්තාවක් දෙන්න ඕනෑ. මේ භාණ්ඩාගාර ලේකම්තුමා ඔය කියන කාරණා කිසි දෙයක් කරලා නැහැ. එතුමා තමයි ප්‍රධාන ගණන් දීමේ නිලධාරිතුමා. මුදල් රෙගුලාසි ගැන කිසිම තැකීමක් නැතුව තමයි කටයුතු කරලා තිබෙන්නේ. දැන් මෙතුමන්ලා කියනවා, technical committee එකක් පත් කළාලු. Technical committee එකක් ගැන මුදල් රෙගුලාසිවල සඳහන් කරලා නැහැ. මුදල් රෙගුලාසිවල තිබෙන්නේ, "පූර්ණ වාර්තාවක් ලබා දීම සඳහා කමිටුවක්" කියලා. Technical වාර්තාවක් සහ පූර්ණ වාර්තාවක් කියන්නේ දෙකක්. මේක තේරුම් ගන්න බැරි නිලධාරි කණ්ඩායමක් තමයි ඉන්නේ.

මුදල් රෙගුලාසි අමු-අමුවේ කැඩීම නිසා විශේෂයෙන්ම මෙන්න මේ කාරණාවලට යටත් වෙනවා. යම් නිලධාරි කණ්ඩායමකගේ වැඩ තහනම් කළා. ඒ, මධ්‍යම ප්‍රමාණයේ නිලධාරින්. හැබැයි, ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම්ට මඟ හරින්න බැහැ. මුදල් රෙගුලාසි 155හි ඒක පැහැදිලිව කියනවා. විගණන විමසුම් කියන ඡේදය කියවලා බැලුවොත් ඒකේ තිබෙනවා, "විගණකාධිපතිවරයා විසින් ගිණුම් පරීක්ෂා කරනු ලබන්නේ වී නමුත් එම ගිණුම්වල නිරවද්‍යතාව සහ දෝෂ විරහිතභාවය සම්බන්ධ වගකීම සම්පූර්ණයෙන් රඳා පවතින්නේ අදාළ ගණන් දීමේ නිලධාරියා කෙරෙහි බව පැහැදිලිවම තේරුම් ගත යුතුය" කියලා. මේ කියන්නේ මුදල් රෙගුලාසිවල 155 - විගණන විමසුම් යටතේ. ඒ නිසා මේ කොහෙන්වත් එතුමාට ගැලවිල්ලක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Chathura Galappaththi, your time is up now.

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ අනුව විශේෂයෙන්ම විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති XLVIII වන පරිච්ඡේදයට අනුව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා හෙවත් අමාත්‍යාංශ ලේකම්වරයා බරපතළ ලෙස රජයේ විෂමාචාරයක් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 1992 මාර්තු 03වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/92ට අනුකූලව විනය තීන්දුවක් ගතයුතු වන බවට මම යෝජනා කරනවා. ඒ වාගේම ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 31:1:10ට අනුව අමාත්‍යාංශ ලේකම් හෙවත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා රාජ්‍ය සේවය අපකීර්තියට පත් කරන අයුරින් මෙම කටයුතු කර තිබෙන බව පැහැදිලියි. ඒ වාගේම ජනාධිපතිතුමා, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්, රාජ්‍ය නිලධාරින් මේ සියලු දෙනාගේ තනතුරු බලාත්මක වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන උපලේඛනයට අනුව දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දීමෙන් අනතුරුව බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කරනවා. ඒ අනුව මම ඉදිරිපත් කරපු මේ ක්‍රියාවලිය විධිමත්ව සිදු වී නැත්නම් අමාත්‍යාංශ ලේකම්වරයාට එරෙහිව මා සඳහන් කළ විනය තීන්දු ගත යුතුයි. එසේ නොගන්නේ නම් මුදල් අමාත්‍යවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4වන උපලේඛනයේ සඳහන් දිවුරුම හෝ ප්‍රතිඥාව කඩ කර ඇති බව පැහැදිලියි.

ඒ නිසා මුදල් අමාත්‍යවරයා අනිවාර්යයෙන්ම මුදල් ඇමති ධුරයෙන් අයින් විය යුතුයි. ඒක තමයි මම මේ කියන්නේ. මේ මගේ අදහසක් නොවෙයි. මේ රටේ නීතියයි, මම මේ කථා කරන්නේ. ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න. මොකද, මම මෙතැනදී නීතියට පිටින් කිසිම වචනයක් කථා කළේ නැහැ. අල්ලපු රට වන ඉන්දියාව ගත්තොත්, ඉන්දියාවේ විභාග ප්‍රශ්න පත්‍රයක් එළියට ගිය නිසා අධ්‍යාපන ඇමතිතුමා අයින් වුණා. හැබැයි, මේ රටේ සිද්ධ වුණු දේවල් ගත්තොත්, කන්ටේනර් 323ක් එළියට ගියා, ඇමතිතුමා ඉන්නවා. බාල ගල් අඟුරු ප්‍රශ්නයක් තිබුණා, ඇමතිතුමා ඉන්නවා. බන්ධනාගාරයේ 30දෙනෙක් මැරුණා, ඇමතිතුමා ඉන්නවා. "දිට්වා" සුළි කුණාටුවෙන් පාස්කු ප්‍රහාරය අවස්ථාවට වඩා මිනිස්සු ප්‍රමාණයක් නැති වුණා. ඒවාට වග කියන්න ඕනෑ ඇමතිවරු ඉන්නවා. ජනාධිපතිතුමාත් ඒ විධියටම ඉන්නවා. ඉන්දියාවේ එහෙම වුණාට, ලංකාවේ එහෙම වෙන්නේ නැති එකයි ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Wasantha Samarasinghe. You have 14 minutes.

[අ.භා. 12.11]

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 නොවැම්බර් මාසයේ භාණ්ඩාගාරය විසින් ඕස්ට්‍රේලියාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක ණය මුදලක් ගෙවීමේදී ඇති වූ ගැටලුව සම්බන්ධයෙන් තමයි අද දවසේ විපක්ෂය විසින් මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ යෝජනාව ඉදිරිපත් කරද්දී යෝජනාව වෙනුවෙන් අදහස් දක්වපු ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විවිධ අදහස් කියන්න උත්සාහ කළා. විපක්ෂයේ මන්ත්‍රීවරු කියන්නේ මුදල් අමාත්‍යතුමාත් ඉල්ලා අස් වෙන්න ඕනෑ කියලායි. මුදල් ලේකම්තුමාත් ඉල්ලා අස් වෙන්න ඕනෑ කියලායි. හැබැයි, මේ කමිටුවේ වාර්තාවක් තිබෙනවා. ඒ කමිටුවේ නිර්දේශ තිබෙනවා. ඒකේ එහෙම මොනවාවත් කියලා නැහැ නේ. පාර්ලිමේන්තුවේ මුදල් පනත් පිළිබඳව විමර්ශනය කරන ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් යුතුව තිබෙන කමිටුව විසින් මේ පිළිබඳ නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිර්දේශ ගණනාවක් ඉදිරිපත් කර තිබෙන කමිටුවවත් මෙහෙම එකක් කියලා නැහැ. ඒ කමිටුවේ නිර්දේශ ගත්තොත්, -

ගරු චතුර ගලප්පත්ති මහතා
(மாண்புமிகு சத்துர கலப்பத்தி)
(The Hon. Chathura Galappaththi)
රටේ නීතිය, -

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ නීතිය කියලා තමන්ට හිතෙන හිතෙන ඔක්කෝම කියාගෙන යනවා. සමහරු හිතාගෙන ඉන්නේ නීතිය ගැන ඔක්කෝම දන්නවා කියලායි; එහෙමයි හිතා ගෙන ඉන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කමිටුව මඟින් නිර්දේශ ප්‍රමාණයක් දීලා තිබෙනවා. එහි කියා තිබෙනවා මේ පිළිබඳව සම්පූර්ණ විගණනයක් කරන්න කියලා. ඔව්, එහෙම කරන්න ඕනෑ. මෙවැනි සිදුවීම් වාර්තා වෙලා නැතිව නොවෙයි. මේ cybercrimes පිළිබඳව දැන් අලුත් අර්ථකථන දෙන්න හදනවා. මේ හැකර්ලා බිහින්නේ කොහොමද? හැකර්ලා බිහින

විධිත් තිබෙනවා. SLCERT එකත්, මේ පිළිබඳව දන්නා විශේෂඥයනුත් මේ සිදුවීම පිළිබඳව ඉතා හොඳින් කරුණු කියලා තිබෙනවා. මේ, අපිට විතරක් වෙන දේවල් නොවෙයි. ලෝකයේ මේ වාගේ දේවල් සිද්ධ වෙනවා. cybercrimes පිළිබඳව දවස ගණනේ developments සිදු වෙනවා. ADB එක වාර්ෂිකව, ආසියානු කලාපයේ සිදු වෙන cybercrimesවලදී ආර්ථිකයට වන බලපෑම් ගැන වාර්තා කරනවා. ඒවා නිකම් නොවෙයි, estimate කරලා කියන්නේ.

මේ cybercrimesවලින් ලෝකයේ ආර්ථිකයන්ට ඇති වෙලා තිබෙන බලපෑම නෝට්ටු සහ මුදල්වලින් විතරක් නොවෙයි ඇති වන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ බලපෑම පිළිබඳ විවිධ අවස්ථාවල කරුණු කියනවා, වාර්තා තිබෙනවා. ඉතිහාසයේ පළමු වතාවට මෙවැනි දෙයක් සිදු වුණා වාගේ, ලංකාවේ අපි මේක මැජික් එකක් වාගේ කියන්න හදනවා. ලංකාවේ මෙවැනි සිදුවීම් පිළිබඳ වාර්තා ගත්තොත්; ආපසු ගිහිල්ලා මේ වාර්තා අරගෙන බැලුවොත්, අපිට විවිධ අවස්ථාවල cybercrimes පිළිබඳ පැමිණිලි ලැබිලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විවිධ අවස්ථාවල ලැබිලා තිබෙන ඒ පැමිණිලි ගත්තාම, 2020දී cybercrimes පිළිබඳ පැමිණිලි 24යි ලැබිලා තිබෙන්නේ. 2021දී cybercrimes පිළිබඳ පැමිණිලි 557ක් ලැබිලා තිබෙනවා. 2022 දී cybercrimes පිළිබඳ පැමිණිලි 654ක් ලැබිලා තිබෙනවා. 2023 දී cybercrimes පිළිබඳ පැමිණිලි 472ක් ලැබිලා තිබෙනවා. 2024දී cybercrimes පිළිබඳ පැමිණිලි 1,539යි. 2025 වනකොට cybercrimes පිළිබඳ පැමිණිලි 12,000කට වැඩි ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. මේ සයිබර් අපරාධ තුළ රජයේ ගිණුම්වලට බිහින ඒවා, පෞද්ගලික ගිණුම්වලට බිහින ඒවා, විවිධ ආකාරයට, හැකර්ලා phishing දා ගෙන ඉඳලා අල්ලා ගන්න ඒවා තිබෙනවා, හරියට ඇම දානවා වාගේ. ඒවාට අහු වුණොත් අහු වුණාම තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාර්තාවේ පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "මේ කටයුත්ත සිදු වුණේ 2025 නොවැම්බර්, දෙසැම්බර්, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ - UAEහි - බැංකු ගිණුමකට යැවීමට ගිය ඇමෙරිකානු ඩොලර් 977,799.48ක මුදල පිළිබඳව මහ බැංකුවේ මූල්‍ය දෙපාර්තමේන්තුව සැක පහළ කළ ද, පසුව සයිබර් අපරාධකරුවන් විසින් ලබා දුන් වෙනත් US ගිණුමකට එම මුදල් යොමු කර වංචාව සිදු කිරීම" යනුවෙන්.

ඊට පසුව මේ ප්‍රශ්නය පිළිබඳව විවිධ අවස්ථාවල සැක මතු වුණු තැන් තිබෙනවා. විපක්ෂයත් හොඳටම දන්නවා, සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද කියන කාරණය. සිද්ධ වෙලා තිබෙන කාරණය මොකක්ද කියා දැනගෙන තමයි අද විපක්ෂය විසින් මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ, විවාදයට ගැනීම සඳහා. ඒක හොඳයි. විවාදයට ගන්න යෝජනාව ඉදිරිපත් කරන ගමන් විපක්ෂය දන්නවා, මේ ආණ්ඩුව සිදු කරමින් තිබෙන ක්‍රියාමාර්ග ගැනත්. මොකද, මුදල් අමාත්‍ය අනුර දිසානායක ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ ආණ්ඩුව මේ රට මෙතැනට ගෙන එන්නට දේශපාලන ක්ෂේත්‍රය තුළ සිදු කර තිබෙන පරිවර්තන සහ ආර්ථික ක්ෂේත්‍රය තුළ සිදු කර තිබෙන පරිවර්තන අතිවිශාලයි. ඒවා ජනතාව විශ්වාස කරනවා; පිළිගන්නවා; ඒවාට ආදරය කරනවා. ඒ නිසා මේක සරල එකක් නොවෙයි. ඒක නිසාම දැන් බලන්නේ මොකක් කරන්නද?

මේ ආණ්ඩුවට ලැබුණු mandate එක මොකක්ද? වංචාවට, දූෂණයට එරෙහි mandate එකක් ලැබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා වංචාවට හා දූෂණයට එරෙහිව ආ එම ජන වරම සූරන්න පුළුවන්ද, එම ජන වරමට හානි කරන්න පුළුවන්ද කියා තමයි මේ බලන්නේ. මෙහෙමත් වංචාවක් වෙලා තිබෙනවා, භාණ්ඩාගාරයෙන් තමයි මේ ගෙවීම කර තිබෙන්නේ, මේ ගෙවීම කරන්න මේ මුදල් ඇමතිතුමාත් සම්බන්ධයි වාගේ අපට හැඟෙනවා, ඒකට මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් වග කිව යුතුයි කියා හැඟෙනවා වාගේ කථාවක් විපක්ෂයෙන් කියන්න හදනවා. නමුත් අපි කියන්න ඕනෑ, අපේ ආණ්ඩුව මේ රටේ හොරකම, වංචාව, දූෂණය නවත්වන්න ආපු ආණ්ඩුවක් බව. ඒ වෙනුවෙන් අපි වැඩ කරනවා. මේ පාර්ලිමේන්තුවට එනකොටත් ඔය විපක්ෂයේ සිටින බොහෝදෙනෙකුට චෝදනා තිබෙනවා. සමහරු ඇප පිට ඉන්නේ. සමහරු උසාවි ගිහිල්ලා මෙහාට එන්නේ. *[බාධා කිරීමක්]* මම හිතන විධියට ඔබතුමා ඉන්නේත් සැක පිට. මේ අය උත්සාහ කරනවා, වෙන කථාවක් කියා ජන වරම සූරන්න පුළුවන්ද, ඒකට damage කරන්න පුළුවන්ද කියා බලන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දවස්වල Commonwealth ක්‍රීඩා උළෙල පැවැත්වුණා නේ. එහිදී රුමේෂ් තරංග ක්‍රීඩකයා රන් පදක්කමක් දිනාගත්තා, හෙල්ල විසි කිරීමේ තරගයෙන්. ඔහු හෙල්ල විසි කරන්න පටන් ගත්ත දවසේ ඉඳලා ඉලක්කයට හෙල්ල විසි කළා වාගේ අපේ ආණ්ඩුවත් 2024 සැප්තැම්බර් මාසයේ ජනාධිපතිවරයා දිවුරුම් දීපු තැන සිට හොරකම, වංචාව නවත්වන්න ගත් උත්සාහයන් අතිවිශාලයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Commonwealth ක්‍රීඩා උළෙල සම්බන්ධව කථා කළ මේ වෙලාවේ මම රුමේෂ් තරංග ඇතුළු Commonwealth ක්‍රීඩා උළෙලට සම්බන්ධ වෙලා පදක්කම් ලැබූ සියලුදෙනාටම සුබ පතන ගමන්, ඒ තරගවලට සම්බන්ධ වුණු සියලුම ක්‍රීඩක-ක්‍රීඩිකාවන්ට සහ පුහුණුකරුවන්ටත් සුබ පතනවා. රුමේෂ් තරංග හෙල්ල විසි කළා වාගේ මේ ආණ්ඩුවත් එල්ලයට හරියටම පහර දෙමින් යනවා. ඒක වහන්න තමයි විපක්ෂය විසින් ඩොලර් මිලියන 2.5ක වංචාවක් සිද්ධ වෙලා තිබෙනවාය කියන කථාව කියලා ජන වරමට හානි කරන්න පුළුවන්ද කියා බලන්නේ. නැහැ, ඒක එහෙම කරන්න වෙන්නේ නැහැ.

මේ කටයුත්ත සිදු වුණාට පසුව කරපු දේවල් හරි වැදගත්, මන්ත්‍රීවරුනි. ඒවා නොවැදගත් නැහැ. මොකද, ඔබතුමන්ලා ඔය කියනවා වාගේ පරිගණක ලෝකය තුළ මාස හයෙන් හයට වේගවත් විප්ලව සිද්ධ වනවා. ඒ නිසා මේක ඇතුළේ එක පැත්තකින් IT industry එකේ AI - artificial intelligence - දියුණු වෙලා තිබෙනවා. එතකොට IT industry එක දියුණු වනවා වාගේම අනෙක් පැත්තෙන් cybercrimes වැඩි වනකොට computer security, cybersecurity දියුණු වෙලා තිබෙනවා, systems වැඩි වෙලා තිබෙනවා. එසේ cybersecurity, cyber systems වැඩි වෙලා තිබෙන්නේ ඇයි? මේ අපරාධවලින් සිදුවන හානිය වළක්වා ගන්නයි. මේ අපරාධවලින් සිදුවන හානිය වළක්වා ගන්න වෙලා තිබෙන්නේ ඇයි?

මේ රට අපට භාර දෙනකොට තිබුණේ බොහොම හොඳට systems හදා, රාජ්‍ය සේවය තුළ අඩුපාඩුවක් නැතුව, රාජ්‍ය ආයතන හොඳින් සක්‍රිය වෙලා තිබුණු රටක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව 120,000කට ආසන්න පිරිසක් රාජ්‍ය සේවයට බඳවා ගන්න කටයුතු කළා. රාජ්‍ය සේවය අකාර්යක්ෂමත් සේවයක් වෙලා තිබුණේ. සමහර රාජ්‍ය ආයතන වහන්න දමා තිබුණා, ලිස්ට් පිටින්. එසේ අඩපණ කර තිබුණු රාජ්‍යය නැවත ගොඩනඟන්න අවශ්‍ය තීන්දු තීරණ අරගෙන අපි වැඩ කරමින් යනවා. ඒක ඇතුළේ පද්ධතිවල ප්‍රශ්න තිබෙනවා. සමහර පද්ධති අලුත්වැඩියා කරන්න තියා ඒවා නවීකරණය කරන්න, update කරගන්න මුදල්වත් වෙන් කර තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපි එම කටයුතු කරගෙන යනකොට තමයි මේ සිදුවීමත් වෙලා තිබෙන්නේ. අපි කියන්නේ නැහැ, මේක හරි කියලා. කිසි ලෙසකත් අපි මේක සාධාරණීකරණය කරන්නේ නැහැ. මේකට වගකිව යුතු අදාළ නිලධාරීන් වග වෙන්න ඕනෑ. මේ සිදුවීම

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ඇතුළේ අපරාධයක් වෙලා තිබෙනවා නම් ඒ අපරාධයට අදාළ පරීක්ෂණ තිබෙනවා. කමිටුව හඳුනා ගත් දේවල් ටිකක් තිබෙනවා. ඒකට අදාළ නිර්දේශ තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරලා මෙවැනි වංචා තවදුරටත් සිදු නොවන්න පරිගණක පද්ධති update කරගෙන අපි ඉස්සරහට යන්න ඕනෑ.

හැබැයි, ඒ වෙනුවට විපක්ෂය උත්සාහ කරන්නේ මොකක් කරන්නද? මම අහගෙනයි අපේ විපක්ෂ නායකතුමා කිව්වා, දැන් ආණ්ඩුවට තිබෙන ප්‍රශ්නත් එක්කම IMF එක කියන විධියට රටේ ජනතාවට බදු ගසා රාජ්‍ය ආදායම වැඩි කරලා පෙන්වනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි ගහපු එක බද්දක් ගැනවත් කිව්වේ නැහැ. අලුතින් බදු ගැහුවා නම්, ගහපු බදු මොනවාද කියලා කියන්න එපායැ. අපි ආණ්ඩුවක් අරගෙන අතරමැද බදු ගැහුවේ නැහැ. අය වැයෙන් බදු ගැහුවා නම්, මෙන්න මේවාට බදු ගැහුවා කියලා කියන්න ඕනෑ. එහෙම නැත්නම් ගහපු මොනවා හරි බදු තිබෙනවා නම්, ඒ බදු ගැන කියන්න ඕනෑ. හැබැයි, ගහපු එක බද්දක් ගැනවත් විපක්ෂ නායකතුමා කිව්වේ නැහැ.

ඒ විතරක් නොවෙයි. අපි IMF එකේ බදු ඉලක්ක පසු කරගෙනත් යනවාලු. අපි IMF එකේ බදු ඉලක්ක නොවෙයි, රටේ ආදායම් ඉලක්ක පසු කරගෙන යනවා. රටේ ආදායම් ඉලක්ක පසු කරගෙන යන්න අවශ්‍ය නීති නැත්නම් නීති හදනවා කිව්වා. හොරකම, වංචාව නවත්වනවා කිව්වා විතරක් නොවෙයි, රටේ නීති හදලා, ඒ නීතිවලට අදාළව බදු ගෙවන්නන් ප්‍රමාණය වැඩි වෙලා, රටේ බදු ආදායම වැඩි වෙලා, රාජ්‍ය ආදායම ඉහළ නංවන්න අවශ්‍ය තීරණ අපි අරගෙන තිබෙනවා. ඒ තීරණ ගත්තාම, එක පැත්තකින් රාජ්‍ය වියදම අඩු වනවා, අනෙක් පැත්තෙන්, රාජ්‍ය ආදායම වැඩි වනවා, ඒ දෙක වුණාට පස්සේ රජයේ ඉතිරි කිරීම් වැඩි වනවා. රජයේ ඉතිරි කිරීම් වැඩි වනකොට ප්‍රාථමික ශේෂය තවත් වැඩි වනවා. ඒ නිසා ප්‍රාථමික ශේෂය ධනාත්මක වෙලා තිබෙන්නේ. Plus 2.5 per cent වෙනුවට plus 5 per cent වෙනවා කියන එක හොඳයි. පසුගිය අවුරුද්දේ අය වැය හිඟය සියයට 5ක් කියලා අපි ඇස්තමේන්තු කළා. අපි ඒක සියයට 2.5ට අඩු කරලා පෙන්වුවා. ඒ නිසා රාජ්‍ය ආදායම වැඩි වනකොට, අනෙක් පැත්තෙන් රාජ්‍ය වියදම අඩු වනවා. ඒ දෙක වනකොට අපේ plus එක වැඩි වනවා. ඒ නිසා මේවා දරාගන්න බැරිව ඉන්නේ. මේවා දරාගන්න බැරි වුණාම කියනවා, මේක තමයි අපරාධය කියලා. අපි ගහපු අලුත් බදු මොනවාද? කිසිවක් නැහැ.

මැද පෙරදිග කලාපයේ ඇති වෙච්ච යුද්ධමය තත්ත්වය විසින් අපට ඇති කරපු බලපෑම, අපේ ආර්ථිකයට ඇති වෙච්ච බලපෑම, පාලනය කරන්න ආණ්ඩුවක් හැටියට අපි ගත්ත වෙහෙස බලන්න. මේ රටේ තෙල් මිල ඉහළ යන්න දෙන්නේ නැතුව, ලයිට් බිල වැඩි වෙන්න දෙන්නේ නැතුව, අපි ගත්ත වෙහෙස ඇතුළේ පාරිභෝගික ජනතාවට දුන් සහනත් මේක ඇතුළේ තමයි තිබෙන්නේ. ලෝක වෙළෙඳ පොළේ තෙල් මිල වැඩි වුණු ප්‍රමාණයට සාපේක්ෂව අපේ රටේ තෙල් මිල වැඩි වුණා නම්, තෙල් මිල වැඩිවීම පාලනය කිරීම වෙනුවෙන් අද භාණ්ඩාගාරය රුපියල් මිලියන 57,000ක් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෙවන්න ඕනෑ නැහැ. විදුලිය ඒකක 180 දක්වා පාවිච්චි කරන අයට අපි විදුලි බිල වැඩි කළේ නැහැ. මේ, මැද පෙරදිග කලාපයේ මතු වූ තත්ත්වය නිසා අපේ රට තුළ ඇති වෙලා තිබෙන තත්ත්වය. අපේ අපනයනවලට බලපෑම් ඇති වෙලා තිබෙනවා; සංචාරක ව්‍යාපාරයට බලපෑම් ඇති වෙලා තිබෙනවා; පෞද්ගලික සංක්‍රාමවලට බලපෑම් ඇති වෙලා තිබෙනවා; ඒ හරහා අපේ සංචිතවලට බලපෑමක් ඇති වෙලා තිබෙනවා. ලෝකයේ තෙල් මිල වේගයෙන් ඉහළ ගියා. ඒ නිසා මේ තත්ත්ව කළමනාකරණය කරමින්, අපි රට ඉලක්කයක් කරා මෙහෙයවනවා. එලෙස රට ඉලක්කයක් කරා මෙහෙයවමින් යනකොට, ඒවා කඩාකප්පල් කරන්න වංචා පිළිබඳ කථාවක් දාලා බලනවා. කොහේ හරි තැනක අපරාධයක්, වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා නම්, විපක්ෂය වාගේ කල් දමමින් ඉන්න ආණ්ඩුවක් නොවෙයි මේ ආණ්ඩුව. ඒකට අදාළ නීතිය ක්‍රියාත්මක කරන ආණ්ඩුවක් තමයි, අපේ ආණ්ඩුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව මතු කරපු කාරණා එක්ක මම තව එක දෙයක් කියන්න ඕනෑ. මේ අපරාධය සයිබර් අපරාධයක් නොවෙයි කියන්න උත්සාහ ගන්න එකේම විපක්ෂයේ අසාර්ථක බව තිබෙනවා නේ. මොකද, ඒක මේ කමිටුවත් දැන් පිළිඅරගෙන තිබෙනවා. මේක සයිබර් අපරාධයක්. ඒකට අදාළ අපරාධය සිද්ධවීමට අදාළව වගවීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම්, එම නිලධාරින්ට අදාළව මුදල් රෙගුලාසි 105 යටතේ මුදල් අය කර ගන්න ඕනෑ. නිකම් නොවෙයි, ඊට අදාළ නිලධාරින්ට ඒ පරීක්ෂණ කටයුතු කරගෙන යනවා වාගේම, මුදල් රෙගුලාසි 105 යටතේ නැවත මුදල් අය කර ගන්නත් ඕනෑ. ඒවාත් කමිටුව කියනවා. ඒවා කියන්නේ ඇයි? මේ අපරාධයේදී වගවීම සහ යම් නිලධාරියෙකු වගකීමෙන් රාජකාරි ඉටු කරද්දී අතපසුවීමක් සිද්ධ වෙලා තිබෙනවා නම්, ඒකත් ඔහුගෙන් අය කර ගන්න ඕනෑ නිසායි. මේ කථාව කියන්නේ නිකම් නොවෙයි. මේ තත්ත්වයන් ගැන කියන්නේ ලෝකය පුරා ඇති වෙලා තිබෙන තත්ත්වයන් එක්කයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒකයි මුලිනුත් සඳහන් කළේ. ලෝකය පුරා මේ සයිබර් අපරාධ සිද්ධ වනවා. ඒ නිසා 2025දී INTERPOL එක කියනවා, ලෝකය පුරා සිද්ධ වෙලා තිබෙන සයිබර් අපරාධවල තක්සේරුව. මේක නිකම් මුදල් හුවමාරුවක් විතරක් නොවෙයි. මේ cybercrimes ලෝකය පුරා සිද්ධ වනකොට, අනෙක් පැත්තෙන් cybersecurity ලෝකයේ දියුණු වන්නේ ඇයි? නිකම් නොවෙයි, මේවා නවත්වා ගන්නයි. මේවා අඩු කරන්නයි. ඒ නිසා මේක ඇතුළට බහින මිනිහා තව බැහැලා මේක කොල්ලකන්න හදනවා. 2025 INTERPOL report එකකින් කියනවා, 2025දී සිදු වූ cybercrimes නිසා ලෝකයට ඇමෙරිකානු ඩොලර් බිලියන 442ක ආර්ථික බලපෑමක් ඇති කර තිබෙනවා කියලා. මේක ඇතුළේ, currencyවලින් වෙච්ච බලපෑමට අමතරව ආර්ථිකමය වශයෙනුත් බලපෑමක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම ADB report එකකින් කියනවා, cybercrimesවලින් ඩොලර් මිලියන 450ත්, බිලියනයත් අතර ප්‍රමාණයක ආර්ථික බලපෑමක් ලංකාවට ඇති වනවා කියලා.

ඒ නිසා මේ පාලන පද්ධතීන්වල තිබෙන දුර්වලතා හඳුනාගෙන, ඒ දුර්වලතා අතික්‍රමණය කරන්න පුළුවන් ආරක්ෂණ පද්ධති - security systems - දමලා, ඒවා ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අපේ Ministry of Digital Economy හරහා වෙනම මෙහෙයුමකුත් අපි දියත් කරමින් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මුදල් අමාත්‍යාංශයට විතරක් නොවෙයි, රජයේ සියලු ආයතනවලට මේ ප්‍රශ්නය අදාළයි. රාජ්‍ය අංශයේ සියලු ආයතනවල සයිබර් අපරාධ සිදු විය හැකියි. ඊයේ පෙරේදා අපි දැක්කා, කොළඹ 7 ඉඩම්වලට ඔප්පු හදලා විකුණන ඒවාත් තිබෙන බව. ඒ සයිබර් අපරාධකරුවන් එක තැනක නොවෙයි ඉන්නේ. ඒ නිසා සයිබර් අපරාධකරුවන් ඉන්න සියලු තැන්වල, සයිබර් අපරාධ සිද්ධ වන සියලු තැන්වල සිදු වන අපරාධ නවත්වන්න අවශ්‍ය මැදිහත් වීම කරන්න තමයි රජයක් හැටියට අපි කටයුතු කරමින් සිටින්නේ.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ඩොලර් මිලියන 2.5 මේ ආණ්ඩුව විසින් හොරකම් කරන්න යෙදුණා, නැත්නම් ආණ්ඩුව විසින් හොරකම් කරන්න ගත්ත ක්‍රියාමාර්ගයක් කියලා විපක්ෂය කියන්න උත්සාහ කරනවා නම් අපි විපක්ෂයට කියන්න ඕනෑ,

මෙවැනි අපරාධ වළක්වන්නත් එක්කම තමයි අපේ ආණ්ඩුවට ජන වරම ලැබුණේ කියන එක. එම නිසා අපි ඒ ජන වරම පාවිච්චි කරලා අපේ රටේ සිද්ධ වන මහා පරිමාණ වංචා සහ දූෂණ නවත්වන්න කටයුතු කරනවා විතරක් නොවෙයි, ඒ මහා පරිමාණ අපරාධකරුවන් නීතිය ඉස්සරහට ගෙනෙන්න, මහා පරිමාණ ලෙස අපරාධ කරපු මිනිසුන්ට දඬුවම් දෙන්න, ඒ අපරාධවලින් අත්පත් කර ගත්ත වත්කම් පිළිබඳව පරීක්ෂා කරලා ඒවා නැවත ජනතාවට අත්පත් කරලා දෙන්නත් කටයුතු කරනවා. ඒ වාගේම එවැනි අපරාධ නැවතත් සිදු නොවෙන්න මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව වාගේම රජයේ අනෙකුත් ආයතනවල පරිගණක පද්ධතිවල තිබෙන දුර්වලතා හඳුනාගෙන ඒවාට අවශ්‍ය කරන විසඳුම් හොයන්නත්, රජයේ මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය ඇතුළු ආයතනවල තිබෙන ප්‍රතිපත්තිමය තීන්දු තීරණ සහ නීති රෙගුලාසි යටතේ කටයුතු කරමින්, රාජ්‍ය ආරක්ෂාව තහවුරු කරමින් ඉස්සරහට යන්නත් අපි කටයුතු කරනවා. ඒ නිසා කිසිදු හොරකමකට, වංචාවකට ඉඩ නොදී මේ රට ඉදිරියට ගෙන යන්න, පොහොසත් රටක් බවට මේ රට පත් කරන්න අවශ්‍ය සියලු තීන්දු තීරණ අරගෙන අපි කටයුතු කරනවාය කියන කාරණය මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Taking into consideration the need to suspend the Sitting for lunch, I now call upon the Hon. Ajith P. Perera, who has only six minutes.

[අ.භා. 12.27]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු ඇමතිතුමා මේ කමිටු වාර්තාව කියවලා නැහැ, නැත්නම් කියවන්න කැමැති නැහැ. මේ වාර්තාවේ නිගමනවල සඳහන් වෙනවා, "මේ සිදු වුණු වංචාවට සමස්තයක් ලෙස පරිපාලනමය වශයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා - ඒ කියන්නේ හර්ෂණ සූරියප්පෙරුම - සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාගේ මට්ටමෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරින් වගකිව යුතු වේ" කියලා. මේ, සර්ව පාක්ෂික කමිටුවේ ඒකමතික නිගමනය. දැන් ඔබතුමා ළඟ තිබෙන වාර්තාවයි, මගේ ළඟ තිබෙන වාර්තාවයි දෙකක් වෙන්න බැහැ නේ, වසන්ත සමරසිංහ ඇමතිතුමනි. එතකොට ආයතන ප්‍රධානියා වග කියන්න ඕනෑ කියලා මේ කමිටුවෙන් කියනවා. ඒ ගැන මේ වාර්තාවේ තිබෙනවා. මොකටද, වග කියන්න ඕනෑ?

හැකර් කෙනෙක් වෙන්න පුළුවන්, හැකර් කෙනෙක් නොවන වෙනත් කෙනෙක් වෙන්න පුළුවන්, කවුරු හරි හොරෙක් මේ ජනරජයේ මුදල් - ආණ්ඩුවේ සල්ලි - හොරකම් කරගෙන යනකොට ඒ ක්‍රියාවලිය නොසැලකිල්ල - වචන කිහිපයක් කියා තිබෙනවා; අදාළ නිලධාරින්ගේ ක්‍රියා කලාපය, නොදැනුවත්කම, අකාර්යක්ෂමතාව, නොසැලකිල්ල ආදී වශයෙන් - මත පදනම් වූවක්ද සහ වෙනත් වගකීමක් - ඒ කියන්නේ අපරාධ වගකීමක් - තිබේද යන්න පරීක්ෂා කරන්න ඕනෑ කියලා එහි කියා තිබෙනවා. මේ ආණ්ඩුව වගකීමෙන් කටයුතු කරනවා නම්, මේ ආණ්ඩුව අවංක නම්, මේ ආණ්ඩුව එය ප්‍රමුඛ කාරණයක් වශයෙන් සලකා මේ වනකොට අපරාධ පරීක්ෂණ අවසන් කරන්න ඕනෑ. නමුත් දැන් මාස ගණනක් ගත වෙලා තිබෙනවා. ඒ පිළිබඳව හුදු පැමිණිල්ලක් කරලා බලාගෙන ඉන්නවා, එතැනින් ඔබ්බට විධිමත් පරීක්ෂණ කර නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම අවංක නම්, ඒ විධියට වගකිව යුතු පුද්ගලයන්ට දඬුවම් කරන්න කැමති නම්, ඒ අයගේ වගවීම පිළිබඳව පරීක්ෂා කරන්න කැමති නම්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ අවසන් වෙන්න ඕනෑ. නමුත්, එහෙම නැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට කී දෙනෙක් විස්තරාත්මකව කොපමණ පැමිණිලි කළාද? ඒ විමර්ශන අවසන් නැහැ. ඒවා පිළිබඳව ප්‍රමුඛතාවක් නැහැ. ඒ නිසා මේ වාර්තාවේ මතුපිටින්ම ලියා තිබෙන දේ "නැහැ" කියන්න එපා. ආයතන ප්‍රධානියා හැටියට සූරියප්පෙරුම මේකට වග කියන්න ඕනෑ. දේශපාලනඥයෙක් මේ වාගේ ස්වාධීන වෘත්තීයමය තනතුරුවලට පත් කළාම සිදු වන පාඩුවට අජිත් නිවාඩ් කබ්රාල් හොඳ උදාහරණයක්. මේ පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක් මහ බැංකු අධිපති කළා. ආර්ථිකය විනාශ වුණා. මේ පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය ඇමතිවරයෙක් භාණ්ඩාගාරයේ ලේකම් කළා. භාණ්ඩාගාරයේ සල්ලි හොරකම් කරන්න ඉඩ දුන්නා. ඒක විශාල මුදලක්. ඒක තමයි තත්ත්වය.

ඊළඟට, තාක්ෂණය ගැන කථා කරනවා. 2016දී සවි කරපු Microsoft Exchange server එකේ වලංගු කාලය අවසන් වුණේ 2025.10.14වැනි දා.

ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමනි, 2025.10.14වැනි දා වෙනකොට මේ රට පාලනය කළේ කවුද? අනුර කුමාර දිසානායක මුදල් ඇමතිතුමා, ජනාධිපතිතුමා. දැන් මේ server එකේ ආරක්ෂාව පිළිබඳ සහතිකය මයික්‍රොසොෆ්ට් සමාගම විසින් අවසන් කරන්නේ 2025.10.14වැනි දා. කාගේද ආණ්ඩුව? යහ පාලන ආණ්ඩුවද, ගෝඨාභයගේ ආණ්ඩුවද? නැහැ, අනුර කුමාරගේ ආණ්ඩුව. මුදල් ඇමති, අනුර කුමාර දිසානායක. එතුමා පත් කරපු භාණ්ඩාගාර ලේකම් කෙනෙක් ඉන්නේ. මොනවාද, කථා කරන්නේ? කවුද මේවාට වග කියන්න ඕනෑ? අපිද? මීට කලින් කථා කළ චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, කලින් ආණ්ඩුව මේවාට වග කියන්න ඕනෑ කියලා. ඒ කියන්නේ, මයික්‍රොසොෆ්ට් සමාගමෙන් මේ server එක ගත්තාටද වග කියන්න ඕනෑ? 2025.10.14වැනි දා වෙනකම් මේක නිසි ලෙස වලංගු ගිවිසුමක් යටතේ නඩත්තු කළා. නඩත්තුව අවසන් වුණේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ. ඒ නිසා තමයි මේ ඊමේල් පිළිබඳ ප්‍රශ්නය මතු වුණේ, ඊමේල්වල ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය මතු වුණේ. ආරක්ෂාව පිළිබඳ වගකීම අහිමි කර ගෙන තිබෙනවා. මොකද, ඊට මාසයකට පසුවයි මේ පළමුවැනි නීති විරෝධී transaction එක සිද්ධ වුණේ.

ඒ විතරක් නොවෙයි, මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට එවකට මුදල් අමාත්‍යාංශයේ පැහැදිලි කිරීම මොකක්ද? මේ ප්‍රශ්නය පිළිබඳව පාර්ලිමේන්තුව ප්‍රශ්න කරනකොට, සමාජය ප්‍රශ්න කරනකොට, මුළු රටම ලජ්ජා වනකොට කිව්වා, "මම මේක කිව්වේ නැහැ, මොකද හැකර්වරුන් දැන ගත්තොත් මේ සල්ලි ආපසු ගන්න බැරි වෙනවා" කියලා. හැකර්ලා ඉන්නේ කොහේද? එහේද, මෙහේද? හැකර්ලා ඉන්නේ මෙහේ. හැකර්ලා ඉන්නවා, ලෝකයේ. තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. ආරක්ෂිත පද්ධතිවලටත් ප්‍රහාර එල්ල කරනවා. හැබැයි, මේ වාගේ වැඩවලට හැකර්වරුන්ට වගකීම් පවරනවා නම් හැකර්ලාත් ලජ්ජා වෙයි. මේ තිබෙන්නේ තමුන්නාන්සේලා පත් කරපු නිලධාරින්ව රැවටීමක්. මම පිළිගන්නවා, ඒ සම්බන්ධයෙන් මහ බැංකුවේත් වගකීමක් තිබෙනවාය කියලා. හැබැයි, මහ බැංකුව විසින් ERD එකට වගකීම පැවරුවාට පසුව තමයි මේක වුණේ. සංක්‍රමණය සඳහා වන අවබෝධතා ගිවිසුම අත්සන් කරලා තිබුණේ නැහැ. මේ වංචාවෙන් පසුවයි එය අත්සන් කළේ. ගරු ඇමතිතුමනි, චෝදනා කරන්න පුළුවන්; ශ්‍රී වික්‍රම රාජසිංහ රජ්ජුරුවන්ගේ කාලයේ ඉඳලාම චෝදනා කරන්න පුළුවන්. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ කොතැනද? මේ ඊමේල් පද්ධතිය ආරක්ෂා සහිතව පවත්වාගෙන යන්න බැරි වුණා. මයික්‍රොසොෆ්ට් සමාගම සමඟ තිබෙන ගිවිසුම

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

අවසන් වුණාට පසුව ඒක දීර්ඝ කළේ නැහැ. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වාර්තාව තුළ කියනවා, බරපතළ මූල්‍යමය හානියක් එළිදරව් වෙනවා කියලා.

මම මේ අවස්ථාවේදී යෝජනාවක් කරන්න කැමතියි. ස්ථාවර නියෝග සංශෝධනය කළා, 2026 අප්‍රේල් මාසයේ 07වැනි දා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට පුළුවන්කම තිබෙනවා, මහා භාණ්ඩාගාරය පිළිබඳව පරීක්ෂා කරන්න. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, ස්ථාවර නියෝග 119 (1) වගන්තිය ප්‍රකාරව මේ පිළිබඳව වෙනම පරීක්ෂණයක් කරලා එහි 4වන වගන්තිය ප්‍රකාරව මෙය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නිසි විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තුව හරහා යොමු කරන්න පුළුවන්. ඔබතුමන්ලාගේ රජයෙන්මයි මේ ප්‍රතිපාදනය අරගෙන ආවේ, 2026 අප්‍රේල් මාසයේ 07වැනි දා. ඒ ප්‍රතිපාදනය ප්‍රකාරව මෙම කාරණය පිළිබඳව විනිශ්චය කිරීම සඳහා, අපරාධ පරීක්ෂණය කිරීම සඳහා කටයුතු කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කමිටුව කියනවා, ඔව්, මෙතැන වංචාවක් වෙලා තිබෙනවා, සයිබර් අපරාධයක් වෙලා තිබෙනවා, දූෂණයක් වෙලා තිබෙනවා, හොරකමක් වෙලා තිබෙනවා, රාජ්‍යයට මූල්‍ය පාඩුවක් වෙලා තිබෙනවා, නිලධාරින් වගකිව යුතු වෙනවා, වගවීම - accountability - ගැන පරීක්ෂා කළ යුතු වෙනවා කියලා. ඒ වාගේම කියනවා, අපරාධ පරීක්ෂණය අපේ වැඩක් නොවෙයි, අපරාධ පරීක්ෂණය අදාළ ආයතන කරන්න ඕනෑ කියලා. පාර්ලිමේන්තුව මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරලා තිබෙන නිසා ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව මේ කාරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කළ යුතු යැයි කියා මා යෝජනා කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் தொடங்கிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Nishantha Jayaweera. You have 12 minutes.

[අ.භා. 1.00]

ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අවුරුද්දේ රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක වීමත් සමඟම එතෙක් රජයේ ණය ගෙවීම සඳහා විසිර තිබූ ක්‍රමවේදය, ඒ කියන්නේ එක තැනකට යොමු වෙලා නැතිව තිබූ ක්‍රමවේදය විධිමත් කිරීමේ අරමුණින් මුදල් අමාත්‍යාංශයේ වෙනමම අංශයක් ස්ථාපනය වෙනවා, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය නමින්. ණය කළමනාකරණ පනත අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය ස්ථාපිත වුණාට පස්සේ ඒ ණය කළමනාකරණ කටයුතු, - ණය කළමනාකරණය කියලා එන්නේ ණය ගැනීම, ණය ගෙවීම සහ ඒ පිළිබඳ වාර්තාකරණය - පවත්වාගෙන යාමේ වගකීම එක ස්ථානයකට පැවරෙනවා. පනත අනුව ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමත් සමඟ ඒ කටයුතු සම්පූර්ණයෙන්ම ඒ කාර්යාලය වෙත පැවරෙන්නේ මාස 18ක කාල සීමාවක් ඇතුළත.

ඒ මාස 18 කාල සීමාව ඇතුළතදී මුලින්ම 2024 නොවැම්බර් 24වෙනි දා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවනවා. ඊට පස්සේ ඒ පිහිටුවන ණය කළමනාකරණ කාර්යාලය විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ණය අංශය සමඟ සම්බන්ධ වීමක් සිද්ධ වෙනවා. ඊටත් පසුව 2024 මාර්තු සිට දෙසැම්බර් දක්වා අලුතෙන් ස්ථාපනය කරන PDMO එකේ නිලධාරින් පුහුණුවීම් කරනවා මහ බැංකුව යටතේ; on-the-job training එකක් විදියට තමයි ඒ පුහුණුවීම් සිද්ධ වෙන්නේ. ඊටත් පස්සේ 2025 ඔක්තෝබර් 13 සහ 14 කියන දිනවල ඒ නිලධාරින්ට, ඒ කියන්නේ මුදල් අමාත්‍යාංශයේ PDMO එක යටතේ වැඩ කරන නිලධාරින්ට මහ බැංකුව විසින් එතෙක් පාලනය කළ පද්ධතියට ප්‍රවේශයන් ලබා දෙනවා. ඊට පස්සේ 2025 ඔක්තෝබර් 30 දිනට නියමිත දේශීය ණය නිකුතුව භාර ගැනීම 2025 දෙසැම්බර් දක්වා ප්‍රමාදයකට ලක් වෙනවා, යම් යම් කරුණු හින්දා. ඊටත් පසුව දෙසැම්බර් මාසයේදී රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත සංක්‍රමණය වීමක් සිදු වෙනවා. එතෙක් ණය ගෙවන කොටස කෙරුණේ මහ බැංකුවේ Public Debt Department - PDD - එකෙන්. අන්න ඒ කටයුතු කිරීම සම්පූර්ණයෙන් PDD එකෙන් නවත්වනවා. PDD එක 2025 දෙසැම්බර් 31වන දා වෙනකොට වසා දැමෙනවා. ඊට පස්සේ ඒ සියලු කටයුතු මුදල් අමාත්‍යාංශය යටතේ තිබෙන ණය කළමනාකරණ කාර්යාලය - PDMO - වෙත පැවරෙනවා. මේ වෙනුවෙන් වන අවබෝධතා ගිවිසුම 2026 මාර්තු 09වෙනි දා අත්සන් කරලා, ඊට අනුව තමයි ඒ කටයුතු කෙරෙන්නේ. ඊටත් අමතරව 2026 මැයි 22වන දා වෙනකොට අර මාස 18ක කාල සීමාව අවසන් වීමත් එක්ක මහ බැංකුවේ සංක්‍රාන්ති කාර්යාලය නිල වශයෙන් අවසන් වන ගමන්ම ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රය මුදල් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනවා.

මේ කරුණු කාරණාත් එක්ක පසුගිය කාල වකවානුවේදී මුදල් අමාත්‍යාංශය විසින් විශේෂයෙන්ම මැදිහත්වෙලා ණය හිමියන්ගේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් දායක වෙලා, විශේෂයෙන්ම මේ කරුණට සම්බන්ධ වන ඕස්ට්‍රේලියානු අපනයන මූල්‍ය ආයතනය කියන සමාගම සමඟ එකතු වෙලා ඔවුන්ගේ ණය ප්‍රතිව්‍යුහගත කරගෙන ඒ සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කරනවා. ඒ අත්සන් කරන ගිවිසුම්වල එක පිටපතක් මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට - ERD එකට, ඊළඟ පිටපත PDMO කාර්යාලයට සහ අනෙක් පිටපත 2025 ඔක්තෝබර් මාසය වෙනකොට මහ බැංකුවේ Public Debt Department - PDD - එක වෙත ලබා දීලා තිබෙනවා. මෙන්න මේ ගිවිසුම අනුව, ඊළඟ ණය වාරිකය ගෙවන්න අවස්ථාව එන වෙලාවේදී, 2025 නොවැම්බර් මාසය වාගේ වෙනකොට ඒ ඕස්ට්‍රේලියානු ආයතනයෙන් ERD එකට ඊමේල් එකක් එනවා, ණය මුදල ගෙවන්න. හැබැයි ණය මුදල ගෙවනකොට ගෙවන ගිණුම් අංකය වෙනස් කරලා ගෙවන්න කියලා තිබෙනවා. ERD එකේ අදාළ නිලධාරියා එය පරීක්ෂා කර බලලා ඒක මුදල් අමාත්‍යාංශයේ PDMO එකට යවනවා. එතැනින් පස්සේ ඒක මහ බැංකුවේ PDD එකෙනුත් තහවුරු කරලා ණය කළමනාකරණ

දෙපාර්තමේන්තුව - PDMO - වෙත යවනවා. එතැනිනුත් තහවුරු වීමෙන් අනතුරුව මේ මුදල ගෙවීම සඳහා අදාළ බැංකුව වෙතට යොමු කරනවා. යොමු කරන අවස්ථාවේදී ඒක ගෙවීම් 6ක් විධියට යනවා.

ඒ 6න්, 4ක් අදාළ account එකට ප්‍රේෂණය වන ගමන්ම දෙකක් සැක සහිත ගනුදෙනු කියලා ඒ බැංකුවෙන් දැනුම් දීමත් එක්ක - මහ බැංකුව වෙත තමයි ඒ දැනුම් දීම සිද්ධ වෙන්නේ - මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශයේ තිබෙන PDMO එකට දැනුම් දෙනවා, මේ පිළිබඳව පරීක්ෂා කර දන්වා එවන්න කියලා. එතැනින් ERD එකට ආපහු ඇවිල්ලා, ERD එක මඟිනුත් ඒ අවශ්‍ය කටයුතු කරනවා. අර ණය හිමියා විධියට ERD එක මෙතෙක් හිතන්නේ නැහැ, තමන්ගේ mail server එක සයිබර් අපරාධකරුවන් විසින් hack කරලා තිබෙනවා කියලා. මේ ගැන නොදැනුවත්කම නිසා මුදල් අමාත්‍යාංශය විසිනුත් මේ තහවුරු කර ගැනීම සිදු කරන්නේ ඒ ආයතනය වෙත ඊමේල් එකක් යවලා. එතකොට ඊමේල් එක යන්නේ හැකර්වරයාට. හැකර්වරයා එවනවා, "මේක පොඩි වැරදීමක්, මගේ account number එක මේකයි" කියලා කලින් credit වුණු account number එක නැවත එවනවා. ඒ account number එකට නැවත ඔය ආකාරයට ගෙවීම් සිදු වෙනවා. ඔය විධියට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක මුදලක් මේ හැකර්වරයා වෙත ගිහිල්ලා තිබෙනවා කියලා පසුව අනාවරණය වනවා.

හැබැයි, මේ සිද්ධි යන අතරේදී 2026 ජනවාරි මාසයේදී Indian Exim Bank එකට කරන්න තිබෙන ගෙවීම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ගෙවීම් කරන්න යනකොට ඒකත් ගිණුම් අංකය වෙනස් කරලා යවන අවස්ථාවේදී ඒ බැංකුවෙන් පැහැදිලිවම දන්වා එවනවා, මේක මුදල් විශුද්ධිකරණය - anti-money laundering - සම්බන්ධ සිද්ධියක් වෙන්න පුළුවන්, ඒ නිසා මෙය පැහැදිලිව පරීක්ෂා කර බලන්න කියලා. ඒ තොරතුරත් එක්ක විධිමත් විධියට පරීක්ෂා කරගෙන යනකොට මේ පිටුපස වෙන හැකර්වරයෙක් ඉන්නවා කියලා ERD එක විසින් පැහැදිලිවම අනාවරණය කර ගන්නවා. ඒ පිළිබඳව අනාවරණය වුණ ගමන්ම, දැනගත් වහාම මුදල් අමාත්‍යාංශය විසින් CID එක, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය - SLCERT එක - සහ මූල්‍ය අපරාධ අංශය - FIU එක - වෙත පැමිණිලි කළා. මොකද, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා මේ සිද්ධිය දැනගත් වහාම ඊට මැදිහත් වෙලා මේ සම්බන්ධව අදාළ ආයතනවලට දැනුම් දුන්නා, නීතිමය කටයුතු කරන්න මේ පිළිබඳව සොයා බලා වාර්තා කරන්න කියලා. ඒ දැනුම් දීමත් එක්කම මුදල් අමාත්‍යාංශයේ වෙනම විමර්ශන කණ්ඩායමක් පත් කරලා, මේ පිළිබඳව අභ්‍යන්තර විමර්ශනයක් පවත්වනවා. 2026 අප්‍රේල් මාසයේ තමයි අභ්‍යන්තර විමර්ශන වාර්තාව ලැබුණේ. ඒ විමර්ශන වාර්තාවෙන් හෙළිදරව් වන කරුණු අනුව ඔවුන් නිර්දේශ කරනවා, මේ සම්බන්ධයෙන් කටයුතු කරන ලද නිලධාරින් හතරදෙනෙකුගේ තාවකාලිකව වැඩ තහනම් කරලා පරීක්ෂණ කටයුතු ඉදිරියට කරගෙන යන්න. ඒ අනුව, මේ සම්බන්ධයෙන් සම්පව කටයුතු කරපු නිලධාරින් හතර දෙනෙකුගේ තාවකාලිකව වැඩ තහනම් කරලා, ඒ පරීක්ෂණ තවදුරටත් පවත්වාගෙන යනවා.

මීට අමතරව, Public Service Commission - PSC - එක මඟින් විශේෂ විමර්ශනයක් පැවැත්වීම සඳහා කමිටුවක් පත් කරලා, මේ වනකොට ඒ අදාළ විමර්ශනත් පැවැත්වෙමින් තිබෙනවා. මෙහිදී විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, මුදල් අමාත්‍යාංශය විධියට, මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා මේ සිද්ධිය දැනගත් වහාම ප්‍රමාද නොවී ඉතා නිවැරදිව අදාළ ආයතනවලට පැමිණිලි කරලා, නීතිමය ක්‍රියාමාර්ග ගන්න ගමන්ම විධිමත් පරීක්ෂණ පවත්වන්න කියලා උපදෙස් දීලා තිබෙන බව. මේ උපදෙස් ක්‍රියාත්මක කරගෙන යනකොට මුදල් අමාත්‍යාංශය විධියට හඳුනාගෙන තිබෙනවා, අභ්‍යන්තර පාලන ක්‍රමවල තිබුණු යම් යම් අඩුපාඩු. ඒ කියන්නේ, internal proceduresවල යම් යම් අඩුපාඩු තිබිලා තිබෙනවා. නමුත්, මේ තිබෙන්නේ නව රජය ආවාට පස්සේ වුණු අඩුපාඩු නොවෙයි. ඉතිහාසයේ සිටම මෙතෙක් කාලයක් ණය ගෙවීමේ ක්‍රියාවලිය සිදු වෙලා තිබෙන්නේ ඔය ආකාරයට. එතැන රාජකාරි කරන නිලධාරින් නව රජය පත් වුණාට පස්සේ අලුතින් පත් කරපු නිලධාරින් නොවෙයි. ඔවුන් පළපුරුද්දක් තිබෙන නිලධාරින්. ඔවුන්ට රාජකාරි පළපුරුද්ද තිබෙනවා. නමුත්, මෙතැනදී විශේෂයෙන් හඳුනා ගන්නවා, අභ්‍යන්තර ක්‍රමවේදවල තිබෙන යම් යම් දුර්වලතා. මේ වනකොට මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් ඒ සියලු දුර්වලතා හඳුනාගෙන, ඒ දුර්වල පරිපාලන ක්‍රමවේද නිවැරදි කරන්න අවශ්‍ය කටයුතු මේ වනකොට කරලා තිබෙනවා.

ඊටත් අමතරව විශේෂයෙන්ම මෙහිදී මතු කළා - විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු විසින් දැන් ටිකකට කලිනුත් ප්‍රකාශ කළා - විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ - ERD එකේ - ඊමේල් පද්ධතිය යල් පැන ගොස් තිබීම මේකට ප්‍රධාන හේතුවක් කියලා.

ඒ කියන්නේ, SLCERT එක මඟින් දීපු වාර්තාව අනුව පෙනෙනවා, ඊමේල් පද්ධතිය යල් පැන ගිහින් තිබෙන බව. හැබැයි, කලින් කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේ, ඒ ඊමේල් පද්ධතිය යල් පැන ගිහින් තිබෙන්නේ 2025දී කියලායි. SLCERT එක දීපු වාර්තාවට අනුව, ඒ ඊමේල් පද්ධතිය යල් පැන ගිහින් තිබෙන්නේ 2019 අවුරුද්දේදීයි. 2019 අවුරුද්දේදී එය යල් පැන ගියාම එවකට හිටපු නිලධාරින් විසින් යම් පිළියමක් කරලා එය 2023 වනකල් පවත්වාගෙන ගිහින් තිබෙනවා. ඊට පසුව 2023දී නැවතත් SLCERT එක පැහැදිලිවම දැනුම් දෙනවා, "මේක දැන් සම්පූර්ණයෙන්ම යල් පැන ගිය පද්ධතියක්. මේක වහාම යථාවත් කරන්න අවශ්‍ය කටයුතු කරන්න" කියලා. අන්න ඒ ආකාරයෙන් දැනුවත් කිරීම් සිදු කර තිබෙනවා. ඒ සිද්ධිය වෙලා අප ඒ පිළිබඳව පැහැදිලිවම දැනගත්තාට පසුව ඒ ඊමේල් පද්ධතිය මේ වන කොට ඉතාම හොඳින් යථාවත් කර තිබෙනවා. ඒ යථාවත් කිරීම තුළ හඳුනා ගත්තු ප්‍රධාන පරිපාලනමය අඩුපාඩු, දුර්වලතා සහ තොරතුරු තාක්ෂණය පැත්තෙන් වන දුර්වලතා සියල්ල මඟ හරවන්නත්, ඒ පද්ධතිය වැඩිදියුණු කරන්නත්, cybercrimes මඟින් වන තර්ජන අවම කරන්නත් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග මුදල් අමාත්‍යාංශය විධියට, එහි ලේකම්වරයා විධියට ගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉතාම සුළු කාරණයක් විතරයි. මොකද, ලෝකයේ විවිධ cybercrimes හින්දා විශාල මූල්‍ය හානි සිදු වෙනවා. මේක ඉතාම සුළු කාරණයක්. නමුත්, මේ සුළු කාරණය සිදු වන්නේත් එක පැත්තකින් පරිපාලන ක්‍රමවේදයේ තිබිච්ච අඩුපාඩුවක් නිසා. ඒ වාගේම, තොරතුරු තාක්ෂණ පද්ධතිය හරියාකාරව update නොවීමත් යම් ආකාරයකට මේ සඳහා බලපා තිබෙනවා. මෙන්න මේ කරුණු කාරණා දෙකම අනුව තමයි එය සිදු වන්නේ. නමුත්, මේ සියලු කරුණු කාරණා මධ්‍යයේ මුදල් අමාත්‍යාංශය විසින් ණය ගෙවීම ඇතුළුව ණය කළමනාකරණය හොඳින් කරගෙන යනවා. මෙහිදී විශේෂයෙන්ම පැහැදිලිව කියන්න ඕනෑ, මේ ආයතනයට අදාළ ඊළඟ වාරිකය මේ වන කොටත් ගෙවා තිබෙන බව. ගෙවන්න බැරි වෙච්ච වාරිකය ගෙවීම සම්බන්ධයෙනුත් මේ වන කොට සාකච්ඡා පවත්වමින් යනවා. කිසිම ණය පැහැර හැරීමක් සිදු වෙලා නැහැ. මුදල් අමාත්‍යාංශය විධියට ගත්තාම, ඉතාම හොඳින් තමන්ගේ කාර්ය සාධනය සිදු කිරීම හින්දා තමයි 2026 අවුරුද්දේ පළමුවැනි කාර්තුව ගත්තත් අපේ ආදායම් රැස් කිරීම ඉතාම හොඳින් පවත්වාගෙන යන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ කියන්නේ අප ලබා ගත යුතු ඉලක්කයටත් වඩා එහාට ගිහින් තිබෙනවා.

[ගරු නිශාන්ත ජයවීර මහතා]

විපක්ෂය මොන තරම් චෝදනා කළත්, අලුතින් බදු ගහන්නේ නැතිව, තිබෙන බදු ක්‍රමය තුළ බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සහ බදු ගෙවන්නන්ගේ විශ්වාසය වඩාත් තහවුරු කර ගැනීම යන කරුණු තුළින් වඩාත් හොඳින් ආදායම එකතු කර ගැනීමේ ක්‍රියාවලියේ අප නිරත වෙනවා. මේ නිසා තමයි "දිට්වා" සුළි කුණාටුව වෙලාවේදී සහ පසු ගිය කාලයේ ඇති වූ මැද පෙරදිග යුද්ධය වෙලාවේදී පිටතින් ණය ගන්නේ නැතිව විශාල මුදලක් වියදම් කරන්න හැකියාව අපට ලැබුණේ. අපි ඒ සිද්ධිය හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, මුදල් අමාත්‍යාංශයත් ඉතාම කාර්යක්ෂමව ඉදිරි කටයුතු සිදු කරගෙන යන බව ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Thurairasa Ravikaran. You have nine minutes.

[பி.ப. 1.13]

ගරු තුරෙයිරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அவுஸ்திரேலியா வுக்கு 2.5 மில்லியன் ஐக்கிய அமெரிக்க டொலர் கடன் மீளச் செலுத்தல் தொடர்பாக இடம்பெற்ற இணையக் குற்றச் செயலுடன் தொடர்புடைய மோசடி குறித்த அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை தொடர்பான ஒத்திவைப்புவேளை விவாதத்தில், கடந்த காலத்துக்கான விசாரணை, நிகழ்காலத் துக்கான தொடர்ச்சி மற்றும் எதிர்காலத்துக்கான வலுப் படுத்தல் என மூன்று நிலைகளிலுமான அரசின் தொடர் செயற்பாடுகள்மீது கவனம் செலுத்த வேண்டியுள்ளது. இன்று விவாதிக்கப்படும் இவ்விணையவழிக் குற்றம், காலாவதியான மென்பொருள், பலவீனமான உள்ளகக் கட்டுப்பாடுகள், தெளிவற்ற பொறுப்புப் பகிர்வு, உரிய மேற்பார்வையின்மை மற்றும் நிறுவனங்களுக்கு இடையிலான ஒருங்கிணைப் பின்மை என்பவற்றின் கூட்டு விளைவால் ஏற்பட்டு, நாட்டுக்குப் பாரிய பொது நிதி இழப்பை ஏற்படுத்தியுள்ளது. அரசாங்க நிதி பற்றிய குழுவின் 2026.07.10ஆம் திகதிய அறிக்கையும் இதனைச் சுட்டிக்காட்டுகின்றது.

பல காரணி அடையாள உறுதிப்படுத்தல் இன்மை, வலுவான கடவுச்சொல் பயன்பாடின்மை, இவற்றோடு ஊழியர்களுக்கிடையே வரையறுக்கப்பட்ட பொறுப்புகள் மற்றும் கடமைகள் இல்லாத காரணத்தால், பொறுப்புக்கூறல் தோல்விகள், செயற்பாட்டுத் திறனின்மை என்பனவும் இனங் காணப்பட்டிருப்பதாகக் குற்றப் புலனாய்வுத் திணைக்களம், இலங்கை கணினி அவசர தயார் நிலைக்குழுவுடன் இணைந்து 2024 டிசம்பரில் மேற்கொள்ளப்பட்ட ஆய்வில் சுட்டிக் காட்டப்பட்டுள்ளது. மேற்படி குறைபாடுகள், 2026 சனவரி மற்றும் ஏப்பிரல் மாதங்களில் மேற்கொள்ளப்பட்ட மீளாய்வுகளின்போதும் சீர்செய்யப்படாது தொடர்ந்திருந்தமை கண்டறியப்பட்டுள்ளது. கிட்டத்தட்ட ஓராண்டுக்கு முன்னரே இவ்வாறான முறைமைகளில் உள்ள பலவீன நிலைகளை எடுத்துரைத்தும் அவற்றுக்கான தொடர் நடவடிக்கைகளை மேற்கொள்ள இயலாத உயிரோட்டமற்ற, விழிப்புணர்வற்ற நிருவாக நடைமுறையே இவ்விணையவழிக் குற்றத்துக்கு வழிவகுத்துள்ளது.

அரச நிறுவனங்களுக்கு இணையப் பாதுகாப்பு ஆலோசனைகளை வழங்குவது மாத்திரம் SLCERT அமைப்பின் கடமையாக இருக்கக்கூடாது. அதன் பரிந்துரைகள் நடைமுறைப்படுத்தப்படுகின்றனவா என்பதைக் கண்காணிக்கவும், அவற்றைப் பின்பற்றாத நிறுவனங்களிடம் விளக்கம் கோரவும், அவசர பாதுகாப்பு நடவடிக்கைகளை நடைமுறைப்படுத்தவும் தேவையான சட்ட மற்றும் நிருவாக அதிகாரங்கள் அதற்கு வழங்கப்பட வேண்டும்.

நிதி அமைச்சு மட்டுமல்ல, இலங்கையிலுள்ள பல அரச நிறுவனக் கட்டமைப்புகளிலும் இன்றளவிலும் காலாவதியான மென்பொருள்களும் பாதுகாப்புப் புதுப்பிப்புகளைப் பெறாத கணினி முறைமைகளும் பயன்படுத்தப்படுகின்றன. இவை தொடர்பான துல்லியமான தரவுகளைப் பெறும் வகையில் தீவளாவிய கணக்காய்வு தேவைப்படுகிறது. மேலும், அவ்வகையான மென்பொருள்களைப் புதுப்பிப்பதற்கும், மென்பொருள் மற்றும் இணையப் பாதுகாப்புக் குறைபாடுகளை உரிய காலத்தில் அறிவிக்கவும், சுயாதீன மாகப் பாதுகாப்புப் பரிசோதனைகளை மேற்கொள்வதற்கும் நியம, தேசிய பொறிமுறையொன்று வகுக்கப்பட வேண்டும். குறிப்பாக, அரச நிறுவனங்களின் கணக்குக் கிளைகள், சம்பளப் பிரிவுகள், வருமானச் சேகரிப்பு முறைமைகள், கொடுப்பனவுப் பிரிவுகள், வங்கி விபரங்கள் மற்றும் பொதுமக்களின் தனிப்பட்ட தகவல்களை நிருவகிக்கும் முறைமைகள் தொடர்பாகக் கூடுதல் கவனம் செலுத்தப்பட வேண்டிய தேவையுள்ளது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று விவாதிக்கப்படும் இந்தப் பிரச்சினை அரச நிறுவனங்களின் உள்ளக மற்றும் வெளிப்புறப் பரிவர்த்தனைகளுக்கு மட்டும் மட்டுப்படுத்தப்பட்டதன்று. மாறாக, இவ்வாறான இணையவழி முறைகேடுகளால் பொதுமக்களும் பாதிக்கப் படுகின்றனர். அரச மற்றும் பிரபல நிறுவனங்களைப்போல தம்மைக் காண்பிக்கும் போலி இணையத்தளங்கள், போலி மின்னஞ்சல்கள், குறுஞ்செய்திகள் மற்றும் வங்கிக் கணக்கு மாற்ற அறிவிப்புகள் ஊடாகப் பொதுமக்களும் நாளாந்தம் பெருமளவு பணத்தை இழக்கின்றனர். இவை தொடர்பான எச்சரிக்கைகளை SLCERT அவ்வப்போது வெளியிட்டாலும் இவ்வாறான பண மோசடிகள் இணைய வழியிலும், ஏனைய தொலைத்தொடர்பு வழிகளிலும் நடைபெற்ற வண்ணமே உள்ளன. எனவே, இவ்வாறான எச்சரிக்கைகள் பொதுமக்களை விரைவாகச் சென்றடைய வேண்டும். முறையான தகவல் பரிமாற்றக் கட்டமைப்பின் ஊடாக வங்கிகள், தொலைத்தொடர்பு நிறுவனங்கள், பிரதேச செயலகங்கள் உள்ளிட்ட, மக்களுடன் நேரடியாகத் தொடர்புறும் நிறுவனக் கட்டமைப்புகள் ஒருங்கிணைந்த வகையில் செயற்படும்போது இவ்வாறான மோசடிகளால் மக்கள் பாதிக்கப்படுவதை இயன்றளவு இழிவளவாக்கிக் கொள்ள முடியும்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இச்சம்பவத்தில் போலி விலைப்பட்டியல்கள் தயாரிக்கப்பட்டுள்ளன. அவுஸ்திரேலிய நிறுவனத்தின் உண்மையான மின்னஞ்சல் முகவரியை ஒத்த போலி முகவரிகள் பயன்படுத்தப்பட்டுள்ளன. புதிய வங்கிக் கணக்கு விபரங்கள் அனுப்பப்பட்டபோதும் அவை கடன் உடன்படிக்கையிலுள்ள விபரங்களுடன் முறையாக ஒப்பிட்டுச் சரிபார்க்கப்படவில்லை. அடுக்கு நிலைகளில் எச்சரிக்கைகள் ஏற்படுத்தப்பட்டபோதும் அவை

உயர்மட்ட அலுவலர்களிடம் தீவிரமாக எடுத்துச் செல்லப் படவில்லை. பொதுகடன் முகாமைத்துவ அலுவலகத்திற்குப் பொறுப்புகள் மாற்றப்பட்ட 18 மாத நிலைமாறு காலத்திற்கான விரிவான வழிகாட்டல், முன்கூட்டிய புரிந்துணர்வு உடன்படிக்கை மற்றும் செயற்றிறன் குறிகாட்டிகள் தயாரிக்கப் படவில்லை. மத்திய வங்கிக்கும் நிதி அமைச்சுக்கும் இடையிலான புரிந்துணர்வு உடன்படிக்கைகூட நிலைமாறு காலத்தின் இறுதிக் கட்டத்திலேயே - 2026 மார்ச் மாதத்தில் - கையெழுத்திடப்பட்டுள்ளது.

நிதி அமைச்சு ஒரு நிறுவனத்தைச் சுட்டிக்காட்டுவதும், மத்திய வங்கி மற்றொரு நிறுவனத்தைச் சுட்டிக்காட்டுவதும் அரசின் பொறுப்புக்கூறல் அல்ல. இவ்வரசாங்கமே தனது ஆட்சிக் காலத்தில் இடம்பெற்ற இந்த இணையவழிக் குற்றத்துக்கான அரசியல் மற்றும் நிருவாகப் பொறுப்புக் கூறலை ஏற்க வேண்டும். இன்று விவாதிக்கப்படும் இவ்விணையவழிக் குற்றத்தினூடாகவும், இதனுடன் தொடர்புடையதாகக் காணப்படும் இன்னமும் வெளிவராதுள்ள ஏனைய இணையவழிக் குற்றங்கள் ஊடாகவும் அரசுக்கு ஏற்பட்டுள்ள பொது நிதி இழப்புக்கான விசாரணைகளை அரசியல் மற்றும் நிருவாகத் தலையீடு களின்றிச் சுயாதீனமாகவும் வெளிப்படைத் தன்மையோடும் முன்னெடுக்க வேண்டும். அதற்கமைவாக, குற்றவியல் விசாரணைகளின் அடிப்படையில் பொறுப்பாளர்களாகக் கண்டறியப்படுபவர்களுக்கு எதிராக அவர்களின் பதவி நிலையைப் பொருட்படுத்தாது சட்ட நடவடிக்கை எடுக்கப்பட வேண்டும். இந்தப் பொதுநிதி இழப்பு, மக்களின் வாழ்க்கைச் செலவின்மீதோ அல்லது அவர்கள்மீது விதிக்கப்படும் மேலதிக வரிகளின் மீதோ மடைமாற்றப்படக் கூடாது. விசாரணை முடிவில் பொறுப்பாளர்களாகக் கண்டறியப்படுபவர் களிடமிருந்து நிதி ஒழுங்குவிதி 105 உள்ளிட்ட பொருத்தமான சட்ட ஏற்பாடுகளுக்கு அமைவாக ஏற்பட்ட இழப்பை மீட்டெடுக்க நடவடிக்கை எடுக்கவேண்டும்.

வெளிநாட்டுக் கடன் மீளச் செலுத்தும் நடவடிக்கைகள் பல காரணி அடையாள உறுதிப்படுத்தல், சரிபார்க்கப்பட்ட உத்தியோகபூர்வத் தொடர்புவழிகள் மற்றும் பல நிலைக் கொடுப்பனவு அனுமதி ஆகியவற்றின்கீழ் முன்னெடுக்கப்பட வேண்டும். இவ்விணையவழிக் குற்றம் வெளிப்படுத்தியுள்ள எச்சரிக்கையை இறுதி வாய்ப்பாகக்கொண்டு, அரசின் உள்ளக, வெளிப்புறத் தகவல் மற்றும் நிதிப் பரிமாற்றங்களுக்குத் தேவையான இலத்திரனியல் உட்கட்டமைப்பு, இணையப் பாதுகாப்பு மற்றும் காண்காணிப்புப் பொறிமுறைகள் உடனடியாக வலுப்படுத்தப்பட வேண்டுமெனவும் இப்பேரவை ஊடாக அரசாங்கத்தைக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்னும் ஒரு முக்கிய விடயமாக, ஓகஸ்ட் 04 ஆம் திகதியான நேற்றைய தினம் யாழ்ப்பாணம் நீதவான் நீதிமன்றத்தின் மேற்பார்வை யில் மீண்டும் ஆரம்பிக்கப்பட்டுள்ள செம்மணி மனிதப் புதைகுழியின் 3ம் கட்ட அகழ்வாய்வுப் பணிகள் பற்றி குறிப்பிட விரும்புகிறேன். அந்த செம்மணி மனிதப் புதைகுழி அகழ்வாய்வுகளில் இதுவரை மொத்தம் 483 எலும்புக்கூடுகள் அடையாளம் காணப்பட்டுள்ளன. அவற்றில் 481 மனித எலும்புக்கூடுகள் முழுமையாக அகழ்ந்து எடுக்கப்பட்டுள்ளன. மனிதப் புதைகுழி விடயத்தில், அடையாளம் காணப்பட்ட எலும்புத் தொகுதிகளை நிலத்தில் இருந்து அகழ்ந்து எடுப்பது என்பது முதற்கட்டச் செயற்பாடாகும். அத்துடன், வலிந்து காணாமல் ஆக்கப்பட்ட உறவுகளின் ஒப்புதலுடன் அவர்களின் மரபணுக்களைச் சேகரித்து, அவற்றைப் பன்னாட்டு மேற்பார்வையுடன் பாதுகாக்க நடவடிக்கை எடுக்கப்பட வேண்டும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Thurairasa Ravikaran, your time is up

ගරු තුරෙයිරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Give me one more minute please, Sir.

அதன் பிற்பாடு என்பு மாதிரிகளை அறிவியல் பூர்வமாக ஆய்வுசெய்வது இரண்டாவதுகட்ட நடவடிக்கையாகும். அதனைத் தொடர்ந்து, அகழ்ந்தெடுக்கப்பட்ட என்புத் தொகுதிகளின் கால எல்லை தொடர்பில் தொல்லியல் திணைக் களத்தினால் அறிவியல் அறிக்கை ஒன்று சமர்ப்பிக்கப்பட வேண்டும். மூன்றாவது கட்டமாகவே காணாமற்போன உறவுகள் தொடர்பான தேடுதல் விவகாரங்கள் ஆரம்பமாகும். யாராவது தங்களுடைய உறவினர்கள் குறிப்பிட்ட காலத்தில் காணாமற்போனதாகவோ அல்லது கைது செய்யப்பட்ட பின் இருப்பிடம் தெரியவில்லை என்றோ முறைப்பாடு வழங்கி யிருந்தால், தொல்லியல் திணைக்களம் கணித்துள்ள காலப்பகுதியோடு அந்தத் தரவுகளை ஒப்பிட்டு, பாதிக்கப்பட்ட உறவுகளின் மரபணு மாதிரிகளை ஆய்வு செய்யவேண்டிய சட்டத் தேவைப்பாடு உள்ளது. ஆனால், வலிந்து காணாமல் ஆக்கப்பட்ட உறவுகளின் மரபணுக்களைச் சேகரித்து, அவற்றைப் பாதுகாக்கும் காப்பகம் எதுவும் இதுவரை உருவாக்கப்படாத நிலையே காணப்படுகின்றது.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time has been far exceeded.

ගරු තුරෙයිරාසා රවිකරන් මහතා
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
முடிக்கின்றேன்.

எனவே, காணாமல் ஆக்கப்பட்டவர்களின் உறவினர்களின் மரபணுக்களை அவர்களின் ஒப்புதலுடன் சேகரித்து, அவற்றைப் பன்னாட்டு மேற்பார்வையுடன் பாதுகாக்கும் நடவடிக்கைகள் முன்னெடுக்கப்பட வேண்டும். மனிதப் புதைகுழி அகழ்வாய்வுகளில் பங்கேற்கின்ற சட்டத்தரணிகளில் ஒருவரான ரனித்தா ஞானராசா அவர்களும் அண்மையில் இது தொடர்பில் வலியுறுத்தியிருக்கின்றார். எனவே, இது தொடர்பிலும் கவனம் செலுத்தப்பட வேண்டுமெனத் தங்களிடம் கோரிக்கையை முன்வைக்கின்றேன். நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. M.K.M. Aslam. You have 10 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Sujeewa Dissanayake to the Chair?

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
Sir, I propose that the Hon. Sujeewa Dissanayake do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.

[பி.ப. 1.24]

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் மிக முக்கியமானதொரு விடயம் தொடர்பான விவாதத்தில் நாங்கள் கலந்துகொண்டிருக்கின்றோம். எமது நாட்டின் வெளிநாட்டுக் கடனான 2.5 மில்லியன் அமெரிக்கன் டொலரை மீளக்கொடுக்கும்பொழுது, குறித்த அந்தக் கடன் முறையாகக் கொடுக்கப்படவில்லை என்ற விடயம் தொடர்பில், அரசாங்க நிதி பற்றிய குழு விசாரித்து சமர்ப்பித்த அறிக்கையின் அடிப்படையில் இந்த விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இது, அந்தக் கொடுக்கல்வாங்கல் ஊடாக என்ன தவறு நடந்தது என்பதை இந்த நாட்டு மக்கள் அறிந்துகொள்வதற்கு நல்லதொரு சந்தர்ப்பமாகும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த cyber கொள்ளை - cybercrime பற்றி பேசுவோமானால், உண்மையில், உலகத்திலேயே மிக threat ஆனதும் மிகவும் அபாயகரமான ஒன்றாகவும்தான் cybercrime இருக்கின்றது. குறித்த கொடுக்கல்வாங்கலின் காரணமாக எமது நாட்டின் 2.5 மில்லியன் அமெரிக்க டொலர் பெறுமதியான பணம் மோசடி செய்யப்பட்டது என்பது நாங்கள் எல்லோரும் ஏற்றுக்கொள்ள வேண்டிய ஓர் உண்மை. இந்த cyber கொள்ளையின் ஊடாக, 2025ஆம் ஆண்டில் அமெரிக்காவில் மாத்திரம் 20 பில்லியன் அமெரிக்க டொலருக்கும்மேல் அதாவது 20,877 மில்லியன் அமெரிக்க டொலர்கள் நஷ்டம் ஏற்பட்டுள்ளது. அதேபோன்று, உலகம் பூராகவும் உள்ள நாடுகளில் cybercrime காரணமாக மாதம் ஒன்றுக்கு 4.8 பில்லியன் ரூபாவையும், நாளொன்றுக்கு 159 மில்லியன் ரூபாவையும் மக்கள், அரசாங்கங்கள் - நாடுகள் இழந்து நஷ்டத்துக்கு உள்ளாகின்றனர்.

இந்தப் பிழையான கடன் கொடுக்கல்வாங்கலையோ இதனால் ஏற்பட்ட நிதி இழப்பையோ நாங்கள் ஒருபோதும் நியாயப்படுத்தப் போவதில்லை. எமது தரப்பில் ஆளுங் கட்சியைச் சேர்ந்த அமைச்சர்களும் பிரதி அமைச்சர்களும் கருத்துத் சொல்லும்போது, technological part - தொழில்நுட்ப ரீதியாக ஏற்பட்ட பிழைகளைச் சுட்டிக் காட்டினார்கள். 2015ஆம் ஆண்டு BOC மூலம் மேற்கொள்ளப்பட்ட சில பணப் பரிமாற்றங்களில் 750,000 அமெரிக்க டொலர் இழப்பு ஏற்பட்டது. இது தொடர்பாகத் தொடரப்பட்ட வழக்கு இன்றுவரை நடைபெற்றுக் கொண்டிருக்கின்றது.

இந்தக் கொடுக்கல்வாங்கல் எவ்வாறு முறைகேடாக அல்லது பிழையான முறையில் நடைபெற்றது என்பதை ஆராயும்வேளையில், இந்த நாடு பொதுவாக முறையாக வழிநடத்தப்பட வேண்டும், ஒவ்வோர் அமைப்பும் ஒவ்வொரு நிறுவனமும் முறையான வழியில் செயற்பட வேண்டும் என்ற நோக்கில் எமது அரசாங்கத்தின் செயற்பாடுகள் இன்று நடைபெற்றுக் கொண்டிருக்கின்றது. வெளிநாட்டுக் கடன் கொடுக்கல்வாங்கலாக இருக்கலாம், ஏனைய விடயங்களாக இருக்கலாம் அவை யாவும் ஒரு முறையான வழியில் செயற்பட வேண்டும். இதற்கமையவே, 2024ஆம் ஆண்டு புதிதாக அறிமுகப்படுத்தப்பட்ட PDMAஇன்கீழ், PDMO - அரச கடன் மேலாண்மை Office - ஆரம்பிக்கப்பட்டது. அந்த ஒழுங்கு முறையின்கீழ், ERD என்ற வெளிநாட்டு வளங்கள் திணைக்களம் தனது பொறுப்புகளை PDMOவிடம் வழங்குகின்றது. இதற்கான முதலாவது 18 மாதங்கள், அதாவது 2024 நவம்பர் முதல் 2026 மே மாதம் வரையான காலப்பகுதி, ஒரு transit periodஆக - நிலைமாற்றுக் காலமாகக் கருதப் பட்டுக் கண்காணிக்கப்பட்டது. இந்தக் காலப்பகுதியில்தான் குறித்த கொடுக்கல்வாங்கல் நடந்துள்ளது. இந்தக் கடன் கொடுக்கல்வாங்கலில் இடம்பெற்றுள்ள தவறை யாராலும் நியாயப்படுத்த முடியாது. இந்தக் கடன் கொடுக்கல் வாங்கலுடன் சம்பந்தப்பட்ட Central Bankஆக இருக்கலாம் அல்லது ERDஆக இருக்கலாம், எவ்வாறு எந்த இடத்தில் பிழை நடந்துள்ளதோ அந்தப் பிழையை நாங்கள் பொறுப்பேற்றுக்கொண்டு முன்செல்ல வேண்டும்.

கடந்த காலங்களில் எமது நாட்டில் பல கொள்ளைகளும் மோசடிகளும் நடைபெற்றுள்ளன. உண்மையில் அதற்கு ஒரு நோக்கம் - චේතනාව இருந்தது; intention இருந்தது. ஆனால், இந்த அரசாங்கமும் அல்லது அரசாங்கத்துடன் தொடர்புடையவர்களும் எந்தவொரு கொள்ளையிலும் மோசடியிலும் சம்பந்தப்படமாட்டார்கள் என்பதை இன்று நாட்டு மக்கள் அனைவரும் ஏற்றுக்கொள்கின்றனர்; அவ்வாறு ஓர் உறுதியான நம்பிக்கை நாட்டு மக்களுக்கு ஏற்பட்டுள்ளது. இது ஒரு முக்கியமான விடயமாகும். ஆனால், கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் எவ்வாறு எவ்வளவு திட்டங்களைத் தீட்டினாலும் இதுபோன்ற களவும் கொள்ளைகளும் கொலைகளும் தொடர்ந்தும் நடக்கின்றது; அவை நடக்கக்கூடாது. அவ்வாறு நடைபெறாதவகையில் பாதுகாப்பு நடவடிக்கைகளை நாங்கள் எடுக்க வேண்டும். அவற்றை நாங்கள் வேடிக்கை பார்த்துக்கொண்டிருக்க முடியாது.

இந்தத் தவறு நடவடிக்கையின் பின்னால் யார் இருந்தார்கள்? எங்களுக்குத் தெரியும், கடந்த காலங்களில் Central Bankஇல் நடந்த மோசடியாக இருக்கலாம், சீனி இறக்குமதி மோசடியாக இருக்கலாம் அல்லது இந்த நாட்டில் நிகழ்ந்த மிகவும் மோசமான 'ஈஸ்டர்' தாக்குதலாக இருக்கலாம், இந்த அனைத்து மோசடிகளுக்கும் கொலைகளுக்கும் கொள்ளைகளுக்கும் பின்னால் அரசாங்கத்தின் தலைமைத்துவமே இருந்தது என்பது. அன்று போதைப் பொருளுக்கு எதிராக அரச அதிகாரிகள் செயற்படும்போது, நாட்டினுடைய தலைவரே போய் அவர்களைக் காப்பாற்றினார். ஆனால், இந்த cybercrimesக்குப் பின்னால் நிச்சயமாக அரசாங்கம் செயற்படவில்லை; மத்திய வங்கியின் Governor செயற்படவில்லை. இன்று இது ஒரு பிழையாக இருக்கலாம். ஆனால், இந்தப் பிழைக்குப் பின்னால் நாட்டின் நிருவாகிகளுக்கோ அல்லது அரச தரப்பினருக்கோ எந்தவொரு நோக்கமும் இருக்கவில்லை. இது தவிர்க்கப்பட்டிருக்க வேண்டிய ஒரு விடயம். இழக்கப் பட்ட நிதியை நாங்கள் மீண்டும் நாட்டுக்குப் பெற்றுக் கொள்ள வேண்டும்.

இந்தச் சம்பவம் நடந்ததற்குப் பின்னர் அரசாங்கம் மிகவும் transparencyஉடன் நடந்துகொண்டிருப்பதை நாங்கள் காணலாம். இதில் எந்தவொரு அரசியல் நோக்கமும் இல்லை. நிலக்கரி கொள்முதலில் மோசடி நடைபெற் றுள்ளது என்று கூறியபோதும், சிறைச்சாலையில் பிரச்சினை

ஏற்பட்டபோதும் நாங்கள் எதிர்க்கட்சிக்கு மிகவும் கண்ணியம் கொடுத்து, மிக அவசரமாக அது தொடர்பாக விவாதிப்பதற்கு அவர்களுக்குரிய சந்தர்ப்பத்தை வழங்கினோம்.

இந்த 2.5 மில்லியன் அமெரிக்க டொலர் இழப்பு ஏற்பட்ட பிறகு, இது சம்பந்தமாக அரசாங்க நிதி பற்றிய குழுவில் ஆராயப்பட்டது. அக்குழுவின் தவிசாளரான கௌரவ ஹர்ஷ த சில்வா அவர்களுக்கு நாங்கள் நன்றி கூறுகின்றோம். ஏனெனில், இந்த நாட்டில் முறையானதொரு திட்டம் வர வேண்டுமென்ற நோக்கத்தோடு அவர் அந்தச் செயற்பாட்டைச் சிறப்பாகச் செய்தார். அந்தச் செயற்பாடு இந்த நாட்டுக்கு மிக முக்கியமானது. எனவேதான் இன்று நாங்கள் அது பற்றி விவாதிப்பதற்கு சந்தர்ப்பம் வழங்கியுள்ளோம். அரசாங்க மானது எந்தவோர் இடத்திலும் இதை மூடிமறைக்கக்கூடிய எந்தச் செயற்பாட்டிலும் ஈடுபடவில்லை. கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, இந்த அரசாங்கத்துக்கு களவு, மோசடி, கொள்ளை போன்ற செயற்பாடுகளைச் செய்ய வேண்டிய எந்தத் தேவையுமில்லை என்பதை இந்த நாட்டு மக்கள் தெளிவாகப் புரிந்துகொண்டுள்ளார்கள். இந்த நாடு இந்த நிலைமைக்கு தள்ளப்பட்டதற்குக் காரணம், கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள்தான். கடந்த காலங்களில் இருந்த அரசியல்வாதிகள்தான் எல்லாவற்றுக்கும் leadership கொடுத்துள்ளார்கள்.

அன்று ஓர் அரசாங்க நிறுவனத்துக்கு எதிராக வழக்குத் தாக்கல் செய்யப்பட்டால், அப்போதிருந்த நீதி அமைச்சரோடு தொடர்புடையவர்கள்தான் அந்த வழக்கில் வாதிடக் கூடியவர்களாகவும் இருந்துள்ளார்கள். குறித்த வழக்குக்கு அரச நிறுவனம் சார்பாக ஆஜராகக்கூடிய வழக்கறிஞரை அவர் தடுக்கிறார்; அதற்கு தன்னிச்சையான ஒரு முடிவு கிடைக்கிறது; அதனால் நீதி அமைச்சர் இலாபமடைகிறார். இந்த நாட்டு மக்கள் நன்றாகப் புரிந்துள்ளார்கள், இந்த மோசடியைத் தடுக்க வேண்டுமென்ற உண்மையான உணர்வு எங்களுக்கு உள்ளது என்பதை. இது தொடர்பான அறிக்கைகளைப் பெற்று, அதற்குரிய நடவடிக்கைகளை நாங்கள் எடுப்போம். அரசாங்க நிதி பற்றிய குழு ஊடாக கிடைத்த தகவல்களை மையப் படுத்திய விசாரணைகள் CID ஊடாக அல்லது குறித்த நிறுவனங்கள் ஊடாக நடைபெறுகின்றன.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025දී cybercrimes නිසා ඇමෙරිකාවට බිලියන 20කට එහා පාඩුවක් සිදු වුණා නම්, 2025දී ලෝකය පුරා cybercrimes නිසා මාසයකට බිලියන 4.8ක් අහිමි වුණා නම්, දවසකට මිලියන 150ක් අහිමි වුණා නම්, - 2025-2026 දී ලංකාව ඩොලර් මිලියන 2.5ක් අහිමි කර ගත් එක අපි කිසිසේත් සාධාරණීකරණය කරන්නේ නැහැ. අපි මේ වාගේ අපරාධ නවත්වන්න හැදුවත් අපේ සීමාවෙන් එහා මේ වාගේ දේවල් සිද්ධ වෙන්න පුළුවන්. අපි ඒ සඳහා ආරක්ෂිත වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. පාස්කු ප්‍රහාරය සිද්ධ කරන්න ඕනෑ, ගල් අඟුරු වංචා කරන්න ඕනෑ, Sri Lanka Customs එකෙන් මොනවා හරි එකක් පන්නන්න ඕනෑ, මුදල් වංචා කරලා කාගේ හරි සාක්කුව පුරවන්න ඕනෑ, සීනි වංචා කරලා කාවහරි සතුටු කරන්න ඕනෑ කියන චේතනා වර්තමාන ආණ්ඩුවට නැහැ. අපි නීති ගෙනැල්ලා තිබෙනවා. හැබැයි, රටට, ජාතියට, ජනතාවට අහිතකර වන කිසිම නීතියක් මේ අවුරුදු එකහමාර තුළ අපි ගෙනැල්ලා නැහැ. අපි මේ විමර්ශනයට ඉතාම සාධාරණයක් ඉෂ්ට කරනවා කියන එක අවසාන වශයෙන් මා කියන්න ඕනෑ. වංචා කරපු මුදල් ආපසු ලබා ගැනීම සම්බන්ධව සාකච්ඡා පැවැත්වෙනවා. මෙවැනි දේවල් ඉදිරියට සිදු නොවෙන්න අපි කවුරුත් වගබලා ගන්න ඕනෑ. ඒ වගකීම අපි භාර ගන්නවා කියමින්, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.35]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ලාංකිකයන් හැටියට එකමුතුවෙලා ආඩම්බර විය හැකි කරුණු කාරණා ඇති වෙන්නේ ඉතාම කලාතුරකින්. මෙවර පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී රුමේෂ් තරංග කියන තරුණ ක්‍රීඩකයා අපේ රටට ලබා දී තිබෙන ආඩම්බරය, ගෞරවය පිළිබඳව අපි එතුමාට ශුභාශිංසනය පළ කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ කලාපයේ නීරාජ් චොප්රා සහ නදීම් වැනි ප්‍රමුඛ පෙළේ ඔලිම්පික් ශූරයන් සිටින අවස්ථාවකදීත් රුමේෂ් තරංග හෙල්ල විසිකිරීමේ තරගයේදී මීටර් 89.75ක දුරක්, - නීරාජ් චොප්රාගේ දුරට වඩා මීටර් 4කට වැඩි ප්‍රමාණයක් - වාර්තා කර තිබෙනවා. ඒ නිසා ඊළඟ ඔලිම්පික් ශූරතාවලියේදී - ඩන්කන් වයිට්ට පස්සේ, සුසන්තිකා ජයසිංහට පස්සේ අපේ රටට අනිවාර්යයෙන්ම පදක්කමක් දිනා ගැනීමට හැකියාවක් ලැබේවි කියන බලාපොරොත්තුව, අභිලාෂය අපට ඇති කර ගැනීමට එතුමා මඟ පාදා තිබෙනවා. එතුමාටත්, එතුමාගේ පුහුණුකරුවන්ටත්, එතුමා වැනි දක්ෂයෙක් බිහි කරපු ශාන්ත පීතර විද්‍යාලයටත් මගේ ප්‍රණාමය මුලින්ම පුදකර සිටිනවා.

විශේෂයෙන්ම අද දින විවාද කරන මාතෘකාව පිළිබඳව කථා කරද්දී මම සඳහන් කළ යුතු කාරණාවක් තිබෙනවා. ණය ආපසු ගෙවීමේ විශාල ගැටලුවකට මේ රට පත්වෙලා තිබෙනවා. ඒක, නොසැලකිලිමත්භාවය නිසා ඇතිවෙලා තිබෙන ප්‍රශ්නයක්.

මේ Public Finance Committee Report එකේ, Annexure 4හි page 9වල මෙසේ සඳහන් වෙලා තිබෙනවා:

> "It is observed that although the CBSL maintains that it acts solely as the banker to the government, the Ministry of Finance (MoF) is of the view that adequate attention does not appear to have been accorded to transactions, carrying potential Anti-Money Laundering (AML) implications, notwithstanding that such transactions had reportedly been identified by CBSL."

එතැනදී මහ බැංකුවත්, මුදල් අමාත්‍යාංශයත් අතර බෝලය පාස් කිරීමේ ක්‍රියාවලියක් තමයි සිදුවුණේ. අපි ඒක දැක්කා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් හැටියට අප එම නිලධාරින්ගෙන් ප්‍රශ්න කරද්දී ඔවුන් එකිනෙකාට මාරුවෙන් මාරුවට බෝලය පාස් කරන්න උත්සාහ කළා. නැත්නම් තමන්ගේ වගකීම වෙනත් කෙනෙකු වෙත පවරා, එය පැහැර හැර තිබෙන බවට වෙන කෙනෙකුට චෝදනා කරන්න තමයි ඒගොල්ලන්ට වුවමනා වුණේ. නමුත් එතැනදී දැකපු විශේෂ කාරණයක් තමයි, anti-money laundering legislation කියන එක.

That is a very clear matter. I apprised the Committee on Public Finance as well of that. If we take the issue relating to money laundering, in fact, under Section 7 of the Financial Transactions Reporting Act, the Central Bank, too, is responsible for transferring money on behalf of the Government. The Central Bank, being the banker to the State or the Government, did this transfer. Therefore, they are bound to report to the Financial Intelligence Unit about this transaction, that there was some suspicious dealing here. In fact, there had already

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

been some red flags; they had been shown that something wrong is happening. Having known that, they had continued to authorize and transfer these monies. So, the Central Bank, too, is responsible. And, when the Attorney-General came and exonerated the Central Bank, I, in fact, asked the official from the Attorney-General's Department about that particular Section in the legislation on financial reporting. It clearly states about an institution that transfers money. And here, the Central Bank transferred money on behalf of the State or on behalf of the Government as the banker to the State, as the banker to the Government. Therefore, they, too, are caught up in this. So, they should have reported it and should have been held responsible, even the Governor included. But, with the assistance of the Attorney-General's Department, he got away scot-free. Therefore, that is a matter which should be looked into. A lot of top officials are being sent to the gallows for negligence and for aiding and abetting even murder. Also, here, there had already been a suicide of a senior official; a life had been lost. So, it is a very serious matter. Here, the need to maintain maximum diligence had been missed out and therefore, the Central Bank cannot run away from their responsibilities.

Having said that and since there is limited time, Sir, I would like to divert and talk about some serious implications of the recent floods that is happening in my district, the Kandy District. The Kotmale Dam has once again filled up to the maximum; just a while ago, the report on the dam indicated that it has virtually reached the maximum level. This morning, too, there had been warnings. Even at 12 noon, there was a report stating that the Kotamale Reservoir has reached its spill level, that the water level was 702 msl, the gross storage was 168 mcm and the percentage of the gross storage was 98.7, just very close to the spill level. Then, the spillway discharge rate is 160 mcm and the bottom release rate is 130 mcm. So, the people living downstreams are still in fear though the flood level has receded; a lot of problems are being faced by them.

In Nawalapitiya alone, I would like to say that the Al Azhar School in the Selam Bridge area had been inundated several times over during the recent floods. In 2022, too, I mentioned in this House about the need to have buildings constructed for that school on upper ground or to relocate it elsewhere. Already, there is a building on higher ground, but that, too, had been inundated. That had happened all the time. A lot of people displaced from this area are staying at the Jayasundara Wedding Hall and the Anuruddha Kumara National School. There are more than 600 families who have been displaced. Of course, the Divisional Secretary is looking into their welfare. During the last floods due to Cyclone "Ditwah", the downstream areas of the Kotmale Reservoir, Gampola, Gelioya, Peradeniya and Katugastota got affected.

But, at that time, Nawalapitiya was not so badly affected. However, due to this recent flood, the towns in Kotmale downstream areas including Nawalapitiya, Balantota and other areas, too, have been inundated. So, this has been happening very frequently. Therefore, we need to have a relook at as to what could be done in that regard. Jayasundara, Ovita, Mapakanda, Godamuduna, Mecca Colony and Labuwalkotuwa areas have been totally inundated. Since these issues are recurring all the time, those should be addressed. I am told that during the 6th, 7th and the 8th , another cyclone is expected. ඒ කියන්නේ, තවත් සුළි කුණාටුවක් එන්න නියමිතයි කියලා දැන් අනාවැකියක් පළ කර තිබෙනවා, 06, 07 සහ 08 දිනවල. එම නිසා, මෙම ප්‍රදේශවල සිදුවන ආපදා තත්ත්වයන්ට මුහුණ දීම සඳහා සදාකාලික යන්ත්‍රණයක් අවශ්‍යයි. විශේෂයෙන්ම town planningවලදී, proper drainage plans are needed and we must also look at what needs to be done about the reservations of the rivers, particularly about the streams. ගෙලිඔය ටවුන් එක මෙවරත් සම්පූර්ණයෙන්ම යට වුණා. එහි අඩි 3ක, 4ක වතුර මට්ටමක් තිබුණා. ඉතින් එහෙම වෙලා තිබෙන්නේ එම ඇළ ළඟ කිසිදු ප්‍රමිතියකින් තොරව ගොඩනැඟිලි සෑදීම නිසායි. ඒ පිළිබඳවත් කල්පනා කරලා යමක් කළ යුතුයි. උඩුනුවර ප්‍රාදේශීය සභාවට මෙහිදී විශාල කාර්යභාරයක් පැවරෙනවා. උඩුනුවර ප්‍රාදේශීය සභාව ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් පාලනය වන ප්‍රදේශයක් බැවින් උඩුනුවර ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුළු නිලධාරින් ඒ සම්බන්ධව අවධානය යොමු කළ යුතුයි. ගෙලිඔය නගරය විතරක් නොවෙයි, ගම්පොල නගරය පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. Therefore, a total drainage plan has to be drawn up and the building requirements also have to be addressed. Saliyawala and Illawathura in Gampola have again been inundated. Many families have been evacuated. Of course, they have , now, slowly begun to go back to their homes, but once again, warnings have been issued with regard to the Kotmale Reservoir. Issuing a warning is a good thing. කොත්මලේ වේල්ලෙන් වතුර පිට කරන්න දොරටු අරින බව මෙවර දැනුම් දුන්නාට කලින් වතාවේදී දැනුම් දුන්නේ නැහැ. කලින් වතාවේදී වේල්ලේ වාන් දොරටු එක පාරටම ඇරියා. ඒකෙන් තමයි විශාල හානියක් සිදු වුණේ. ඒකෙන් විශාල පිරිසක් මරණයට පත් වුණා. දැන්, හිටපු පොලිස්පතිවරුන් හා හිටපු ආරක්ෂක ලේකම්වරුන් නොයෙකුත් දේවල්වලට එල්ලුම් ගස් යවද්දී, ඒ වැඩේ කළාට එම ඉංජිනේරුවරුනුත් එල්ලුම් ගස් යවන්න ඕනෑ. අපි ඒ පිළිබඳව විමර්ශනය කරන්න පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවකුත් පත් කළා. එම කාරක සභාවේ වාර්තාව තවම ඉදිරිපත් කරලා නැහැ. ඔබතුමන්ලා ඒ පිළිබඳව සලකා බලන්න. ඒ සම්බන්ධව නිසියාකාරව ක්‍රියා කිරීමට වැඩ පිළිවෙළක් අවශ්‍ය බව නැවතත් අවධාරණය කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආනන්ද විජේපාල අමාත්‍යතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.46]

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් මාස කිහිපයක් තිස්සේ මේ ගරු සභාවේ විතරක් නොවෙයි, පිටතදීත් කතිකාවක්

ගොඩනැඟිලා තිබුණා. ඒ අනුව මීට අදාළ තාක්ෂණික කාරණා විශාල ප්‍රමාණයක් මේ සභාව තුළ කතිකාවට බඳුන් වුණා.

විශේෂයෙන් රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට අපි සඳහන් කළ යුතුයි, මේ සිදුවීම වූ වහාම මේ පිළිබඳව විමර්ශනයක් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් විසින් අවශ්‍ය පියවර ගනු ලැබූ බව. ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරලා අධිකරණයට කරුණු වාර්තා කළා. ඒ වාගේම ඒ විමර්ශන දිගින් දිගටම තවදුරටත් සිදුවෙමින් පවතිනවා.

මෙහිදී අවධාරණය කරගත යුතු ප්‍රධානම කාරණය මෙයයි. මෙතැන යම් සිදුවීමක් වෙලා තිබෙනවා; ඩොලර් මිලියන 2.5ක මුදලක් අහිමි වෙලා තිබෙනවා. මෙය සයිබර් අපරාධයක් හැටියට දැනට වාර්තා වෙලා තිබෙනවා. මෙහිදී ව්‍යාජ email හරහා යම් මුදලක් ව්‍යාජ ගිණුම්වලට බැර කරවා ගැනීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ අහිමි වෙච්ච මුදල පිළිබඳව විවාදයක් නැහැ. මේකෙදි අලාභයක් වීම සම්බන්ධයෙනුත් විවාදයක් නැහැ. හැබැයි මෙතැනදි අපි විශේෂයෙන් අවධාරණය කරන්න ඕනෑ, සයිබර් අපරාධ හරහා රටට මුදල් අහිමි වීම සහ වෙනත් මුදල් වංචා හරහා රටට මුදල් අහිමි වීම, භාණ්ඩාගාරයට මුදල් අහිමි වීම වැනි කාරණාවලදී රජයක් හැටියට අපේ ආණ්ඩුව කටයුතු කරන ආකාරය පිළිබඳව. මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් මේ ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කළ වහාම විනිවිදභාවයෙන් යුතුව ඒ පිළිබඳව විමර්ශනයක් ආරම්භ කළා. ඒ වාගේම එහි ප්‍රතිඵලයක් හැටියට විශේෂයෙන් කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කළා. අධිකරණ නියෝගය අනුව විමර්ශන සඳහා තාක්ෂණික කමිටුවක් පත් කළා. කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අංශය, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධව තාක්ෂණික විද්වත් කමිටුවක් පත් කරලා මේ පිළිබඳ විමර්ශන කටයුතු ශක්තිමත් කළා. ඒ වාගේම මේ වනකොට ඉතාම ගැඹුරින් මේ විමර්ශන සිද්ධ කරමින් පවතිනවා, මේ සයිබර් අපරාධය තුළ යම් මූල්‍ය අපරාධයක් සිද්ධ වෙලා තිබෙනවා, මේකට වගකිව යුත්තේ කවුරුන්ද කියන කාරණා පිළිබඳව.

මෙහිදී නිලධාරින්ගේ පාර්ශ්වයෙන් යම් අඩුපාඩු සිද්ධ වෙලා තිබෙනවා. අපි ඒක පිළිගන්න අවශ්‍යයි. නමුත් මේකේ දෝෂාරෝපණය මුදල් අමාත්‍යාංශයට පැටවිය යුතු නැහැ. මේකේ දෝෂාරෝපණය මහ බැංකුවට පැටවිය යුතුත් නැහැ. හුඟක් අය මෙහිදී මුදල් අමාත්‍යාංශයට ඇඟිලි දිගු කරනවා. නමුත්, මුදල් අමාත්‍යාංශය කාර්යක්ෂමව කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, ගරු ජනාධිපතිතුමා මේ වනකොට මුදල් අමාත්‍යාංශය කාර්යක්ෂමව මෙහෙයවමින් ආර්ථිකය ඉතාම සාධනීය තත්ත්වයක් දක්වා ගෙනැල්ලා තිබෙන බවත්, ආර්ථික ස්ථාවරත්වය ගොඩනඟා තිබෙන බවත්. මේ කාරණා තුළ මේ අමාත්‍යාංශයට යම් ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා සමහර අවස්ථාවලදී කටයුතු කරන බව සමහර මන්ත්‍රීවරුන් කථා කරපු ආකාරයෙන් අපට පැහැදිලි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ වෙලාවේ මම ප්‍රකාශ කරන්න ඕනෑ, මීට අදාළ විමර්ශන ශක්තිමත්ව ඉදිරියට යන බව. මේ සම්බන්ධව CID එක විසින් කරන විමර්ශනයේ ප්‍රගතිය මේ සභාවට අවධාරණය කරන්න මම කැමැතියි. මේ වනකොට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ server පරිගණකයේ දත්ත සුරක්ෂිත කර තිබෙනවා. ඒ වාගේම එම දත්ත පිටපත් කර විශ්ලේෂණය කරමින් පර්යේෂණ සිදු කරනවා. ඒ වාගේම විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේත්, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයේත්, ශ්‍රී ලංකා මහ බැංකුවේත් නිලධාරින් 91දෙනෙකුගේ ප්‍රකාශ සටහන් කරගෙන තිබෙනවා. ඒ වාගේම බැංකු ගිණුම් තොරතුරු හා ඩිජිටල් සාක්ෂි ලබා ගැනීම සඳහා MLA ක්‍රමවේදය යටතේ විදේශ රාජ්‍යයන් 5කින් තොරතුරු ඉල්ලා තිබෙනවා. ඒ අනුව ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ස්විට්සර්ලන්තය හා සැම්බියාව යන රටවලින් MLA ක්‍රමවේදය හරහා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරලා තිබෙනවා. 24/7 ක්‍රමවේදය යටතේ International Desk එක වෙත ඉල්ලීම් කරලා තිබෙනවා, මේ ඩිජිටල් දත්තවල සුරක්ෂිතතාව තහවුරු කරන්න කියලා. සැකකරුවන් හඳුනා ගැනීම සඳහා අන්තර්ජාතික පොලීසිය සහ අදාළ රාජ්‍යයන් සමඟ ඒකාබද්ධව කටයුතු කරමින් ඒ තොරතුරු ලබා ගනිමින් ඉන්නවා. වංචනිකයින් අදාළ ව්‍යාජ ගිණුම වෙත බැර කරවාගෙන ඇති මුදල් සංසරණය වී ඇති ආකාරය පිළිබඳ තොරතුරු ඇමෙරිකානු මූල්‍ය බුද්ධි ඒකකය විසින් ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය වෙත මේ වනකොට ලබා දී තිබෙනවා. ඒ තොරතුරු ඔස්සේ තවදුරටත් විමර්ශනය කරමින් පවතිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදි මා අවධාරණය කරන්න අවශ්‍යයි, යම් සිද්ධියක් වුණාම, යම් අලාභයක් වුණාම ඒ පිළිබඳව හොඳ විධිමත් විමර්ශනයක් කරන්න ආණ්ඩුව කිසිසේත්ම පැකිළෙන්නේ නැහැ කියන එක. අපි විනිවිදභාවයෙන් යුතුව, සාධාරණව ඒ විමර්ශනය සිද්ධ කරනවා. මේ වනකොට නිලධාරින් කිහිපදෙනෙකු මේ සම්බන්ධව වැඩ තහනමට ලක් වෙලා තිබෙනවා. ඔවුන් යම් වගකීමකට බැඳෙනවා නම් ඒ සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග අරන් තිබෙනවා. ඒ අනුව මේ වනකොට මේ සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග අරන් තිබෙනවා. හැබැයි පෙර පැවති රජයන්, නැත්නම් ආණ්ඩු ඒ ආකාරයෙන් කටයුතු කරලා නැහැ. මීට පෙරාතුව 2014-2015 වාගේ කාලවකවානුවක කිරිහරකුන් 20,000ක්, නැත්නම් කිරි එළදෙනුන් 20,000ක් ලබා ගැනීම සඳහා ඕස්ට්‍රේලියාවේ Wellard Limited එකට ඇමෙරිකානු ඩොලර් මිලියන 11.09ක මුදලක් ලබා දී තිබෙනවා.

හැබැයි, එලෙස ලබා දුන්නු මුදල්වලින් රුපියලක්වත්, නැත්නම් ඩොලරයක්වත් ආපසු ලබා ගන්න හැකියාව ලැබිලා නැහැ. එලෙස ලබා දීලා තිබෙන්නේ ඩොලර් මිලියන 11.09ක්; රුපියල් කෝටි 175කට අධික මුදලක්. හැබැයි, ඒ ගනුදෙනුව සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් කරලා තිබුණේ නැහැ. මෙතරම් විශාල මුදලක් මේ රටට අහිමි වෙලා තිබියදීත් ඒ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් කරලා නැහැ. කිරි එළදෙනුන් මේ රටට ගෙන්වලාත් නැහැ. නමුත් එම ගනුදෙනුව නිසා විශාල මුදලක් අපේ රටට අහිමි වෙලා තිබෙනවා. පැවති රජයන් ඒ වාගේ අවස්ථාවලදී කටයුතු කරලා තිබෙන්නේ ඒ ආකාරයටයි. මේ සභාවේ ඩොලර් මිලියන 2.5ක මුදල ගැන මහ ලොකුවට උජාරුවට කථා කරන සමහර අය තමන්ගේ ආණ්ඩු කාල තුළදී සිදු වූ ඩොලර් මිලියන 11.09ක ගනුදෙනුව සම්බන්ධයෙන් කිසිවක් කර තිබුණේ නැහැ. අපි ඒ සම්බන්ධයෙනුත් විමර්ශනයක් ආරම්භ කරලා තිබෙනවා. ඕනෑම ආණ්ඩුවක් යටතේ ඕනෑම වෙලාවක රජයේ මුදල් අවභාවිතයක් වෙනවාද, නොසැලකිලිමත්කමින් ඒ මුදල් අහිමි වෙනවාද කියන ඒ සියල්ල සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. පැවති ආණ්ඩු සහ අපේ ආණ්ඩුව අතර ඇති වෙනස ඒකයි. යම් සිද්ධියක් වුණොත් ඒ සිද්ධිය සම්බන්ධයෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වීම, විනිවිදභාවයෙන් යුතුව විමර්ශනයක් ආරම්භ කිරීම අපේ වගකීම හැටියට සලකමින් අපි කටයුතු කරලා තිබෙනවා. මේ ඩොලර් මිලියන 2.5 සම්බන්ධවත් ඒ ආකාරයෙන් අපි කටයුතු කරලා තිබෙනවා. හැබැයි, ඔවුන්ගේ පාලන කාලවලදී ඇමෙරිකානු ඩොලර් මිලියන 11.09ක මුදල් ප්‍රමාණයක් අහිමි වෙලා තිබෙනවා. ඒ මුදලත් ගිහිල්ලා තිබෙන්නේ ඕස්ට්‍රේලියාවේ Wellard Company එකට. ඒ සම්බන්ධයෙන් කිසිදු විමර්ශනයක් කරලා තිබුණේ නැහැ. නමුත් අපි ඒ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම ආරම්භ කළා. මේ වනකොට ඒ විමර්ශනය අපි හොඳින් ක්‍රියාත්මක කරනවා.

[ගරු ආනන්ද විජේපාල මහතා]

ඒ විතරක් නොවෙයි, චීන සමාගමකට ඇමෙරිකානු ඩොලර් මිලියන 6.7ක මුදලක් ගෙවා තිබෙනවා. නමුත්, පොහොර ඇටයක්වත් නැහැ, මුදලුත් නැහැ. හැබැයි, ඔවුන්ගේ ආණ්ඩු කාලයේදී ඒ පිළිබඳව කිසිදු විමර්ශනයක් ආරම්භ වෙලා නැහැ. නිලධාරින්ට එරෙහිවත්, දේශපාලකයන්ට එරෙහිවත් එවැනි කිසිදු විමර්ශනයක් පවත්වා නැහැ. හැබැයි, අපේ ආණ්ඩු කාලය තුළ අපි ඒ පිළිබඳව විමර්ශන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒක තමයි අපේ ආණ්ඩුවේ තිබෙන වෙනස. අපි සිද්ධියක් වන එක වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගන්නවා වාගේම ඒ පිළිබඳව හොඳින් අවධානය යොමු කරලා ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරලා සාධාරණ තීන්දුවකට එළඹීම සඳහා කටයුතු කරනවා. ඒ වාගේම අනාගතයේදී එවැනි සිද්ධීන් සිදු වීම වැළැක්වීම සඳහාත් අවශ්‍ය සියලු පියවර ගන්නවා. ඒක තමයි වගකිව යුතු ආණ්ඩුවක් හැටියට අපට කරන්න පුළුවන් වන්නේ. ඒක තමයි අපි මේ කරමින් ඉන්නේ. නමුත් බොරු ප්‍රකාශ හරහා ආණ්ඩුව මේකට සම්බන්ධයි කියන මතය නිර්මාණය කිරීමට උත්සාහ කරනවා. එවැනි දෙයක් කරන්න කිසිසේත්ම හැකියාවක් නැහැ. මොකද, මේ සිදුවීම සිදු වූ මොහොතේ ඉඳලා මේ දක්වා අපි අරගෙන තිබෙන ක්‍රියාමාර්ග ඔස්සේ ඉතාම ස්වාධීනවත්, අපක්ෂපාතීවත්, විනිවිදභාවයෙනුත් යුතු විමර්ශනයක් මේ සඳහා කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයට අමතරව තවත් කාරණයක් මතු කරන්න අවශ්‍යයි. ඊයේ දිනයේදීත් පාර්ලිමේන්තුව තුළ මේ කාරණය පිළිබඳව කථා වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවසක පොහොට්ටුව පක්ෂයේ ලේකම්වරයා අපේ රටේ පොලිස්පතිවරයා සම්බන්ධයෙන් ප්‍රකාශයක් වාගේම තර්ජනයක් කළ බව ඔබතුමා දන්නවා. මේ තර්ජනය කළේ කවුද, මොන දේශපාලන ව්‍යාපාරයෙන්ද? ඇයි, මෙහෙම තර්ජනයක් කරන්නේ? මොකක් වෙනුවෙන්ද මේ තර්ජනය කරන්නේ? කාටද මේ තර්ජනය කරන්නේ? ඔබ දන්නවා, අපේ රටේ මේ වනකොට මේ පොලිස්පතිවරයාගේ නායකත්වය සහ මෙහෙයවීම යටතේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහිව දැවැන්ත ව්‍යාපාරයක් - මත්ද්‍රව්‍ය නිවාරණ ව්‍යාපාරයක් - දියත් වෙලා තිබෙන බව. කාලයක් තිස්සේ මේ රට අල්ලසට, දූෂණයට සහ වංචාවට භාජන වෙලා තිබුණා. දේශපාලකයෝ විශාල වශයෙන් ඒවාට සම්බන්ධ වෙලා හිටියා. ඒවාට එරෙහිව සිදු කළ විමර්ශන යටපත් කරලා තිබුණා. සමහර නඩු ඉල්ලා අස් කරගෙන තිබුණා. ඒ විමර්ශන සියල්ල නැවත ආරම්භ කරලා මේ වනකොට එම කටයුතු හොඳින් සිදු වෙමින් පවතිනවා.

අද පාතාල අපරාධකරුවන්, සංවිධානාත්මක අපරාධකරුවන් මේ රටේ විතරක් නොවෙයි විදේශ රටවලත් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඔවුන්ට එරෙහිව මෙහෙයුම් දියත් වෙලා තිබෙනවා. ඔවුන් මේ රටට ගෙන්වා ගැනීමට වාගේම ඔවුන් නීතියේ රැහැනට හසු කර ගැනීමටත් කටයුතු කරමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි දැවැන්ත වැඩ කොටසක් කරමින් ඉන්නකොට පොලිස්පතිතුමාට එරෙහිව තර්ජනය කරන්නේ මොන අරමුණකින්ද කියන එක මේ සභාව අවබෝධ කර ගත යුතුයි. මේ පොලිස්පතිවරයා මහ මහ මරා දමන්න ඕනෑ කියන සාහසික ප්‍රකාශය කරන්න තරම් ඔවුන් මොන තරම් මිලේච්ඡත්වයෙන් යුතුව, මනෝ විකාරී ස්වරූපයෙන් කටයුතු කරනවාද යන්න කාටත් පැහැදිලි කාරණයක්. මෙවැනි ප්‍රකාශ කරන්නේ කවුද? ජාවාරම්කාරයන්ගේ මුදල්වලින් යැපුණු, අල්ලස, දූෂණය සහ වංචාවට සම්බන්ධ වෙලා මේ රටේ ජනයාගේ මහජන දේපළ කොල්ල කාපු අයට එරෙහිව ක්‍රියාත්මක වනකොට, ඔවුන්ගේ ව්‍යාපාර අහිමි වනකොට, පොලීසිය ස්වාධීනව සහ අපක්ෂපාතීව විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරනකොට ඒකට එරෙහිව කරන ප්‍රකාශයක් හැටියට තමයි මම ඒක දකින්නේ.

මේක නීතියේ ආධිපත්‍යයට කරපු තර්ජනයක්; මේ රටේ නීතියේ, සාමයේ පැවැත්මට එරෙහිව කරපු තර්ජනයක්. ඒක අපි සුළුකොට තකන්නේ නැහැ. මේක බරපතළ කාරණයක්. මේවා තහවුරු කරනවා, ඒ පක්ෂවල නායකයෝ මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා. සුදු ඇඳගෙන, සාටක දමාගෙන හිටියාට මේ රටේ කරපු දැවැන්ත ඝාතනවලට, මංකොල්ලකෑම්වලට, මහජනයාගේ දේපළ විනාශ කිරීම්වලට පාදක වෙච්ච පිරිස් තමයි අද පොලිස්පතිවරයාගේ මේ නිවැරදි අපරාධ විමර්ශන ක්‍රියාවලියට එරෙහිව මෙවැනි ප්‍රකාශ කරන්නේ. ඒ හරහා කිසිසේත්ම අපි ආරම්භ කර තිබෙන මේ විමර්ශන අතරමඟ නතර කරන්න හෝ ඊට එරෙහිව බාධා පමුණුවන්න හෝ ඊට අභියෝග කරන්න ඔවුන්ට කිසිදු හැකියාවක් නැහැ. ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාර ක්‍රියාත්මක වෙච්ච ආකාරය ඒ කාලය තුළදී අපි හොඳින් දැක්කා. මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන් ගිහින් බදා ගත් ආකාරය, මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන් නිර්මාණය කරපු ආකාරය, පාතාලය නිර්මාණය කරලා බලය සඳහා එම පාතාලය යොදා ගත් ආකාරය, ඔවුන් එක්ක තමන්ගේ දේශපාලන ගනුදෙනු හදා ගත් ආකාරය, ඒ හරහා කළු සල්ලි උපයා ගත් ආකාරය පසුගිය කාලය පුරාවට අපි දැක්කා. ඒ සියල්ල පිළිබඳව දැන් විමර්ශන ආරම්භ වෙලා තිබෙනවා. සමහර සාක්ෂි විනාශ කර තිබුණත් කෙසේ හෝ එම විමර්ශන නැවත ආරම්භ වෙලා තිබෙනවා. ඒ සියලු ඝාතන පිළිබඳව විමර්ශනය කරන්න අවශ්‍යයි. මේ සියලු මූල්‍ය වංචා පිළිබඳව විමර්ශනය කරන්න අවශ්‍යයි. මේ රටේ මහජනයාගේ දේපළ කොල්ලකෑම් පිළිබඳව විමර්ශනය කරන්න අවශ්‍යයි. ඒ විමර්ශන නිසා බියට පත් වුණාම තමයි මේ විධියේ ප්‍රකාශ ඔවුන්ගේ මුවින් නොදැනුවත්වම පිට වෙමින් තිබෙන්නේ. ඔවුන්ගේ බලය වෙනුවෙන් මේ රටේ ජනතාව බිල්ලට ගත් එවැනි දේශපාලන ව්‍යාපාරවල ලේකම්වරු අපේ රටේ වර්තමාන පොලිස්පතිවරයාට තර්ජනය කිරීම සුළුකොට තැකිය හැකි කාරණයක් නොවෙයි. ඒ නිසා අපි මේ වනකොට දැනුම්දීමක් කර තිබෙනවා, මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කරන්න කියලා. මේ වනකොට මේ සම්බන්ධයෙන් පැමිණිලි ලැබී තිබෙනවා. මධ්‍යම අපරාධ විමර්ශන කාර්යාංශය ඒ සම්බන්ධව විමර්ශන ආරම්භ කර තිබෙනවා. මේ විමර්ශන ඉතාම කෙටි කාලයක් තුළ සාර්ථකව නිම කරන එක තමයි අපේ අදහස. ඒ සඳහා උපදෙස් දීලා තිබෙනවා.

මේ රටේ පොලිස්පතිවරයා අල්ලස, දූෂණය, වංචාවට එරෙහිවත්, අපරාධවලට එරෙහිවත්, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට එරෙහිවත් ගන්නා මේ උත්සාහය, පරිශ්‍රමය, මේ මෙහෙයුම් කිසි ලෙසකින්වත් අඩාළ කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය ශක්තිය සහ ධෛර්යය අපි ලබා දෙනවා. ඒ වාගේම, පොලිස්පතිවරයා යටතේ විමර්ශන සිදු කරන සියලු විමර්ශන නිලධාරින්ට අපි රැකවරණය සහ සුරක්ෂිතතාව හදලා දෙනවා. මොවුන්ගේ මේ පුහු බස්වලට, මේ අභියෝගවලට අපි කිසිසේත්ම සැලෙන්නේ නැහැ. අපි ආණ්ඩුවක් හැටියට ශක්තිමත්ව, ධෛර්යය සම්පන්නව සහ අධිෂ්ඨානශීලීව මේවාට එරෙහිව කටයුතු කරන්න සූදානම් කියන පණිවුඩය ලබා දෙමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.00]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට පෙර කථා කරපු පොලීසිය භාර ඇමතිතුමා පරණ කථා ගොඩක් කිව්වා. දැන් පරණ කථා නවත්වලා අලුත් කථා කරන කාලයක් තමයි ඔබතුමාට තිබෙන්නේ. ඔබතුමා අවුරුදු 2කට ආසන්න කාලයක් මේ පාර්ලිමේන්තුවේ වගකීම දරනවා. ඔබතුමා කිව්වා, ඝාතන ගැන. ඔබතුමා කිව්වා, මිනී මැරුම් ගැන. ඔබතුමා කිව්වා, පාතාල නායකයන් බඳා ගත්තා, මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් බඳා ගත්තා කියලා. ඒ බඳා ගත් ඒවා ගැන උත්තර දෙන්න, ඒ බඳා ගත් ඒවා ගැන හොයන්න තමයි ඔබතුමන්ලාට බලය දීලා තිබෙන්නේ. හැබැයි, මේ රටට ඝාතන සංස්කෘතිය ගෙනාපු, මේ රටට තුවක්කු සංස්කෘතිය ගෙනාපු, කොටි ත්‍රස්තවාදීන්ටත් ඉස්සෙල්ලා මේ රටට තුවක්කුව ගෙනාපු කණ්ඩායම අද කියනවා, ඝාතන රැල්ල ගැන, පාතාලය ගැන. අපි අහනවා, ඔය පාතාලය ගැන, ඝාතන ගැන කථා කරන්න ඔවුන්ට අයිතියක් තිබෙනවාද කියලා. ඔවුන් තමයි මේ රටට ඝාතන රැල්ල ගෙනාවේ. ඒක අපට අමතක කරන්න බැහැ. ඔවුන් තමයි තුවක්කු රැල්ල ගෙනාවේ. ඔවුන් තමයි අපේ National Identity Cards ටික හොරකම් කළේ. ඔවුන් තමයි මේ රටේ මිනිස්සුන්ගේ දේපළ වංචා කළේ. ඒ ඇමතිවරයා ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේදී අද ඒවා අමතක කරමින් කථා කරනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද එතුමාට අමතක වෙලා තිබෙනවා, උප පොලිස් පරීක්ෂකවරු 100ක් බඳවා ගැනීමේදී එතුමා අනීතිකව, ඉතාම නරක විධියට කටයුතු කළාය කියන එක.

අපේ ආණ්ඩුව ආවාම ඒවාටත් උත්තර බඳින්න බලාගෙන ඉන්න කියන කාරණයත් අපි මේ මොහොතේ මතක් කරනවා. විශේෂයෙන්ම මා ඒ පිළිබඳවත් සිහිපත් කරනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දවල් හීනද?

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ඔබතුමන්ලා හීන දකිමින් ඉන්න. හැමදාම හීන දකින්න පුළුවන්. හැබැයි, ඔය හීනවලින් ඔබ,- *[බාධා කිරීමක්]* කාට හරි කථා කරන්න අවස්ථාව ඕනෑ නම්, මම මගේ වේලාව දෙන්නම්. හීන තමයි හැබෑ වෙන්නේ. ඒ නිසා බලාගෙන ඉන්න, ඒ හීන සැබෑ වන දවසක් එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලිස්පතිවරයාට විරුද්ධව එක එක කථා කියන්නේ මොකද කියන කාරණය විමසනකොට අපි මේ කාරණය කියන්න ඕනෑ. පොලිස්පතිවරයා අද මාලිමාව ආණ්ඩුවේ පොලිස්පතිවරයා විධියටයි කටයුතු කරන්නේ. ඔහු මේ රටේ පොලිස්පතිවරයා නොවෙයි, අද ඔහු මාලිමාව ආණ්ඩුවේ පොලිස්පතිවරයා බවට පත්වෙලා. ඔවුන්ට ඕනෑ තීන්දු තීරණ ක්‍රියාත්මක කරන පොලිස්පතිවරයෙක් බවට පත්වෙලා තිබෙනවා. අනාගතයේදී ඔහුට ඒවාට උත්තර දෙන්න වේවි. හැබැයි, ඔහු කරන අනෙක් කටයුතු ගැන නොවෙයි අපි කියන්නේ. මත්ද්‍රව්‍ය වැටලීම් කරලා මත්ද්‍රව්‍ය අල්ලන්න ඕනෑ, පාතාලය මැඩලන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ කවුරුවත් විරුද්ධ නැහැ. අපි හැමෝම - මේ සමස්තයම - ඒකට එකඟයි. හැබැයි, මොවුන් පෙන්වන්න හදනවා, පොලිස්පතිවරයාගේ එම ක්‍රියාකලාපයට තමයි මේ විපක්ෂය විරුද්ධ කියන කාරණය. එම නිසා ඒ පිළිබඳවත් පැහැදිලි කරමින්, මීට පෙර ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා විසිනුත් සිහිපත් කළ කාරණයක් පිළිබඳව මම කථා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී වසර 20කට පසුව මේ රටට අද්විතීය සහ විශිෂ්ට ජයග්‍රහණයක් ගෙනාපු රුමේෂ් තරංගට, ඒ රන් පදක්කමෙන් අපේ රට සරසපු ඒ ක්‍රීඩකයාට සහ රිදී පදක්කමක් ගෙනාපු පාලිත බණ්ඩාර ක්‍රීඩකයාට අපි මේ මොහොතේ අපේ උත්තමාචාරය සහ මේ රටේ ගෞරවය පුද කළ යුතුයි. අපේ රටට මහා වටිනාකමක් එක්කර දුන්, ඒ වාගේම අනාගතයේදී මේ රටට ඔලිම්පික් පදක්කමක් ගෙන ඒමේ සිහිනය සැබෑ කරවීමට කටයුතු කරන රුමේෂ් තරංග ක්‍රීඩකයා ඇතුළු ඒ සමස්ත ක්‍රීඩකයින්ට අපේ ගෞරවය සහ උත්තමාචාරය පුද කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

අද දවසේ අපි සම්බන්ධ වෙලා ඉන්නේ, ඕස්ට්‍රේලියාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක ණය ආපසු ගෙවීමේදී සිදු වූ සයිබර් අපරාධය හා සම්බන්ධ වංචාව පිළිබඳ වූ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ගැන සාකච්ඡා කරන සභාව කල් තැබීමේ විවාදයටයි. අපි ඉතාම සතුටු වෙනවා, ඉතාම කාලෝචිත විවාදයකට සම්බන්ධ වීමට ලැබීම පිළිබඳව. විශේෂයෙන්ම ඊට පෙර අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ප්‍රධාන සමස්ත මන්ත්‍රීවරුන්ට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ. මොකද, ඔවුන් තමන්ගේ වගකීම ඉතාම හොඳින් ඉෂ්ට කරමින් අද දවසේ මේ වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අහිංසක ජනතාවගේ බදු මුදලින් විශාල මුදලක්, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් සයිබර් වංචාවක් මඟින් සොරාගෙන තිබෙනවා. මෙවැනි බරපතළ රාජ්‍ය මූල්‍ය හානියක් සිදු වන තෙක් අපේ රටේ මූල්‍ය පාලන පද්ධතිය දෑස් පියාගෙන සිටියේ කෙසේද යන්න පිළිබඳව අද රටට තිබෙන්නේ විශාල ගැටලුවක්. ඒ වාගේම, මෙම සයිබර් වංචාව සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර නිලධාරින්ගේ සම්බන්ධයක් හෝ බරපතළ නොසැලකිලිමත්භාවයක් තිබුණාද කියන කාරණය පිළිබඳව කඩිනමින් පරීක්ෂා කළ යුතුයි කියන කාරණයත් අපි මේ මොහොත් කියා සිටිනවා. මේ සා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් රටින් පිටට ගලාගෙන යද්දී ඊට අදාළ අනුමැතිය ලබා දුන් පාර්ශ්වයන් පිළිබඳව වහාම විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුයි. මෙම ගැටලුවේ මූලික අවදානම තිබෙන්නේ අපේ රටේ විදේශ ණය නැවත ගෙවීමේ ක්‍රමවේදයේ පවතින යල් පැන ගිය සහ අක්‍රමවත් ස්වභාවයේය කියන කාරණය මා මේ මොහොතේ සිහිපත් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සයිබර් අපරාධකරුවන් ගෝලීය වශයෙන් නවීකරණය වෙලා, ඔවුන් තාක්ෂණය ලබාගෙන, තාක්ෂණයෙන් සන්නද්ධ වෙලා තිබෙනවා. නමුත්, අපේ රටේ මූල්‍ය පද්ධතිය තවමත් ක්‍රියාත්මක වෙන්නේ ඩිජිටල් ආරක්ෂණ ක්‍රමවේදවලින් තොරවයි කියන කාරණයත් මා මේ වෙලාවේ සිහිපත් කරනවා. මෙම දුර්වලතාව සයිබර් අපරාධකරුවන්ට මෙරට මහජන මුදල් කොල්ලකෑමට පාලමක් තනා දී තිබෙනවාය කියන කාරණයත් මා සිහිපත් කළ යුතුයි. ඒ වාගේම මෙය සයිබර් අපරාධයක් ලෙස හුවා දක්වන්න බොහෝ දෙනෙක් උත්සාහ ගත්තත්, අපට මෙහි ඇතුළාන්තයේ වෙනත්

[ගරු චානක මාදුගොඩ මහතා]

කරුණක් පෙනෙනවා. පැහැදිලි ලෙසම තවත් ප්‍රධාන කරුණක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි, මෙය හුදෙක් පිටතින් පැමිණි තාක්ෂණික ප්‍රහාරයක් පමණක් නොව, අභ්‍යන්තරිකව සිදු වූ අපරාධයක් බවට තිබෙන දැඩි සැකය. අද දවසේ අපි දැක්කා, මේ වාර්තාවේ තිබෙන කාරණා. ඒ වාර්තාවේ සඳහන් වගන්තියක් මම කියවන්නම්.

විශේෂයෙන්ම මේ වාර්තාවේ නිගමනවල සඳහන් වෙනවා, මෙම වංචාව සම්බන්ධයෙන් සමස්තයක් ලෙස පරිපාලනමය වශයෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් වගකිව යුතුයි කියලා. ඒ වගකීම පිළිබඳ චෝදනාව එල්ල වෙලා තිබෙන්නේ කාටද? ඔබේ ආණ්ඩුවේ හිටපු මන්ත්‍රීවරයෙක් තමයි මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා බවට පත් කළේ. එතුමා ඒ වගකීම දරනකොට තමයි මෙය සිදු වුණේ. එතකොට මේ ක්‍රියාවලිය පිටුපස යම් දේශපාලන කෝණයක්, දේශපාලන අරමුණක් තිබෙනවා නේද, කියන ප්‍රශ්නාර්ථයත් අපි හමුවේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය වැනි අතිශය සංවේදී, අධි ආරක්ෂිත රාජ්‍ය ආයතන දෙකක් තුළ මෙවැනි මහා පරිමාණයේ මූල්‍ය වංචාවක් සිදු වනවා නම්, එය අභ්‍යන්තර අනුබලයකින් තොරව කිසිසේත්ම සිදු කරන්න බැහැ. මෙතරම් මහා පරිමාණ මූල්‍ය වංචාවක් බියකින් තොරව සිදු කිරීමට තරම් මේ අය පිටුපස තිබෙන දේශපාලන බලය කුමක්ද කියන කාරණය අපි සෙවිය යුතුයි. මෙය සයිබර් වංචාවක් විධියට හුවා දක්වන්න උත්සාහ ගත්තත්, මෙයට ආරක්ෂාව සැපයුවේ කවුද, නිලධාරින් නහර කපාගෙන මැරෙන සිද්ධි සිදු වුණේ ඇයි කියන ප්‍රශ්න ටික තවම ඉතිරි වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නයේ වින්දිතයන් වෙලා ඉන්නේ නිලධාරින් විතරයි. මේ සිද්ධිය පිටුපස ඉන්න මහ මොළකරු තවමත් වාර්තාවලින් හඳුනා ගෙන නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මහජන මුදල් පවතින්නේ අතිශය අවදානම් තැනක. ඒවා සුරක්ෂිත යැයි කියන්න කිසිදු ශක්තිමත් සාක්ෂියක් අපට පෙනෙන්නේ නැහැ. ඒ නිසා මේ ආණ්ඩුවෙන් අපි ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ඔබ වග කියන්නේ මේ රටේ ජනතාවගේ මුදල්වලට. ඒ කටයුත්ත හරියාකාරව ඉෂ්ට කිරීම ඔබේ වගකීමක් විධියට සලකන්න කියා අපි ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම තව එක කාරණයක් මතක් කරන්න කැමැතියි. අද ඊශ්‍රායලයේ රැකියා කරන 6,000කට අධික අපේ තරුණ තරුණියන් පිරිසක් විශාල ගැටලුවකට මුහුණ දී තිබෙනවා. ඔවුන් ඒ ඇති කරගත් ගිවිසුම්වලින් ඉවත් වෙලා වෙනත් රක්ෂාවලට ගිහිල්ලා තිබෙනවා. හැබැයි, එහෙම වෙනත් රක්ෂාවලට යන්න සිදු වුණේ ඔවුන්ට ගිවිසුම්ගත වුණු මුදල ලබා නොදීම පිළිබඳ යම් යම් කාරණා නිසා. ඒ නිසා මේ රටෙන් විදේශගතව ඉන්න 6,000කට අධික පිරිසක් මේ මොහොත වන විට ඉතාම අනාරක්ෂිත තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඔවුන් ඒ අනාරක්ෂිත තත්ත්වයෙන් ඉවත් කරගත යුතුයි. ඒ නිසා ගරු ඇමතිතුමාගෙන් මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ ගිවිසුම් කඩවීම නිසා විවිධ විධියට ප්‍රශ්න මතු වෙලා ඉන්න ඒ 6,000ට අධික පිරිස වෙනුවෙන් රජයන් දෙක අතර යම් මැදිහත්වීමක්, යම් එකඟතාවක්, යම් කථා බහක් සිදු කර, සරණාගත වීසා ලබා දීම සඳහා කටයුතු කර, ඔවුන්ගේ රැකියාව ආරක්ෂා කර දෙන්න කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු ඇමතිතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා වැරදි අදහසක් ඉදිරිපත් කළා, උප පොලිස් පරීක්ෂකවරු 100ක් බඳවා ගැනීම පිළිබඳ කාරණාව සම්බන්ධයෙන්. විශේෂයෙන් මම මේ සභාවට මීට පෙරාතුවත් මේ කාරණය පිළිබඳව අවධාරණය කර තිබෙනවා. අපි බලයට පත්වන අවස්ථාව වන විට උප පොලිස් පරීක්ෂකවරු 100ක් තෝරාගෙන තිබුණා. ඒ සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි 17ක් පරීක්ෂා කරලා, ඒ බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඒ සඳහා විමර්ශන කමිටුවක් පත් කරනු ලැබුවා. ඒ විමර්ශන කමිටුවේ අවසාන වාර්තාවේදී සඳහන් කර තිබුණා, විභාගය සමත් 2,535ක් අතරින් තෝරා ගත්ත මේ 100ක පිරිසට ඒ තෝරා ගැනීමේදී වැරදි සහගත ලෙස ලකුණු ලබා දුන්නා කියලා. ඒ අනුව 19දෙනෙක් ඒකෙන් ඉවත් කර අලුත් 19දෙනෙක් ඒ කියන්නේ, විභාගය සමත් 19දෙනෙක් ඒ ලැයිස්තුවට ඇතුළු කර තිබෙනවා. ඒ අනුව ඒ 100ක පිරිස මීට මාස දෙක තුනකට පෙරාතුව බඳවා ගෙන මේ වෙනකොට Police Collegesවල පුහුණුව ලබමින් ඉන්නවා. ඒ නිසා මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වේ, වැරදි ප්‍රකාශයක්. මොකද, බඳවා ගැනීමේ පටිපාටි උල්ලංඝනය කර අසාධාරණ ලෙස බඳවා ගැනීම් කරනවා නම්, ඊට එරෙහිව කටයුතු කරන්න ඕනෑ. ඒක අපේ වගකීමක්. ජාතික පොලිස් කොමිෂන් සභාව තිබෙනවා. කොමිසම ඒ පිළිබඳව දැනුවත් කර තිබෙනවා. මම හිතන විධියට, මේ මහත්වරුන්ගේ පාර්ශ්වයෙන් FR cases 10ක් දමලා තිබුණා. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිල්ලක් කර තිබුණා, වියදමක් දරලා තෝරා ගත්ත අයට පත්වීම් දුන්නේ නැහැ කියලා.

ඒ සියල්ල අවසන් කරමින් අපි බඳවා ගැනීම් කළා. ඒවා සියල්ල විනිවිදභාවයෙන් කළා. අදත් මේ රටේ තරුණ තරුණියන් 125,000ක් රජයේ සේවයට බඳවා ගන්නේ කිසිදු දේශපාලන මැදිහත්වීමකින් තොරවයි. ඒ හින්දා මේ කියන කාරණා කිසිසේත් භාර ගත හැකි කාරණා නොවෙයි. මේවා ප්‍රතික්ෂේප කළ යුතු කාරණා හැටියට මා මෙහිදී සඳහන් කරනවා.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එතුමාගේ ප්‍රකාශයට කිසිසේත් එකඟ වෙන්න බැහැ. අපි එතුමාට අභියෝග කරනවා, පුළුවන් නම්,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විවාදයක් එපා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
විවාදයකට යනවා නොවෙයි. එතුමා දීර්ඝ කථාවක් කළා. මට පොඩි අවස්ථාවක් හෝ දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, ඒ සම්මුඛ පරීක්ෂණයට වාඩි වෙලා හිටපු, ඒ සම්මුඛ පරීක්ෂණය කරපු නිලධාරින් වරදක් කරලා තිබෙනවා නම් ඒ නිලධාරින් සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද? මොකද, ඒ නිලධාරින් තමයි සම්මුඛ පරීක්ෂණය කළේ. ඒ දරුවන් කිසිදු දේශපාලන මට්ටමකින් බඳවා ගත්ත පිරිසක් නොවෙයි. ඔවුන් දක්ෂතාවෙන් පරිපූර්ණ දරුවන්. ඒ දරුවන් සම්බන්ධයෙන් දේශපාලන වුවමනාවට මෙතුමන්ලා අද කටයුතු කර තිබෙනවා කියන කාරණාව තමයි අපට කියන්න තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමනි, විවාදයකට යන්න එපා. කාලය පිළිබඳ ගැටලුවක් තිබෙනවා.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන විදියට, එතුමාට මං කියන කාරණය පැහැදිලි නැහැ. ඒ කාරණය තමයි මා මෙතැනදී කිව්වේ. මම කිව්වේ නැහැ දේශපාලන මැදිහත් වීමක් කියලා. මම කිව්වේ, ඒ අය තෝරා ගැනීමේදී නැති සහතිකවලට වැරැදි විධියට යම් ලකුණු ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා කියලායි. ලකුණු 80ක් දෙනවා, සහතිකවලට. ලකුණු 20ක් දෙනවා, සම්මුඛ පරීක්ෂණයෙන්. ලකුණු 80 ලබා දීම තුළ ඔවුන් සතුව නොමැති සහතික ප්‍රමාණයකටත් ලකුණු දීලා තිබුණා. එතැන වැරැද්දක් වෙලා තිබුණා. ඒ වැරැද්ද නිවැරදි කරලා තිබෙනවා. ඒක තමයි මම මේ ගරු සභාවට කිව්වේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳ ගැටලුවක් තිබෙනවා. තවත් කථිකයෝ ගොඩක් ඉන්නවා, ගරු අමාත්‍යතුමනි.

මීළඟට, ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු කිට්නන් සෙල්වරාජ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair, and THE HON. KITNAN SELVARAJ took the Chair.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව ආරම්භ කරන්න.

[අ.භා. 2.14]

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බෙහෙවින් ස්තුතියි, මට කාලය ලබා දීම පිළිබඳව. මම ප්‍රථමයෙන්ම ලංකාවේ බාහුබලි රුමේෂ් තරංගයන්ට අපේ ජාතියේ ගෞරවය පිරිනමනවා, ලක් මාතාව රනින් සැරසීම සම්බන්ධයෙන්. ඒ වාගේම අපි ඔහුට සුබ පතනවා. පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී අපේ රටට රන් පදක්කමක් දිනා දීම සම්බන්ධයෙන් ඔහුට මුළු ජාතියේම ශුභාශිංසන පිරිනමනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව තුළ පැවැත්වෙන මෙම සාකච්ඡාවේදී විපක්ෂය ටිකක් බය වෙලා වාගේ කථා කරනවා අපි දකිනවා. විපක්ෂ නායකතුමාට මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන් දරා ගන්න බැරි තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙන බව අපි දැක්කා. ප්‍රාථමික අතිරික්තය IMF එකේ ඉලක්කය පන්නලා ගිහිල්ලාලු. ඒ විතරක් නොවෙයි, මේ රටේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට විශාල අගයක්ලු. ඒ විතරක් ද නොවෙයි. එතුමා කියනවා, අපි මේ සියල්ලම කරන්නේ IMF එක සතුටු කරන්නයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වර්තමාන ආණ්ඩුවට උරුම වුණේ ණය බරින් පිරිච්ච රටක් බව අපි දන්නවා. එහි දුර්වල වෙච්ච රාජ්‍ය ආයතනයි තිබුණේ. රටේ අනාගතය පිළිබඳ විශ්වාසය බිඳ වැටුණු ජනතාවක් වෙසෙන සමාජයක් එදා තිබුණේ. 2022 අප්‍රේල් මාසයේදී විදේශ ණය ගෙවීම් ඒකමතිකව අත් හිටුවනවා අපි දැක්කා. ඒ වාගේම, ඉතිහාසයේ ප්‍රථම වරට අපි ස්වෛරී ණය ගෙවීම පැහැර හැරීම කරනවා. අපේ විදේශ විනිමය සංචිත හිඳිලා යනවා. මෙන්න මෙහෙම තත්ත්වයක් තිබියදී තමයි අපි මේ රටේ ආර්ථිකය භාර ගන්නේ.

අද වන කොට මොකද වෙලා තිබෙන්නේ කියලා අපි දන්නවා. මේ රට ඉහළ මැදි ආදායම් ලබන රටක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මේ රටේ ඒක පුද්ගල ආදායම, දළ

[ගරු විජේසිරි බස්නායක මහතා]

දේශීය නිෂ්පාදිතය වර්ධනය වෙලා තිබෙනවා. මේ අවුරුද්දේ පළමුවැනි කාර්තුව ගත්තාම, සියයට 5.1ක ආර්ථික වර්ධනයක් අපි ලබා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ණය ශ්‍රේණිගත කිරීම්වල CCC+ මට්ටමට එනවා. ඒ විතරක් ද නොවෙයි. අපි Transfer and Convertibility assessment එකේ B- තත්ත්වය උදා කර ගන්නවා. අපි මෙවැනි තැනකට අපේ රට ගෙනැවිත් තිබෙනවා. මෙයට නායකත්වය දෙන්නේ කවුද? ඒ, මේ රටේ ජනාධිපතිතුමායි. ඒ වාගේම, එතුමා මේ රටේ මුදල් ඇමතිවරයායි. මෙන්න මේක තමයි ඇත්ත තත්ත්වය. ඒ විතරක් නොවෙයි, එතුමා මේ රටේ සමාජය වෙනස් කිරීමේ ක්‍රියාවලියටත්, පරිවර්තන ක්‍රියාවලියටත් අත ගහලා තිබෙනවා. අන්න ඒක බලාගෙන ඉන්න බැරි විපක්ෂය අද වන කොට මොනවාද කියන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අප මේ කරුණු කාරණා සාකච්ඡා කරන්නේ, Export Finance Australia කියන කොම්පැනියට ණය ආපසු ගෙවීමට තිබූ ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක මුදල වංචා කිරීම පිළිබඳව - ඒ සයිබර් අපරාධය පිළිබඳව - රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරපු වාර්තාව පදනම් කරගෙනයි. ඒක සයිබර් අපරාධයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද හැකර් සිද්ධියක් කියන්නේ? යම්කිසි පද්ධතියක් තුළ තිබෙන දුර්වලතා භාවිත කරලා අනවසරයෙන් ඒකට ඇතුළු වීමයි. එය සිදු වන්නේ කොහොමද? සමහර විට පරිගණක ජාලයේ දුර්වලතා නිසා, ඒ පද්ධති update කරලා නැති නිසා, යාවත්කාලීන කරලා නැති නිසා, දුර්වල මුරපද නිසා, phishing වැනි වංචා ක්‍රම ආදිය නිසා මෙවැනි දේවල් සිදු වෙනවා. මේ අනුව, සයිබර් අපරාධයක් කියන්නේ, අන්තර්ජාලය, පරිගණක ජාල, ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ආශ්‍රිතව සිදු කරනු ලබන අපරාධයක්. ලංකාවේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම සයිබර් අපරාධ සිදු වෙනවා. අපි දන්නවා, දිනකට මිලියන 150කට වැඩි සයිබර් අපරාධ ප්‍රමාණයක් ලෝකය පුරා සිදු වන බව. එහෙම නැතුව විපක්ෂය කියන විධියට ඒක අතරමැදියෙකු ළඟ ඉඳලා කරපු වංචාවක් නොවෙයි. මම විපක්ෂයේ ගෞරවනීය මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා, මේ වාර්තාව හොඳට කියවන්න කියලා.

2022 අප්‍රේල් මාසයේදී ද්විපාර්ශ්වික සහ වාණිජ ණය හිමියන් වෙත ණය ආපසු ගෙවීම අපි ඒක පාර්ශ්විකව අත්හිටුවනවා. ඊට පස්සේ මොකද වෙන්නේ? අපි ඔවුන් සමඟ එකඟතාවක් ඇති කර ගන්නවා. විශේෂයෙන්ම ඒ ණය ප්‍රතිව්‍යුහගතකරණය - debt restructuring - කරනවා. අන්න එතැනදී මේ ණය කළමනාකරණ වගකීම විශේෂයෙන්ම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත -PDMO වෙත - පවරනවා. මේක සිදු වෙන්නේ, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතට අනුවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය කළමනාකරණය කරන කොට කාරණා කිහිපයක් සිදු වෙනවා. ඒවායෙන් විශේෂ වන්නේ ණය ගැනීම වාගේම ණය පියවීමයි. ඉහත කී පරිදි ණය කළමනාකරණ කාර්යාලය වෙත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යය පැවරීමේ ආයතනික සංක්‍රමණික ක්‍රියාවලිය සිදු වෙනවා. ඒ සඳහා 2026 මැයි මාසය දක්වා මාස 18ක සංක්‍රමණික කාල පරිච්ඡේදයක් ලබා දෙනවා. ඒ භාරදූර කාර්යය PDMO එකට පවරන්න ඉස්සෙල්ලා එහි මූලික වගකීම තිබුණේ ශ්‍රී ලංකා මහ බැංකුවටයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ප්‍රමුඛ ආයතන ගණනාවක් එකතු වෙලා තමයි ණය ගෙවීමේ ක්‍රියාවලිය සිදු කළේ. විශේෂයෙන්ම එහි පියවර කිහිපයක් තිබෙනවා. මුලින්ම විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් ණය හිමියන්ගෙන් ඉන්වොයිසි ලබාගෙන, එහි ණය කළමනාකරණ අංශය විසින් ඒවා සකස් කිරීම, සත්‍යාපනය කිරීම - verification - සහ අනුමත කිරීම සිදු කරනවා. ඒකේ දෙවැනි පියවර විධියට, එහෙම අනුමත කරපු ඉන්වොයිසි ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත යොමු කරනවා. ඒකේ තුන්වන පියවර වන්නේ, සෑම ප්‍රමිතිගත ගෙවීම් උපදෙසකම අවශ්‍ය ගෙවීම් තොරතුරු අඩංගු බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් දෙපාර්තමේන්තුව විසින් සත්‍යාපනය කරන එකයි. ඒකේ අවසාන පියවර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය සංචිත භාවිත කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලාභීන්ගේ - beneficiariesලාගේ - ගිණුම් වෙත ජාත්‍යන්තර SWIFT පද්ධතිය ඔස්සේ ගනුදෙනුව සිදු වීමයි. මෙන්න මේක තමයි එතෙක් සිදු කරමින් ආවේ. මෙහෙම සිදු කරමින් ආපු ඒ දැවැන්ත, භාරදූර ක්‍රියාවලිය ඒ සඳහා සුවිශේෂ වූ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පවරනවා. අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, එය භාරදූර, සංකීර්ණ ක්‍රියාවලියක් බව. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත එම වගකීම් පැවරීම හා සම්බන්ධ කරුණු ගණනාවක් ගැන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ මේ වාර්තාවේ සඳහන් කරනවා.

විශේෂයෙන්ම මේ සංකීර්ණ, බහු ආකෘතික, සංක්‍රාන්ති ක්‍රියාවලිය සඳහා විස්තරාත්මක මාර්ගෝපදේශයක් - direction එකක්, කාර්ය නියමයක් - ToR එකක් - පැහැදිලි වෙලා තිබුණේ නැහැ. ඒ වාගේම මේ සංක්‍රාන්තිය සිදු කිරීමේ දී එය අවසන් කිරීමට අවශ්‍ය ප්‍රධාන කාර්යය සාධන දර්ශකවලට අපි කියනවා KPIs කියලා. ඒවා දකින්න තිබුණේ නැහැ. රාජ්‍ය ණය කළමනාකරණ මෙහෙයුම් පාලනයට අදාළ මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ PDMO එක ස්ථාපිත කරලා මාස 10කට පස්සේ. ශ්‍රී ලංකා මහ බැංකුවයි, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයයි අතර සහයෝගිතා ක්ෂේත්‍ර පිළිබඳ, අවබෝධතා පිළිබඳ ගිවිසුම අත්සන් කරලා තිබෙන්නේ 2026 මාර්තු 09වෙනි දා. මෙන්න මෙවැනි කාරණා රාශියක් නිරීක්ෂණය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් අපි සඳහන් කරන්න ඕනෑ ඒ තොරතුරුවලින් පැහැදිලි වෙන්නේ ඒ සයිබර් අපරාධය සිදු වෙලා තිබෙන්නේ PDMO එකේ කාර්යය මණ්ඩලයට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඔවුන්ට අවශ්‍ය on-the-job training ලබා දීපු කාල පරාසයේ බව. ඒ සිදුවීම ආරංචි වෙච්ච මුල්ම අවස්ථාවේ මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා ඒ මොහොතේම ක්‍රියාත්මක වෙලා ඒ අවශ්‍ය පියවර ඉතා ඉක්මනට ගත්තා. විශේෂයෙන්ම ඒ ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුවත් කළා. ඒ වාගේම ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය දැනුවත් කළා. ශ්‍රී ලංකා මහ බැංකුවේ Financial Intelligence Unit - FIU - එක දැනුවත් කළා. මෙන්න මේ විධියට ඒකට අවශ්‍ය ක්‍රියා සිදු කළා.

ඒ විතරක් නොවෙයි, අභ්‍යන්තර තාක්ෂණික කමිටුවක් නිර්මාණය කරලා ඒකෙන් නිර්දේශ සහිත වාර්තාවක් අරගෙන ඒ අවශ්‍ය කාරණා ටික ඉෂ්ට කළා. අපි දන්නවා පැහැදිලිවම මේ මොහොත වන විටත් විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශය මෙවැනි සිදුවීම් අනාගතයේ සිදු නොවීමට අවශ්‍ය සියලු පියවර අරගෙන තිබෙන්නේ කියලා. විශේෂයෙන්ම ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාල හරහා අදාළ ආයතන සමඟ සාකච්ඡා කරලා මුදල් ගෙවන ආකාරය පිළිබඳව එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ expert team එකක් එක්ක මේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරලා තිබෙනවා. ඒ වාගේම මේ cyber-operating system එක යාවත්කාලීන වෙලා තිබුණේ නැහැ. නමුත්, මේ මොහොත වන විට,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු විජේසිරි බස්නායක මහතා
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි වේලාවක් දෙන්න.

විශේෂයෙන්ම ඒ servers update කරලා මේ මොහොත වන විට විදේශීය ණය ගෙවීම් අපි කිසිසේත්ම පැහැර හැර නැති තත්ත්වයකට පත් කර තිබෙනවා. 2026 ජූලි මාසයේ 05වෙනි දා ඊළඟ වාරිකයත් ගෙව්වා. විශේෂයෙන්ම අපි සඳහන් කරන්න කැමතියි, මේ කාරණාවේ දී ශ්‍රී ලංකා මහ බැංකුවත්, මුදල් අමාත්‍යාංශයත්, මහා භාණ්ඩාගාරයත් එකතු වෙලා මේ කර්තව්‍යය සිදු කළ යුතු බව. ඒ තිබෙන අඩුපාඩු අවසන් කරලා මේ රටට ගැළපෙන සේ අපේ ප්‍රතිඥාව අනුව මූල්‍ය විනයක් සහිත ප්‍රබල රටක් බවට පත් කිරීමේ කර්තව්‍යය සිදු කරන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දිලිත් ජයවීර මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.25]

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, **வணக்கம்**. මම හිතුවා මට විනාඩි 10ක් තිබෙනවා කියලා. ඔබතුමා විනාඩි දෙකක් අඩු කරලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡා කරන භාණ්ඩාගාරයෙන් ඩොලර් මිලියන 2.5 අතුරුදහන් වීමේ සිද්ධිය ගැන ආණ්ඩු පක්ෂය විසින් දක්වන කරුණු විශ්වාස කරන්න තිබුණා, රටේ ජනතාවක් නොහිටියා නම්, ඒ ජනතාවට සාක්ෂරතාව නොතිබුණා නම්, අපේ Gen Z පරම්පරාව, Gen Alpha පරම්පරාව හැකර්වරුන් ගැන නොදැන හිටියා නම්, ඔවුන් මේ නව තාක්ෂණය ගැන නොදැන හිටියා නම්. මේ පැහැදිලි කිරීම් කිසිවක නැහැ, අදාළ නිශ්චිත පැහැදිලි කිරීම. හැකර්වරුන් ගැන දන්නා තාරුණ්‍යය ඔබට හිනා වෙයි. මොකද, හැකර් සිද්ධියත් මෙතැන කොහෙත්ම නැහැ. ඒ වචනයත් අවභාවිත කරනවා. ඒකයි ඔවුන් හිනා වෙන්නේ. කොහොම වුණත්, ඔබතුමන්ලා මේ දක්වන කරුණුත්, හැසිරෙන ආකාරයත්, දිගින් දිගටම මේ තාක් දුරට හැසිරුණු ආකාරයත් සිහි කරන්නේ වෙන කිසිවක් නොවෙයි. මේ, තුනෙන් දෙකේ බහුතරය කියන රෝගය, "two-thirds syndrome". That is a terrible syndrome.

අධික බලය ලැබුණාම සියල්ලන්ට සියල්ල අමතක වෙනවා. මේ රටේ මිනිස්සු ඉන්නවා, තමන්ගේ ඡන්ද දායකයෝ ඉන්නවා, තමන්ගේ පාක්ෂිකයෝ ඉන්නවා, තමන්ගේ කාඩරය ඉන්නවා, තමන්ගේ පන්ති පහට ආපු අය ඉන්නවා, තමන් එක්ක පෙළපාළි ගිය අය ඉන්නවා, ඒ මිනිස්සුන්ට මොළය තිබෙනවා කියලා අමතක වෙනවා. මේ ඔක්කෝම අමතක කරලා ඕනෑම දෙයක් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල් අපට නැති වුණා. එසේ නැති වුණේ ඇයි? දීර්ඝ කාලයක් තිස්සේ සම්ප්‍රදායානුකූලව හා තාක්ෂණිකව ඔය භාණ්ඩාගාර ලේකම් තනතුරේ වාඩි වුණේ ඉතා දීර්ඝ කාලයක් අත්දැකීම් ඇති පුද්ගලයන්. රාජ්‍ය බලය ඇල්ලීම සඳහා මෙතුමන්ලා කොහොම හරි කෙනෙක් - අපේ මිත්‍රයෙක් - ගෙනැල්ලා වාඩි කළා. ඔහුට කිසිම අත්දැකීමක් තිබුණේ නැහැ. ඉතින් කොහොම වුණත් ඒ නිසා මේක වුණා. ඒ පැහැදිලි කිරීම්වල කිසි තැනක ඒක පිළිගන්නේ නැහැ. මෙතැන වංචාවක් සිදු වුණා යැයි ජනතාවට සිතිය හැකි පසුබිමක් තිබෙනවා. අන්න ඒක සිදු නොවුණා යැයි කියා තහවුරු කරන්නට ගෙන එන කරුණු තාර්කික නැති බවත් කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව අද වැඩ කරන්නේ අපේ මහා නායක හිමිවරුන් අමතක කරලා. අපේ සංඝයා වහන්සේලාත් අමනාප කරගෙන, රාජ්‍ය සේවයත් සම්පූර්ණයෙන්ම අමනාප කරගෙන, නීතිඥ ප්‍රජාවත්, වෛද්‍ය ප්‍රජාවත් සම්පූර්ණයෙන්ම අමනාප කරගෙන, සුළු කරුණක් ගැනවත් ඔවුන්ට ඇහුම්කන් නොදී ඒ සියලු දෙනා තරහ කරගෙන. අත්තනෝමතිකව තමන්ට ඕනෑ විධියට තමයි මේ අය වැඩ කරන්නේ. ඒ වාගේම මේ රටට පණ නල ලබා දෙන අපේ ගොවියාගේ හඬට ඇහුම්කන් නොදී නම් මේ අය වැඩ කරන්නේ, තවත් මොන කථාද? ඒ ගොවියා කොතරම් සංවේදීවද ඒ හඬ නඟන්නේ? නමුත් ඒකත් අමතක කරලා, ගොවියාත් එපා, රාජ්‍ය සේවකයනුත් එපා, නීතිඥවරුත් එපා, විනිසුරුවරුත් එපා, අපිට ඕනෑ දේ අපි කරනවා කියන කථාව තමයි මේ කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට ඉතිහාසයක් තිබෙනවා. අපි පිළිගන්නට ඕනෑ, ඉතිහාසය පුරා අධික බලය භාවිත වුණු ආකාරය අනුව අධික කරදර, අධික විනාශකාරී සිදුවීම් මේ රටේ සිදු වුණු බව. ඒ ඉතිහාසයෙන් පාඩම් ඉගෙන ගන්නවා වෙනුවට මෙතුමන්ලා කරන්නේ ඊටත් එහා ගිහින් අධික බලය භාවිත කරන එකයි. එසේ භාවිත කරමින් නැවත නිවැරදි කළ නොහැකි වැරදි බොහොමයක් සිදු කරමින් තිබෙනවා.

ඒ අතරතුර සිදු වන විශාල වරදක් නැවතත් මතක් කර දෙන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි විනිසුරුවරුන්ගේ විශ්‍රාම යෑමේ වයස දීර්ඝ කිරීම. ඒ පිළිබඳව මහ මිථ්‍යාවක ජනතාව පටලවපු මේ ආණ්ඩුවට ඇත්ත වශයෙන්ම අනුකම්පා කළ යුතුයි. අපේ මහානායක හිමිවරුන් ලිඛිතව දැනුම් දී ඇති පරිදි සහ විනිසුරුවරුන්ගේ සංගමයද, අපේ නීතිඥවරුන්ගේ සංගමයද, ලොව පුරා තිබෙන බොහොමයක් නීතිඥ සංගම්ද, මේ රටේ මහජනතාවගේ ඒ හඳ ගැස්මද ප්‍රකාශ කර සිටින්නේ විශාල වරදකට ගෙනියන්නද මේ හදන්නේ කියන එකයි. ඇත්තටම දැන් මිනිස්සුත් "විනිසුරුවරුන්ගේ විශ්‍රාම යන වයස දීර්ඝ කිරීම" කියන මාතෘකාවේ පැටලී තිබෙන්නේ. එහෙම එකක් මෙතැන නැහැ. මේ මහ විනාශය සිද්ධ කරන්නේ එක විනිසුරුවරයෙක් තවදුරටත් පුටුවේ තබා ගැනීමට මෙතුමන්ලාට තිබෙන ඒ අභිලාෂය ඉෂ්ට කර ගන්නටයි. ඒ විනිසුරුතුමා ශ්‍රේෂ්ඨ විනිසුරුතුමෙක්. මම හිතන්නේ නැහැ, එතුමාවත් අපේක්ෂා කරනවා කියලා මෙවැනි තත්ත්වයකින් එතුමා අපහසුතාවකට පත් කරයි කියලා. අපි විශ්වාස කරන විධියට මේ ආණ්ඩුවට අවශ්‍ය වෙලා තිබෙනවා, බලය පාවිච්චි කරලා අධිකරණ පද්ධතිය සම්පූර්ණයෙන්ම තමන්ගේ අණසකට ගන්නට. ඒක දිගින් දිගටම තහවුරු වෙනවා. "විනිසුරුවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම" කියලා මේකට පුළුල් මාතෘකාවක් දමලා, ඊට අමතරව "රාජ්‍ය සේවකයන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම" කියා තව මහ මිථ්‍යාවක් හදා තිබෙනවා, තමන්ට අවශ්‍ය පටු දෙයක් ඉටු කර ගැනීමට. ඒ පටු දේ මොකක්ද? ඔවුන් විශ්වාස කරනවා, අධිකරණය තමන්ගේ අණසකට ගත යුතුයි කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු දිලිත් ජයවීර මහතා
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එසේ අණසකට ගන්න හදන්නේ ඇයි? එහෙම කරන්නේ මේ රට වෙනුවෙන් නම්, මේ රටේ පැවැත්ම වෙනුවෙන් නම්, මේ රටේ ජනතාව වෙනුවෙන් නම් සමහර විට මේ රටේ ජනතාව හිතයි, කමක් නැහැ කියලා. මීට කලිනුත් 21 වතාවක් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මීට ආසන්න විධියට වෙනස් කර තිබෙනවා, පුද්ගලයන් කේන්ද්‍ර කරගෙන, පක්ෂවල අපේක්ෂා ඉෂ්ට කර ගැනීමට, නායකයින්ගේ අපේක්ෂා ඉෂ්ට කර ගැනීමට.

අපි එය දැඩි ලෙස විවේචනය කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජපක්ෂ යුගයේ ශිරානි බණ්ඩාරනායක මහත්මියට විරුද්ධව දෝෂාභියෝගය ගෙනෙන අවස්ථාවේදී, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයකු හැටියට පෞද්ගලිකව ඊට දැඩි ලෙස විරුද්ධ වුණු පුද්ගලයෙක්, මමත්. ඒ නිසාම අපට මෙවරත් මේ හඬ නඟන්නට ඒ ශුද්ධ වූ අයිතිය ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ ආණ්ඩුව නැවත නැවතත් මේ ගැන සිතා බැලිය යුතුයි කියන එකයි මම යෝජනා කර සිටින්නේ.

බලය කියන්නේ කෙතරම් කෙටි කාලීන දෙයක්ද? තාවකාලික දෙයක්ද? තමන්ගේ බලයේ සීමාව තමන් හඳුනා නොගෙන, මේ සියලු ප්‍රජාව අමතක කරලා, මේ රටේ සියලු ප්‍රජාවන්ගේ අභිලාෂයන්, අපේක්ෂාවන් අමතක කරලා, තමන්ට ඡන්දය ලබා දුන්, තමන් ගැන විශ්වාසය තැබූ මිනිසුන් අද අන්තිම අසරණ කරලා තිබෙනවා. ඔවුන්ට අද සමාජ මාධ්‍යවල comment එකක්වත් දමන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, ඔවුන් පෙනී සිටිය දේ නොවෙයි, අද ඔබ කරන්නේ. අර දරදඬුම පාලකයා යැයි හඳුන්වපු ජේ.ආර්. ජයවර්ධනටත් එහා ගිය දෙයක් කරන්නේ. ඔවුනුත් අධිකරණයට බලපෑම් කරලා තිබෙනවා. අර, ගල් ගහලා තිබෙනවා කියලා කියන්නේ. ඊටත් වැඩිය දරුණු දෙයකට මේ රට අරගෙන යනවා. එක් පුද්ගලයකු වෙනුවෙන් මේ වෙනස කරන්නට, මේ රටට මොන තරම් බොරුවක්, මොන තරම් පාඩුවක්, මොන තරම් ධන විනාශයක්, මොන තරම් අපහාසයක් කරනවාද? මේ රට අන්තර්ජාතිකව විහිළුවට ලක් වෙන තත්ත්වයට පත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ, - ඔබතුමන්ලා මේක කියවලා නැතුව ඇති - දීඝිති කෝසල ජාතකයේ එන, "පුත දීඝායු, දුර බලනු; ළඟ නොබලනු" කිව්වා වාගේ, "පුත අනුර, දුර බලනු; ළඟ නොබලනු" කියන එකයි.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිමල් පලිහේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

ගරු නිමල් පලිහේන මහතා
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී අපි විවාද කරනු ලබන්නේ, Export Finance Australia සමාගම වෙත ගෙවිය යුතු වන ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක මුදල වංචා සහගත ලෙස වෙනත් ආකාරයේ පුද්ගලයකු වෙත යැවීම සම්බන්ධයෙන් ඇති වුණු ප්‍රශ්නය පිළිබඳවයි. ඒ හා මැදි වෙච්ච සහ ඊට බලපෑ කරුණු මොනවාද, ඒ සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කුමක්ද, ඒ එක්කම ඉදිරියේදී කටයුතු කරන්නේ කොහොමද කියන කාරණා මගේ කථාව තුළින් මතු කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ඇත්තටම විපක්ෂයේ අදහස් දැක්වීම්වලට බොහෝ වෙලාවක් මම ඇහුම්කන් දීලා බැලුවේ, මේ කාරණාව හරියට කොහෙන්වත් මතු වෙලා එනවාද කියලායි. නමුත්, එහෙම බවක් කොතැනකදීවත් දකින්නට ලැබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාව පොඩ්ඩක් ඉතිහාසයට ගෙනිහිල්ලා ඉස්සරහට අරගෙන එන්න මම කැමැතියි. 2020-2022 වාගේ කාලය වෙනකොට මේ රට අර්බුදයකට මුහුණ දුන්නේ, එවකට පැවති රජයන් මහ බැංකුව කෙරෙහි සෘජුව කරන ලද බලපෑම් නිසා. මුදල් අච්චු ගැසීම, පොලී අනුපාතය අඩු මට්ටමක පවත්වා ගෙන යෑම, ඒ ස්වාධීනත්වයට අතිශය ප්‍රබල බලපෑම් ඇති කරමින් කටයුතු කිරීම නිසා තමයි එවන් තත්ත්වයක් උදා වුණේ. ඒ නිසා මොකද වුණේ? ආර්ථිකය කඩාගෙන වැටුණා. මට මතක විධියට, උද්ධමනය සියයට 80ක විතර ප්‍රමාණයකට ඉහළ ගියා. මිනිසුන් කර කියා ගත නොහැකි තත්ත්වයකට පත් වෙලා, අවසාන වශයෙන් රට ජාත්‍යන්තරය ඉදිරියේ ණය ගෙවා ගත නොහැකි තත්ත්වයට පත් වුණා. මේ අවස්ථාව වෙනකොට රටට ඉදිරියට යන්න කිසිම අවකාශයක්, ඉඩක් තිබුණේ නැහැ. අපි විරුද්ධ පක්ෂයේ සිටියදී කැමැති වුණත්, අකමැති වුණත් ඒ වෙලාවේ ආපු එකම ප්‍රතිකර්මය තමයි, IMF යෝජනාව. ඔවුන් මේවා අධ්‍යයනය කරලා, ඒ අවස්ථාවේ පැමිණි එක් එකඟතාවක් තමයි, මහ බැංකුව ස්වාධීන කිරීම.

ඒ අනුව මහ බැංකුව ස්වාධීන කිරීමෙන් අනතුරුව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනු ලැබූ කාර්යයන් අලුතෙන් නිර්මාණය කරන ලද ආයතනයක් වන රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය - PDMO - වෙත පවරනු ලැබුවා. ඇත්තටම එතැනදී අපි අපේක්ෂා කළේ, මෙන්න මේ කියන මහ බැංකුව විසින් කරන ලද කාර්යයන් PDMO එක හරහා කිරීමයි. නමුත් ඊට ප්‍රමාණවත් සම්පත් - විශේෂයෙන්ම මානව සම්පත - තිබුණේ නැහැ. අත්දැකීම් බහුල කාර්ය මණ්ඩලය හිටියේ මහ බැංකුව සතුව. ඒ නිසා ඔවුන් යටතේ අවුරුදු එකහමාරක පුහුණු කාලයක්, එහෙම නැත්නම් සංක්‍රමණ කාලයක් විධියට සලකා තමයි ඒ කටයුත්ත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරෙන්නේ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් විධියට අපත් ඒ සියලු කටයුතු සම්බන්ධයෙන් අධ්‍යයනය කළා; සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී අපේ නිරීක්ෂණ, නිගමන ලබා දීමට කටයුතු කළා.

මම මෙහිදී ඉතා ඕනෑකමින් කියන්න කැමැතියි, මහ බැංකුව වෙත කරන ලද බලපෑම් කොයි වාගේද කියන කාරණාව. බොහෝ වෙලාවට අය වැය හිඟය පියවා ගන්න අවශ්‍ය වුණාම කවුරුත් දන්නේ නැහැ, මුදල් අච්චු ගහනවා; ඒ වුවමනාව පිරිමහ ගන්නවා. එතැනදී ආර්ථිකය තුළ මුදල් සංසරණය වේගවත් වෙනවා. නමුත් නිෂ්පාදනය ඊට සාපේක්ෂ ලෙස සිදු නොවන නිසා රටේ උද්ධමනය ඇති වෙනවා. එතකොට මහ බැංකුවේ වගකීම තමයි රටේ මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම, පොලී අනුපාතය වාගේ දේවල් පාලනය කිරීම. නමුත් මහ බැංකුවට අවශ්‍ය පරිදි පොලී

අනුපාතය පාලනය කරන්න ඉඩ දුන්නේ නැහැ. පොලී අනුපාතය ඔවුන්ට වාසි සහගත වන ආකාරයේ පහත් මට්ටමක තබා ගැනීම නිසා නැවත වටයකින් සිද්ධ වුණේත්, ණය නිකුත් කිරීම වාගේ දේවල් වැඩි වීම තුළ උද්ධමනයට තවත් උත්තේජනයක් සැපයීමයි.

අනික් කාරණය තමයි, විදේශ විනිමය අනුපාතය හිර කර තබා ගැනීම. ඒක රටකට සුදුසු තත්ත්වයක් නොවෙයි. එසේ හිර කර තබා ගැනීමෙන් කොච්චර පීඩාවට පත් වුණාද කියනවා නම්, අපේ ආණ්ඩුව බලයට පත්වන වෙලාවේ අප වෙත චෝදනාවක් ගෙනාවා, අපේ ආණ්ඩුව බලයට ආවොත් - ඒක නිදහස් කිරීම ඇතුළේ- ඩොලර් එක රුපියල් 500ට, 600ට යන්න ඉඩ තිබෙනවා කියලා. ඒ නිසා අපට බලය දෙන්න එපා කියලා ජනතාවට වැරදි අදහසක් දුන්නා. නමුත් අපි බලයට ආවාට පස්සේ ඒවා යම් කළමනාකරණයකින් යුක්තව පාලනය කර ගත්තා කියන එක ඕනෑවටත් වඩා ඔප්පු වෙලා තිබෙනවා. මෑතකදී ජාත්‍යන්තර වශයෙන් ඇති වෙච්ච crisis එක නිසා ඩොලරයේ අගය යම් ප්‍රමාණයකට ඉහළ ගිහින් රුපියලේ අගය පහළ බැස්සා. නමුත් අපේ රජය බලයට ආවාට පස්සේ මේ අවුරුදු එකහමාරකට, දෙකකට ආසන්න කාලය තුළ ඩොලරයේ අගය යම් ප්‍රමාණයකට නඩත්තු කර ගන්න අපට හැකියාව ලැබුණා.

මහ බැංකුවේ තීරණවලට දේශපාලනික බලපෑම් කිරීම හොඳ තත්ත්වයක් නොවෙයි. ස්වාධීන ආයතනයක් විධියට, රටේ බැංකුව විධියට, උපදෙස් දෙන ආයතනය විධියට මහ බැංකුවට ස්වාධීනව කටයුතු කරන්න ඉඩක් තිබුණේ නැහැ. ඒ එක්කම මම කලින් සඳහන් කළා වාගේම විනිමය අනුපාතයට යම් ප්‍රමාණයකට නිදහසේ සැරිසරන්න ඉඩ දුන්නේ නැහැ, ඉල්ලුමට හා සැපයුමට අනුව. නමුත් පාලන තත්ත්වයක් ඇතුළේ ඒක යම් ප්‍රමාණයකට හිර කරගෙන හිටපු එකත් ඒ සඳහා බලපෑ කරුණක් විධියට මම සඳහන් කරන්න කැමැතියි.

PDMO එක ස්ථාපිත කළාට පස්සේ සමස්තයක් වශයෙන් මහ බැංකුව තමන්ගේ කටයුතු ස්වාධීනව කරගෙන යන ගමන් මෙච්චර කාලයක් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් කරන ලද කටයුතු ඊට පැවරීමක් තමයි සිද්ධ වුණේ. එතැනදී රටට අවශ්‍ය කරන දේශීය සහ විදේශීය ණය ලබා ගැනීම, ඒ වාගේම ඒ ණය පිළිබඳව අවශ්‍ය කරන තොරතුරු නඩත්තු කිරීම වාගේම අවසාන වශයෙන් ඒ ණය නිදහස් කිරීම කියන කරුණු සම්බන්ධයෙනුත් මැදිහත් වීම සිද්ධ වෙනවා.

මෙතැනදි ජාත්‍යන්තර වශයෙන් ගනුදෙනු සිද්ධ වනකොට තාක්ෂණය විශේෂයි. තාක්ෂණික මෙවලම් මේ කියන කාලය වනකොට ප්‍රමිතිගත තත්ත්වයෙන් නඩත්තු වෙලා නැහැයි කියන කාරණය ඒ පරීක්ෂණ කටයුතුවලදී අනාවරණය වනවා. ඒ තුළ කෙනෙකුට යම් ආකාරයකට මේ සඳහා මැදිහත්වීමේ හැකියාව ලැබෙනවා. මෙතැනදි හඳුනාගෙන තිබෙන මේ cyberattack එකක් කියන කාරණාව අපි නිරන්තරයෙන් අහන කථාවක් සහ ලෝකය පුරාම සිද්ධ වන තත්ත්වයක්. ඒ තත්ත්වයන් තුළදී කෙනෙකුට මේවා අතරට හැකර්ලා විධියට ගොඩවෙලා අනවශ්‍ය ආකාරයේ මැදිහත්වීම් කරමින්, මේ ගනුදෙනු අපි අපේක්ෂා නොකරන තත්ත්වයන් යටතට ගන්න පුළුවන්. එවැනි සිද්ධියක් තමයි මෙතැනදි අපි අනාවරණය කර ගන්නේ. මේක හුදෙක්ම අපට මහ බැංකුවේ අඩුපාඩුවක්, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශයේ අඩුපාඩුවක්, එහෙම නැත්නම් මේ සේවකයින්ගේ අඩුපාඩුවක් කියලා නිශ්චිත වශයෙන් කරුණු සඳහන් කිරීමට අයිතියක් නැහැ. මොකද, මේ වනකොට මේ සම්බන්ධව විමර්ශන සිද්ධ වෙමින් පවතින තත්ත්වයක් තිබෙන්නේ. ඒ තුළ අනාගතයේ ඒ අවශ්‍ය කරන තීන්දු තීරණ ලබාදේවි. ඒ පිළිබඳව අපට අපේක්ෂාවක් තිබෙනවා.

නමුත් මේ සිද්ධිය අපට යම් ආකාරයකට පාඩමක් කියලා දෙනවා, පවතින සම්පත් උපරිම අන්දමින්, කාර්යක්ෂමව සහ ඵලදායීව යොදා ගැනීමට සහ ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය මැදිහත්වීම් කිරීමට. ඒ නිසා මේ අවස්ථාව වනකොට අපි හඳුනාගත් පරිදි ඒ අවශ්‍ය කාර්ය මණ්ඩලය නිවැරදි පුහුණු කිරීම්වලට යොමු කරමින්, කාර්යක්ෂමව මේ කටයුත්තේ යොදවා ගනිමින් සිටිනවා. ඒ වාගේම එම තොරතුරු හා දත්ත පද්ධතිය නවීකරණය කරමින් ඒ සඳහා අවශ්‍ය අලුත් තාක්ෂණය ගෙනැල්ලා, මේ ආයතනවලට කාර්යක්ෂමව කටයුතු කරන්න අවශ්‍ය පරිසරය අපි නිර්මාණය කරනවා වාගේම අදාළ වගකීමෙන් යුතු ආයතන සම්බන්ධීකරණය කරමින් ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවන ආකාරයට කටයුතු කිරීමට අවශ්‍ය සියලු තත්ත්වයන් මේ වනකොට අප ගොඩනඟා තිබෙනවා. අපි විශ්වාස කරනවා, මෙන්න මේ කියන කරුණු ඇතුළේ ඇත්තටම යහපත් වූ පාලනයක්, ආයතන අතර හොඳ සම්බන්ධීකරණයක්, වගකීමෙන් සහ වගවීමෙන් කටයුතු කරන මානව සම්පතක් තිබෙනවා නම්, අපට මේ වැරදි අඩුපාඩු හඳුනාගෙන ඒ අවශ්‍ය තත්ත්වයන් නිර්මාණය කර ගැනීමේ හැකියාවක් තිබෙන බව.

මේ සිද්ධිය අපි පසුගිය නොවැම්බර් - මාර්තු මාස අතර කාලයේදී හඳුනා ගැනීමට අතිරේකව, මේ අවස්ථාවේ මම සඳහන් කරන්න කැමැතියි, මේ පද්ධතිය දියුණු කිරීම ඇතුළේ නිවැරදි ආකාරයෙන් මේ කියන ආයතනයට පසුගිය ජූලි මාසයේදී අපේ රජය විසින් ඊළඟ වාරිකයේ ගෙවීම් කරන ලද බව. ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් සිදුවීම අපේක්ෂා නොකරන නමුත්, වගකීමෙන් යුතු පුරවැසියන් විධියටත්, නිලධාරින් වාගේම මහජන නියෝජිතයින් විධියටත් අපි කටයුතු කරන බව මේ සභාව හමුවේ ප්‍රකාශ කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.45]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කවුරුත් දන්නවා, මහා භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5ක මුදල් අවභාවිතයක් සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාවේ සඳහන් වන හෙළිදරව් කිරීම් සහ නිර්දේශ අනුව ගෙනෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විවාදයට ගැනෙන බව.

රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාවේ 7.II. අ. ඡේදයේ මෙසේ සඳහන් වනවා:

> "සමස්තයක් ලෙස පරිපාලනමය වශයෙන් භාණ්ඩාගාර ලේකම්වරයා සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාගේ මට්ටමින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතැම් අඩුපාඩු සම්බන්ධයෙන් වගකිව යුතු වේ"

අද මොන අටුවා ටීකා ටිප්පණි කිව්වත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඇත්තටම මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, මේ තත්ත්වයේ සැබෑ ස්වරූපය හෙළි කිරීම පිළිබඳව. අපට ඇහුණා,

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

උදේ ඉඳලා ආණ්ඩුව පැත්තෙන් මේ සම්බන්ධයෙන් ඉතිහාස කථා, ජාතක කථා කියනවා. නමුත් ඇත්ත තත්ත්වය සමාජයට හෙළි කිරීම පිළිබඳව ඒ කමිටුවට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. පැහැදිලිවම පරිපාලනමය හේතුවක් සම්බන්ධයෙන් මෙතැන ගැටලුවක් ඇති වෙලා තිබෙනවා නම්, විශේෂයෙන්ම මින් ඉදිරියට මේක යන්න ඕනෑ කොතැනටද කියන එක පිළිබඳව සලකා බලන්න වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක මෙතැනින් එහාට යන්න ඕනෑ කොතැනටද? එහෙම නම් මේක ගෙනයන්න ඕනෑ, CID එකට. එහෙම නැත්නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට. ඊළඟට, එතැනින් එහාට ගියාම උසාවියට. නමුත් දැන් කාටද මේ ආයතන ගැන අපේ රටේ විශ්වාසයක් තිබෙන්නේ? විශේෂයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම, ඊළඟට අධිකරණය ගැන. මොකද, මේවායේ ඉන්න ප්‍රධානීන් සම්බන්ධයෙන් අද වනකොට දැවැන්ත ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මම මුලින් කියපු ඒ ආයතන දෙකේම ඉන්නේ මේ ආණ්ඩුවේ වේදිකාවල හිටපු අයගේ හිතවතුන්.

අධිකරණය සම්බන්ධයෙන් කථා කළොත් අපට කියන්න තිබෙන්නේ, අද අධිකරණය විශාල අර්බුදයකට ගමන් කරමින් තිබෙන බවයි. මේ ආයතන ස්වාධීන කරන්නේ නැතිව ආණ්ඩුව සම්බන්ධයෙන් තිබෙන වංචා, දූෂණ මේ කියන තැන්වලට ගියාට කිසිම සුගතියක් වෙන්නේ නැහැයි කියන එක මම කියන්න ඕනෑ.

අණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා වැනි නොයෙකුත් දේවල් කියපු මේ ආණ්ඩුව අද වනකොට විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේන්න යනවා. මොකටද? වර්තමාන අග්‍ර විනිශ්චයකාරතුමා වන පී.පී. සූරසේන මැතිතුමාගේ කාලය තව වසර දෙකකින් දික් කරන්න. ඇයි එතුමාව තියාගන්න හදන්නේ? දැන් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේ රජයට ඕනෑවෙලා තිබෙනවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මොකද, විපක්ෂය දඩයම් කරන්න තිබෙනවා. අපට කිසි ප්‍රශ්නයක් නැහැ, වංචා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශන කරලා ඕනෑ කෙනෙක් අත්අඩංගුවට ගත්තාට. හැබැයි අනවශ්‍ය ලෙස ඒ දේවල් සිද්ධ කර ගන්නට මේ ආණ්ඩුවට ඕනෑකම තිබෙනවාද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

ජනතා විමුක්ති පෙරමුණ ඒ කාලයේ විපක්ෂය පැත්තේ ඉස්සරහ වාඩි වෙලා කිව්වා, නීතිය කියන්නේ පාලකයාගේ කැමැත්ත කියලා. අද එතුමන්ලාම පෙරටත් වඩා හොඳට ක්‍රියාත්මක කරලා පෙන්වනවා, නීතිය කියන්නේ පාලකයාගේ කැමැත්ත කියලා. මේ වනකොට මාස 7කට වැඩි කාලයක සිට ඉහළ උසාවි දෙකක පුරප්පාඩු පිරවිය යුතුව තිබෙනවා. ඊට සුදුසුකම් තිබෙන විනිසුරුවරුන් ඉන්දෙද්දි ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව මේ රටට ක්‍රියාවෙන්ම පෙන්වනවා, නීතිය කියන්නේ පාලකයාගේ කැමැත්ත බව. මම සමාජ මාධ්‍යයේ දැක්කා සමහර අය ප්‍රසිද්ධියේ කියලා තිබෙනවා, අපට ඕනෑ තීන්දු දෙන්න නම් මේ සූරසේන විනිශ්චයකාරතුමා ඉන්න ඕනෑ වාගේ අදහසක්.

අධිකරණය ස්වාධීන කරන්න අවශ්‍යම නම් පළමුවෙනි දේ හැටියට අපි කරන්න ඕනෑ මොකක්ද? අපි දකිනවා, මේ වනකොට පී.පී. සූරසේන අග්‍ර විනිශ්චයකාරතුමාට විරුද්ධව සමාජයේ බරපතළ චෝදනාවක් තිබෙන බව. එහෙම නම් ඒ චෝදනාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විමර්ශනයක් කරන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කැඳවා ප්‍රශ්න කරන්න ඕනෑ. මොකද, එතැනින් තමයි මෙම පත්වීමට නිර්දේශ ලබා දුන්නේ. එහෙම නැත්නම් විශේෂ කාරක සභාවක් පත් කරලා ඒ පිළිබඳව හොයන්න ඕනෑ. එහෙම නැත්නම් මුළු පාර්ලිමේන්තුවම කමිටුවක් ලෙස වාඩිවෙලා ඒ ලේඛන සහ සාක්ෂි විභාග කරන්න ඕනෑ. මොකක්ද, සමාජයේ කථා වන චෝදනාව? සමාජයේ කථා වනවා වාගේම විනිසුරුවරුන් අතරත් කථා වනවා කියලා ආරංචි වනවා, ව්‍යාජ උප්පැන්න සහතිකයක් සම්බන්ධව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම විනිසුරුවරුන් කිහිපදෙනෙකුගේ විශ්‍රාම වයස සඳහන් අන්තර්ජාලයේ තිබෙන ලේඛනයක් **සභාගත*** කරනවා.

මේ තිබෙන්නේ ජයන්ත ජයසූරිය අග්‍ර විනිශ්චයකාරතුමා ඉන්න කාලයේ හැදුවා කියන ලේඛනයක්. *[බාධා කිරීමක්]*

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මගේ වෙලාව ගන්නේ නැතිව මගේ කථාවෙන් පස්සේ ඔබතුමියගේ අදහස දක්වන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය.

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 83(1)හි පැහැදිලිව මෙසේ සඳහන් වනවා:

> "ජනාධිපතිවරයාගේ හෝ වැඩබලන ජනාධිපතිවරයාගේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ, විනිශ්චයකාරවරයන්ගේ හෝ යුක්තිය පසිඳලීමෙහි නියුක්ත අන් තැනැත්තන්ගේ පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරනු නොලැබිය යුතුතේ ය. ..."

පූර්ණ යෝජනාවක් නැතිව අග විනිසුරුතුමා හෝ වෙනත් යම් විනිශ්චයකාරවරයෙකුගේ හෝ නමක් නිශ්චිතව සඳහන් කරමින් ඔවුන්ගේ පෞද්ගලික පැවැත්ම පිළිබඳව මේ සභාවේ විවාද කරන්නේ කොහොමද? *[බාධා කිරීමක්]* ආණ්ඩුවේ නැට්ටක් වෙලා තිබෙනවා කියලා කොහොමද එහෙම සඳහන් කරන්නේ? ඒක සම්පූර්ණයෙන් ස්ථාවර නියෝගවලට පටහැනියි.

---

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මේ වනකොට ප්‍රසිද්ධියේ මාධ්‍යවල යන දේවල් මම කථා කරන්නේ. මේ පිළිබඳව පරීක්ෂණ කරන්න කියලායි මම ඉල්ලන්නේ, ඒ සඳහා පාර්ලිමේන්තුව මැදිහත් වන්න කියලායි මම ඉල්ලන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් නිර්දේශ ලබා දුන් තනතුරක් නිසා ඒ පිළිබඳව පරීක්ෂණ කරන්න කියලායි මම ඉල්ලන්නේ.

මා සභාගත කළ ඒ ලේඛනයේ හැටියට එතුමා විශ්‍රාම ගත යුත්තේ 2026 ජනවාරි මාසයේ 12වෙනි දා. ඊට කලින් හිටපු සියලුදෙනා අදාළ දිනයන්හිදී විශ්‍රාම අරගෙන තිබෙනවා. ඊට පහළින් හිටපු අයත් අදාළ දිනයන්හිදී විශ්‍රාම අරගෙන තිබෙනවා. මේ වාර්තාව බොරුවක් නම් මේ පාර්ලිමේන්තුවෙන් විශේෂ කාරක සභාවක් රැස් කරලා ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වන්න කියලා මම යෝජනා කරනවා.

මේ වනකොට බොරු සමාජගත කිරීමක් සිද්ධ වනවා. මොකද, ඉහළ උසාවි අටෙහි පුරප්පාඩු පිරෙව්වොත් මහාධිකරණය වහන්න වනවා, නඩු ගොඩ ගැහෙනවා කියලා මේ වනකොට ප්‍රචාරයක් යවනවා.

එතකොට ඡන්දය දුන්නු හැටඅටලක්ෂය ඒවා පිළිගන්නවාද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මොකද, ඒවා මෝඩ තර්ක. උසාවිවල අඩුපාඩු හදලා, පුරප්පාඩු පුරවලා, ලඝුලේඛනයට අවශ්‍ය පහසුකම් දීලා, සාක්ෂි සටහන් කර ගන්න අවශ්‍ය පහසුකම් දීලා, නීතිඥයන්ට stress එකක් නැතුව වැඩ කරන්න කටයුතු සකස් කරලා දුන්නොත් ඒ සියලු දේවල් කරන්න පුළුවන්.

මම මේ වෙලාවේදී විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. අධිකරණ ක්ෂේත්‍රයේ පත්වීම් කරනකොට හැම දාම වුණේ මහාධිකරණයේ විනිසුරුවන් අභියාචනාධිකරණයට පත් කිරීම සහ අභියාචනාධිකරණයේ විනිසුරුවන් ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කිරීමයි. නමුත්, අද වනකොට ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. මහාධිකරණයක විනිසුරු හිඟයක් තිබෙනවා නම් මහෙස්ත්‍රාත්වරුන්ගෙන් පුරවන්න පුළුවන් වනවා. ඒ වාගේම මහෙස්ත්‍රාත්වරුන්ගේ හිඟයක් තිබෙනවා නම් එය පුරවන්න අලුතින් බඳවා ගන්න පුළුවන්කම තිබෙනවා. ජීවිත කාලය තුළ අවුරුදු 20ක, 30ක කාලයක් අධිකරණයේ ගත කරලා, අදටත් ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහළින්ම ඉන්න විනිසුරුවන් ඉන්නවා; තම ජීවිතය අධිකරණය වෙනුවෙන්ම කැප කරපු, පළපුරුද්ද තිබෙන විශාල පිරිසක් ඉන්නවා. ඒ පිරිසෙන් කී දෙනෙකුට අද තමන්ගේ උසස්වීම ඇස් පනාපිට නැති වෙලා තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වූ කාලය අවසන්.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මගෙන් ගත්ත කාලය මට ලබා දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමාගේ කාලයෙන් මිනිත්තු තුනක් මට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනකොට කී දෙනෙකුට තම උසස්වීම් ඇස් පනාපිට නැති වෙලා තිබෙනවාද කියන එක මම මේ ගරු සභාවට මතක් කරන්න ඕනෑ. ඉහළ පුරප්පාඩු පිරෙව්වාම පහළ උසාවි වහන්න වනවා කියන එක මොන තරම් ගොබ්බ තර්කයක්ද කියන එක මේ වෙලාවේදී මම කියන්න ඕනෑ.

මා ළඟ තිබෙනවා, තිෂ්‍ය වෙරගොඩ මහතා පළ කළ Facebook post එකක්. එතුමා කියා තිබෙනවා, "සතියට දවස් දෙකක් තුනක් සුප්‍රීම් කෝට් වාඩි වුණේ නැහැ කියලා අධිකරණ ඇමතිතුමා කියන එක සම්පූර්ණ බොරුවක්" කියලා. එහි අවසානයට එතුමා කියා තිබෙනවා, "අපි එක්ක එකට හිටපු නීති වෘත්තිකයෙක් ඇමති කෙනෙක් වෙලා මෙහෙම බොරු කියනවා බලන්න වෙච්ච එක ලොකු අභාග්‍යයක්" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිෂ්‍ය වෙරගොඩ මහතා පළ කළ Facebook post එකේ ඡායා පිටපතක් මම **සභාගත*** කරනවා.

ඒ වාගේම වර්තමාන අගවිනිසුරුතුමාගේ කාලයේ කිසිම වග විභාගයකින් තොරව විනිසුරුවරුන් 30කට වැඩි පිරිසකගේ වැඩ තහනම් කරලා තිබෙනවා. ඊට එරෙහිව කෙරෙන පරීක්ෂණවලට ප්‍රමාණවත් කාලයක් ලබා දීලා නැහැ. ඒ තුළ ස්වාභාවික යුක්තියේ මූලධර්මයට පටහැනිව කටයුතු සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම දක්ෂ විනිසුරුවරුන්ව ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට නොගැළපෙන තැන්වලට ස්ථාන මාරුවීම් කරලා තිබෙනවා. ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ වුණු නිසාම නෙත්ති කුමාර විනිසුරුතුමා, ඒ වාගේම උද්දාල සුවන්දුරුගොඩ විනිසුරුතුමා වාගේ අයට අද ඒ තත්ත්වයට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. පැහැදිලිවම

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

අධිකරණ පද්ධතිය තමන්ට ඕනෑ හැටියට සහ ආණ්ඩුවට ඕනෑ හැටියට මෙහෙයවනවා කියලා මම හිතනවා.

ඒ වාගේම FR නඩු ප්‍රතික්ෂේප වීමේ ප්‍රතිශතය ඉහළ ගිහින් තිබෙනවා. පහළ උසාවිවලින් ශ්‍රේෂ්ඨාධිකරණයට එන අභියාචනා අවසර ඉල්ලීම් ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. ඒවා ප්‍රතික්ෂේප වීමේ සම්භාවිතාව ඉහළ ගිහින් තිබෙනවා. නීතිඥයන් කියනවා, මූලික අයිතිවාසිකම් නඩු දාලා වැඩක් නැහැ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝ, එතකොට ජනතාවට නීතියේ සහාය? එතකොට කෝ, නීතියේ සහනය? කෝ, නීතිය පිළිබඳ විශ්වාසය? කෝ, යුක්තිය පිළිබඳ විශ්වාසය? ශ්‍රේෂ්ඨාධිකරණයේ FR අයිතිවාසිකම් නඩුවක් දාන්නත් කලින්ම ප්‍රතික්ෂේප වනවා නම් අධිකරණයෙන් බලාපොරොත්තු වන යුක්තිය ඉටු වෙයිද කියන එක මම මේ වෙලාවේදී අහන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමියට ලැබී ඇති කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනිසුරුවන්ට වන අසාධාරණ සම්බන්ධයෙන් කථා කරන්නට මේ පාර්ලිමේන්තුව තුළ විශේෂ කාරක සභාවක් පත් කරන්න තිබුණා. ඒ ඉල්ලීම විපක්ෂයෙන්

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

කළාම ගරු කථානායකතුමා ඒ ඉල්ලීම වළක්වා තිබෙනවා. ඒ තීරණය තුළ ඒ අයිතිය නැති වෙලා තිබෙනවාය කියා මම හිතනවා. අවසාන වශයෙන් මම කියන්නේ මෙයයි. මේ රජය හදන්නේ තමන්ගේ පාලනය යටතේ තබා ගත හැකි, තමන්ගේ අදහස්වලට ගැළපෙන කෙනෙක් පත් කර ගන්නයි.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිළිණ සමරකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.
[අ.භා. 2.56]

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැකර් ප්‍රහාරයට අදාළ සංවාදය පැවැත්වෙන මේ මොහොතේදී අධිකරණ ක්‍රියාවලියට අදාළව ආණ්ඩුවක් විධියට අපි ගෙනෙන වෙනස්කම් පිළිබඳව මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමිය දීර්ඝව අදහස් දැක්වීමක් කළා. මම එතුමියට කියන්න කැමැතියි, හැටඅටලක්ෂයක ප්‍රාර්ථනාව ඒක තමයි කියලා. හැටඅටලක්ෂයක ප්‍රාර්ථනාව ඉෂ්ට කිරීම තමයි අපේ වගකීම. ඉතින්, ඒක නිසා තමයි අපි මේ අධිකරණ ක්‍රියාවලිය සහ අධිකරණ පද්ධතිය සම්පූර්ණ වෙනස් කිරීමකට භාජන කරන්න සූදානම් වෙන්නේ. අද වනකොට වෙනදාට වඩා, අධිකරණ ක්‍රියාවලිය සහ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව මිනිසුන්ට විශ්වාසයක් ගොඩනැඟිලා තිබෙනවා.

ඒ පිළිබඳව යම් හෝ අවිශ්වාසයක් ඇති වෙලා තිබෙනවා නම් එලෙස අවිශ්වාසයක් ඇති වෙලා තිබෙන්නේ පසුගිය ඉතිහාසය තුළ හිටපු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට වෙන්න පුළුවන්, දැනට විපක්ෂය තුළ ඉන්න කණ්ඩායමට වෙන්න පුළුවන්. ඒ හැරෙන්න රටේ සමස්ත ජනතාවට අධිකරණ ක්‍රියාවලිය සහ අධිකරණ පද්ධතිය පිළිබඳව වෙනදාට වඩා විශ්වාසයක්, වෙනදාට වඩා තහවුරුවක් ඇති වෙලා තිබෙනවා. ජනතා බලාපොරොත්තු සමඟ බලයට පත් වෙච්ච ආණ්ඩුවක් විධියට අපේ යුතුකම සහ වගකීම තමයි, මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීම, අධිකරණ ක්‍රියාවලිය තුළ තිබුණු අවිධිමත්භාවය වඩා හොඳ තැනකට ගෙන ඒම. ඒ සඳහා තමයි අපි උත්සාහ දරමින් ඉන්නේ. කවුරු මොනවා කිව්වත් අධිකරණ ක්‍රියාවලිය සහ පද්ධතිය තුළ සිද්ධ කරන වෙනස්කම් රටේ සමස්ත ජන ප්‍රජාව වෙනුවෙන් අනිවාර්යයෙන් අපි කරනවා. එම නිසා ඒ සම්බන්ධව කිසි සැකයක්, අවිශ්වාසයක් තියා ගන්න අවශ්‍ය නැහැ. මොන අවලාද නැඟුවත් අපි ඒ වැඩේ කරනවා.

අධිකරණ ක්‍රියාවලිය විධිමත්භාවයකින් සිද්ධ වන මොහොතක, මීට විනාඩි කිහිපයකට කලින් ප්‍රවෘත්තියක් පළ වනවා මම දැක්කා. මෙතුමියලා එක්ක කටයුතු කරපු, කුලියාපිටිය පැත්තේ හිටපු ඇමතිවරයෙකුත් මේ වනවිට අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ විධියට අත්අඩංගුවට ගත්තාට පස්සේ හිත් වේදනාවක්, හිත් රිදීමක් ඇති, අධිකරණ ක්‍රියාවලිය විධිමත් විධියට ක්‍රියාත්මක වන තත්ත්වයත් එක්ක.

ඊට අමතරව මම දැක්කා, විපක්ෂයේ තව මන්ත්‍රීවරයෙකු දවසට පැය කිහිපයක් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු රැස්වීම් කාලය අතරතුර මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තමන්ට ලැබෙන විනාඩි 7, 8 තුළ මොනවා හරි වචන ටිකක් කියලා මෙතැනින් පිට වෙලා යන තත්ත්වයක්. ඇත්තටම අද දවසේ විවාදය කුමක්ද, එහෙම නැත්නම් අද දවසේ කථා කළ යුතු කාරණා මොනවාද කියන දේ පිළිබඳවවත් අවබෝධයක් ඇතිව නොවෙයි එතුමා ඒ කාරණා ප්‍රකාශ කළේ කියන එකයි මම නම් දැක්කේ. ඇත්තටම බොරු කියන්නේ කවුද, සත්‍ය ප්‍රකාශ කරන්නේ කවුද කියන එක සමාජය දන්නවා. ඒ වාගේම එතුමන්ලාගේ පැත්තේ ඒ සම්බන්ධයෙන් උදාහරණත් ඕනෑ තරම් තිබෙනවා. අසත්‍ය ප්‍රකාශ කළේ කවුද, නයි පෙන්නුවේ කවුද කියන කාරණා සම්බන්ධයෙන් පසුගිය ඉතිහාසයේ අත්දැකීම් සහ උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවක් විධියට අපි සත්‍ය ප්‍රකාශ කරමින් තමයි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් අහිමි වීමට අදාළ කාරණය ගත්තොත්, මේ වාර්තාව ආණ්ඩු පක්ෂයේ පෞද්ගලික වුවමනාවකට, එහෙම නැත්නම් ගරු මුදල් ඇමතිවරයාගේ වුවමනාවට, ගරු මුදල් නියෝජ්‍ය ඇමතිවරයාගේ වුවමනාවට, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වුවමනාවට ඉදිරිපත් කරපු වාර්තාවක් විධියට සලකලා තමයි විපක්ෂය අද දවසේ කරුණු ඉදිරිපත් කරන්නේ. නමුත්, එහෙම එකක් නොවෙයි මේක. පාර්ලිමේන්තුවේ 121වන ස්ථාවර නියෝගය යටතේ ක්‍රියාත්මක වන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව එකතු වෙලා හදපු වාර්තාවක් තමයි, අද දවසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා සාකච්ඡා කරන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු වන ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා තමයි එහි සභාපතිත්වය දරන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකුත් එම කාරක සභාවේ ඉන්නවා. මන්ත්‍රීවරු 18දෙනෙකු කණ්ඩායමක් විධියට එකතු වෙලා හදපු වාර්තාවක් තමයි අද සාකච්ඡාවට ගන්නේ. එහෙම නැතිව මුදල් ඇමතිවරයා තනිවම හදපු, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා තනිවම හදපු, මුදල් නියෝජ්‍ය ඇමතිවරයා තනිවම හදපු, එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හදපු වාර්තාවක් නොවෙයි අපි අද දවසේ මේ සාකච්ඡාවට ගන්නේ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු සභාපතිත්වය දරන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විධියට අපි හදපු වාර්තාව පිළිබඳව තමයි අද දවසේ සාකච්ඡාවට ගන්නේ. ඒකපාර්ශ්විකව ආණ්ඩුවට ලකුණු දමා ගන්න අදාළ වාර්තාවක් නොවෙයි මේ හදලා තිබෙන්නේ. ඕස්ට්‍රේලියානු මූල්‍ය ආයතනයකට මේ ණය ගෙවද්දී සිද්ධ වෙච්ච වංචාවට අදාළව, එහෙම නැත්නම් ඒ සිද්ධ වෙච්ච හැකර් ප්‍රහාරයට අදාළ තත්ත්වයන් මොනවාද කියලා පැහැදිලි කරන්න තමයි මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ හැකර් ප්‍රහාරය සම්බන්ධවත් නොයෙක් අය නොයෙක් විශ්ලේෂණ, නොයෙක් අදහස් ඉදිරිපත් කළා. ඇත්තටම පරිගණක හැකර් ප්‍රහාරයක් කියන්නේ මොකක්ද කියන එක පිළිබඳව යම්කිසි අවබෝධයක් ලබා ගැනීම හොඳයි කියලා මගේ පැත්තෙන් මම හිතුවා. මොකද, මීට කලින් කථා කළ මන්ත්‍රීවරයෙකුත් මේ හැකර් ප්‍රහාරය ගැන එක එක අදහස් ඉදිරිපත් කරනවා මම දැක්කා. පරිගණක හැකර් ප්‍රහාරයක් - computer hacking attack එකක් - එහෙම නැත්නම් cyber attack එකක් කියන්නේ, පරිගණක ජාලයක් තොරතුරු පද්ධතියක් තුළට අවසරයකින් තොරව ප්‍රවේශ වී තොරතුරු සොරකම් කිරීම, වෙනස් කිරීම, විනාශ කිරීම හෝ සේවාවන්ට බාධා කිරීමයි. ඔය විධියට සිද්ධ කරන කාරණයක් තමයි හැකර් ප්‍රහාරයක් විධියට අර්ථ දක්වා තිබෙන්නේ.

තොරතුරු වෙනස් කරමින්, අපේ ණය ගෙවීමට අදාළ සේවාවන්වලට යම්කිසි බාධා කිරීමක් තමයි මේ හැකර් ප්‍රහාරය හරහා සිද්ධ වෙලා තිබෙන්නේ. මේ පරිගණක හැකර් ප්‍රහාර සිදු වන ආකාරය කාරණා කිහිපයක් යටතේ දක්වා තිබෙනවා. ඒක

ඇතුළේ අපට වෙච්ච ප්‍රශ්නය තමයි, ව්‍යාජ ඊමේල් මඟින් පෞද්ගලික තොරතුරු වෙනස් කරමින් අදාළ මුදල් ප්‍රමාණය ඔවුන්ගේ ගිණුම්වලට බැර කරවා ගැනීම. ඒ නිසා හැකර් ප්‍රහාරයක් තුළින් තමයි මේ දේ වෙලා තිබෙන්නේ කියන කාරණය මේ සභාව හමුවේ මා ප්‍රකාශ කරන්න කැමැතියි.

2025 නොවැම්බර් සිට 2026 ජනවාරි දක්වා කාලය තුළ Export Finance Australia ආයතනයට ගෙවන්න තිබුණු මුදලක් තමයි මේ විධියට නැති වෙලා තිබෙන්නේ. ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් ශ්‍රී ලංකා භාණ්ඩාගාරයට මේ හරහා අහිමි වෙලා තිබෙනවා. ඒ වාගේම, විදේශ ණය හිමියාට ද හිගයක් ඇති වෙලා තිබෙනවා. මේ විදේශ ණය හිමියාට හිඟයක් ඇතිවීම සම්බන්ධවත් අපි මේ වන විට සාකච්ඡා කරමින්, ඒක ඉදිරියේදී විධිමත් ක්‍රමයකට ගෙවන්නේ කොහොමද කියන කාරණාත් සැලකිල්ලට ලක් කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කලිනුත් මතක් කළ ආකාරයට ස්ථාවර නියෝග 121 යටතේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට පැවරුණු බලතලවලින් තමයි මේ කාරණයට අදාළ සාකච්ඡාව අපි සිද්ධ කළේ. එහිදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාව අවස්ථා 4කදී රැස් වුණා. විවිධ රාජ්‍ය ආයතනවලින්, රාජ්‍ය නිලධාරින්ගෙන් තොරතුරු ලබා ගත්තා. සමහර ආයතනවලින් සවිස්තරාත්මක වාර්තා ද ලබා ගත්තා. කාරක සභාවේ නිගමන තුළ, මේ සිද්ධිය සිදුවීමට ප්‍රධාන හේතු විධියට අපි දකින කාරණා කිහිපයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මමත් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙක්. එකක් තමයි, විදේශ ණය ගෙවීමේ ක්‍රියාවලියේ, අභ්‍යන්තර පාලන ක්‍රමවල බරපතළ දුර්වලතා පැවතීම. මේ බරපතළ දුර්වලතා පැවතිලා තිබෙන්නේ, 2024දී අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ නොවෙයි. ඉතිහාසයේ ඉඳන් බරපතළ දුර්වලතා තිබිලා තිබෙනවා. සමහර පරිගණක පද්ධති 2016 අවුරුද්දේ සිට update වෙලා නැහැ. ඒ සියල්ල ගත්තාම, දීර්ඝ කාලයක් තිස්සේ අභ්‍යන්තර පාලන ක්‍රමවල තිබුණු දුර්වලතා මෙයට හේතුවක් වෙලා තිබෙනවා. ඒ වාගේම, යල්පැන ගිය විද්‍යුත් තැපැල් පද්ධතිය - මෙහි ඊමේල් පද්ධතිය යල්පැන ගොස් තිබෙනවා - මෙන්ම ආයතනික පාලනයේ දුර්වලතාත් - ආයතනික මට්ටමින් තිබුණු පාලන දුර්වලතා - මේකට හේතු විධියට අපි දැක තිබෙනවා.

ඊට අමතරව මේකට අදාළ කාරණා ගොඩක් තිබෙනවා. නමුත්, මේ සිදුවීම් මාලාවෙන් පස්සේ මුදල් අමාත්‍යාංශය විධියට ගත් පියවර පිළිබඳව මා මේ සභාව දැනුවත් කරන්නම්. එකක් තමයි, ණය හිමියන් සමඟ සම්බන්ධීකරණ කාර්යය සම්පූර්ණයෙන්ම PDMO එක වෙත පැවරීම. ඒ කියන්නේ, Public Debt Management Office එක වෙත පවරාගෙන තිබෙනවා. පසුගිය කාලයේ ERD හරහා සිද්ධ වෙච්ච එක, PDMO එක හරහා සිද්ධ කරන්න ඉදිරි කටයුතු සැලසුම් කරලා තිබෙනවා. ඒ කටයුතු මේ වෙනකොට සිද්ධ වෙමින් යනවා. ඊළඟ කාරණය තමයි, ණය හිමියන් සමඟ නිල සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම. ඒ කියන්නේ, ණය හිමියන් සමඟ නිල විධියට සන්නිවේදන මාර්ග ස්ථාපිත කර ගන්නට අවශ්‍යයි. මොකද, ඔවුන් හරහා තොරතුරු හුවමාරු කර ගැනීමේදී තමයි පසුගිය කාලයේ ගැටලු මතුවෙලා මේ දේ සිද්ධ වෙලා තිබෙන්නේ. ඊළඟ කාරණය තමයි, ගෙවීම් සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ පූර්ව අනුමැතියක් ලබා ගැනීම. ණය ගෙවීමට අදාළව දින 10කට පෙර භාණ්ඩාගාර ලේකම්ට ඉදිරිපත් කරලා අනුමැතියක් ලබා ගැනීම සිදු කළ යුතුයි. ඒ වාගේම, Department of Treasury Operations සත්‍යාපන ක්‍රියාවලියකට ඇතුළත් කරලා තිබෙනවා. ඒ කියන්නේ, ඒකාබද්ධ අරමුදලේ මුදල් වෙන් කිරීමට අදාළ තොරතුරු තහවුරු කර ගත්තාට පස්සේ තමයි මේ කටයුත්ත සිද්ධ කර ගන්න ඕනෑ. ඒකාබද්ධ අරමුදලින් මුදල් වෙන් කර ගන්නවා නම්, තොරතුරු තහවුරු කර ගැනීමෙන් පස්සේ තමයි මේ කටයුත්ත සිද්ධ කරන්න ඕනෑ කියලා, මුදල් අමාත්‍යාංශය හරහා දැනුම් දීලා තිබෙනවා. ඊළඟ කාරණය තමයි, NRM පද්ධතියේ බැංකු ගිණුම් තොරතුරු වෙනස් කිරීම් සඳහා සීමා පැනවීම. ඒ කියන්නේ, නිසි අවසරයකින් තොරව ගිණුම් අංක වෙනස් නොකිරීම. මේ ගිණුම් අංක වෙනස් කිරීමත් මේ කාරණයට බලපා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තිළිණ සමරකෝන් මහතා
(மாண்புமிகு திலிண சமரக்கோன்)
(The Hon. Thilina Samarakoon)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟ කාරණාව තමයි, සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීම. මුදල් අමාත්‍යාංශයේ සමස්ත තොරතුරු තාක්ෂණ පද්ධති ශක්තිමත් කිරීමට ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, SLCERT සහ ජාතික සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය සමඟ එක්ව කටයුතු කිරීම ආරම්භ කර තිබෙනවා. මේ විධියට ගත්තාට පස්සේ ආණ්ඩුවක් විධියට අපි මෙන්න මේ විදේශ ණය ගෙවීමේ ක්‍රියාවලිය මීට වඩා ශක්තිමත්ව, මීට වඩා ආරක්ෂාකාරීව කරගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ වන විට සකස් කරලා ක්‍රියාත්මක කරනවා. ඒක නිසා ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට, වගකිව යුතු ආණ්ඩුවක් විධියට උපරිම ලෙස අප කටයුතු කරන බව මතක් කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.07]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද දිනයේදී කථා කරන්නේ පැහැදිලිවම හොරකමක්, වංචාවක්, මූල්‍ය අක්‍රමිකතාවක් පිළිබඳවයි. මේ ආණ්ඩුව බලයට එනකොට රටේ ජනතාවට පොරොන්දු වුණේ හොරකම, වංචාව, දූෂණය නතර කරනවා කියලායි. හැබැයි, ආණ්ඩුව බලයට ඇවිල්ලා වසර දෙකක් යනකොට අපට අහන්න ලැබෙන්නේ හොරකම, වංචාව සහ බැරිකම කියන කාරණා පිළිබඳවයි.

දැන් මේ ඩොලර් මිලියන 2.5 ගැන අපි අද කථා කළාට එතැනින් එහාට ගිය ගැටලුවක් මේ රටේ පවතිනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපේ රටේ තිබෙන සංචිත, එහෙම නැත්නම් රජය විසින් භාවිත කරන ධනය, මූල්‍ය පාලනය කොහෙන්ද ලැබෙන්නේ? මේ රටේ බදු ගෙවන අහිංසක ජනතාවගෙන් බදු මුදල් එකතු කරලා තමයි මේ මුදල් පරිපාලනය කරන්නේ, එහෙම නැත්නම් කළමනාකරණය කරන්නේ. එතකොට ඕස්ට්‍රේලියාවට ගෙවන්න තිබුණු ඩොලර් මිලියන 2.5ක මුදලක්, ඒ අදාළ පාර්ශ්වයට ගෙවන්නේ නැතිව වෙනත් වංචනික පාර්ශ්වයකට ගෙවන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වුණා. දැන් මේ ණය ඩබල් වෙලා තිබෙනවා. ඩොලර් මිලියන 2.5ක් හොරුන්ට

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

ගෙවලා, ඒකට මේ අයගේ කණ්ඩායම සම්බන්ධ වෙලා, තවත් ඩොලර් මිලියන 2.5ක් නිවැරදි පුද්ගලයාට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ ආකාරයට අපේ රටේ ජනතාවට තමන්ගේ බදු මුදල් මෙසේ වංචනික ලෙස අහිමි වන කාරණය පිළිබඳව අපි කල්පනා කර බලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව බලයට එනකොට පැහැදිලිව කිව්වා, අපේ රටේ ජනතාවගෙන් එකතු කරන බදු මුදල් ඒ අය සාංඝික දේපළ වාගේ ආරක්ෂා කරනවා කියලා. SMS එකක් එවනවා කිව්වා, ඒ බදු මුදල් තමන් මොනවාටද යොමු කරන්නේ කියා සඳහන් කරලා. ඒ වාගේම ඒවා පිළිබඳව විනිවිදභාවයක් තිබෙනවා කිව්වා. අද අපේ රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් කෝටි ගණනක්, ඩොලර්වලින් අහිමි වන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා, මේ ආණ්ඩුවේ නොහැකියාව සහ හොරකම නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, RDA එක, payments දෙකක් කරලා තිබෙනවා. එනම්, රුපියල් මිලියන 385ක් දෙපාරක් ගෙවා තිබෙනවා. ඔක්කෝම ඩබල් ගෙවන්නේ; "ඩබල් පොකට්" වාගේ ඩබල් ගෙවනවා. ඊට පස්සේ මොකක්ද කළේ? අස්වැසුම ප්‍රතිලාභ දෙපාරක් ගෙව්වා. ආයෙත් ඩබල්. එතැනින් නතර වුණේ නැහැ. SriLankan Airlines එක ඩුබායිවලට රුපියල් මිලියන 80ක ගෙවීමක් කර තිබෙනවා. ඒ වාගේම, SriLankan Airlines එක, INR 2.2 million ගෙවා තිබෙනවා. ඊට පස්සේ US Postal Service එකට ඩොලර් ලක්ෂ 6ක් ගෙව්වත් එය ලැබිලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා cyber crime කියලා කවුරු හරි සුදු පිරුවටයකින් වහන්න හැදුවාට වැඩක් නැහැ. මේක බැරිකම සහ හොරකමයි කියන එක හොඳට මතක තබා ගන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් ද නොවෙයි. NDB එකේ සිදු වුණු රුපියල් බිලියන 13.2ක වංචාව නිසා මේ රටේ අහිංසක ජනතාවට තමන්ගේ මුදල් අහිමි වුණා. ආණ්ඩුව ඒවා ගැන කථා කරන්නේ නැහැ. ඒ මුදල් නැවත ලබා ගැනීමට ආණ්ඩුවේ ක්‍රියාත්මක වීමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකෙන් පැහැදිලිවම පෙනෙන්නේ මොකක්ද? මේ රටේ බදු ගෙවන අහිංසක ජනතාව ඔහේ බදු ගෙවනවා; සෘජු බදු ගෙවනවා, වක්‍ර බදු ගෙවනවා. ඔවුන් ගෙවන්නේ නැති බද්දක් නැහැ. හැබැයි, ඒ සල්ලිවලට හෙණ ගැහුවා වාගේ වෙච්ච දෙයකුත් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකයි අප මේ කියන්නේ. On 9th June, 2026, the Minister of Public Security disclosed to the House of a US Dollar 85 million forex fraud. මේ ආකාරයට අහිංසක මිනිසුන්ගේ මුදල් සහ දේපළ පාලනය කර ගන්න බැරි, කළමනාකරණය කර ගන්න බැරි ආණ්ඩුවක් මේ රටේ තිබෙන නිසා අපට දිනෙන් දින මේ රටේ මුදල් අහිමි වෙනවා, කෝටි ගණනක් මේ රටින් එළියට යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක පැත්තකින්, අපේ ණය ටික ගෙවා ගන්න විධියක් නැතිව ණය දෙගුණ තෙගුණ වෙනවා. අනෙක් පැත්තෙන්, රටේ සංවර්ධනයක් සිදු වන්නේ නැහැ. රටේ අද සංවර්ධනයක් සිදු වන්නේ කොහේද කියලා බලන්න. රටේ පාරවල් හදනවාද? පාලම් හදනවාද? ගුවන් තොටුපළවල් හදනවාද? නැහැ. ඒ ඇයි? ඒ අපේ රටේ අහිංසක ජනතාවගේ මුදල් අනවශ්‍ය ලෙස අවභාවිතයට ලක් වන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණාවත් කියා මගේ කථාව අවසන් කරන්නම්. ආණ්ඩුව හිතුමතයට උත්සාහ ගන්නවා, විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යැමේ කාල සීමාව දීර්ඝ කර ගන්න. අපි ආණ්ඩුවට කියනවා, මේ රට පාලනය කරන්න ඔබතුමන්ලාට අවුරුදු 5ක කාල සීමාවක් ලැබිලා තිබෙනවා, ඒ කාලය තුළ බොහොම බුද්ධිමත්ව තමන්ගේ පාලනය කරගෙන යන්න කියලා. මොකද, ඔබ අද පාලන තන්ත්‍රයට ඇවිල්ලා ඉවරයි; ප්‍රධාන දේශපාලන පක්ෂයක් බවට පත් වෙලාත් ඉවරයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම තව තත්පර කීපයකින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මොළය තිබෙන, උගත්කමක් තිබෙන, දැනුමක් තිබෙන, හොඳ හිතක් තිබෙන මන්ත්‍රීවරුන් NPP එකේ ඉන්නවා නම් මේකට විරුද්ධ වෙන්න. ඔබට අනාගතයේදී නැවත වතාවක් මේ රටේ පාලනය ගන්න අවශ්‍යතාවක් තිබෙනවා නම්, මෙවැනි දෙයකට ඉඩ දෙන්න එපා කියන ගෞරවනීය ඉල්ලීම අපි කරනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.13]

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී මට කථා කිරීමට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව හැටියට අපි කිහිප වතාවක්ම හමු වෙලා, ඉතා දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා හදපු වාර්තාවක් තමයි අද පාර්ලිමේන්තුවේදී මේ ආකාරයට විවාදයට භාජන වන්නේ. අපි ඇත්තටම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාට, සාමාජිකයන්ට සහ විශේෂයෙන්ම අපට සහාය දෙන විශ්ලේෂකයන්ට. මොකද, ඒ සියලුදෙනා ඉතා මහන්සි වෙලා හදලා පාර්ලිමේන්තුවේ සභාගත කරපු වාර්තාවක් තමයි අද මේ ආකාරයට විවාදයට ලක් වන්නේ. එහෙම මහන්සි වෙලා එය සකස් කළාට අද මේ විවාදයට සම්බන්ධ වන විපක්ෂයේ මන්ත්‍රීවරුන් නම් මේ වාර්තාව කියවා නැහැ කියන එක බොහොම පැහැදිලියි. මොකද, විපක්ෂයේ කිසිම කෙනෙක් මේ වාර්තාව ගැන කථා කරන්නේ නැහැ; මේ වාර්තාවේ තිබෙන කරුණු ගැන කථා කරන්නේ නැහැ. තමන්ගේ ඔළුවට එන ඔක්කෝම දේවල් මෙතැනට ඇවිල්ලා ඔහේ කියනවා. ඉතින් මට තේරෙන්නේ නැහැ, ඇත්තටම අප මේ වාර්තාව හැදුවේ මොකටද කියලා. අප මේ වාර්තාව හැදුවේම, මේක පාර්ලිමේන්තුවේ සභාගත කරලා මේ සම්බන්ධව සාකච්ඡාවක් ඇති කර ගන්නයි. මේ වාර්තාවේ සඳහන් කර තිබෙන අඩුපාඩුකම් මොනවාද, ඉදිරියේදී ඒවා නිවැරැදි කර ගන්න කරන්න පුළුවන් මොනවාද, දැනට කරලා තිබෙන්නේ මොනවාද කියන එක සම්බන්ධව ඉතා දීර්ඝ විස්තරයක් මෙහි තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කියන දෙපාර්ශ්වයම සහභාගි වන කාරක සභාවක් තමයි රජයේ මුදල් පිළිබඳ කාරක සභාව. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් තමයි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ බහුතරයක් ඉන්නේ. එහෙම ඉඳලාත්, අර බැඳුම්කර වංචාව සම්බන්ධව COPE එකේ වාර්තාව ආපු වෙලාවේ වාගේ මේ කාරණාව සම්බන්ධයෙන් අපේ බෙදුණු මතයක් ඇවිල්ලා නැහැ. අපි ඒකත් මතක් කර ගන්නට ඕනෑ. එදා බැඳුම්කර වංචාව සම්බන්ධව COPE එක වාර්තාවක් හැදුවාම ඒකට footnotes දාන්න කට්ටියක් හිටියා. ඒවා දාපු කට්ටිය අද උදේ කථාත් කළා. නමුත් මෙහි එහෙම වෙලා නැහැ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජික සාමාජිකාවන් හැටියට අපි අවංකව, බෙහෙවින් මහන්සි වෙලා, වෙලාවක් අරගෙන කරුණු සලකා බලා හදපු වාර්තාවක්, මේක. මෙවැනි වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ අඩුම ගණනේ ඒක කියවාගෙන ඇවිල්ලා මෙතැන කථා කරන්න වෙලාවක්, විනයක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට නැත්නම්, මොකක්ද මේකේ තේරුම? එහෙම නම්, මේ පාර්ලිමේන්තුව මොකටද රැස් වෙන්නේ? ඒ මන්ත්‍රීවරුන් මොකටද පාර්ලිමේන්තුවට එන්නේ? ඇත්තටම මට ඒක තේරෙන්නේ නැහැ. විවාදයකට අවස්ථාව දුන්නාම මෙතැනට ඇවිල්ලා හදාගෙන ආපු මොකක් හරි කථාවක් කියනවා; හැම ප්‍රශ්නයම මෙතැන කියනවා. ඇත්තටම ඒක කනගාටුදායකයි. අපි මේ කාරණයත් මතක් කරන්නට ඕනෑ. මේ වාර්තාවේ කිසිම තැනක සඳහන් වන්නේ නැහැ, විපක්ෂය කියන විධියේ කරුණු. මේකේ සඳහන්ව තිබෙන්නේ මොකක්ද?

අපි දැන් මතක් කර ගනිමු, මේ ගැන ඇති වුණු සාකච්ඡාව. කට්ටියක් ගිහිල්ලා අපේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ගෙදරත් වට කළා. අපේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ගෙදර වට කළා; මේ ඩොලර් මිලියන 2.5 එතුමා හොරකම් කරලා ඕස්ට්‍රේලියාවට ගෙනිච්චා කිව්වා; මේ මුදල් පැලවත්තේ account එකකට දැම්මා කිව්වා. ඒවා තමයි කිව්වේ. ඒවා එකක්වත් මේ වාර්තාවේ තිබෙනවාද? එහෙම කළා කියලා තිබෙනවාද? නැහැ. මේ වාර්තාවේ තිබෙන්නේ ඒක cybercrime එකක් කියලායි. මොකක්ද, cybercrime එකක් කියන්නේ? Cybercrime එකක් කියන්නේ, අන්තර්ජාලය පාවිච්චි කරමින් සිදු කරන ලද අපරාධයක්. අපරාධ විමර්ශනයකින් තමයි, ඒ අපරාධය සිද්ධ කළේ කවුද කියන එක සම්බන්ධව හොයා ගන්න පුළුවන් වන්නේ. ඒක රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට හොයා ගන්න බැහැ. එහෙම තත්ත්වයක් තිබියදීත් මෙතුමන්ලා තවමත් පිළිගන්නේ නැහැ, මේක cybercrime එකක් කියලා. මේක වහන්න හදන්නේ කවුද කියලා අහනවා, කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. මම දන්නේ නැහැ මේක වහන්න හදන්නේ, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ද, රවුෆ් හකීම් මන්ත්‍රීතුමා ද, හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා ද කියලා. එතුමන්ලා ඔබතුමන්ලාගේ පක්ෂයේ මන්ත්‍රීවරු; ඔබතුමන්ලාත් එක්ක දේශපාලනය කරන මන්ත්‍රීවරු. ඒගොල්ලන්ද මේක cybercrime එකක් කියලා වහන්න හදන්නේ? මා හිතන්නේ මේ තරම් ග්‍රාම්‍ය level එකකට මේ වාගේ සංවාද ගෙනෙන එක අපරාධයක් කියලායි. මේ විවාද පවත්වන්නේ මෙහෙම නම් ජනතාවගේ මුදල් අපරාදේ; ජනතාවගේ කාලය අපරාදේ; අපේ කාලයත් අපරාදේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, cybercrime එකක් සිදු වෙලා තිබෙනවා කියලා තමයි අප මේ ඉදිරිපත් කරපු වාර්තාවෙන් පෙන්වා දෙන්නේ. මෙතැනදී ඇත්තටම මොකක්ද සිද්ධ වුණේ? මේක පසුගිය ඔක්තෝබර් මාසයේ අග භාගයේ සිට සිදු වන දෙයක්. පසුගිය ඔක්තෝබර් මාසයේ අග භාගයේ සිට ජනවාරි මාසයේ මුල් භාගය වනකල් මේ ගනුදෙනු සිද්ධ වෙනවා. ඒක ගැන detailed වාර්තාවක් මේකේ තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මතක් කර ගන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් අප නොදන්නා කාලය තුළ, ඒ කියන්නේ ජනවාරි මාසයේ මුල ඉඳන් අප්‍රේල් මාසයේ මේ පිළිබඳ සාකච්ඡාව ඇති වුණු තැන දක්වා වෙච්ච දේවල්. Free Lawyers කියා සංවිධානයක්, ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා කියලා ගරු කථානායකතුමාටත් ලිපියක් ලියලා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමාටත් ලිපියක් ලියලා පසුගිය අප්‍රේල් 22වන දා තමයි මේ ගැන මාධ්‍යයට නිරාවරණය කරන්නේ. නමුත්, මුදල් අමාත්‍යාංශය විසින් ඒ සිදුවීම ගැන දැන ගත්තාට පසුව ජනවාරි මාසයේ 09වන දා ඒ ගැන SLCERT එකට දැනුම් දී තිබෙනවා. මේ වාර්තාවේ සඳහන් වෙනවා, මාර්තු මාසයේ 24වන දා ඒ සම්බන්ධව තාක්ෂණික විමර්ශනයක් කිරීමට අභ්‍යන්තරිකව කමිටුවක් පත් කරලා අප්‍රේල් මාසයේ 10වන දා වන කොට ඒකෙන් සොයා ගත් කරුණු මත අප්‍රේල් මාසයේ 17වන දා සේවකයන් පිරිසකගේ වැඩ තහනමට ලක් කර තිබෙනවා කියලා. මෙය සිදු වුණා කියලා දැනගෙන, ඒ සම්බන්ධව අදාළ පාර්ශ්වවලට විමර්ශන භාර දීලා, ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තරිකව කරන්න ඕනෑ විමර්ශන කටයුතු කරලා, ඒකට අදාළව බලපෑම් විය හැකි කවුරු හරි ඉන්නවා නම් ඒ පුද්ගලයන්ගේ වැඩ තාවකාලිකව තහනම් කරලා ඒ සම්බන්ධව ඉදිරි විමර්ශන කටයුතු සිදු වෙමින් තිබෙන අතරතුර තමයි, ඒ කියන්නේ මේ ඔක්කෝම කළාට පසුව තමයි Free Lawyers කියලා සංවිධානයක් ඇවිල්ලා මාධ්‍ය සාකච්ඡා පවත්වමින් ඒ ගැන හැමෝටම කිව්වේ. ඊට පසුව කියනවා,"මේ මුදල් කොහේට ගියාද දන්නේ නැහැ. පැලවත්තට ගෙනිච්චා, හොරකම් කරලා" ආදී නොයෙකුත් දේවල්. මේ වාර්තාවේ කොහේද, ඒ මුදල් හොරකම් කරලා කියා සඳහන් කරලා තිබෙන්නේ? කවුද ඒවා හොරකම් කරලා තිබෙනවා කියන්නේ? ඒ මුදල් හොරකම් කළාද, නැද්ද කියන එක ගැන සොයන්න බලයක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඇත්තේ නැහැ. ඒක ගැන සොයන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හැකියාවක් ඇත්තේත් නැහැ. ඒක කරන්න ඕනෑ CID එකෙන්. එම නිසා මේ investigation එක CID එකට භාර දීලා තිබෙන්නේ. මෙතැන ඇවිල්ලා එකම කථාව ආයේ ආයේ කියනවා. අප්‍රේල් 22වැනි දා කියපු කථාව update වෙලා නැහැ. ඒකම කියනවා. ඒකම කියනවා. මම දන්නේ නැහැ, මේ විවාදය ගත්ත එකම නිරර්ථකයි. අපටත් ලජ්ජයි, මේ විවාදයේදී කථා කරන්න.

අනෙක් කාරණය හැටියට දිගටම කියනවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමායි, Central Bank එකේ Governorයි මේකට වග කියන්න ඕනෑ කියලා මේ වාර්තාවේ තිබෙනවාලු. එහෙම එකක් මේකේ නැහැ. ඒ, පළමුවැනි කාරණය. තිබෙනවා නම් ඔබතුමන්ලා පෙන්වන්න කොහේද තිබෙන්නේ කියලා. එහෙම එකක් මේකේ නැහැ. මේ වාර්තාවේ තිබෙන්නේ PDD එකේ ඉඳන් PDMO එකට Public Debt Management Act එක යටතේ transition එක කරපු අවස්ථාවේදී මීට වඩා සැලකිලිමත්ව කටයුතු කරන්න තිබුණා කියලා. හැබැයි, එහෙම කරන්න තිබුණා නම් කරන්න තිබුණේ මොකක්ද, ඒ ගැන දැන් කියන්න පුළුවන් මොකක්ද කියන එක මේ සිද්ධිය වුණාට පස්සේ අපට නිශ්චිත වශයෙන් කියන්නට බැහැ. "මේක කරලා තිබුණා නම් මේක වළකින්න තිබුණා" කියලා අපට නිශ්චිත වශයෙන් කියන්නට බැහැ. එහෙම කියන්න බැරි හින්දා තමයි මේ වාර්තාවේ ඒක නිශ්චිතව ලියලා තිබෙන්නේ. මම ඒක කියවන්නම්. The Report states under "Conclusions", I quote;

> "The Secretary to Treasury and Governor of CBSL could have avoided disagreements on responsibility..."

මොකද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් විධියට අපට පෙනිච්ච දෙයක් තමයි මේ නිශ්චිත අවස්ථාවේදී කුමන ආයතනයද වගකීම ගත්තේ කියන එක ගැන යම් කිසි නොඑකඟතාවක් ආයතන දෙක අතර තිබුණාය කියන එක.

It goes on to state, I quote;

> "...for the effective transition, had there been an ex-ante MoU that provided terms of reference to guide the 18-month transition..."

[ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

ඒ කියන්නේ මාස 18ක වැඩ මාරුවීමේ කාරණයේදී MoU එකක් තිබුණා නම් කියන කාරණය සලකා බලනවා. It further states, I quote;

"That would have contained the KPIs…"

එහෙමත් සඳහන් වෙනවා. It also states, I quote;

"While the Committee cannot establish a direct link between the lack of an MoU and the occurrence of this incident,..."

MoU එකක් නැතිවීමයි, මේ සිද්ධිය සම්බන්ධවයි කමිටුවට සෘජු සම්බන්ධතාවක් ගොඩනඟාගත නොහැක කියලායි මෙහි තිබෙන්නේ.

"...it believes that formalizing such an agreement would have clarified the responsibilities..."

මෙහෙම එකක් තිබුණොතින් මේක වළක්වා ගන්න තිබුණාද, නැද්ද කියලා අපි දන්නේ නැහැ, නමුත් අපට වගකීම පිළිබඳ යම් කිසි පැහැදිලිභාවයක් ලැබෙනවා කියන එක තමයි මෙහි සඳහන් වෙලා තිබෙන්නේ. ඒක හින්දා වාර්තාවේ තිබෙන කරුණු කථා කරන්න. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වන හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඔබතුමන්ලාගේම පක්ෂයේ සාමාජිකයෙක්; විපක්ෂයේ සාමාජිකයෙක්. ඇත්තටම එතුමා මහන්සි වෙලා තමයි මේ වාර්තාව හැදුවේ. අඩු ගාණේ ඒ ගැනවත් හිතලා ඒක ගැන කථා කරන්න. ඒක ගැන කථා කරන්නේ නැතිව තමන්ට හිතෙන හිතෙන වෙන වෙන දේවල් ඇවිල්ලා කියන එක නවත්වන්න. ඒක හොඳ නැහැ. ඒක ජනතාවට කරන අගෞරවයක්, මේ පාර්ලිමේන්තුවට කරන අගෞරවයක්, අපේ කාලයට, මේ මිනිස්සුන්ගේ ශ්‍රමයට, ඒ හැමෝටම කරන අගෞරවයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් තවත් කාරණයක් කියන්න ඕනෑ. අපේ රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය මේ පාර්ලිමේන්තුව තුළ ඉතා බරපතළ ප්‍රකාශ වගයක් කළා. අපි මතක් කර ගන්නට ඕනෑ, මේ පාර්ලිමේන්තුව අධිකරණයට එරෙහිව පාවිච්චි වෙච්ච තැනක් කියන එක. පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කරලා, කිසිදු සුදුසුකමක් නැති මන්ත්‍රීවරුන් ඒ විශේෂ කාරක සභාවට පත් කරලා, කිසිම පදනමක් නොමැතිව අයුතු චෝදනා නඟලා රටේ ප්‍රථම අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කරපු ආයතනයක් තමයි මේ පාර්ලිමේන්තුව. විනිසුරුවරුන්ට එරෙහිව ප්‍රකාශ කරන්නට නිදහසේ පාවිච්චි කරන ආයතනයක් තමයි මේ පාර්ලිමේන්තුව. අපේ රජය කාලයේදී ඒ කාරණය සිද්ධ වීමට ඉඩ තැබිය නොහැකියි. රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය ඇවිල්ලා කිසිදු ලජ්ජාවක් නැතිව, කිසිම ආකාරයකින් හිතන්නේ නැතිව ඉතාම නිදහසේ කියනවා, අග්‍ර විනිශ්චයකාරතුමා නටවන්නේ ආණ්ඩුවලු. අග්‍ර විනිශ්චයකාරතුමාට එරෙහිව මේ පාර්ලිමේන්තුවේ මෙවැනි ප්‍රකාශ කරන්න පුළුවන්ද? මේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමාට එරෙහිව එහෙම කියද්දි එහා පැත්තේ ඉන්න නීතිඥවරුන්ගේ කටවල මොනවත් නැහැ; ඒගොල්ලෝ මොකුත් කියන්නේ නැහැ. ඒගොල්ලෝත් ඒකට උල්පන්දම් දෙන්න තමයි ඉන්නේ. එතුමා මේ රටේ උපරිමාධිකරණයේ - ශ්‍රේෂ්ඨාධිකරණයේ - අග්‍ර විනිශ්චයකාරතුමා. එතුමාට එරෙහිව මේ වාගේ චෝදනා කරන්න කොහොමද මේ පාර්ලිමේන්තුව පාවිච්චි කරන්නේ? අපි මේකේ සීමාවක් හඳාගන්නට අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමියට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමියනි.

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව තත්පර 30ක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඕනෑම නීතියක් සම්බන්ධව, ඕනෑම ව්‍යවස්ථා සංශෝධනයක් සම්බන්ධව විවේචන කළාට කමක් නැහැ. ඒක කරන්න. හැබැයි, හැමෝටම පිළිගන්න පුළුවන්, හැමෝටම තේරෙන භාෂාවෙන් අපට කථා කරන්න පුළුවන් කරුණු තිබෙනවා. අග්‍ර විනිශ්චයකාරතුමා ආණ්ඩුවට ඕනෑ විධියට දීලා තිබෙන තීන්දුව මොකක්ද? එක පුද්ගලයෙක් එල්ල කරගෙන මෙහෙම චෝදනා කරන එක හොඳ නැහැ. ශිරානි බණ්ඩාරනායක මහත්මියට පාර්ලිමේන්තුව තුළ කරපු දේ පිටතදී හෝ මේ පාර්ලිමේන්තුව තුළ ඒ ආකාරයෙන්ම නැවතත් අපේ රටේ අග්‍ර විනිශ්චයකාරතුමාට සිදු වෙන්නට රජයක් විධියට අපි ඉඩ දෙන්න හොඳ නැහැ. අධිකරණයේ ස්වාධීනත්වය කියන නාමයෙන් විනිසුරුවරුන්ට පහර දෙන එක වහාම නතර කරන්න ඕනෑ, පාර්ලිමේන්තුව විසින්. ඔබතුමාගෙන් මා ඉල්ලා සිටිනවා මූලාසනයේ සිටින අවස්ථාවලදී ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න කියලා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.24]

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කරපු, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු විධියටත් කටයුතු කරන මගේ දිස්ත්‍රික්කයේම මන්ත්‍රීවරයෙක් බොහොම අසත්‍ය ප්‍රකාශ දෙක තුනක් කළා. ඒකත් මතක් කරමින් මගේ කථාව පටන්ගන්නවා. එතුමා කිව්වා, එතුමන්ලා ආණ්ඩුව ගනිද්දී උද්ධමනය සියයට 70 ගණනක, 80 ගණනක තිබුණේ, ඩොලර් එක විනිමය අනුපාතයේ ඉතාම ඉහළ මට්ටමක තිබුණේ කියලා. මම එතුමාට මතක් කරන්න ඕනෑ, අනුන්ගේ ළමයින්ට උප්පැන්න දෙන්න යන්න එපා කියලා. අපි පිළිගන්නවා, ආර්ථික අර්බුදයක් ආවා; ප්‍රශ්නයක් ඇති වුණා. හැබැයි, අපි ඒක කළමනාකරණය කරලා, උද්ධමනය සෘණ 3.5ට අඩු කරලා, ඩොලරයේ අගය අවුරුද්දක් විතර රුපියල් 291ක අගයක තියාගෙන ගිහිල්ලා, ණය ගෙවන්න පුළුවන්, බංකොලොත්භාවයෙන් මිදුණු රටක් හැදුවා. ඒ නිසා අනුන්ගේ ළමයින්ට උප්පැන්න දෙන්න යන එක වැරදියි කියලා මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම, විශේෂයෙන්ම මේ කාරණයත් මම මතක් කරන්න ඕනෑ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ මේ වාර්තාව පිළිබඳව දැන් කථා කළා. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව මේ වාර්තාව හදන්න ගියාම ඒ කාරක සභාවේ සභාපතිවරයාට තිබුණු බලපෑම, වචනයක් ඇතුළත් කරන්න ගියාම එල්ල වුණු විරෝධය මොකක්ද කියලා අපි දන්නවා. ආණ්ඩු පක්ෂයට රජයේ මුදල් පිළිබඳ කාරක

සභාවේ බහුතරය තියාගෙන, ඒ සභාපතිවරයාට අවශ්‍ය ආකාරයට අවශ්‍ය කටයුතු කරන්නට නොදී මේ වාර්තාව පිළිබඳව කථා කළත් විපක්ෂය විධියට අපි දන්නවා ඒ කාරක සභාවේදී කොහොමද කටයුතු කළේ කියලා.

ඒ වාගේම, මේ ඩොලර් මිලියන 2.5ක වංචාව ගැන Free Lawyers සංවිධානය මේ රටට කියනතුරු භාණ්ඩාගාරයේ ලේකම්වරයා, මුදල් අමාත්‍යාංශයේ අදාළ නිලධාරින් මොකක්ද කළේ කියන එක ඔබතුමන්ලාගෙන් අපට අහන්න සිද්ධ වෙනවා. Free Lawyers සංවිධානය තමයි මේ රටේ මහජනයාගේ මුදල් මෙහෙම වංචා කරලා තිබෙනවා කියලා මේ රටට කිව්වේ. ඒ ප්‍රකාශයත් එක්ක තමයි මේ පිළිබඳව කටයුතු කරන්න පටන් ගත්තේ. අද වෙනකොට මේ සිද්ධියට මාස 6කට අධික කාලයක් ගෙවිලා ගිහින් තිබෙන වෙලාවේ අපි අහනවා, මොකක්ද ඒ පරීක්ෂණවල ප්‍රගතිය කියලා. මේ රටේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මේ ඩොලර් මිලියන 2.5ක වංචාව ගැන සිදු කරන පරීක්ෂණවල මොකක්ද තිබෙන ප්‍රගතිය? මේවා අපේ රටේ මහජනයාගේ මුදල්. මේවා මේ රටේ මහජනයාට බදු ගහලා අමාරුවෙන් එකතු කරන මුදල්. හැබැයි, අදටත් මීට වගකිවයුත්තන්ට දඬුවම් දෙන්නට නොහැකි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අපි කියනවා, මේ වංචාව පිටතින් විතරක් සම්බන්ධ වෙලා කරන්න පුළුවන් වංචාවක් නොවෙයි කියන එක. ඇතුළත ඉන්න කවුරු හෝ මේකට උදවු කරන්න ඕනෑ. හැබැයි, මේ ගැන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්වත්, වංචා විමර්ශන කාර්යාංශයෙන්වත් තවම හරියට පරීක්ෂණ වෙන්නේ නැහැ කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

ජනාධිපතිවරයා ගිය සතියේත් ප්‍රකාශයක් කළා, මේ රටේ මහජනයාගේ මුදල් අපි සාංඝික දේපළ විධියට තමයි පරිහරණය කරන්නේ කියලා. විශේෂයෙන්ම ඒ කථාව වාගේම වැඩ තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. කථාවට එහෙම කියන්න පුළුවන්. හැබැයි, ඒ ආකාරයෙන් වැඩ සිද්ධ වෙනවාය කියන එක නම් අපට පෙනෙන්න නැහැ.

දේශපාලනයේ ප්‍රකට කියමනක් තිබෙනවා, "බලය කියන එකේ පළමුවන නීතිය තමයි හැකි එවුන් අනික් එවුන් මත ජරා කළාම නොහැකි එවුන් ඒවා පිරිසිදු කිරීම" කියලා. අද අපට මේ ආණ්ඩුවේ ක්‍රියාකලාපය දැක්කාම ඒක තමයි කියන්න තිබෙන්නේ. හැකි එවුන් නොහැකි එවුන් මත ජරා කරලා, නොහැකි එවුන් ඒක පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය තමයි මේ කරගෙන යන්නේ කියන කාරණය මතක් කරන්න වෙනවා. මේ කාරණයේදී වගකීම් විරහිතව, තමන්ගේ වගකීම පැහැර හැරපු භාණ්ඩාගාර ලේකම්වරයා අද කිසිදු ප්‍රශ්නයක් නැතිව තවදුරටත් ඒ තනතුරේ කටයුතු කරගෙන යනවා. ඒ වාගේම මම මතක් කරන්න ඕනෑ,

මහා භාණ්ඩාගරයේ ලේකම්වරයා තමන්ගේ වගවීම සහ වගකීම පැහැර හැරපු පළමු අවස්ථාව මෙය නොවෙයි කියන එක. අංක 03/2020 දරන නඩුවේ තීන්දුව ක්‍රියාත්මක කළේ නැහැ කියන කාරණය මත එතුමාට අභියාචනාධිකරණයේදී නඩු පවරලා තිබෙනවා. එහෙම නම්, වර්තමාන භාණ්ඩාගාර ලේකම්වරයා තමන්ගේ වගකීම, තමන්ගේ වගවීම හරියට ක්‍රියාත්මක කරලා නැති නිලධාරිවරයෙක් විධියට වුවත්, ජනාධිපතිවරයා එතුමාව තවමත් එම තනතුරේ තබාගෙන ඉන්නවා. ඔබ සියලුදෙනාම දන්නවා, තමන්ගේ රාජකාරිය හරියාකාරව ඉෂ්ට කළේ නැහැ කියලා තමයි පූජිත ජයසුන්දර, ඒ වාගේම හේමසිරි ප්‍රනාන්දු යන මහත්වරුන්ට මරණීය දඬුවම දීලා තිබෙන්නේ.

එහෙම නම්, අද තමන්ගේ රාජකාරිය හරියට ඉෂ්ට කරපු නැති වර්තමාන භාණ්ඩාගාර ලේකම් හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමාට ලබා දී තිබෙන දඬුවම මොකක්ද? කිසිම දඬුවමක් දීලා නැහැ. තමනුත් හරියට නීතිය ක්‍රියාත්මක කරන්නේ නැතුව

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

හැම තැනකටම ගිහිල්ලා බොරු කියමින් කටින් බතල සිටුවනවා. එම නිසා, විශේෂයෙන්ම මහජනයාගේ බදු මුදල් හොරා කාපු, මහජනයාගේ බදු මුදල් සම්බන්ධයෙන් වගකීම් විරහිතව කටයුතු කළ සියලුදෙනාට සමඟි ජන බලවේග ආණ්ඩුවක් යටතේ දඬුවම් ලබා දෙනවාය කියන කාරණය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

සියලුදෙනාටම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.30]

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, CoPF එකේ සභාපති හර්ෂ ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද එම කමිටුවේ වාර්තාව පිළිබඳව තමයි අද දින විවාද කරනු ලබන්නේ. ඇත්තටම, 2024 රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක වීම මත රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය - PDMO - 2024 නොවැමර්බර් 24වැනි දින මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ලබනවා. ඒ වාගේම, ණය ගැනීමත්, ණය ගෙවීමත්, ණය කළමනාකරණය කිරීමත් තමයි එහි විශේෂ කාර්යභාරය වෙන්නේ. ඒ කාරණා පදනම් කරගෙන තමයි එම ආයතනය පිහිටුවන්නේ. ඒ සඳහා මීට කලින් පැවැති ආයතනය තමයි, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව: PDD ආයතනය. එම දෙපාර්තමේන්තුවේ බලතල ක්‍රමානුකූලව පවරන්න තමයි මෙම ආයතනය පිහිටුවන්නේ. මෙම ආයතනය පිහිටුවලා මාස 18ක් වැනි කාලයක් ඇතුළත සියලුම වගකීම් පවරන්න ඕනෑ. ඉතින්, ඒ අරමුණින් තමයි එම ආයතනය පිහිටුවා ක්‍රියාත්මක වෙන්නේ. 2025.12.31 දින මේ ක්‍රියාවලිය අවසන් වෙලා PDD ආයතනය ඉවත් කරලා, එහි කටයුතු PDMO ආයතනයට පවරනවා. නමුත්, ඊට අදාළ ගිවිසුම - ගැසට් පත්‍රය - නිකුත් වෙන්නේ මැයි මාසයේ 24වැනිදා. දැන් අපි බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ ක්‍රියාවලිය අතරතුර තමයි මේ ගනුදෙනුව, නැත්නම් මේ සයිබර් අපරාධය සිද්ධ වෙන්නේ.

අපි දන්නවා, 2025 නොවැම්බර් මාසයේ තමයි මෙම වංචාවට අදාළ තොරතුරු වාර්තා වෙන්නේ. ඒ වාගේම මේ කාල සීමාව තමයි, PDMO ආයතනයේ නිලධාරින් මහ බැංකු පරිශ්‍රය ඇතුළේ පුහුණු වන කාලය. ඒ කාලය කියන්නේ, සංක්‍රාන්ති අවධියක්. ඒ කියන්නේ ටිකක් ව්‍යාකූල, විනිවිදභාවය නැති, ආයතන අතර වගකීම් පැටළිලි සහගත ස්වභාවයක තිබුණු කාලයක්. මේ CoPF වර්තාවේ ඒ බව පැහැදිලිව කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කාර්ය පටිපාටිමය සහ මෙහෙයුම් පරතරයන් තවදුරටත් උග්‍ර කළ ප්‍රධාන පාලනමය දුර්වලතාවක් විය" කියලා මෙහි කියනවා. ඇත්තටම මටත් කනගාටුයි. මට කලින් කථා කළ විපක්ෂ මන්ත්‍රීවරයා පවා කිව්වා, හර්ෂ ද සිල්වා මහත්මයාව භය කරලා, හර්ෂද සිල්වා මහත්මයාව ඇපේට තබාගෙන මේ වාර්තාව හැදුවා කියලා. ඒ කියන්නේ, හර්ෂ ද සිල්වා මහත්මයාට එච්චර හැකියාවක් තිබෙනවා කියලා ඔබතුමන්ලාට ෂුවර් නැහැ. ඇත්ත තත්ත්වය ගත්තොත්, එහෙම නොවෙයි. එතුමා මෙම වාර්තාවේ ලස්සනට කියලා තිබෙනවා, "පරිපාලනමය දුර්වලතා, නැත්නම්

[ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා]

පරිපාලනමය ගැටලු මේ අතරේ උග්‍ර වුණා" කියලා. ඒ වාගේම, උදේ කථා කරපු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා, අහිංසක රාජ්‍ය නිලධාරින් 4දෙනෙකුගේ වැඩ තහනම් කළා කියලා.

ඒකත් මේ වාර්තාවේ තිබෙනවා. මම හිතන විධියට, උදේ පාන්දර වැඩි නිසා එතුමාටත් වාර්තාව කියවන්න බැරි වෙන්න ඇති. ඕස්ට්‍රේලියාවට ඇමරිකානු ඩොලර් මිලියන 2.5ක ණය ආපසු ගෙවීමේදී සිදුවූ සයිබර් අපරාධ හා සම්බන්ධ වංචාව සම්බන්ධයෙන් 2026 ජූලි 10 දිනැති රජයේ මුදල් පිළිබඳ කාරක සභා වාර්තාවේ පිටු අංක 01හි මෙසේ සඳහන් වෙනවා:

> "…. නිලධාරින් වෙත ගැටලු වාර්තා කිරීමේ පටිපාටි ප්‍රමාණවත් නොවීම තුළ රාජකාරි පැහැර හැරීමක්, කාර්ය පටිපාටිමය මට්ටමෙන් නිරීක්ෂණය විය. මෙහෙයුම් මට්ටමින්, මධ්‍යම මට්ටමේ නිලධාරින් නොසැලකිලිමත් ලෙස කටයුතු කර ඇති අතර, නිවැරදි තීරණ ගැනීමට අසමත් වී ඇත."

ඒ කියන්නේ, අපි අහිංසකයන්ගේ රක්ෂා නැති කළා නොවෙයි. ඒක මේ වාර්තාවේ බොහොම පැහැදිලිව කියනවා. වඩා වැදගත් වෙන කාරණය තමයි, මේ වංචාව සොයා ගත් දින සිට අපි කටයුතු කරපු ආකාරය. ඇත්තටම, මේ සයිබර් අපරාධය සොයා ගත් අවස්ථාවේ ඉඳලා රජයක් විධියට අපි කටයුතු කළේ කොහොමද? වෙනත් රජයන් තමන්ගේ කණ්ඩායම අපරාධ, නැත්නම් මූල්‍ය වංචා කළාම ඔවුන් ආරක්ෂා කළේ කොහොමද කියන එක ගැන අපට පරණ අත්දැකීම් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, අපි රජයක් විධියට - මේකට ජනාධිපතිතුමා අත පෙව්වේ නැහැ, ඇමතිවරු අත පෙව්වේ නැහැ - මහ බැංකුවත් - Central Bank එකත් - එක්ක වරින් වර සම්බන්ධ වෙමින් මේ ගැන සොයා බැලුවා. ඒ නිසා වෙන්න ගිය හානි වළක්වා ගන්නත් අපට පුළුවන් වුණා. ඒ වාගේම ඉන්දියානු එක්සිම් බැංකුව එක්කත් සම්බන්ධ වෙලා කටයුතු කළා.

මෙහිදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි, සයිබර් අපරාධ කියන්නේ ජාත්‍යන්තර මට්ටමේ අවදානමක්, එහෙම නැත්නම් ජාත්‍යන්තර මට්ටමේ අපරාධයක් කියන එක. රටක් විධියට අපට හුදකලාව ඒවාට මුහුණ දෙන්න බැහැ. ඒ සඳහා ජාත්‍යන්තරයෙන් තොරතුරු ගන්න ඕනෑ; ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන්න ඕනෑ. මේ වාගේ කාරණා කිහිපයක් තිබෙන නිසා අපි ජාත්‍යන්තරයත් එක්කත් සම්බන්ධ වුණා. මේ පිළිබඳව CID එක, Sri Lanka CERT, FIU එක වැනි ආයතන දැනුවත් කළා. මේ සයිබර් අපරාධය ගැන ඔවුන්ට පැමිණිලි කළා. මේ සිද්ධිය අපි හැංගුවේ නැහැ. මේ සම්බන්ධයෙන් අපි තවදුරටත් කටයුතු කළා. තාක්ෂණික කමිටුවක් පත් කළා. එම තාක්ෂණික කමිටුවේ නිර්දේශ මත තමයි අප්‍රේල් මාසයේදී 4දෙනෙකුගේ වැඩ තහනම් වුණේ. ඔවුන්ගේ වැඩ තහනම් කරනතෙක්ම මේ ගැන කවුරුත් දැනගෙන හිටියේ නැහැ. හැබැයි, ඒ වැඩ තහනම් කරපු නිලධාරින් මේ ගැන එළියේදී කිව්වා. ඊට පස්සේ තමයි මේ ගැන සමාජය දැනුවත් වුණේ. එයින් පසුවත් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මේක යොමු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ රජයක වගකීම අපි මැනවින් ක්‍රියාත්මක කර තිබෙනවා. මේ සිද්ධියට ආණ්ඩුව වගකියන්න ඕනෑ කියලා අපට ඇඟිල්ල දිගු කරනකොට, ඔවුන්ගේ පැත්තට ඇඟිලි 4ක් දිගු වෙලා තිබෙනවා කියලා ඔවුන් දන්නේ නැහැ. ඔවුන් මීට කලින් කිව්වා, උද්ධමනය පාලනය කළා කියලා. හැබැයි, උද්ධමනය පාලනය කළා කියපු විපක්ෂයේ අය මේ ණය ක්‍රියාවලියට සම්බන්ධ පරිගණක පද්ධතිය 2019 සිට යාවත්කාලීන කර නැහැ. ඒකේ පණිවුඩය හම්බ වෙනවා, 2023දී. ඒත් යාවත්කාලීන කර තිබුණේ නැහැ. එහෙම අය තමයි ආණ්ඩුවට අත දිගු කරන්නේ. හැබැයි, මේ අපරාධයෙන් පස්සේ අපි මේක නිවැරදි කරන්නේ කොහොමද කියලා තීරණ ගත්තා. ඒකත් මේ වාර්තාවේ සහ අනෙකුත් වාර්තාවල පැහැදිලිව තිබෙනවා. ඒ වෙනුවෙන් අපි අලුත් system එකක් ප්‍රසම්පාදනය - procure - කරලා තිබෙනවා. ඒ system එක National Cyber Security Operations Centre එකට ඇතුළත් කර තිබෙනවා. ඒ පිළිබඳව අපි නිරන්තරයෙන් අධීක්ෂණය - monitor - කරමින් ඉන්නවා. අවශ්‍ය ක්‍රියාමාර්ගත් අරගෙන තිබෙනවා.

මම කලිනුත් කිව්වා, සයිබර් අපරාධවල ස්වභාවය හා ඒ සඳහා ජාත්‍යන්තරයත් එක්ක එකතු වෙලා ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය වේගයෙන් දියුණු වෙනකොට ඩිජිටල්කරණය තුළ මේ වාගේ අපරාධ සිද්ධ වෙන බව අපි දන්නවා. එහෙම වාර්තාවක් මා සතුව තිබෙනවා. ඒක ජාත්‍යන්තර මූල්‍ය ආයතනයත් එක්ක සම්බන්ධ වෙලා හදාගත්ත වාර්තාවක්. ඒ වාර්තාවේ කියනවා, 2022 වසර වන විට මෙවැනි සිද්ධීන් විතරක් මිලියන 2.5කට ආසන්න ප්‍රමාණයක් ලෝකයෙන් වාර්තා වෙලා තිබෙනවා කියලා. මේ, වාර්තා වන ටික විතරයි. සයිබර් අපරාධ බොහොමයක් වාර්තා වන්නේ නැහැ. ඒ වාගේම Global Anti-Scam Alliance කියන ආයතනය විසින් සිදු කළ පරීක්ෂණයකින් කියනවා, 2024 වසර තුළ පමණක් වංචා හේතුවෙන් ලෝක ආර්ථිකයට සිදු වූ සමස්ත අලාභය ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියනයක් කියලා. ඒ නිසා මේක ලංකාවට, මේ ආණ්ඩුවට විතරක් වෙච්ච දෙයක් නොවෙයි. මේක ලෝකයටම පොදු තත්ත්වයක්, ගනුදෙනු කිරීම් ඇතුළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ඉන්දියාව, උතුරු ඇමෙරිකානු රටවල්, බටහිර යුරෝපා රටවල්, ඕස්ට්‍රේලියාව වැනි ඉහළ ආදායම් ලබන රටවලුත් මෙවැනි දේවල්වලට ගොදුරු වෙලා තිබෙනවා. ඒකෙන් පිළිබිඹු වන්නේ දියුණු ආර්ථිකයක්, දියුණු තාක්ෂණයක් තිබෙන රටවලට පවා සයිබර් අපරාධවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා කියන එකයි. වඩා වැදගත් වන්නේ මේ සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ග මොනවාද, ඒවාට දක්වන අනුග්‍රහය මොකක්ද කියන එකයි.

ඒත් එක්කම තවත් කාරණයක් තිබෙනවා කියන්න. අද උදේ අපේ විපක්ෂ නායකතුමා කථා කළා. එතුමා ලොකු බිල්ලෙක් මැව්වා, මේ රටේ ආර්ථිකය සම්බන්ධයෙන්. එතුමාගේ වචනවලින් කිව්වා, මේ ඩොලර් මිලියන 2.5 ගියා වාගේම ඒකේ බර දරන්න වෙන්නේ ජනතාවට, කර්මාන්ත කඩාගෙන වැටිලා, බදු බර වැඩි කරලා, රට බංකොලොත් කරලා කියලා. මම දන්නේ නැහැ, එතුමා කොහේද ඉන්නේ කියලා. එතුමා තවම ඉන්නේ රට බංකොලොත් වෙච්ච යුගයේ. එතුමා 2029 ජනාධිපතිවරණයට ඉල්ලන්න බලාපොරොත්තු වනවා නම්, එතුමාට ජනාධිපතිවරණයට ඉල්ලන්නවත් සුදුසුකමක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ, එතුමා මේ කියන සංඛ්‍යාලේඛන දිහා බැලුවාම.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආර්ථිකය ගැන එතුමාට තිබෙන අවබෝධයේ ප්‍රමාණය අපට පැහැදිලි වනවා, එතුමාගේ කථාව තුළින්. එතුමා අපට කියනවා, ලෝකයේ තිබෙන අත්දැකීම් ප්‍රයෝජනයට ගන්න කියලා. එතුමා අපට එහෙම කියනකොට, එහෙම උපදෙස් දෙනකොට ඒ අත්දැකීම්, ඒ දේවල් අරගෙන මේ වංචා නැවත නොවෙන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ, විපක්ෂ නායකතුමා ඇතුළු කණ්ඩායම තව ගොඩක් දුර ඉන්නේ, ගොඩක් පස්සෙන් ඉන්නේ කියන එකයි. ආණ්ඩුව ඩිජිටල්කරණය හරහා වේගයෙන් ඉදිරියට යමින් ඉන්නවා. ඒ අනුව ඉදිරියේදී මෙවැනි ව්‍යසන වෙන්න තිබෙන ඉඩ කඩ අහුරමින්, ජනතාව වෙනුවෙන් හිටගනිමින්, අපි නිවැරදි ක්‍රියාමාර්ග ගන්නවා කියා ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය අගවිනිසුරුතුමා සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අසත්‍ය කාරණා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස මම දන්වා සිටිනවා.

මීළඟට, கௌரவ இளையதம்பி சிறிநாத் அவர்கள்! உங்களுக்கு 8 நிமிடங்கள் உண்டு.

[பி.ப. 3.42]

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசின் நிதிக் கட்டமைப்பில், அவுஸ்திரேலியாவுக்கான 2.5 மில்லியன் அமெரிக்க டொலர் கடனைத் திருப்பிச் செலுத்துவதில் இடம்பெற்ற மோசடி தொடர்பான அறிக்கைமீது இடம்பெறும் விவாதத்திலே கலந்துகொள்வதற்குச் சந்தர்ப்பமளித்தமைக்கு நன்றியையும் எனது வணக்கத்தையும் உங்களுக்கு முதலில் தெரிவித்துக் கொள்கிறேன்.

மிக முக்கியமாக, பொருளாதார ரீதியாக நாட்டிலே ஏற்பட்ட துயரமான ஒரு விடயமாகத்தான் இந்த நிதி இழப்பை நாம் பார்க்க வேண்டியிருக்கின்றது. இதனை ஒரு தோல்வி நிலையால் ஏற்பட்ட விளைவென்றுதான் கூறவேண்டியிருக்கின்றது. உண்மையிலே திறைசேரியிலிருந்தான இந்த நிதியிழப்பானது ஆரம்பத்தில் கூறப்பட்டதுபோன்று ஒரு சைபர் தாக்குதலாக மேற்கொள்ளப்பட்டதா அல்லது அதற்கப்பால் CoPFஇன் அறிக்கையின்படி, இதுவோர் உள்நாட்டு நிறுவனத்தின் அலட்சியம் அல்லது காலாவதியான கட்டமைப்பினூடாக நடத்தப்பட்டதா என்பது இன்று விவாதத்திற்கு உள்ளாகியிருக்கின்றது. இதற்குக் காரணமாக எந்த விடயங்கள் சொல்லப்பட்டாலும், இந்த நாட்டுக்கு ஓர் இழப்பாகக் கருதப்பட வேண்டிய இந்தச் சம்பவம் பொருளாதாரக் கட்டமைப்பு விடயங்களில் அலட்சியமற்ற தன்மையும், நிர்வாகத் திறமையும் பேணப்பட வேண்டும் என்பதையே சுட்டிக் காட்டுகின்றது.

உண்மையிலே இந்தப் பணம் இலங்கை அரசின் வரி வருமானத்திலிருந்து பெறப்பட்டது. இந்த விடயத்தில் இடம்பெற்ற மோசடி கண்டுபிடிக்கப்பட்டு, அப்பணம் மீளப் பெறப்படாவிட்டால் இது நாட்டுக்குப் பாரிய ஓர் இழப்பாகவே ஏற்படக்கூடிய சூழ்நிலை இருக்கின்றது. எனவே, தடயவியல் மற்றும் குற்றவியல் விடயங்கள் அடையாளம் காணப்பட்டு, திருடப்பட்ட பணத்தை மீளக் கொண்டுவருவதற்கான ஏற்பாடு செய்யப்பட வேண்டும். மிக முக்கியமாக, இந்தக் கட்டமைப்பின் ஊடான திறனை விருத்தி செய்வதன்மூலம் எதிர்காலத்திலே இவ்வாறான விடயங்கள் நடைபெறாத வகையில் நாட்டிலே பொருளாதார நெருக்கடிகளை ஏற்படுத்தாத அல்லது பொருளாதாரத்திற்கான ஒரு நெருக்கடியை உருவாக்காத சூழ்நிலை ஏற்படுத்தப்பட வேண்டும். அலட்சியமான அல்லது காலாவதியான திட்ட அமைப்பின் ஊடாக எதிர்காலத்தில் இவ்வாறான சைபர் குற்றங்கள் நடைபெறாது பாதுகாப்பதற்கான நடவடிக்கை களைச் சட்ட நடைமுறைகளின் ஊடாக மேற்கொள்வதோடு, விரிவான தேசிய தணிக்கை அறிக்கையும் இடப்பட வேண்டும் என்பதே எங்களது கோரிக்கையாக இருக்கின்றது. எவ்வாறான விடயங்கள் சொல்லப்பட்டாலும், இந்த இழப்பினை ஏற்றுக்கொண்டு, அதற்கான பொறிமுறையினை உருவாக்கி எதிர்காலத்திலே நாட்டுக்கு இவ்வாறான நெருக்கடிகள் ஏற்படாது பாதுகாக்கவேண்டிய பொறுப்பிலிருந்து அரசு நழுவிக்கொள்ளக் கூடாது என்ற கோரிக்கையையும் முன்வைக்க விரும்புகின்றேன்.

மேலும், இந்த விவாதத்தின் ஊடாக எமது மாவட்டம் அல்லது இனம் சார்ந்த விடயங்களையும் இவ்விடத்திலே முன்வைக்க வேண்டிய பொறுப்பு எனக்கு இருக்கின்றது. செம்மணி மனிதப் புதைகுழியிலிருந்து இதுவரை 480க்கும் மேற்பட்ட மனித எச்சங்கள் அடையாளம் காணப்பட்டுள்ளன. இம்மாதம் 4ஆம் திகதி மீண்டும் அகழ்வுப் பணிகள் ஆரம்பிக்கப்பட்டு இருக்கின்றன. இதிலிருந்து கிடைக்கின்ற மனித எச்சங்கள் அதிகரிக்கும்பொழுது, அவற்றைப் பாதுகாக்கும் நடைமுறையும் DNA பரிசோதனை மாதிரியான தடயங்களை ஆதாரமாகக் கொள்ளும்போது ஏற்படும் சிக்கல் தன்மையும் சட்டரீதியாக முக்கியத்துவம் பெறுகின்றன. எதிர்காலத்தில் இவ்வாறு அதிகரிக்கின்ற மனித எச்சங்களை DNA பரிசோதனை செய்வதில் நெருக்கடியான சூழல் ஏற்பட்டு, அதனூடாக சாட்சியங்களும் அடையாளங்களும் மறைக்கப் படாமல் இருப்பதற்கும், தமிழ் மக்களுக்கு ஏற்பட்ட இந்த நெருக்கடிகளை இல்லாதொழிப்பதற்கும் பல விடயங்களை முன்னெடுக்க வேண்டிய பாரிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருக்கின்றது.

சர்வதேசத்தின் நேரடி பங்குபற்றுதலுடனும் கட்டுப் பாட்டின்கீழும் மேற்கொள்ளப்பட வேண்டிய DNA பரிசோதனை மாதிரிகளை சர்வதேச தரத்தில் பாதுகாக்க வேண்டிய தேவை இருக்கின்றது. இவற்றைச் சாதாரண மனித எச்சங்களை அகழ்ந்தெடுக்கும் பொறிமுறைமூலம் மேற்கொள்ளாது, ஓர் இனத்துக்கு ஏற்பட்ட மிகப் பெரிய அவலமாகவும் இனப் படுகொலையாகவும் அடையாளப் படுத்தி, எதிர்காலத்தில் இவ்வாறான சம்பவங்கள் இடம் பெறாமல் இருப்பதற்கும் இதில் ஈடுபட்ட குற்றவாளிகளைத் தண்டிப்பதற்கும் மிகுந்த சிரத்தையுடனும் சர்வதேச கட்டுப்பாட்டு முறையிலும் சர்வதேசத்தின் பங்கு பற்றுதலுடனும் இதனைச் செய்ய வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். எமது இனத்துக்கு ஏற்பட்ட பல அழிவுகளில் இன்று அடையாளப்படுத்தப்படு கின்ற ஒரு சாட்சியமாக இருக்கின்ற இந்த சிந்துபாத்தி - செம்மணி படுகொலையின் ஆதாரங்களை மிக சிரத்தையுடன் நீதிக்கான ஒரு பொறிமுறையாகக் கொள்வதற்கு, இந்த அரசு மிக உறுதியான நடவடிக்கைகளை சர்வதேசத்தின் பங்கு பற்றுதலுடனும் அதன் கட்டுப்பாடு மற்றும் பாதுகாப்பின்கீழும் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

இதற்கு அப்பால், மிக முக்கியமாக எமது மாவட்டத்தில் இருக்கின்ற ஒரு பிரச்சினை பற்றியும் நான் இந்த இடத்தில் தெரிவிக்க வேண்டும். நேற்று கௌரவ கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அவர்கள் சொல்லியிருந்தார், மயிலத்தமடு - மாதவனை சம்பந்தமாக ஓர் உறுதியான அல்லது எழுத்து மூலமான ஆதாரம் இல்லை என்று. பல வருடங்களாக பல வழக்குகள் இருக்கின்ற நிலையில், எமது மாவட்டத்தில் கால்நடைகளை மேய்க்க அல்லது அவற்றை வளர்க்க முடியாத ஓர் அசாதாரண சூழ்நிலை இருக்கின்ற சந்தர்ப்பத்தில், கௌரவ அமைச்சரின் பதில் ஏமாற்றத்தை அளிப்பதாகவே அமைகின்றது. மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் மாண்புமிகு சனாதிபதி அவர்கள் பங்குகொண்ட கூட்டத்திலும் இந்த விடயம் எடுத்துரைக்கப்பட்டு, மிக விரைவாக தீர்மானங்கள் எடுக்கப்பட்டு, அது மேய்ச்சல் தரையாக அறிவிக்கப்படுமென கூறப்பட்டபோதிலும், இந்தச் சபையில் கௌரவ அமைச்சர் அவர்கள் கூறிய விடயம் அதற்கு முரணாகவே இருக்கிறது. அதற்கு அப்பால், அந்தப் பிரதேசத்தில் காலங்காலமாக கால்நடைகளை வைத்திருக்கின்ற மக்களுக்கு நியாயமான தீர்வு கிடைக்காதபோது, இவ்வாறான பல நடவடிக்கைகள் தமிழ் மக்கள் மத்தியில் சந்தேகங்களையும் நம்பிக்கையற்ற தன்மையையும் உருவாக்குகின்றன.

அடுத்து, முந்தனை ஆறு திட்டம் மற்றும் கித்துல் - றூகம் இணைப்பு திட்டம் பற்றி நாம் கடந்த மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் ஆராயும்பொழுது, அது சம்பந்தமான feasibility studyஇன் முன்னேற்றம் ஒரு சதவீதமாகவே காணப்பட்டது. ஆகவே, அரசியல் தீர்வற்ற தன்மை, பொருளாதார ரீதியாக வளங்களை மேம்படுத்த முடியாத தன்மை, கால்நடைகளை வளர்ப்பதற்கு உகந்ததற்ற சூழல் என்பவற்றுக்கு மத்தியில், எவ்வாறு இந்த அரசாங்கம் தமிழ் மக்கள் மத்தியில் நம்பிக்கையைக் கட்டியெழுப்பப் போகின்றது என்ற கேள்வி எழுகின்றது. உண்மையிலேயே எமது மாவட்டத்துக்கு மிகப் பெரும் ஆதாரமாக இருக்கின்ற கித்துல் - றூகம் இணைப்பு திட்டம் மற்றும் முந்தெனி ஆறு திட்டம் போன்றன கிடப்பில் போடப்பட்டதா? அல்லது அலட்சியத்துடன் மந்தகதியில் நடைபெற்றுக்கொண்டு இருக்கின்றதா? என்ற கேள்வி எழுகின்றது.

இவ்வாறான சூழ்நிலையில், எதிர்காலச் சந்ததியினரை இலக்காக வைத்து, பொருளாதார ரீதியான விடயங்களை முன்னெடுத்துச் செல்வதற்கான திட்டங்கள் அங்கு இல்லை. விவசாயம், கால்நடை வளர்ப்பு, மீன்பிடி சம்பந்தமான எதிர்காலத் திட்டங்கள் மாவட்ட அபிவிருத்தியில் நிதர்சனமாக இல்லை. இதற்கு அப்பால், பொருளாதாரக் கட்டமைப்பில் ஏற்படுகின்ற நெருக்கடிகள் தமிழ் மக்கள் மத்தியில் நம்பிக்கையீனத்தையும் எதிர்காலம் பற்றிய நிச்சயமற்ற தன்மையையும் ஏற்படுத்துவதைத் தடுப்பதற்கு இந்த அரசு உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

அடுத்து, கௌரவ கந்தசாமி பிரபு அவர்கள்! உங்களுக்கு 10 நிமிடங்கள் உண்டு.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කිට්නන් සෙල්වරාජ් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு கிட்ணன் செல்வராஜ் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. KITNAN SELVARAJ left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[பி.ப. 3.50]

ගරු කන්දසාමි ප්‍රභූ මහතා
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நாங்கள் இச்சபையில், இந்த நாட்டில் துரதிருஷ்டவசமாக இடம்பெற்ற ஒரு cyber குற்றம் தொடர்பாக விவாதித்துக் கொண்டு இருக்கின்றோம். அதாவது, அவுஸ்திரேலியாவுக்கு கடனை மீளச் செலுத்தும்போது குறிப்பாக, 2.5 மில்லியன் அமெரிக்க டொலரை வழங்கும் போது இடம்பெற்ற இணையவழி மோசடி தொடர்பான விடயம் பற்றி நாங்கள் விவாதித்துக்கொண்டு இருக்கின்றோம். CoPF எனப்படுகின்ற அரசாங்க நிதி பற்றிய குழுவின் தவிசாளரான கலாநிதி ஹர்ஷ த சில்வா அவர்கள் இது தொடர்பான அக்குழுவின் அறிக்கையை இச்சபையில் சமர்ப்பித்திருக்கிறார். அந்த அறிக்கை தொடர்பான விவாதத்தையே இன்று நாங்கள் முன்னெடுத்துக்கொண்டு இருக்கின்றோம்.

இன்றைய விவாதத் தலைப்புக்குள் நுழைவதற்கு முன்னர், எதிர்க்கட்சி தொடர்பான சில விடயங்களைக் கூறலாமென நினைக்கின்றேன். அன்று எதிர்க்கட்சியில் அமர்ந்திருந்தவர் இன்று இந்த நாட்டின் சனாதிபதியாகிய பின்னர், அரச தரப்பு பலமான நிலையில் இருக்கின்ற அதேநேரம், எதிர்க்கட்சி நலிவடைந்துகொண்டு இருக்கின்றது. Facebook மூலமாக அல்லது ChatGPT என்று சொல்லக்கூடிய இணையத் தளம் ஊடாகப் பெற்றுக்கொண்ட தகவல்களை அடிப்படையாகக் கொண்டுதான் இவர்கள் இந்த விவாதத்தில் ஈடுபட்டுக் கொண்டு இருக்கிறார்கள். இவர்களை யாரோ hack செய்துவிட்டார்கள் என்பது இதன்மூலம் தெளிவாக விளங்கிக் கொள்ளக்கூடியதாக இருக்கின்றது. இருந்தாலும், இந்த நாட்டை நேசிக்கின்ற, இந்த நாட்டை வளர்ச்சிப் பாதையில் இட்டுச்செல்ல வேண்டுமென்ற நோக்கத்தோடு பயணிக்கின்ற தேசிய மக்கள் சக்தி அரசாங்கம் இவ்விடயங்களில் கூடுதலான அக்கறை செலுத்திக்கொண்டு இருக்கின்றது.

நாங்கள் இந்த நாட்டைப் பொறுப்பேற்கும்போது நாட்டில் இருந்த நிலைமையை மீண்டும் இங்கு ஞாபகப்படுத்தவேண்டி இருக்கின்றது. கடனை மீளச்செலுத்த முடியாமலும், வங்குரோத்து அடைந்த நிலைமையிலும் இருந்த

நாட்டைத்தான் நாங்கள் பொறுப்பேற்றோம். அன்று இந்த நாட்டின் தலைவரே குறிப்பிட்டிருந்தார், இந்த நாடு வங்குரோத்து அடைந்துவிட்டது என்று. மக்கள் ஆணைமூலம் இந்த நாட்டின் ஆட்சி அதிகாரத்தைப் பெற்ற பின்னர், இலஞ்ச ஊழலுக்கு எதிராக, பாதாள உலகச் செயற்பாடுகளுக்கு எதிராக, போதைவஸ்து கலாசாரத்தில் இருந்து நாட்டை மீட்டெடுப்பதற்காக சட்ட ரீதியான நடவடிக்கைகளை நாங்கள் தொடர்ச்சியாக முன்னெடுத்து வருவதை மக்கள் அவதானித்துக்கொண்டு இருக்கின்றார்கள். இருந்தாலும், பொருளாதார ரீதியாக வளர்ச்சி அடையவேண்டிய தேவை எமக்கு இருக்கின்றது. இப்பொழுது, நாம் 5.1 சதவீதம் என்ற ரீதியில் பொருளாதாரத்தை வளர்ச்சிப் பாதையில் கொண்டுசெல்கின்றோம்.

அடுத்து, கடனை மீளச் செலுத்துவது தொடர்பான விடயத்தில் குறிப்பாக, CC+ என்ற தர வரிசையில் இன்று இலங்கையை நாங்கள் முன்நகர்த்தி இருக்கின்றோம். இந்த அரசாங்கம் எப்பொழுதுமே பொருளாதார ரீதியாகச் சிந்திக்கின்ற ஓர் அரசாங்கமாக இருக்கின்றது. இந்த நாட்டை வளர்ச்சிப் பாதையில் இட்டுச்சொல்ல வேண்டும் என்பதில் நாங்கள் குறியாக இருக்கின்றோம். நாங்கள் ஆட்சியைப் பொறுப்பேற்பதற்கு முன்னர், அரச இயந்திரமானது குறைபாடுகளுடன் இயங்கிக்கொண்டு இருந்ததை அவதானிக்கக் கூடியதாக இருந்தது. குறிப்பாக, அரச அதிகாரிகளுக்குத் தங்களது கடமைப் பொறுப்புக்களைச் சரியாக நிறைவேற்றிக்கொள்ள முடியாத ஒரு நிலைமை இருந்தது; அவர்களிடம் போதியளவு தொழில்நுட்ப அறிவு இல்லாமல் இருந்தது. இன்று நாங்கள் இந்த நாட்டை digital மயமாக்கலை நோக்கிக் கொண்டுசெல்லும்போது, இத்தகைய குறைபாடுகளை நிவர்த்தி செய்து கொள்ளவேண்டி இருக்கின்றது. அரச அதிகாரிகளை வளப்படுத்தி அவர்களுக்கு ஆலோசனைகளையும் பயிற்சிகளையும் வழங்குவதன் ஊடாக அரச சேவையைச் சிறந்த ஒரு சேவையாக மாற்றிக்கொள்ளக் கூடியதாக இருக்கும்.

இன்று நாங்கள் திறைசேரியால் செலுத்தப்பட்ட 2.5 அமெரிக்க டொலர் சம்பந்தமாக இடம்பெற்ற சைபர் குற்றம் தொடர்பான விடயங்களைப் பேசிக்கொண்டு இருக்கின்றோம். கடனைத் திருப்பிச் செலுத்தும் கட்டமைப்பில் இருந்த குறைபாடுகள் காரணமாகத்தான் இந்த விடயம் இடம் பெற்றிருந்தது. அதாவது, மின்னஞ்சல் கட்டமைப்பை hack செய்து, அதிலிருந்த பணக் கொடுக்கல்வாங்கலுடன் தொடர்புடைய கணக்கு இலக்கங்களை மாற்றி, அதனூடாக நெருக்கடி நிலைமையை ஏற்படுத்தியே இந்தக் குற்றத்தைப் புரிந்திருப்பதாக இந்த அறிக்கையில் தெளிவாகக் குறிப்பிடப்பட்டு இருக்கின்றது.

PDMO எனப்படுகின்ற பொதுக் கடன் முகாமைத்துவ அலுவலகத்தின் ஊடாக திறைசேரிமூலம் பணக் கொடுக்கல் வாங்கல் மேற்கொள்ளப்படும்போது அதாவது, PDMOஇன் உறுதிப்படுத்தலின் அடிப்படையில், மத்திய வங்கி ஊடாக இந்தப் பணக் கொடுக்கல்வாங்கல் இடம்பெறும்போது, பல குறைபாடுகள் இருந்ததாகவும், அதனூடாகத்தான் இந்தத் தவறு இடம்பெற்றதாகவும் இந்த அறிக்கையில் குறிப்பிடப் பட்டுள்ளது. திறைசேரியிலிருந்து ERD ஊடாக மத்திய வங்கிக்குச் சென்றே இந்தப் பணக் கொடுக்கல்வாங்கல் இடம்பெறுகின்றது. இந்த முறைமையில் காணப்பட்ட சில குறைபாடுகள் காரணமாகவே இந்த விடயம் இடம் பெற்றிருப்பதை அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. இதனை நாங்கள் திருத்திக்கொண்டு, அந்தக் குற்றச்செயலில் ஈடுபட்டவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை மேற்கொள்கின்ற இந்தத் தறுவாயிலே இந்த அறிக்கை வெளியிடப்பட்டு இருக்கிறது.

அவுஸ்திரேலிய நிறுவனத்துடனான இந்தக் கொடுக்கல் வாங்கல் இடம்பெறுவதற்கு முன்னர், Indian Exim Bank ஊடாக இணையவழி மூலம் இடம்பெற்ற கொடுக்கல்வாங்கலின் போதுகூட, இவ்வாறான அச்சுறுத்தல் இருப்பதாக திறைசேரியின் செயலாளருக்குத் தகவல் வழங்கப்பட்டு இருக்கிறது. இதன்மூலம் மோசடி இடம்பெறவிருப்பதும் அவதானிக்கப்பட்டு இருக்கின்றது. இணையத்தளத்தில் இருக்கின்ற குறைபாடுகளை நிவர்த்தி செய்து, அந்தக் கட்டமைப்பை வலுப்படுத்தி, எதிர்வரும் காலங்களில் இவ்வாறான மோசடிகள் இடம்பெறாத வகையில் நாம் நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றோம். இந்தச் சம்பவத்தின்போது பெயர்கள், கணக்கு இலக்கங்கள் என்பன மாற்றப்பட்டு இருந்ததை நாங்கள் அவதானிக்கக்கூடியதாக இருந்தது.

நான் இங்கு இன்னுமொரு விடயத்தையும் கூறவேண்டி இருக்கின்றது. எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் அவர்கள் செம்மணி மனிதப் புதைகுழி தொடர்பாகச் சில விடயங்களைக் குறிப்பிட்டிருந்தார். செம்மணி மனிதப் புதைகுழி தொடர்பான விடயம், அங்கு இடம்பெற்றுவரும் அகழ்வு ஆராய்ச்சிப் பணிகள் தொடர்பில் தேசிய மக்கள் சக்தி அரசாங்கம் தொடர்ச்சியாக அக்கறை செலுத்தி வருகின்றது. அந்த விடயத்துக்குத் தேவையான அனைத்து நிதியையும் அரசாங்கம் என்ற ரீதியில் நாங்கள் வழங்கி இருக்கின்றோம். அந்த ஆராய்ச்சிப் பணிகள் மும்முரமாகவும் தொடர்ச்சியாகவும் தடையின்றியும் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. அங்கு கிடைக்கப் பெறுகின்ற மனித எச்சங்களைப் பகுப்பாய்வு செய்வதற்கான ஏற்பாடுகள் தேவையாக இருக்குமாக இருந்தால், அதனைச் சர்வதேசத்தின் அனுசரணையோடு அல்லது ஒத்துழைப்போடு செய்வதற்குத் தயாரென கௌரவ நீதி அமைச்சர் அவர்கள் குறிப்பிட்டிருந்தார். அதுமாத்திரமல்ல, எங்களுடைய கௌரவ நீதி அமைச்சர் அவர்கள் நேரடியாக அந்த இடத்துக்குச் சென்று, அங்கு நடைபெறுகின்ற அகழ்வுப் பணி தொடர்பான விடயங்களைப் பார்வையிட்டதாக நாங்கள் அறிகின்றோம் .எனவே, தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின ராகிய நாங்கள் எப்போதும் தமிழ் மக்கள்மீதும், தமிழ் பேசும் மக்கள்மீதும் அக்கறையோடு செயற்பட்டுக் கொண்டு இருக்கின்றோம்.

இப்பொழுது மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற மேய்ச்சல் தரை தொடர்பான பிரச்சினை தொடர்ச்சியாக பேசப்பட்டு வருகின்றது. எங்களது மாவட்டத்துக்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் வருகைதந்த வேளையிலும்கூட, மயிலத்தமடு - மாதவனை மேய்ச்சல் தரை தொடர்பான பிரச்சினை பேசப்பட்டது. அவர்களது காணி விடுவிப்புத் தொடர்பான பிரச்சினைகள் அங்கே பேசப்பட்டு, ஒரு தீர்மானமும் எட்டப்பட்டு இருக்கின்றது. குறித்த 3,000 ஏக்கர் காணியில் முதற்கட்டமாக மகாவலிக்குச் சொந்தமான காணிகளை விடுவிப்பதென தீர்மானம் மேற்கொள்ளப் பட்டதுடன், மிகுதிக் காணிகளை வெகுவிரைவாக விடுவிப்பதற்கான ஏற்பாடுகளைச் செய்வதாகவும் குறிப்பிடப் பட்டிருந்தது. அது தொடர்பான முன்னெடுப்புகளை அரசாங்கம் என்ற ரீதியில் நாங்கள் தொடர்ச்சியாக மேற்கொண்டு வருகின்றோமெனக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

[ගරු කන්දසාමි ප්‍රභූ මහතා]

அடுத்து, முந்தனை ஆறு திட்டம் பற்றி சொல்ல வேண்டும். கித்துல், றூகம் ஆகிய இரண்டு குளங்களையும் இணைத்து 'முந்தனை ஆறு' திட்டத்தை நாங்கள் கொண்டுவரத் தயாராக இருக்கின்றோம். அதற்கான நிதியும் வழங்கப்பட்டு இருக்கின்றது. அதற்குத் தேவையான ஆய்வுப் பணிகள் மேற்கொள்ளப்பட்டு, feasibility report என்று சொல்லக்கூடிய சாத்தியவள ஆய்வறிக்கையைப் பெற்றுக்கொள்வதற்கான ஏற்பாடுகளும் செய்யப்பட்டுக்கொண்டு இருக்கின்றன. அந்த ஆய்வுப் பணிகளின் பின்னர், அதற்கான நிதியை எவ்வாறு பெறுவது என்பது தொடர்பில் அதாவது, வெளிநாட்டு நிறுவனத்தினூடாகப் பெற்றுக்கொள்ளப் போகின்றோமா அல்லது உள்நாட்டு நிதியைக்கொண்டு செயற்படுத்தப் போகின்றோமா என்பது தொடர்பில் நாங்கள் பேசத் தயாராக இருக்கின்றோம். உங்களுக்குத் தெரியும், நாங்கள் இந்த நாட்டைப் பொருளாதார ரீதியாகச் சிறப்பாகக் கட்டியெழுப்பி வருகின்றோம் என்பது. வெள்ளப் பாதிப்புகளால் உட்கட்டமைப்பு வசதிகள் சிதைவடைந்திருந்தன. இன்று நாங்கள் நாட்டை அபிவிருத்திப் பாதையில் கொண்டு சென்றுகொண்டு இருக்கின்றோம். நாங்கள் நாட்டைப் பொறுப்பேற்கும்போது இருந்த நிலைமையிலும் பார்க்க, இப்போது மும்முரமாகவும் சிறப்பான முறையிலும் அனைத்து வசதிகளையும் ஏற்படுத்தக்கூடிய விதமாக பணிகளை முன்னெடுத்து வருகின்றோம் என்பதை இந்த நேரத்தில் ஞாபகமூட்ட விரும்புகின்றேன். எனக்கு உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.01]

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම අද දවසේ පැවැත්වෙන්නේ ඕස්ට්‍රේලියානු සමාගමකට ණය ආපසු ගෙවීම සඳහා තිබුණු ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක මුදලකට සිදු වූ සයිබර් අපරාධය සම්බන්ධව ඉදිරිපත් කරන ලද රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ගැන විශේෂයෙන් විපක්ෂය විසින් ඉල්ලා සිටි විවාදයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය නියෝජනය කරන ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා තමයි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය දරන්නේ. විශේෂයෙන් ඒ පක්ෂයම නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී, සුරංග රත්නායක මන්ත්‍රීතුමා විසින් කරපු ප්‍රකාශයක් සම්බන්ධව පළමුවෙන්ම මම යමක් කියන්න කැමැතියි. එතුමාගේ කථාවේදී ඉස්මතු කළා, මේ වාර්තාව සකස් කිරීමේදී, වචනයක් ඇතුළත් කිරීමේදී පවා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් එම කාරක සභාවේ සභාපතිතුමාට බලපෑම් සහගතව හැසිරුණා කියන කාරණය. කෙසේ නමුත්, මේ වාර්තාව 2026 ජූලි මාසයේ 10වැනි දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මොහොතේ කාරක සභාවේ සභාපතිතුමා - ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා - කියා තිබෙනවා, කිසිදු බෙදීමකින් තොරව, කාරක සභාවේ සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාව ඇතිව මේ වාර්තාව ඉදිරිපත් කරන්නට එතුමාට හැකිවීම සම්බන්ධයෙන් තමන්ගේ සතුට ප්‍රකාශ කරනවා කියලා. එතකොට සමහර අය මේ පරස්පර විරෝධී අදහස් දැක්වීමෙන් පෙනී යන්නේ, එතුමන්ලාගේ පක්ෂය නියෝජනය කරන එම කාරක සභාවේ සභාපතිතුමා මේ වාර්තාව ඉදිරිපත් කළත්, එකඟතාවකින් තොරව ඔවුන් මෙතැනදී කථා කරනවා කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම බලපෑම් සහගතව, බෙදීම් සහගතව කටයුතු කරපු අවස්ථා ඉතිහාසයේ ඕනෑ තරම් මේ කාරක සභා ඇතුළේ දකින්න තිබුණා. විශේෂයෙන් බැඳුම්කර වංචාව පිළිබඳ "කෝප්" එකේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මොහොතේදී මන්ත්‍රීවරුන්ගේ බලපෑම් සහගත, බෙදීම් සහගත ක්‍රියාවලි නිසා පාද සටහන් - footnotes - යොදන්නට සිදු වුණු ඉතිහාසයක අත්දැකීම් තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ ඉදිරිපත් කරපු footnotes සම්බන්ධයෙන් ඒ වන විට "දිවයින" පත්තරේ ලිපියක් පළ කරලා තිබුණා, "ෆුට් නෝට් ටොම් පච" කියලා සිරස්තලයක් සහිතව. ඇත්තටම මේ කාරණයේදී එවැනි බාධාවකින් තොරව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඉතාම හොඳ වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. විපක්ෂය නියෝජනය කරන බොහෝ මන්ත්‍රීවරුන් ඒ වාර්තාව තියා වාර්තාවේ තිබෙන මාතෘකාවවත් කියවලා නැති බව අද දවසේ විවාදයේදී ඒ අය අදහස් දැක්වීමේදී පෙනී ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂය නියෝජනය කරන ගරු රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය අදහස් දැක්වීමේදී කියා සිටියා, මේක මුදල් අවභාවිතාවක් සම්බන්ධ කාරණාවක් කියලා. ඇත්තටම මම අහන්න කැමැතියි, මේ වාර්තාවේ කොතැනද මුදල් අවභාවිතාවක් සම්බන්ධ කාරණාවක් කියැවෙන්නේ කියලා. දිලිත් ජයවීර මන්ත්‍රීතුමා උත්සාහ කළා, මේක සයිබර් අපරාධයක් නොවෙයි, විහිළු සහගත ක්‍රියාවක්ය කියලා ඉස්මතු කරන්න. මෙයින් පෙනී යන්නේ, මේ ඉදිරිපත් කර තිබෙන වාර්තාව සම්බන්ධයෙන් ඒ අය කිසිම අධ්‍යයනයකින් තොරව කරුණු ඉදිරිපත් කරන බවයි. ඒ වාගේම දිලිත් ජයවීර මන්ත්‍රීතුමා මේ සභාවට විතරක් නොවෙයි, මුළු සමාජයටම විහිළු සහගත අදහස් ප්‍රමාණයක් ඉදිරිපත් කළා.

ඒ විතරක් නොවෙයි. අපි කනගාටු වෙනවා, අපේ රටේ අගවිනිසුරුතුමා සම්බන්ධව රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමිය මේ විවාදය ඇතුළේ ඉදිරිපත් කරපු කාරණාව පිළිබඳවත්. විශේෂයෙන් අවුරුදු ගණනාවක් පාර්ලිමේන්තුව නියෝජනය කළ, අත්දැකීම් බහුල මන්ත්‍රීවරියක් හැටියට එතුමිය ස්ථාවර නියෝග සම්බන්ධයෙන්වත් හරි අධ්‍යයනයක් නැතුව අදහස් ප්‍රකාශ කිරීම ගැන අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය වසර දහය තුළ සයිබර් තාක්ෂණය මඟින් සිදු කරන වංචා සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. 2022 අවුරුද්ද වන විට ඒ වාගේ සයිබර් අපරාධ මිලියන 2.5කට ආසන්න ප්‍රමාණයකට වර්ධනය වීමක් තිබෙනවා. ජාත්‍යන්තර අපරාධ ජාල මඟින් සංවිධානාත්මක ලෙස ක්‍රියාත්මක කරන scam centres බහුල වීම නිසාම තමයි මෙවැනි සයිබර් අපරාධවලට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙන්නේ. 2024 අවුරුද්ද තුළ විතරක් මෙවැනි වංචා හේතුවෙන් ලෝක ආර්ථිකයට සිදු වූ සමස්ත හානිය ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියන එකක් බවට Global Anti-Scam Alliance ආයතනය ප්‍රකාශයට පත් කර තිබෙනවා.

මේ සයිබර් මූල්‍ය අපරාධ සිදු කරන ප්‍රධාන ක්‍රම කිහිපයක් තිබෙනවා. Phishing ක්‍රමය, ransomware ක්‍රමය, අභ්‍යන්තර පද්ධති hack කිරීම, සමාජ ඉංජිනේරු විද්‍යාව කියන මේ ඕනෑම කාරණයක් යටතේ සයිබර් අපරාධ සිදු වෙන්න ඉඩ තිබෙනවා. මේ සිදු වී තිබෙන අපරාධය ගත්තොත්, මේක ලෝකයේ සිදු වුණු

පළමුවැනි අපරාධය නොවෙයි. අපි ඒක සාධාරණීකරණය කරනවා නොවෙයි. ලෝකය ඇතුළේ දත්ත විශ්ලේෂණයේදී එවැනි තත්ත්ව ඕනෑ තරම් අපට දැකගන්න පුළුවන්කම තිබෙනවා.

2016 වර්ෂයේ Federal Reserve Bank of New York හරහා ව්‍යාජ මුදල් මාරු කිරීමක් සිදු කර බංග්ලාදේශ මහ බැංකුවට අයත් ඇමෙරිකානු ඩොලර් මිලියන 101ක් හොරකම් කර තිබෙනවා. ඒක තමයි ලෝක මූල්‍ය ඉතිහාසයේ සිදු වූ විශාලතම සයිබර් අපරාධය බවට පත් වෙන්නේ. ඒ වාගේම 2017 අවුරුද්දේ Equifax ආයතනයේ, මිලියන 147කට අධික පුද්ගලයන්ගේ පෞද්ගලික හා මූල්‍ය තොරතුරු සොරකම් කරලා දැවැන්ත ලෙස දත්ත කඩා වැටීමක් ඇති කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, 2019දී Capital One බැංකු සමාගමට අයත්, මිලියන 100කට අධික ගනුදෙනුකරුවන්ගේ බැංකු හා ණය තොරතුරු හෙළිදරව් කිරීමක් කර තිබෙනවා. 2021දී ransomware ප්‍රහාරයකින් කොලෝනියල් පයිප්ලයින් සමාගමේ දත්ත ටික හොරකම් කරනවා. ඒ සමාගම විශාල මුදල් ප්‍රමාණයක් ගෙවලා තමයි තමන්ගේ දත්ත පද්ධතිය නැවත යථා තත්ත්වයට පත්කර ගන්නේ. ඒ වාගේම තමයි, ක්‍රිප්ටෝ මුදල් හුවමාරු වේදිකාවට එල්ල වූ ප්‍රහාර ගත්තත්. Ronin Network සහ Poly Network වැනි පද්ධතිවලින් ඩොලර් මිලියන සිය ගණනක් වටිනා ඩිජිටල් වත්කම් හොරකම් කරලා තිබෙනවා. අපි මේ කාරණා කියලා මේ වෙච්ච සිදුවීම් සාධාරණීකරණය කරනවා නොවෙයි. අපේ භාණ්ඩාගාරයට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක සයිබර් වංචාවක් වෙලා තිබෙනවා. මේ වන කොට ඒ වෙනුවෙන් ගත යුතු සියලු ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා; ඉදිරියටත් එවැනි අපරාධ නොවන්නට කළ යුතු දෑ වෙනුවෙන් ආණ්ඩුව විධියට අපි විශේෂයෙන් මැදිහත්වීම් කරමින් යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරියේදී මෙවැනි කටයුතු නැවත සිදු නොවන්නට මුදල් අමාත්‍යාංශය විසින් ගනිමින් පවතින හා ගත්තු ක්‍රියාමාර්ග කිහිපයක් ගැන මම මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම ණය සේවාකරණයට අදාළව ණය දෙන්නන් සම්බන්ධීකරණ කාර්යය විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ඉවත් කරලා, එය සම්පූර්ණයෙන්ම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් භාර ගැනීම සිදු කර තිබෙනවා. පළමු ණය වාරික ගෙවීම සිදු කිරීමට අවම වශයෙන් දින 10කට පෙර මාසික ණය සේවා පුරෝකථනය අදාළ ගෙවීම් අනුමැතිය සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීම කරමින් තිබෙනවා. ණය දෙන්නන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අවම වශයෙන් මාර්ග දෙකක් ඔස්සේ හෝ ඵලදායී ලෙස තහවුරු කිරීම සහතික කිරීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික මාර්ග ඇතුළුව අදාළ ණය දෙන්නන් සමඟ විධිමත් සන්නිවේදන මාර්ග ස්ථාපනය කිරීමට කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විධිමත් ලෙස සත්‍යාපන ක්‍රියාවලියට ඇතුළත් කර ඇති අතර, ඒ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරන ඒකාබද්ධ අරමුදල් ගිණුම්වලින් මාසික ණය ආපසු ගෙවීම සඳහා අවසර දෙන්නේ අදාළ සත්‍යාපන ක්‍රියාවලියේදී නිවැරදි තොරතුරු ඇත්නම් විතරයි කියන තීන්දුව අරගෙන තිබෙනවා. ඒ විතරක් ද නොවෙයි, නිසි ආකාරයකින් සහ තහවුරු කිරීමකින් තොරව අදාළ පද්ධතියේ දැනට පවතින බැංකු විස්තර වෙනස් කිරීමට සීමා කිරීම් පැනවීම හා මුදල් අමාත්‍යාංශයේ සමස්ත සයිබර් ආරක්ෂාව ශක්තිමත් කිරීමට ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය හා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය ඇතුළු ආයතනවල සහාය ලබා ගැනීමට කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි අපරාධ සිදු විය හැකි අවස්ථා මේ ලෝක තත්ත්වයන් තුළ තිබෙනවා. හැබැයි, ඒ බව කියා මේ සිදුවීම සාධාරණීකරණය කරනවා නොවෙයි. මේ සිදුවීම වෙනුවෙන් මේ මොහොත වන විට ගත යුතු ක්‍රියාමාර්ග ගනිමින්, ඉදිරියේදී එවැනි තත්ත්වයන් අවම කර ගැනීමට සහ සියලු අපරාධවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරන්න නොපැකිළව කටයුතු කරමින්, දේශපාලන අධිකාරිය තුළ තීන්දු තීරණ ගනිමින්, මේ සියලු ක්ෂේත්‍රයන්හි ආරක්ෂාව ගැන සැලකිලිමත් වෙමින් ආණ්ඩුව කටයුතු කරනවා. ඉතාම හොඳ මූල්‍ය කළමනාකරණයක්, ඉතාම හොඳ මූල්‍ය විනයක් නොතිබුණු නිසා තමයි මේ රට කඩා වැටෙන්න හේතු වුණේ. ඉතාම හොඳ මූල්‍ය කළමනාකරණයක් සහිතව, ඉතාම හොඳ මූල්‍ය විනයක් පවත්වා ගනිමින් ආණ්ඩුව, මහ බැංකුව, මුදල් ලේකම්වරයා ඇතුළු සියලු දෙනා රට පැවැති තත්ත්වයෙන් දිනෙන් දින ඉදිරියට ගන්නට කටයුතු කරමින් ඉන්නවා; ඒ වාගේම, රටේ මූල්‍ය තත්ත්වය, රටේ ස්ථාවරභාවය දිනෙන් දින ඉදිරියට ගන්නට හැම මොහොතකම කටයුතු කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ අය කරපු කථා බහ ඇතුළේ ඔවුන් මේ කාරණාව ඉස්මතු කළේ මෙය ලෝකයේ සහ ලංකාවේ සිදු වුණු පළමු සිදුවීම හැටියටයි. ඔවුන් තම කථා බහ තුළින් කියන්න උත්සාහ කළේ මහ බැංකුව, මහා භාණ්ඩාගාරය ආදි සියල්ල අසමත් ආයතන බවයි. එවැනි තත්ත්වයක් නොවෙයි තිබෙන්නේ. මම ඒකයි ඉස්සෙල්ලාත් කිව්වේ, ඔවුන්ට තිබෙන ලොකුම ප්‍රශ්නය, අපේ ආණ්ඩුව ඉතාම හොඳ මූල්‍ය කළමනාකරණයක් සහ මූල්‍ය විනයක් සහිතව මේ රට ගොඩනඟමින් ඉදිරියට ගෙන යන එකයි කියලා. ඒ බව ඒ අයගේ සියලු කථා බහේදී අපට පැහැදිලි වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.12]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමිය කියපු කාරණාවකින්ම මම මගේ කථාව ආරම්භ කරන්නම්. ඒ අයට යම් අමතක වීමක් වෙලා තිබෙන නිසා එය මතක් කර දෙන්න අවශ්‍යයි. මේ රටේ කඩා වැටීමක් ගැන කිව්වේ 2022 අප්‍රේල් මාසයේ. එදා තමයි උද්ධමනය සියයට 70ට තිබුණේ. 2024 සැප්තැම්බර් මාසයේ අග මේ ආණ්ඩුව මේ රට භාර ගන්න කොට උද්ධමනය සියයට ඍණ 1.4ක් ලෙසයි තිබුණේ. අද සියයට 7.3ක උද්ධමනයක් තිබෙනවා. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා ආණ්ඩුව භාර දෙන කොට සංචිතය US Dollars 6,200 million තිබුණා. අවුරුදු එකහමාරකට පසුව අද ඒක US Dollars 6,100 millionවලට අඩු වෙලා තිබෙනවා. එදා ඩොලරයේ අගය රුපියල් 293යි. අද එය රුපියල් 341 යි. මම මේ කථාව පටන් ගත්තු වෙලාවේ ඩොලරයේ අගය රුපියල් 341යි. කථාව ඉවර වෙන කොට රුපියල් 342 වෙයිද දන්නේ නැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. ඉතින් මේ කාරණය අරගෙන දේශපාලනය කරන්න අපට අවශ්‍ය නැහැ. මොකද, මේක බැරෑරුම් ප්‍රශ්නයක්. ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා මේ ගැන දන්නවා. මේවාත් එක්ක අංක ගණිත සෙල්ලම් කරන්න එපා. ඇත්ත තත්ත්වය මොකක්ද කියලා කියන්න. මේ සම්බන්ධව රටේ ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුවේ මන්ත්‍රීවරු ගණනාවක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයන් හැටියට ඉන්නවා. නමුත්, අපි එහිදී කථා කරන්නේ නිර්දේශපාලනිකවයි. ඇත්ත වශයෙන්ම අපිත් අද මෙතැන දේශපාලනය කළා නම්, ඔබතුමන්ලා ඒ කාලයේ අපට

[ගරු රවී කරුණානායක මහතා]

දුන්නු වධය අද අපිත් දුන්නා නම්, මේකේ මීට වඩා දෙදිරීමක් ඇති වෙනවා නේද, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා? එතුමා මේ ගැන දන්නා නිසායි මම මේ කාරණය මතක් කර දුන්නේ. මම මේ සම්බන්ධව වැඩිදුර කියන්න යන්නේ නැහැ.

2022 වර්ෂයේදීද කොහේදෝ Export Finance Australia ආයතනය අපට ණයක් දුන්නා. ඒ ණය ගන්නා අවස්ථාවේදී ඩොලරයේ අගය රුපියල් 281යි. ඒ අවස්ථාවේ ගත් කෝටි 71 අද වන විට කෝටි 86ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මොකද, එදා ඩොලරයේ අගය රුපියල් 281යි; අද රුපියල් 341යි. ඩොලර් මිලියන 2.5 ඒ ගණනින් වැඩි කළා නම් තේරුම් යනවා, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවට අද වෙලා තිබෙන්නේ මොකක්ද? මම අද මේ සභාවේ සිටියේ නැති වුණත් ආණ්ඩුවේ හැම දෙනාගේම කථා අහගෙන හිටියා. ඒ අය ඉතාම ඕනෑකමින් කථා කරනවා, දේශපාලනීකරණය වෙලා. මෙතැන කාරණා දෙකක් තිබෙනවා. දැන් ආණ්ඩුවට වෙලා තිබෙන්නේ මොකක්ද? මුදල් අමාත්‍යාංශයත් බේරා ගන්න තිබෙනවා; මහ බැංකුවත් බේරා ගන්න තිබෙනවා. මම දන්නේ නැහැ ඒ මොකද කියලා. මා හිතන විධියට, සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කථා කරන කොට ඒ සම්බන්ධව පොඩි ටොක්කක් දෙයි. මොකද එතුමා මේ ගැන දන්නවා. මේ රට වට්ටලා තිබෙනවා නම්, එය මහ බැංකුවෙන් කර තිබෙන ක්‍රියා කලාපය නිසා මිසක්, මුදල් අමාත්‍යාංශය නිසා වෙලා තිබෙන දෙයක් නොවෙයි. මටත් හැඟීමක් තිබෙනවා, මුදල් අමාත්‍යාංශය ආරක්ෂා කරන්න. මොකද, එතැන ඉන්න කට්ටියගෙන් සියයට 99ක් මහන්සියෙන් වැඩ කරන අය. අපටත් උගන්වන්න පුළුවන් කට්ටිය තමයි එතැන ඉන්නේ. මහ බැංකුවේ ඉන්නේ ඊටත් වඩා ලොකු පෙරකදෝරුවෝ ටිකක්. ඒගොල්ලෝ හිතනවා, ලෝකය තිබෙන්නේ ලංකාව ඇතුළේ කියලා. නමුත් අපට තේරෙනවා අප ඉන්නේ ලෝකය ඇතුළේ බව. මෙන්න මේවාට තමයි උත්තර දෙන්න අවශ්‍ය වන්නේ.

මම මෙතැනදී ඔබතුමන්ලා සියලු දෙනාගෙන්ම අහන්නේ මේකයි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අපේ සාමාජික මන්ත්‍රීවරු සියලුදෙනා මේ කාරණය ගැන නිර්දේශපාලනිකව විමර්ශනය කරලා රපෝර්තුවක් භාර දුන්නා. ඒ රපෝර්තුව භාර දෙන කොට අපි හැම දෙනාගෙන්ම ප්‍රශ්න කළා. ඒ ප්‍රශ්න කරන අවස්ථාවේදී එතැනින් එක දෙයක් හෙළිදරව් වුණා. මේක unprofessional touch එකක්; ඒ කියන්නේ වෘත්තියමය පදනමක් නැති දෙයක් කියන එක හෙළිදරව් වුණා. මේක මහ බැංකුව හා මුදල් අමාත්‍යාංශය කියන දෙකටම බර වෙලා තිබෙනවා. නමුත් මුදල් අමාත්‍යාංශයේ Public Debt Management Office - PDMO - එක "L" board එකක් දමාගෙන තමයි යන්නේ. මීට පෙර කටයුතු කළ අනෙක් අය පරිණතභාවය තියාගෙන එය කරගෙන යනවා. නමුත් මුදල් අමාත්‍යාංශයට මේක අලුත් ක්‍රමයක් වශයෙන් ලබා දෙනවා. එහෙම ලබා දෙන කොට "L" board දෙනවා. එහෙම "L" board එක දෙන කොට රිය පැදවීම උගන්වන කට්ටිය ටිකක් ආරක්ෂා සහිත විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 ජූලි 25 දින "ලංකාදීප" පුවත්පතේ මුල් පිටුවේ පළ වුණු පුවතක් මම මේ අවස්ථාවේදී උපුටා දක්වනවා. අපි රපෝර්තුව දුන්නාට පසුවයි එය පළ කර තිබෙන්නේ.

එහි මෙසේ සඳහන් වෙනවා:

> "මුදල් අමාත්‍යාංශය වගකීම පැහැර හැරලා. වැරැද්ද අපේ පිට පටවන්න එපා. මහ බැංකුවෙන් මුදල් කාරක සභාවට වාර්තාවක්."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. ගරු ඇමතිතුමනි, මහ බැංකුව එහෙම කියනවා නම්, මේකේ වගකීම මුදල් ඇමති භාර ගන්න ඕනෑ නේද? කවුද මේ රටේ මුදල් ඇමති? මේ රටේ ජනාධිපතියි. මහ බැංකුව කියනවා, "මේක මගේ වැඩක් නොවෙයි. මේක මගේ ඇඟට පටවන්න එපා" කියලා. එහෙම කියලා ඒ වගකීම මුදල් අමාත්‍යාංශයට පටවනවා. එහෙම නම්, මේ ආණ්ඩුව පිළිගන්නවාද, එහි වගකීම මුදල් අමාත්‍යාංශය භාර ගන්නවා කියලා? මෙතෙක් දුරට කවුරුවත් කථා කළේ නැහැ ඔය සම්බන්ධයෙන්. හැබැයි, මම ආණ්ඩුවේ වුණත්, විපක්ෂයේ වුණත් ඇත්ත කියන්න ඕනෑ. මුදල් අමාත්‍යාංශයේ වගකීම සියයට 15ක්, 20ක්, 25ක් වෙන්න පුළුවන්. නමුත් සැබෑ ප්‍රශ්නය තිබෙන්නේ අතැනයි.

ඒ වාගේම "AsianMirror: Empowering Opinion" states, I quote:

> "CBSL rejects Treasury Secretary's findings on \$2.5 mn payment."

දෙපැත්තෙන්ම වැරදුණා කියලා නිහතමානීව කිව්වා නම් මේක මීට වඩා විසඳිලා ඉදිරියට යනවා. මොකද, ප්‍රශ්නයක් තිබෙනවා නේ. මම මේ අවස්ථාවේදී ඔබතුමන්ලාගෙන් අහනවා, මේකේ වගකීම මහ බැංකුව භාර ගන්නවාද, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශය භාර ගන්නවාද කියලා. සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා ඒකට උත්තර දෙයි. ඒක මට ෂුවර්.

මේක cyber crime එකක් නම් නොවෙයි. මීට පෙර කථා කළ අය මේක cybercrime එකක්, මේක phishing attack එකක් බව කිව්වා. නමුත් මේක ඒ වාගේ එකක් නොවෙයි. මෙතැනදී වුණේ මොකක්ද? වැරදි fax එකක් එව්වා; ඒක පිළිගත්තා; වැඩේ කළා. ඕස්ට්‍රේලියාවේ එකා හිනා වෙවී ඇති, 'යකෝ මේ වාගේ හාදයෝද ලංකාවේ ඉන්නේ!' කියලා. ආණ්ඩුව කියනවා නම්, මේක cybercrime එකක් කියලා, මුදල් අමාත්‍යාංශයේ අහිංසක නිලධාරීන් හතරදෙනෙක් අස් කළේ ඇයි? ඒ අස් කරපු නිලධාරීන් හතරදෙනාගෙන් එක් කෙනෙක් අද අප අතර ජීවත් වෙන්නේත් නැහැ. පව්! ඒ අය අස් කරපු එකට මම සම්පූර්ණයෙන්ම විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මොකද, ඒ වගකීම යන්නේ එක කොටසකට විතරක් නොවෙයි. අත්පුඩි ගහන්න අත් දෙකක් ඕනෑ. මෙහිදී එක පැත්තකින්, මහ බැංකුව තිබෙනවා; අනෙක් පැත්තෙන්, මුදල් අමාත්‍යාංශය තිබෙනවා. ඇයි, මුදල් අමාත්‍යාංශයට විතරක් මෙහිදී ටොක්ක අනින්නේ? ගරු ඇමතිතුමනි, මම විපක්ෂයේ වුණත් බලන්නේ, ඔබතුමන්ලා ආරක්ෂා කරන්නයි. මොකද, මෙහිදී ලෝකය බලන්නේ මුදල් අමාත්‍යාංශය දිහා. මහ බැංකුව පිස්සු කෙළින්න පුළුවන්. නමුත්, මුදල් අමාත්‍යාංශය කියන්නේ, රට. රටේ මුදල් ඇමති කියන්නේ, වත්මන් ජනාධිපති. ඒකයි අපි මේ සම්බන්ධයෙන් අහන්නේ.

මම මේ අවස්ථාවේදී මේ කාරණයත් කියන්න ඕනෑ. අද හැම එක්කෙනාම බලාගෙන ඉන්නවා නේ, ලාල් කාන්ත ඇමතිතුමා මොනවාද කියන්නේ කියලා. I quote this from "The Leader" website.

> "Minister Lal Kantha vows to expose state sector failures, whatever the cost."

He says that, whatever the cost is, he would expose the failures of the government servants. මම ලාල් කාන්ත ඇමතිතුමාට කියනවා, ඔබතුමා ඒ කියන දේ කරුණාකරලා මේ කාරණය තුළින් ඔප්පු කරන්න කියලා. මොකද, එතකොට තමයි ඒ වචනවලට වැදගත්කමක් ඇති වන්නේ.

අද උදේ ආනන්ද විජේපාල ඇමතිතුමා කථා කරමින් කිව්වා, FBI එක ආවා කියලා. අද FBI එක මොකක්ද කියන්නේ? ගියවර Easter Sunday bombing සිද්ධියෙන් පස්සේ ඒ අය ඇවිල්ලා පරීක්ෂණ කරලා කියපු ඒවා පිළිගත්තා. පසුව කළ ඉල්ලීම ප්‍රතික්ෂේප වුණා. දැන් FBI එක කියන්නේ මොනවාද? මොකද, ඒක ගිහිල්ලා තිබෙන්නේ ඇමෙරිකාවට නේ. ඒ සම්බන්ධයෙන් මොකක්ද වෙන්නේ? අප රුපියල් කෝටි 71ක් ගෙවන්න තිබුණු එක, අද රුපියල් කෝටි 86ක් වෙලා තිබෙනවා. කොහොමද අපි ඒක නිවැරැදි කරන්නේ? කවුද ඒකට ගෙවන්නේ? මේ අවුරුද්දේ ආණ්ඩුවෙන් ඒ මුදල් ප්‍රමාණය ගෙව්වා. හරි හෝ වැරැදි ගෙවලා තිබෙනවා. ඒක ගෙව්වාට පසුව දැන් ආයෙත් ගෙවන්න වෙනවා. මොකද, ඕස්ට්‍රේලියාවේ ගිණුම්වලට අපි ගෙවන්න තිබෙනවා. ඒක ප්‍රශ්නයක් කර ගන්න එපා. හැබැයි, කවුද ගෙවන්නේ කියන ප්‍රශ්නය තමයි ඉදිරිපත් වෙන්නේ. අන්න ඒ නිසා තමයි මම අහන්නේ, මුදල් අමාත්‍යාංශය තමයි සම්පූර්ණ වැරැදිකරු කියලා මහ බැංකුව කිව්වාම, ඒකට උත්තර දෙන්නේ කොහොමද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් මාස පහකින් පමණ IMF ගිවිසුමත් එක්ක තිබෙන ජාත්‍යන්තර සම්බන්ධකම් අවසන් වෙනවා. එසේ ඒ සම්බන්ධකම් අවසන් වන මොහොතේ විපක්ෂය වෙනුවෙන් මම අද ඉතාම ඕනෑකමින් ආණ්ඩුවට කියනවා, කරුණාකරලා යම් ගිවිසුමක් තියා ගන්න කියලා; එහි තිබෙන කොන්දේසි අවශ්‍යතාවකදී සැලකිල්ලට ගන්න කියලා. මොකද, ඒගොල්ලන්ගේ අධීක්ෂණය අවශ්‍යයි. එහෙම නැත්නම් වෙන්නේ මොකක්ද? මේ රට අද තිබෙන මේ අමාරු තත්ත්වයන් - turbulent times - තුළින් ගමන් කරන කොට, අත් අල්ලාගෙන යන්න පුළුවන් කවුරු හරි කෙනෙක් අපට අවශ්‍යයි. ඒ නිසා මේ වතාවේ IMF එකට කොන්දේසි දමලා ඒක අල්ලාගෙන තියාගෙන ඉන්න එක වඩා හොඳයි, because we are still having a very fragile economy. ඒක රටින් එළියට ගියාට, the economy is still very fragile. ට්‍රම්ප් එහෙන් බෝම්බයක් ගැහුවාම, තෙල් බැරල් එකක මිල ඉහළ ගියාම ඒක මෙහේට බලපානවා, එතකොට උද්ධමනය වැඩි වෙනවා, ඔන්න ප්‍රශ්නයක් ඇති වෙනවා.

ඒ වාගේම, මම ඉතාම ඕනෑකමින් වත්මන් ජනාධිපතිතුමාට ලිව්වා, රනිල් වික්‍රමසිංහ මහත්මයා ගිවිසුම අත්සන් කරන කොට උද්ධමනය සියයට 5ක් කියා සඳහන් කරපු එක වැරැදියි, කරුණාකරලා සියයට 2කට වඩා යන්න එපා කියලා. බිමල් රත්නායක ඇමතිතුමා දැන් මේ ගරු සභාවට ඇවිල්ලා ඉන්නවා. ඔබතුමන්ලා කැබිනට් මණ්ඩලයේදීත්, ඔය දෙතුන් පොළේදීම කියන්න, කරුණාකරලා උද්ධමන ඉලක්කය සියයට 2කට වැඩියෙන් තියලා අත්සන් කරන්න එපා කියලා. එහෙම නැත්නම් වෙන්නේ මොකක්ද කියලා සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා දන්නවා. අපි පිළිගන්නවා, හැම අවුරුදු දහයෙන් දහයටම අපේ සම්පූර්ණ මුදල් ප්‍රමාණය සියයට 100කින් අවප්‍රමාණය වෙලා තිබෙනවා කියලා. ඉතින් එහෙම වෙනවා නම් ආණ්ඩුවක් ඕනෑ නැහැ නේ. මේක අපේ මහ බැංකුවේ වෙන්දේසි කරන මුදලාලි කෙනෙකුට දුන්නා නම් වැඩේ ඉවරයි. ඒ වාගේම, "එල් නිනෝ" නිසා ඇති වෙච්ච තත්ත්වය ගැනත් බලන්න. Central Bank එකේ FIU එක මේ සම්බන්ධයෙන් මොනවාද කරලා තිබෙන්නේ? මොකද, FIU කියන්නේ Financial Intelligence Unit එකට. ඒ අය මොනවාද කරලා තිබෙන්නේ?

දැන් තමයි මම එන්නේ මෙහි වෙලා තිබුණු දේ මොකක්ද කියන කාරණයට. Hon. Presiding Member, owing to the fact that the Australian Government is also looking at this Debate very passionately, I will speak in English so that they will also understand and reconcile with what we are saying. On 18th June, 2024, the Public Debt Management Act came into effect. On 23rd September, 2025, the Coordination Council accepted that the Director General of the Public Debt Management Office of the Ministry of Finance, Planning and Economic Development would spearhead the debt payment of the country from the 01st January, 2026. And, in the interim, starting from mid-October, 2025, they were training officials as there was a necessity to train them so that they would be able to understand what the payment structure is like. Remember, public debt management was basically in the hands of the Public Debt Department of the Central Bank and they were transferring it under the new Act that came in. So, in mid-October, the trainee officials started moving on with the Central Bank staff in order to let this shift take place.

On 13th November, 2025, the External Resources Department received six manipulated invoices from the hackers. මෙන්න මෙතැනින් තමයි ප්‍රශ්නය පටන් ගන්නේ. Sir, there was a fake email that came in stating that there was an amount outstanding. Then only, there was a referent. Remember, Sir, this happened after the debt restructuring; that loan was given before the country went into bankruptcy. This was a negotiated settlement. At the time of that negotiated settlement, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව මිනිත්තු හතරක් තිබෙනවා නේ. අනේ, එහෙම වෙලාව කපන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ, විනාඩි දෙකයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කමක් නැහැ. ආණ්ඩුවෙන් කථා කරපු නැති එකේ, මම උදවු කරනවා, අඩු ගණනේ මේ ඩොලර් ටික ගෙවන්නේ නැතුව ඉන්න.

All what I want to say is, owing to the fact that that particular loan was negotiated after the debt delinquency, the Central Bank very well knew that that was an outstanding amount. Then, a fake invoice came in. The Hon. Deputy Minister Nishantha Jayaweera mentioned that when you get a document from the External Resources Department, one copy stays with them and the other copy goes to the Central Bank. Then, they reconcile it and make the payment. So, here, at the time of the transfer, they would have very well known that this was outstanding at the bank account.

On the 14th of November, 2025, the trainee PDMO officials got a document. On the 15th, a guy called Ian Gates sent a document, which came to the External

[ගරු රවී කරුණානායක මහතා]

Resources Department and triggered a different problem. That triggering was what basically set this in motion. On the 24th, the intermediary Federal Reserve was questioning certain activities. On the 25th, the hackers, as I said, posing off as Ian Gates, sent those fake documents to be paid. Earlier, there was a question because the first document that came stated, I quote:

> "Please note that the payment for Qutotec related transaction must be remitted to our Abu Dhabi liaison office, ..."

It further gave the full bank details. Remember, a payment meant for Australia was requested to be sent to Abu Dhabi. That information came to the Central Bank and the Central Bank accepted the Finance Ministry's direction, "Please pay this". When they said Dubai was wrong and questioned it, the answer -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Give me just two minutes more, Sir.

Then they say, "Okay, do not pay it to Dubai. Ensure that you pay it to USA". The loan that was given by Australia was first asked to be paid to Dubai and later, to Minneapolis, USA. Why was there no sense of experience shown by the Central Bank? That is the issue in question. I have got here a document which basically mentions about the Export Finance Australia with an account in Minneapolis. Why does the Central Bank not know that Minneapolis is in the USA and not in Australia? Why was there not due diligence? On that particular basis, I question as to why it happened.

Then, the Federal Reserve and JPMorgan said that there was a fraud going on and asked us to look into it. They flagged it. After it was flagged, the Finance Ministry, two days later, sent the request and the Central Bank paid. When there is a payment like that, the Central Bank's Financial Intelligence Unit - FIU - must look into it and report it. Under the Financial Transactions Reporting Act, it is a necessity; under that Act, it is mandatory that you report it. That was a suspicious transaction. So, why was it not reported? That is the issue.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තව එක මොහොතක් මට දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, මම තව එක මිනිත්තුවක් ගන්නද? *[බාධා කිරීමක්]* Sir, I have been generously given a minute by my Friend Hon. Gayantha Karunathilleka.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ විනාඩියත් අවසන් වෙලා තිබෙන්නේ.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, මම ඉල්ලා ගන්නම් ඒක.

I am saying what your people cannot say because then, you all will become angry with the Central Bank. We have the courage and conviction to point out whoever that is wrong. It is not a problem with the Governor, but governance is the problem. So, on that particular basis, we have to look into how we ensure protection.

If we do not pay, they would come back and say that there is a technical default. That is dangerous. But then, who is going to pay this Rs. 860 million to the Government of Australia? Remember, at this moment, JPMorgan and the Federal Reserve have put us on the suspended list. Therefore, it is only through Deutsche Bank that we can do our foreign transactions. Therefore, Sir, the Central Bank cannot hide behind the fact that they are only the banker to the Government and not report it to its anti-money laundering section.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
So, owing to lack of time, I would like to speak about the discharge of statutory responsibilities by the Central Bank very briefly. The Central Bank of Sri Lanka failed to discharge its statutory responsibilities at the level of professional competence, regulatory vigilance and institutional independence it is expected to. Rather than acting as an active regulator, prudent banker to the Government and the final safeguard against irregular sovereign payment transactions, the Central Bank adopted an unduly passive approach, treating its role largely as one of transmitting and executing payment instructions. In doing so, it failed to exercise the independent scrutiny, professional scepticism and risk-based judgement which are fundamental to the responsibilities entrusted to it under the Central Bank of Sri Lanka Act. Such conduct fell materially short of the standards of governance and due diligence expected of the nation's monetary authority.

So, finally, please ensure that this money is going to be paid. If so who is going to make the payment? That payment cannot be made by the citizens of Sri Lanka as they have already paid that.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.28]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී අපි විවාදයට ගන්නේ ඕස්ට්‍රේලියාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක ණය ආපසු ගෙවීමේ ක්‍රියාවලියේදී ඇති වුණු සිදුවීමට අදාළව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කර තිබෙන වාර්තාව ගැනයි. මම මුලින්ම කියන්න ඕනෑ, මේ කාරණය. අපේ විපක්ෂය නියෝජනය කරන, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා තමයි මේ වාර්තාව ඉදිරිපත් කරන්නේ. එතුමාගේ දයාබර පියාණන් අභාවප්‍රාප්ත වෙච්ච නිසා එතුමාට අද මේ සභාවට පැමිණීමට නොහැකි වුණා. ඉතින්, අපි හැමෝගේම ශෝකය එතුමාටත්, එතුමාගේ පවුලේ හැමදෙනාටත් මේ අවස්ථාවේදී පළ කරන්න කැමැතියි.

මේ විවාදයට අදාළව කථා කළොත්, මෙම වාර්තාවේ ඉතාම හොඳින් කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. මම ඒක වෙනම කියන්නම්. ඒ වාගේම උදේ වරුවේ කථා කළ මන්ත්‍රීතුමෙක් කිව්වා මම අහගෙන හිටියා, මුදල් අමාත්‍යාංශයේ ලේකම් හර්ෂණ සූරියප්පෙරුම මහත්මයා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා, නියෝජ්‍ය අමාත්‍යවරයකු විධියට කටයුතු කරලා, ඊට පස්සේ මුදල් අමාත්‍යාංශයට ගිහිල්ලා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට කටයුතු කරන එක unethical, ඒක ගැළපෙන්නේ නැහැ කියලා. නමුත් ඒ ක්‍රියාවලියම අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමන්ලා ආණ්ඩු කළ කාලයේදීත්, එහෙම නැත්නම් එතුමන්ලා සහාය දීපු සභාග ආණ්ඩුව කාලයේදීත් සිදු වෙලා තිබෙනවා. 2021දී අජිත් නිවාඩ් කබ්රාල් රජයේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයවන ඉහළම ව්‍යවස්ථාපිත ආයතනය වන - අපේ රවී කරුණානායක මන්ත්‍රීතුමාත් විවේචනයට ලක් කළ - මහ බැංකුවේ අධිපති ධුරයට පත් වුණා. එතුමා මන්ත්‍රී ධුරයෙන් සහ රාජ්‍ය අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වෙලා ගිහිල්ලා, 2021 සැප්තැම්බර් මාසයේදී මහ බැංකුවේ අධිපති ධුරයට පත් වෙනවා. ඒ වාගේම මහින්ද සමරසිංහ මන්ත්‍රීතුමා 2021 සැප්තැම්බර් 18වැනි දා පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉවත් වෙලා ගිහිල්ලා, ඇමෙරිකා එක්සත් ජනපදයේ තානාපතිවරයා හැටියට කටයුතු කරනවා. 1988 ජූලි 12වැනි දා අබ්දුල් බාකීර් මාකර් මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා ගිහිල්ලා දකුණු පළාත් ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කරලා තිබෙනවා. එතකොට practice එකක් හැටියට මේ පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු, ඇමතිවරු පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා ගිහිල්ලා රජයේ වෙනත් ධුර, තනතුරු දරලා තිබෙනවා. තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. එතුමන්ලා ඒ දරපු ධුරවල වගවීම - accountability - කොයි විධියටද තිබුණේ කියන එක; රජයට, රටට, ජනතාවට හානියක් කළාද, නැද්ද කියන එක. මොකද, 2021දී පාර්ලිමේන්තුවෙන් ඉවත් වෙලා ගිය අජිත් නිවාඩ් කබ්රාල් මහ බැංකු අධිපතිවරයා හැටියට පත්වෙලා තමයි මහ බැංකු බැඳුම්කර අරගෙන ගිහිල්ලා ඩොලර් මිලියන 100කට වඩා ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කරලා රටට පාඩු කළේ. ඔබතුමන්ලා අද විපක්ෂයේ ඉඳගෙන කථා කරන විනිවිදභාවය, අවංකභාවය, පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කිරීම කියන මොකුත්ම එතකොට සිද්ධ වුණේ නැහැ; ඒ මොකුත්ම සිද්ධ වුණේ නැහැ. ඒ විතරක් නොවෙයි. එම පූර්වාදර්ශය මත තමයි ඊට පස්සේ අර්ජුන මහේන්ද්‍රන්ලා ඒ මහ බැංකු බැඳුම්කර වංචාව සිදු කළේ. රවී කරුණානායක මන්ත්‍රීතුමනි, එවකට ඔබතුමා, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවේ මුදල් ඇමති. *[බාධා කිරීමක්]* ආ, ඔබතුමාට තිබුණේ නැහැ නේ. මුදල් ඇමති ධුරය යටතේ ඒ ආයතන තිබුණේ නැහැ නේ. හරි.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔය Public Finance Committee Report එකේම තිබෙනවා, මම මුදල් ඇමති වශයෙන් සිටි කාලයේ මගේ යටතේ මහ බැංකුව තිබුණෙත් නැහැ, රාජ්‍ය බැංකු තිබුණෙත් නැහැ. ඒ සම්බන්ධයෙන් මම ස්තුති කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා.

එතකොට ඒ බැඳුම්කර ක්‍රියාවලියට ඔය විනිවිදභාවය තිබුණේ නැහැ. ඔය විනිවිදභාවය තිබුණේ නැහැ. මට අද වාගේ මතකයි, මම අන්න අතැන තිබෙන පුටුවේ හිටියා. රනිල් වික්‍රමසිංහ මහත්මයා මෙතැන හිටියා. රනිල් වික්‍රමසිංහ පාර්ලිමේන්තුවට කිව්වේ මොකක්ද? අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවේ wedding එකකට යනවා, ඕනෑ වෙලාවක එයාව ගෙන්වලා දෙන්නම් කියලා මේ පාර්ලිමේන්තුවට පොරොන්දු වුණා. අදත් එයාට wedding එක ඉවර නැහැ, තවම. *[බාධා කිරීමක්]* අර්ජුන මහේන්ද්‍රන්ගේ wedding එක තවම ඉවර නැහැ. එහෙම තමයි එදා විනිවිදභාවය ක්‍රියාත්මක වුණේ.

ඩොලර් මිලියන ගණන් මේ රටට පාඩු වුණා. හැබැයි, මම අද සතුටු වෙනවා. අපි විපක්ෂයේ සිටියදී රටේ මූල්‍ය විනය පිළිබඳව, යම්කිසි අඩුපාඩු පිළිබඳව පෙන්වා දුන්නා. ඒවායේ සාධනීය කරුණු තිබුණා. එදා සමහර ඒවා ක්‍රියාවට නැඟුණා. අද මහ බැංකුවේ බැඳුම්කර ක්‍රියාවලිය යම් විනිවිදභාවයකට ලක් වෙලා තිබෙන්නේ, එදා අපි පෙන්වා දුන් කරුණු ක්‍රියාවට නැඟුණාට පසුවයි. ඔබතුමන්ලාට මතක ඇති, ඊට පස්සේ නැවත මහ බැංකුව ගෙනැල්ලා සමාලෝචනයට ලක් කරන හැම වෙලාවකම ඒ කරුණු පදනම්ව අපි නැවත ප්‍රශ්න කළ බව. *[බාධා කිරීමක්]*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හැබැයි, රනිල් වික්‍රමසිංහගේ ටෙන්ඩර් එක නිසා නේ, එහි විනිවිදභාවය තිබෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මොකක්ද?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි දන්නවා නේ, ඒක තමයි ඇත්ත තත්ත්වය.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
රනිල් වික්‍රමසිංහගේ, - [බාධා කිරීමක්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Tender auction එක. Private placements නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔව්, - *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න, රවී කරුණානායක මන්ත්‍රීතුමා. මම ඒ ගැන ඔබතුමාට වැඩිය කියන්න යන්නේ නැහැ. මොකද, ඒ නඩුව නැවත ගන්න ඕනෑ නිසා. ඒ නඩුව බහා තබලා තිබෙන්නේ. ඒ නඩුව ඉස්සරහට එනවා. අපට මතකයි, ලංකා බැංකුවේ තැන්පතු Perpetual Treasuries සමාගමට bid කළේ කොහොමද කියලා මේ පාර්ලිමේන්තුවේ COPE එකේදී අපි අහනකොට, ඒ වෙලාවේ ධර්මප්‍රිය chief dealer හැටියට ඒ කටයුත්ත අන්තිම මොහොතේ කළේ කොහොමද කියලා සාක්ෂි දුන්නා. එයා කිව්වේ, "මගේ වෘත්තීයභාවයෙන් මම ඒක තීරණය කළා" කියලා. හැබැයි, "මගේ වෘත්තීයභාවය" නොවෙයි. පසුව අර ජනාධිපති කොමිසමේදී හෙළිදරවු වුණේ, ජනාධිපති කොමිසමේදී, වෝහාරික විගණනයේදී ඔප්පු වෙලා තිබෙන්නේ, ධර්මප්‍රියගේ වෘත්තීයභාවය නොවෙයි. ඔබතුමන්ලාගේ බලපෑම් නිසා Perpetual Treasuries එකට සම්පූර්ණයෙන්ම bid කළා කියන එකයි. ලංකා බැංකුව, රජයේ බැංකුවක්. රජයේ බැංකුවකට ප්‍රාථමික තැරැව්කරුවකු හැටියට bid කරන්න පුළුවන්කම තිබේද්දී, ලංකා බැංකුවේ තිබිච්ච තැන්පතු Perpetual Treasuries වෙනුවෙන් bid කරන්න නිර්දේශ කළේ කවුද? ඔබතුමාට මතක නම්, හෘදය සාක්ෂියට අනුව - *[බාධා කිරීමක්]* මතකයි, ඒක. ඔබතුමාට ඒක මතකයි.

ඉතින් ඒවා ගැන ඉදිරියේදී පරීක්ෂණ කෙරෙන්න තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් පරීක්ෂණ කෙරෙන බව දන්නා නිසා, පෝලිමේ පෙරහැර එන බව දන්නා නිසා තමයි අද ශ්‍රේෂ්ඨාධිකරණයට, අභියාචනාධිකරණවලට විනිසුරුවන් පත් කිරීම පිළිබඳ ගැටලුවක් විපක්ෂයට ඇවිල්ලා තිබෙන්නේ. තවම මේක ඉවර නැහැ, රවී මන්ත්‍රීතුමා. තවම මේ ක්‍රියාවලිය ඉවර නැහැ. මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ නඩුව තාවකාලිකව බහා තබලා තිබෙනවා. හරිද? ඒක බහා තබලා තිබෙන්නේ. හැබැයි, ඒකත් විභාගයට ගන්න තිබෙනවා. ඒකෙදි ඔබතුමන්ලා ඒ පැත්තේ ඉඳගෙන කිව්වේ මොකක්ද? Perpetual Treasuries එකේ තැන්පතු තිබෙනවා, මේ ගනුදෙනුව ආවරණය කර ගන්න; ගනුදෙනුවේ පාඩුව ආවරණය කර ගන්න කියලා. අවසානයේ ඔබතුමන්ලාට footnotes දාලත් බේරා ගන්න බැරි නිසා, පිළිගන්න සිද්ධ වුණා. ඊට පස්සේ ඔබතුමන්ලා අවසානයේ ඒක තහවුරු කරන්න හැදුවේ මොකක් කියලාද? "ප්‍රශ්නයක් නැහැ, පාඩුවක් වුණාට. ඒකේ පාඩුව අපට දරා ගන්න තැන්පතු තිබෙනවා" කියලා කිව්වා.

හැබැයි, 2045 වෙනකම් ඒ බැඳුම්කර කල් පිරෙන්න තිබෙනවා; 2045 වෙනකම් කල් පිරෙන්න තිබෙනවා. ඒක නිසා පොලී අනුපාතය ඉහළ ගියා. ඒක නිසා ණය ගන්න සිද්ධ වුණා. ඒ නිසා ඩොලර් ණය ගන්න සිද්ධ වුණා. ඒකේ පාඩුව කොච්චරද කියලා ගණන් හැදුවොත්, කැල්කියුලේටරයක ඉඩ නැති වෙන තරමට ඉහළට යනවා. මොකද, 2045 වසර අවසානයේ තමයි බැඳුම්කර කල් පිරෙන්නේ. ඒවාට මේ විවාද තිබුණේ නැහැ. මේක ඩොලර් මිලියන 2.5ක්. මම මේක සාධාරණීකරණය කරන්නේ නැහැ. නමුත් මම කියන්න ඕනෑ, මේක cyber attack එකක් බව. අරක මනුෂ්‍ය attack එකක්. ඒක cyber attack එකක් නොවෙයි. මැතිවරණය කරන්න සිරිකොතේ සල්ලි නැති නිසා, ඒ වාගේම අධිවේගී මාර්ගවල ණය ගෙවන්න සල්ලි නැති නිසා මාමලා, බෑණලා ගිහිල්ලා සාකච්ඡා කරලා මහ බැංකුවට ගැහුවා. ඒක cyber attack එකක් නොවෙයි, මනුෂ්‍ය attack එකක්. ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂිය ඒක දන්නවා. හෘදය සාක්ෂිය කියන දේ නීතිය හමුවට ගෙනෙන්න තමයි දැන් අපට ජන වරම තිබෙන්නේ. අපට mandate එක දීලා තිබෙන්නේ ඒකටයි. අපට ජනතාව ඡන්දය දීලා තිබෙන්නේ ඇයි? ඒ ඔබතුමන්ලාගේ හෘදය සාක්ෂිය දන්නා, අපි දන්නා, අපට දැනෙන, ඒ වාගේම සාක්ෂි සටහන්වලදී හෙළිවුණු දේවල් නීතිය හමුවේ ඔප්පු කරන්න. ඒ දවස්වල සජීවී විකාශය තිබුණේ නැති නිසා, අපි දන්නවා ඔබතුමන්ලා කියපු කරපු ඒවා; ඒ ගනුදෙනුවේදී සාක්ෂි වසන් කරන්න පගාව ගත්ත කට්ටිය කියපු, කරපු දේවල්, ඒවා වහන්න මේක ගැන පොත් ලියපු අය පවා ඉන්නවා. ඒ දන්නා දේවල් දැන් නීතිය හමුවේ ඔප්පු කරන්න තිබෙනවා. සාකච්ඡා කරපුවා, ගෙවල් බදු දීපු ඒවා, ගෙවල් rent කරපු ඒවා, ලැබිච්ච ගෙවල් තෑගි දීපු ඒවා, apartments හම්බ වෙච්ච ඒවා පිළිබඳව අපි දන්නවා නේ. අපට 159ක් හිටියාට ඔබතුමන්ලා දන්නවා, ඒ අයගෙන් හය හත්දෙනෙක් සජීවී සාක්ෂිකාරයෝ බව. පාර්ලිමේන්තුවේ රැස්වන COPE එක එදා අරලියගහ මන්දිරයේ රැස්වුණා මතකයි නේ. වේලු කුමාර් මන්ත්‍රීතුමා මට කථා කරලා ඇහුවා, අපි COPE එක රැස්වෙලා තිබෙන්නේ, සභාපතිතුමා එන්නේ නැත්තේ ඇයි කියලා. මම ඇහුවා, කොහේද තිබෙන්නේ කියලා. අරලියගහ මන්දිරයේ කිව්වා. වේලු කුමාර් මන්ත්‍රීතුමා දන්නේ නැහැ, මම එතැනට එන්න ඕනෑද, නැද්ද කියලා. ඒ, සජීවී සාක්ෂි. එදා අර්ජුන මහේන්ද්‍රන්ව අරලියගහ මන්දිරයේ රැස් වූ COPE එකට කැඳවා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ බැඳුම්කර වංචාවේ ගනුදෙනු කථා කරන්න රනිල් වික්‍රමසිංහ COPE එක කැඳෙව්වා, අරලියගහ මන්දිරයට. එයාර්බස් ගනුදෙනුව පිළිබඳව සාකච්ඡා කරන්න චමල් රාජපක්ෂ එදා COPE එක කැඳෙව්වා, කථානායක නිල නිවසට. එහෙම ඉතිහාසයක් තමයි අපි මේ පහු කරලා ආවේ.

එහෙම ඉතිහාසයක් නිවැරදි කරන්න නම් මොකක්ද කරන්න ඕනෑ? අධිකරණය හරියට තිබෙන්න ඕනෑ. ඒකයි ප්‍රශ්නය. දැන් ඔබතුමන්ලා මහා ලොකුවට කියනවා, අධිකරණයට ඇඟිලි ගහනවා, ප්‍රජාතන්ත්‍රවාදය අවුළුවනවා, ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වෙනවා, අධිකරණය අතට ගන්න යනවා වාගේ කථා. කලබල වෙන්න එපා. ඒ සංශෝධනයෙන් විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස වෙනස් කළා කියලා ඒ ඔක්කෝම වෙන්නේ නැහැ. හැබැයි ඔබතුමන්ලාට පෙනෙනවා, වෙන්න යන දේ. ඔබතුමන්ලා හිතනවා නම් ඒකෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙනවා, අධිකරණය විනාශ වෙනවා කියලා, විපක්ෂයට හොඳයි නේ, අපට නේ ප්‍රශ්නයක් ඇති වන්නේ, ඒකට විපක්ෂය කැමැති වෙන්න එපායැ. එතුමන්ලාගේ විශ්‍රාම වයස වෙනස් කරලා එච්චර මහා විනාශයක් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සිද්ධ වනවා නම්, විපක්ෂයේ හිටියා නම් මම ඒකට අත උස්සනවා. මොකද, ආණ්ඩුවට ෂොට් එකක් දෙන්න, ආණ්ඩුවට වරද්දන්න ඒකෙන් පුළුවන් වන නිසා. අපි ඒක බලාගන්නම්, ගරු මන්ත්‍රීතුමා.

විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන වයස් සීමාව වෙනස් කිරීමෙන් රටට වෙන්නේ හානියක්ද, වාසියක්ද කියන එක නේ වැදගත් වන්නේ. ඒක තීරණය වන්නේ ඒ නඩු තීන්දු මත. දැන්ම ඔබතුමන්ලා ඒකට පෙරකදෝරුකම් කරන්න ඕනෑ නැහැ, ඒකට උප්පැන්න ලියන්න ඕනෑ නැහැ, අපි ආණ්ඩුවක් හැටියට ඒකේ සම්පූර්ණ වගකීම භාර ගන්නවා. අපට බැඳිච්ච වගකීමක් තිබෙනවා, රටේ ආර්ථිකය හදනවා වාගේම මේ දූෂිත තක්කඩි දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න. මම ඒ අතින් ගෞරව කරනවා, ස්තුති කරනවා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට. එතුමාගේ සභාපතිත්වයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් වැදගත් නිර්දේශ ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. ඒ නිර්දේශ දිහා බලන්න. විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකුට මේ නිර්දේශවලට විරුද්ධ වන්න බැහැ.

මේ ඩොලර් මිලියන 2.5ක ගනුදෙනුව පිළිබඳව මෙම නිර්දේශවල කියන්නේ මොකක්ද? නැවත එවැනි සිද්ධියක් වීම වළක්වා ගැනීමට ගත යුතු පියවර ඇතුළත් සවිස්තරාත්මක, කාල

රාමුවක් සහිත වාර්තාවක් ඉදිරිපත් කරන්න කියනවා. අපි එය ඉදිරිපත් කරනවා. ඒ වාගේම කියනවා, අදාළ මූල්‍ය පාලන බලතල පැවරීම තහවුරු කරන ලිපි ලේඛන ඉදිරිපත් කරන්න කියලා. අපි එය ඉදිරිපත් කරනවා. රාජ්‍ය ණය කළමනාකරණ පනතේ සඳහන් පරිදි ණය කළමනාකරණ කටයුතු සියල්ලම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත මාරු කර ඇති බව මුදල් අමාත්‍යාංශය විසින් තහවුරු කරන්න කියනවා. අපි එයත් තහවුරු කරනවා. සයිබර් ආරක්ෂාව මූල්‍ය අවදානමක් ලෙස සලකා මෑත වසරවල රාජ්‍ය ආයතනවල සාමාන්‍ය සිදුවීමක් බවට පත්ව ඇති ගෙවීම් පිළිබඳ ගැටලු, දත්ත සොරකම් කිරීම නැවත සිදුවීම වළක්වා ගැනීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් පුළුල් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බවත් එහි කියනවා. අපි එම ක්‍රියාමාර්ග අනුගමනය කරනවා. යාවත්කාලීන කරන ලද මුදල් රෙගුලාසි, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට හා රජයේ ණය කළමනාකරණ පනතට අනුකූල වන පරිදි සම්පාදනය කරමින් පවතින අතර එය අවසන් කර හැකි ඉක්මනින් පාර්ලිමේන්තුව විසින් සමාලෝචනයක් කරනු ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු බවත් එහි කියනවා. අපි එයත් ඉදිරිපත් කරනවා. හර්ෂ ද සිල්වා මැතිතුමා සභාපතිතුමා හැටියට හැඳින්වීමේදී වැදගත් දෙයක් ඉදිරිපත් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න, ගරු අමාත්‍යතුමා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මට තව විනාඩියක් දෙන්න.

මොකක්ද, ඒ හැඳින්වීම? එතුමා කියනවා, "ඒක අද ඊයේ සිද්ධ වෙච්ච දෙයක් නොවෙයි, ඒක ක්‍රියාවලියක්, ඒක 1992 ඉඳලා සිද්ධ වෙලා තිබෙනවා, විදේශ ණය ආපසු ගෙවීමේ ක්‍රියාවලිය තුළ මෙකී කාර්ය පටිපාටියේ අඩුපාඩු ඓතිහාසිකව පැවත ඇති බව කාරක සභාව විසින් තවදුරටත් නිරීක්ෂණය කරනු ලබයි" කියලා. ඒක ඓතිහාසිකව, කාලයක් තිස්සේ සිද්ධ වෙලා තිබෙන දෙයක්. මේ cyber attack කියන දෙය ලෝකයේ හැම රටකම සිද්ධ වනවා. ඒ දේ හරි දෙයක් නොවෙයි. ඒවා නිවැරදි කරන්න ඕනෑ. ඒවා සිදු නොවන්න ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. ඒ සඳහා systems හදන්න ඕනෑ. අවශ්‍ය ආවේක්ෂණ හදන්න ඕනෑ. ඒවා අපි කරනවා. ඇත්තටම මෙක මීට වඩා පුළුල් විධියට ගන්න ඕනෑ. මම ඒකයි කියන්නේ. අද වෙන්නේ, cyberattacks. එදා ඔබතුමන්ලා ගිහිල්ලා හොර රහසේ සාකච්ඡා කරලා tender committeesවල ප්‍රධානීන්ට ඇඟිල්ල දික් කරලා බල කරලා කිව්වේ, "මේක කරපන්" කියලායි. ඒ අනුව එදා තිබුණේ, "මනුස්ස ඇටැක්". ඒ නිසා මේ දෙකේ වෙනස අපි හොඳට දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රටේ බදු ගෙවන ජනතාවගේ හැම රුපියලකටම වග කියන රජයක්. ඒ වගවීම අපට තිබෙනවා. ඒක තමයි ජනතා අභිලාෂය; ජනතා කැමැත්ත. අද අපි මේ සිදු කරන අධිකරණ ක්‍රියාවලියේත්, රට හැම තැනම සිදු කරන සියලු ප්‍රතිසංස්කරණවලත් අවසාන බලාපොරොත්තුව රටේ ජනතාවට වගවීමයි. ඒ කාරණයත් සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රුවන් විජේවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.44]

ගරු රුවන් විජේවීර මහතා
(மாண்புமிகு ருவன் விஜேவீர)
(The Hon. Ruwan Wijeweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තැබීමේ යෝජනාවේදී සාකච්ඡාවට ගැනෙන්නේ, ඕස්ට්‍රේලියාවට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක ණය ආපසු ගෙවීමේදී සිදු වූ සයිබර් අපරාධ වංචාව සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවේ සභාගත කළ වාර්තාවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම වාර්තාවේ මාතෘකාවේම සඳහන් වනවා, "ඕස්ට්‍රේලියාවට ඇමරිකානු ඩොලර් මිලියන 2.5ක ණය ආපසු ගෙවීමේදී සිදුවූ සයිබර් අපරාධ හා සම්බන්ධ වංචාව සම්බන්ධයෙන්" කියන කාරණාව. එම මාතෘකාව ඇතුළේම තිබෙනවා, එය සයිබර් අපරාධයක් කියලා. හැබැයි විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අවස්ථා කිහිපයකදී උත්සාහ කළා, එතැන වෙලා තිබෙන්නේ සයිබර් අපරාධයක් නොවෙයි, හොරකමක්, intentionally කරන ලද හොරකමක් තමයි තිබෙන්නේ කියන එක ඔප්පු කරන්න. ඒ වාගේ කාරණා ටිකක් ඔවුන් මතු කරන්න හැදුවා. නමුත්, මාතෘකාවේම තිබෙනවා "සයිබර් අපරාධ හා සම්බන්ධ වංචාව" කියලා. අපි කියමුකෝ, සමස්ත වාර්තාව කියවන්නේ නැහැ කියලා. සමස්ත වාර්තාව කියවන්නේ නැති වුණත්, වාර්තාවේ විධායක සාරාංශය හා හැඳින්වීමේ ඉඳලා මූලික නිර්දේශ ටික කියවනකොට අපට පැහැදිලිව තේරෙනවා, සයිබර් අපරාධයක් හා සම්බන්ධ වංචාවක් සම්බන්ධයෙන් තමයි මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා.

මෙම වාර්තාවේ විධායක සාරාංශය යටතේ සඳහන් කරනවා, 2025 නොවැම්බර් සිට 2026 ජනවාරි දක්වා කාලය තුළ Export Finance Australia කියන සමාගමට ණය ආපසු ගෙවීමේ ක්‍රියාවලියේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් ගෙවීමේදී සිදු වූ සයිබර් අපරාධයක් හා සම්බන්ධ වංචාවක් සම්බන්ධයෙන් තමයි මෙම වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ කියලා. මෙම වාර්තාවේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, අභ්‍යන්තර පාලනයන්හි පද්ධතිමය දුර්වලතා - system errors - මේක ඇතුළේ තිබෙන බව. ඒ වාගේම ඒකේ තිබෙන කාර්ය පටිපාටින් ප්‍රමාණවත් නොවීම මත හට ගත් කාරණා, දුර්වලතා ප්‍රමාණයක් පවතිනවා කියන කාරණාවත් වාර්තාවේ සඳහන් කරනවා. මෙම වාර්තාවේ තිබෙන ඉතා වැදගත් කාරණාව තමයි, විදේශ ණය ආපසු ගෙවීම් ක්‍රියාවලිය තුළ මෙකී කාර්ය පටිපාටිමය අඩුපාඩු ඓතිහාසිකව පැවති බව. එම අඩුපාඩු ඓතිහාසිකව සහ කාලයක් තිස්සේ පරිණාමය වෙලා ඇවිල්ලා තිබෙන බව කාරක සභාව විසින් වැඩිදුරටත් නිරීක්ෂණය කර තිබෙන බවත් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම විවාදයේදී කියන්න උත්සාහ කළා, විශේෂයෙන්ම මෙම ක්‍රියාවලිය ඇතුළේ අපේ මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා - මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා - සහ මහ බැංකු අධිපතිතුමා - Central Bank Governor - මේකට මූලිකව වග කියන්න ඕනෑ; එම දෙදෙනාගේ මූලිකත්වයෙන් තමයි මේක වුණේ කියලා. නමුත්, a very clear fact is that for the Central Bank Governor as well as for the Secretary to the Treasury, there is a shared responsibility. But, that does not mean they had committed the fraud. They had not

[ගරු රුවන් විජේවීර මහතා]

committed the fraud, but they have a responsibility, as institutional heads. අපි දන්නවා, ඕනෑම ආයතනයක ප්‍රධානියෙකුට තමන්ගේ ආයතනය සම්බන්ධව වගකීමක් පැවරෙන බව. වගකීමක් පැවරෙනවා කියන එකෙන් අදහස් කෙරෙන්නේ, තමන්ගේ ආයතනයේ යම් ආකාරයක වැරැද්දක් - error එකක් - සිදු වෙලා තිබෙනවා නම් ඒ වැරැද්ද නැවත සිදු නොවීමට සහ වැරැද්දක් ආපසු ඇති නොවන ආකාරයේ තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ආරම්භ කරන්න අවශ්‍ය වටපිටාව සකස් කිරීමට ඔහුට හැකියාව තිබෙනවා කියන එකයි. ඒක නිසා තමයි මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා - අපේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා - ඉතා පැහැදිලිව එය කිව්වේ. විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් ඇහුවා, Free Lawyers Organization කියන කල් මේ වංචාව සම්බන්ධ තොරතුරු එළියට නොදුන්නේ ඇයි කියලා. එතෙක් කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නැහැ කියලාත් කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අවුරුද්දේ මුල් මාසවලම මේක දැන ගත්තාට පස්සේ මෙය SLCERT එකට දන්වලා ඒ සම්බන්ධව තීරණ අරගෙන, අභ්‍යන්තර විමර්ශනයක් කරන්න අවශ්‍ය කරන මූලික පියවර සියල්ල ගෙන තිබෙනවා. ඒ වාගේම සිදු කරන ලද විදේශ ණය ගෙවීමේ ක්‍රියාවලිය නැවත වතාවක් supervise කරලා කිසියම් වැරැද්දක් සිදු වෙලා තිබෙනවා නම් ඒ වැරැද්ද කොතැනද සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක හොයන්න අවශ්‍ය කරන මූලික පියවර සියල්ල අරගෙන තිබෙනවා. ඒ අනුව අපි භාණ්ඩාගාර ලේකම්තුමාගේ - මුදල් ලේකම්තුමාගේ - පැත්තෙන් ගන්න ඕනෑ තීන්දු තීරණ වාගේම පියවර අරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමාගේ කථාවේදී එතුමා කියපු එක කාරණාවක් තිබෙනවා. මේ ගන්නා ක්‍රියාමාර්ග ඇතුළේ රට බංකොලොත් වෙලා, IMF එක කියන විධියට නටනවා, IMF එක projections දීලා තිබෙනවා, ඒ projections ඉක්මවා යමින් අනවශ්‍ය වැඩ කරනවාය කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මූලිකම චෝදනාව වුණේ ඒක නොවෙයි. විපක්ෂයේ මූලිකම චෝදනාව වුණේ, IMF එක කියන projectionsවලට යන්න බැහැ, IMF එක කියන දේවල් කර ගන්න බැහැ, inability එකක් තිබෙනවා, that there is a clear inability on the part of the Government කියන එකයි. "They cannot do this" කියලා කිව්වා. මුල තිබුණු accusation එක, ඒක. හැබැයි, අපි ආණ්ඩුවක් - Government එක - විධියට නිවැරදි ආර්ථික ප්‍රතිපත්ති, නිවැරදි fiscal policy එකක්, monetary policy එකක් අනුගමනය කරමින් ගත් ක්‍රියාමාර්ග ඇතුළේ අර කියපු එක හරි. සියයට 2.3ක්ව තිබුණු ප්‍රාථමික ශේෂය 2025දී සියයට 5.4කට ගෙනාවා. ඒ වාගේම තමයි, රජයේ ආදායම - Government revenue as a ratio to GDP - සියයට 13.9 ඉඳලා සියයට 16.7ක් දක්වා ගෙනාවා. මේවා අත්පත් කර ගත්තේ නිකම් නොවෙයි. මේවා අත්පත් කර ගන්න ඉතා ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ආණ්ඩුව පැත්තෙන් දියත් කළා. විශේෂයෙන්ම අපේ රටේ ඉතිහාසය තුළ රාජ්‍ය මූල්‍ය විනයක් තිබුණේ නැහැ. මූල්‍ය විනයකින් තොරව තමන්ට හිතෙන හිතෙන දේ කරපු ආණ්ඩු තිබුණේ. තමන්ට හිතෙන හිතෙන විධියට මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව පාලනය කළා. ඒ විතරක් නොවෙයි, ඊට අදාළව තීන්දු තීරණ ගත්තේ කොහොමද කියලා සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ කථාවේදී ඉතා පැහැදිලිව පෙන්නුම් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම ඉතිහාසයක් පසු කරගෙන අපි ඇවිල්ලා තිබෙන්නේ. අපට තිබෙනවා, එහෙම ඉතිහාසයක්. ඒ ඉතිහාසය පසු කරගෙන තමයි අපි ඇවිල්ලා තිබෙන්නේ.

අපි රාජ්‍ය මූල්‍ය විනය ශක්තිමත් කළා. විශේෂයෙන්ම අපට රාජ්‍ය ආදායම ලැබෙන ප්‍රධාන ප්‍රවේශ තුනක් තිබෙනවා. ඒ ප්‍රධාන ප්‍රවේශ තුන තමයි, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව. මීට අදාළව බදු අය කිරීමේ ක්‍රියාවලිය ගත්තොත්, බදු වැඩිපුර ගහලා තිබෙනවා කිව්වා. අපි බදු වැඩිපුර ගහලා නැහැ. පුළුවන් නම් කියන්න, වැඩිපුර ගහපු බද්ද මොකක්ද කියලා. බදු වැඩිපුර ගැහුවා නොවෙයි, බදු ක්‍රියාවලිය විධිමත් කළා, කාර්යක්ෂම කළා. එකතු කරන බදු ටික භාණ්ඩාගාරයේ නිවැරදිව රැස් කළා. බදු දැලෙන් රිංගා ගිය දයා ගමගේ, මෙන්ඩිස් සමාගම වාගේ ලොකු මාළු හිටියා. ඒගොල්ලන්ට බදු ගෙවන්න තිබුණේ නැහැ. ඒගොල්ලන්ගෙන් බදු එකතු කළේ නැහැ. ඒගොල්ලන් යාළුවෝ, මේගොල්ලන්ගේ. ඒ නිසා මොකක්ද කළේ? ඒගොල්ලන්ගෙන් බදු එකතු කළේ නැහැ. ඒගොල්ලන්ට යන්න දුන්නා. ඒ හැම එකක්ම අපි බදු දැලට එකතු කර ගත්තා. ඒ නිසා එකතු කරන ලද බදු ටික මහජනතාව වෙනුවෙන් වියදම් කරන ක්‍රමවේදයක් හැදුවා. ඒ නිසා විපක්ෂ නායකතුමා කියපු ඒ කාරණාව වැරදියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම, he said that there was no clear integration between the fiscal policy and the monetary policy. Who said this? He said that the Secretary to the Treasury and the Central Bank Governor had written a letter stating that there was no clear integration between the fiscal policy and the monetary policy; එහෙම ලියුමක් ලියා තිබෙනවාය කිව්වා. If there was no such integration, how could these achievements be made by the Government? That is the thing.මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් විධියට ගත්තොත්, අල්ලසට, දූෂණයට සහ වංචාවට එරෙහිව, රාජ්‍ය මූල්‍ය අයථා භාවිතයට එරෙහිව කටයුතු කරන ජන වරමක් - mandate - අපට තිබෙනවා. ඒ නිසා ආණ්ඩුවක් විධියට අපට තිබෙනවා, වගකීමක්. මොකක්ද අපට තිබෙන වගකීම? ජන වරම ප්‍රකාරව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය බලගැන්වීම අපේ වගකීම. ඒ වගකීම අනුව යමින් යුක්තිය පසිඳලීමට අදාළව කටයුතු කරන ආයතන ටිකක් තිබෙනවා. මොනවාද ඒ ආයතන? අද රටේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, නීතිපති දෙපාර්තමේන්තුව සහ පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන ගණනාවක් තිබෙනවා. ස්වාධීනව කටයුතු කරන්න අවශ්‍ය කරන පෞරුෂය ඒ ආයතනවලට වාගේම ඒ නිලධාරින්ට ලබා දීලා තිබෙනවා. ඒ නිලධාරින්ට කොන්ද කෙළින් තියාගෙන, දේශපාලන බලපෑමකින් තොරව නීතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන පෞරුෂය අපි හදා දීලා තිබෙනවා. අද උදේ ඉඳලා විතරක් නොවෙයි, මේ දවස් ටිකේම පොලිස්පතිතුමාව ඉලක්ක කරගෙන පහර ගහනවා. ඇයි එහෙම පහර ගහන්නේ? එහෙම පහර ගහන්නේ නීතිය ක්‍රියාත්මක කරන නිසායි. අපරාධකාරයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙනවා. ඝාතකයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙනවා. දූෂිතයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙනවා. නීතිය අපරාධකාරයන්ගේ පිටුපසින් එමින් තිබෙනවා. ඒක නිසා මොකක්ද කරන්නේ? ඒ බව අපරාධකාරයා දන්නවා. ඒක අපරාධකාරයාට දැනෙනවා. ඒක නිසා පොලිස්පතිතුමාව ඉලක්ක කරනවා, අග්‍ර විනිශ්චයකාරතුමාව ඉලක්ක කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍ර විනිශ්චයකාරවරයා ආණ්ඩුවට පක්ෂපාතිව දීලා තිබෙන තීන්දුව මොකක්ද? මොකක්ද එතුමා දීලා තිබෙන තීන්දුව? පුළුවන් නම් කියන්න, මෙන්න මේ තීන්දුව දුන්නා, ඒ නිසා අග්‍ර විනිශ්චයකාරවරයා වැරදියි කියලා. හැබැයි, විපක්ෂයේ මන්ත්‍රීතුමියක් කිව්වා, අග්‍ර විනිශ්චයකාරවරයා ආණ්ඩුවේ රූකඩයක්, ආණ්ඩුවට ඕනෑ විධියටයි වැඩ කටයුතු කරන්නේ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අයටත් ජන වරමක් තිබුණා. ඒ ජන වරමේ නාමයෙන් මේ රටේ අපරාධ කරලා තිබෙනවා, දූෂණ කරලා තිබෙනවා, රාජ්‍ය මූල්‍ය අයථා විධියට භාවිත කර තිබෙනවා. ඒ සියලු දෙනාට එරෙහිව මහජනතාවගේ නාමයෙන් අපි යුක්තිය ඉෂ්ට කළ යුතුයි. එලෙස යුක්තිය ඉෂ්ට කරනවා විතරක් නොවෙයි, ඒ වෙනුවෙන්

ක්‍රියාත්මක වන සියලුම නිලධරයන් ආරක්ෂා කිරීමේ වගකීමත් ආණ්ඩුවට තිබෙන බව ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.54]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කථාව අවසාන කළ තැනින්ම මම කථාව ආරම්භ කරන්නම්.

රාජ්‍යය සතු මුදල් විනාශ කරපු අයට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොවීමම තමයි මෙතැන තිබෙන අර්බුදය. ලංකාවේ මිනිස්සුන්ගේ මුදල් නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා අපි නොදන්නා, ඔවුන් දන්නා යම් පුද්ගලයෙකුගේ ගිණුමකට මුදල් බැර කිරීම තමයි මෙතැන තිබෙන අර්බුදය. නොවැම්බර් මාසයේ 26වැනි දා මහ බැංකුව විසින් ඉදිරිපත් කරනවා, මෙන්න මෙහෙම එකක්. හැම වෙලාවේදීම කිව්වා නේ, මේ document එක කියවන්න කියලා. ඔන්න මම කියවන්නම්. "ප්‍රතිලාභියාගේ ලිපිනය Export Finance Australia ආයතනයේ ලිපිනය නොවන බවත්, ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතු බවත්, ආපසු ගෙවීම සඳහා ගිණුම් විස්තර යළි තහවුරු කර ගැනීම පිණිස ණය දෙන ආයතන සමඟ සන්නිවේදනය කරන ලෙසත් උපදෙස් ලබා දෙන ලදී" කියලා මේකේ තිබෙනවා.

ඒ අනුව, නොවැම්බර් 26වැනි දා පළමුවැනි උපදේශය ලබා දෙනවා. ඒ, කාටද? මුදල් අමාත්‍යාංශයට. දෙවැනි උපදේශය ඉන්දියාව විසින් ලබා දෙනවා. තුන්වැනි උපදේශයකුත් ලබා දෙනවා. මේ කිසිවක් ගැන අවධානය යොමු නොකර, අපේ පැත්තෙන්, නොදන්නා ගිණුමකට සල්ලි යවනවා. නොදන්නා ගිණුම තමයි මෙතැන මාතෘකාව. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ අපේ පැත්තෙන්, අපේ රට පැත්තෙන් සිද්ධ වෙච්ච වරද. අපේ රට පැත්තෙන් මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම නිසි ආකාරයට නොවීම නිසා ලංකාවේ මුදල් රෙගුලාසි උල්ලංඝනය වෙනවා. ඒ මුදල් රෙගුලාසි උල්ලංඝනය වීමත් එක්ක ප්‍රශ්නයක් ඇති වුණා. නොසැලකිලිමත්භාවය නිසා, අපි සතුව තිබුණු සල්ලි වගයක් වෙනත් ගිණුමකට ගියා. ඊළඟට දැන් ඔය වාර්තාවේ පිටු අංක 20හි තිබෙනවා, "මේ පිළිබඳව පරීක්ෂණ කරලා අදාළ නිලධාරීන්ගේ ක්‍රියා කලාපය, නොදැනුවත්කම, අකාර්යක්ෂමතාව සහ නොසැලකිලිමත්භාවය මත පදනම්වූවක්ද යන්න සොයා බලන්න" කියලා. මම මේ කිව්වේ එම වාර්තාවේ තිබෙන කරුණු දෙකක්.

ඊළඟ එක තමයි, ඩොලර් මිලියන 2.5ක් නොසැලකිලිමත් ලෙස වෙනත් නොදන්නා ගිණුමකට යැවීම නිසා මුදල් රෙගුලාසි උල්ලංඝනය වෙනවා කියන එක. මුදල් රෙගුලාසි 104 (1) අනුව ඒ වෙලාවේදී කළ යුතු කාර්යයක් තිබෙනවා. මෙතැනදී ඒක උල්ලංඝනය වෙනවා. ඒ උල්ලංඝනය වීමට පස්සේ කළ යුතු වැඩ වගයක් තිබෙනවා. ඒ වැඩ ටික සිද්ධ වුණාද? පළමුවැනි ක්‍රියාවලිය තමයි, ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කරන්න ඕනෑ කියන එක. ඒ ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කළාද? ආණ්ඩුව පැත්තෙන් දෙන්න ඕනෑ උත්තරය ඒකට. ඊට පස්සේ දින 7ක් ඇතුළත මේක ලැබුණේ නැත්නම් ඊළඟට කරන්න ඕනෑ දේ තිබෙනවා. පූර්ණ වාර්තාවක් පරීක්ෂණයෙන් පසු ඉදිරිපත් කරන්න ඕනෑ. ආණ්ඩුව පැත්තෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් වුණාද? මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පැත්තෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් වුණාද? එහෙම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් වුණේ නැත්නම් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට විරුද්ධව මුදල් අමාත්‍යවරයා කටයුතු කළාද?

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව තිබෙනවා, මුදල් අමාත්‍යවරයා විසින් මේ වගකීම් පැහැර හරින්න බැහැ කියලා. එතකොට එක පැත්තකින්, ලංකාවේ මුදල් වගයක් නොදන්නා ගිණුමකට යැව්වා. එලෙස මුදල් යැවීම පිළිබඳව ඒ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණ සිද්ධ වුණාද, ඒ වෙනුවෙන් කටයුතු කළාද කියන එක තමයි විපක්ෂය හැටියට අපි ප්‍රශ්න කරන්නේ. එතකොට මේ මුදල් ටික ගියේ කොහේටද? ඒක පිළිබඳව හොයා බලන එක වෙනම වැඩක්. හැබැයි, අපේ කථාව තමයි, මේ පිළිබඳව නිසි පරීක්ෂණයක් නියමාකාරයට සිද්ධ වෙලා නැහැ කියන එක. විශේෂයෙන්ම ආණ්ඩුව පැත්තෙන් මේ මුදල් පරිහරණය කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට හෝ කිසිම තැනකට දන්වන්නේ නැතිව සිටියදී එළියෙන් තමයි පළමුවැනි වතාවට තොරතුර එන්නේ. එම නිසා ආණ්ඩුව වගකීම් පැහැර හැරීම පිළිබඳව අමුතුවෙන් කියන්න දෙයක් නැහැ.

ඊළඟ කාරණය මේකයි. මේ විධියට තොරතුරු ලැබිලා තිබියදීත් ක්‍රියාත්මක නොවීම නිසා සිද්ධ වෙච්ච දේ තමයි, එක පැත්තකින් මුදල් නැති වුණු එක. අනෙක් පැත්තෙන්, මහ බැංකුවේ සේවය කරපු නිලධාරියෙකුගේ ජීවිතය නැති වුණා. මේ විධියට, කරුණු ලැබිලා තිබියදී නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම නිසා තමයි පූජිත් ජයසුන්දර සහ හේමසිරි ප්‍රනාන්දු කියන දෙදෙනාට මරණ දඬුවම නියම වුණේ. එතකොට එතැනත් ඒ අපරාධමය වරද සිද්ධ වෙනවා. ඒ අපරාධමය වරද සිද්ධ වෙනවා නම්, ඒ වෙනුවෙනුත් උසාවිය හරහා දඬුවම් කිරීමේ වගකීම ආණ්ඩුවටම තිබෙනවා. මොකද, ඒගොල්ලන් හැම වෙලාවේම මේ වැඩේ හරියට කරනවා කියලා කියනවා නේ. මේක පළමුවැනි වතාව නොවෙයි. මීට කලිනුත් මේ වැඩේම සිද්ධ වෙලා තිබෙනවා. මේක, මේ ආණ්ඩුව සැරින් සැරේ කරන එකම දේ. "දිට්වා" සුළි කුණාටුව පිළිබඳ අදහසත් මේකම තමයි. "දිට්වා" සුළි කුණාටුව පිළිබඳ අදහස කියලා කියද්දිම, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමා යන්න යනවා. සභානායකතුමා කිව්වා, එතුමා සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා කියලා. එහෙම ක්‍රියාත්මක වුණාද? අද වෙනකල් ක්‍රියාත්මක වුණේ නැහැ නේ. සභානායකතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

පිළිබඳව ක්‍රියාත්මක වෙනවා කියලා ඔබතුමා කිව්වා නේ. නමුත් අද වෙනකල් ක්‍රියාත්මක වුණේ නැහැ නේ. *[බාධා කිරීමක්]*

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

ඒක මම පස්සේ කියන්නම්. ඩිජිටල් අමාත්‍යාංශයත් එක්ක එතුමා කරන ව්‍යාපාර පිළිබඳව කියන්නම්. එතුමා යනවා දැකපු නිසායි දැන් ඒක කිව්වේ.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඩොලර් මිලියන 2.5 පිළිබඳ කාරණය විතරක් නොවෙයි, ඊළඟට තිබෙනවා, "දිට්වා" සුළි කුණාටුව පිළිබඳ කාරණය. "දිට්වා" සුළි කුණාටුව පිළිබඳව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, අසල්වාසී රටවල් දන්වා තිබියදීත් ඒ පිළිබඳව කටයුතු නොකිරීම නිසා මිනිස් ජීවිත 800ක් පමණ නැති වුණා. හැබැයි, එයින් සැලකිය යුතු පිරිසක් බේරා ගන්න තිබුණා, ආණ්ඩුව සහ අදාළ අමාත්‍යවරයා නිසි ආකාරයට කටයුතු කළා නම්. මොකද, නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම තුළ සහ තමන් කැමැති, තමන් ආස කරන නිලධාරින් අදාළ ආයතනවලට පත් කර ගත්තාට පස්සේ ඒ අයට මේ කාර්ය ක්‍රියාවලිය නිසි ආකාරයට කරන්න බැරි වනවා. එසේ බැරි වන විට ඒ ඇතිවන ගැටලුවලට ලංකාවේ ජීවත්වෙන මිනිස්සුන්ට වගකියන්න සිද්ධ වෙනවා.

ඊළඟට, මේ වාගේ තත්ත්වයකදී රටේ මිනිස්සුන්ට කරන්න තිබෙන්නේ උසාවියේ පිළිසරණ පැතීම විතරයි. උසාවියේ පිළිසරණ පතන්න නම්, උසාවිය ස්වාධීනව තිබෙන්න ඕනෑ. මේ කාලය තුළ ලංකාවේ අධිකරණ පද්ධතිය පිළිබඳව බරපතළ සාකච්ඡාවක් සිද්ධ වෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් යම් අදහසක් ඉදිරිපත් කළ යුතුයි කියා මම හිතනවා. ඇයි, මම එහෙම කියන්නේ? මේ වෙලාවේදී ආණ්ඩුව ගේන්න හදන මේ ප්‍රතිසංස්කරණයට නීති ක්ෂේත්‍රයේ ඉන්න සියලු දෙනා විරුද්ධයි. නීතිඥ සංගමය විරුද්ධයි, විනිසුරු සංගමය විරුද්ධයි, මහ නායක හිමිවරු විරුද්ධයි, පිටරට සංවිධාන විරුද්ධයි. මම දැක්කා, ප්‍රංශයේ නීතිඥ සංගමයකුත් විරුද්ධ වෙලා තිබෙනවා. ඇංග්ලිකන් සභාව විරුද්ධ වෙලා තිබෙනවා. ආසියාවේ නීතිඥ සංගමයක් විරුද්ධ වෙලා තිබෙනවා. ජාත්‍යන්තර විනිසුරුවරුන්ගේ සංගමය විරුද්ධ වෙලා තිබෙනවා. මේ සියලු දෙනා විරුද්ධ වෙලා තිබෙන මොහොතක ආණ්ඩුව ලහි-ලහියේ මේ කටයුත්ත කරන්න යනවා. අග්‍ර විනිශ්චයකාරතුමා පිළිබඳව නේ වැඩිපුර කථා කළේ. අග්‍ර විනිශ්චයකාරතුමාගේ ධුර කාලය වැඩි කරගන්න නේ වුවමනා වුණේ. මා දැක්කා, වසන්ත ඇමතිතුමා කියා තිබෙනවා, අපට තිබෙන්නේ සූරසේන භීතිකාව කියලා. අපට සූරසේන භීතිකාවක් නැහැ. නමුත් ආණ්ඩුවට තිබෙනවා, කෝදාගොඩ භීතිකාව. ඒ මොකක්ද? ඊළඟට අග්‍ර විනිශ්චයකාර ධුරයට පත්වෙන්න ඉන්න කෙනාට ඒ තනතුර අහිමි කිරීම තමයි ආණ්ඩුවේ අරමුණ. අවාසනාවට, මේ අය කෝදාගොඩ භීතිකාවෙන් පෙළෙන නිසා සූරසේන භීතිකාව කියලා ඒක අපේ පැත්තට යොමු කරන්න උත්සාහ කරනවා. මේ වාගේ ප්‍රතිසංස්කරණයක් ලෝකයේ කරපු හැම අවස්ථාවකදීම, ඒ සඳහා විශාල කාලයක් අරගෙන, අදාළ ක්ෂේත්‍රයේ ඉන්න අය එක්ක සාකච්ඡා කරලා බොහොම හොඳින් සිදු කළත්, මේ ආණ්ඩුව එය ලහි ලහියේ කරන්න දරන උත්සාහයෙන් පෙනී යනවා, මොකක් හෝ සැක සහිත දෙයක් කරන්න මේ අයට වුවමනාවක් තිබෙනවා කියලා.

ප්‍රජාතන්ත්‍රවාදී රටක අධිකරණ පද්ධතිය ස්වාධීනව තිබෙන්න ඕනෑ. නමුත් ආණ්ඩුව දරන මේ උත්සාහය නිසා අධිකරණයේ ස්වාධීනත්වයට බරපතළ තර්ජනයක් සිදුවෙන්න යනවා. ඇත්තටම නඩු ප්‍රමාද වෙනවා නම්, ඒ නඩු ප්‍රමාද වීම සම්බන්ධයෙන් කළ යුතු දේවල් ටික සඳහන් කර ලංකාවේ අධිකරණ අමාත්‍යාංශය විසින් පිටු 506ක වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. එහි එක තැනකවත්, අධිකරණයේ විනිසුරුවරු විශ්‍රාම ගන්වන වයස දීර්ඝ කිරීම පිළිබඳව නැහැ. ඊළඟ කාරණය තමයි, අධිකරණ විනිසුරුවරුන්ගේ සේවා කාලය අවුරුදු දෙකකින් දීර්ඝ කිරීම. ඔබතුමන්ලා ඒ අවුරුදු දෙක හොයා ගත්තේ කොහෙන්ද? ඒ සඳහා ඔබතුමන්ලා ගත් නිර්ණායකය මොකක්ද? මොකක්ද, ඒ විද්‍යාත්මක ක්‍රමය? මේ කිසිම දෙයක් පිළිබඳව යම් අදහසක් අවම වශයෙන් විනිසුරුවරුන්ගෙන්වත් අහන්නේ නැතිව ඔබතුමන්ලා තීරණය කරනවා, අවුරුදු දෙකකින් සේවා කාලය වැඩි කළාම නඩු ටික ඉවර කර ගන්න පුළුවන් වෙයි කියලා. ඔබතුමන්ලා දිගින් දිගටම කුමක් හෝ දෙයක් එක්ක වැඩ කරන බව පෙනී යනවා. හොඳ දේවල් කරනවා නම්, ඒවා කලබලයේ ලහි-ලහියේ කරන්න වුවමනාවක් නැහැ.

ඊළඟට කිව්වා, ශිරානි බණ්ඩාරනායක හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය අයින් කිරීම පිළිබඳව. ශිරානි බණ්ඩාරනායක හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය අයින් කිරීම පිළිබඳ සාකච්ඡාවේදී, ලංකාවේ ඔය ආණ්ඩුව දිගින් දිගටම කියන, ඒකාධිපතියෙක් යැයි හඳුන්වන මහින්ද රාජපක්ෂ මැතිතුමාට තිබුණා එහෙම නම් එදා මොනවත්ම නොකර; විශේෂ කාරක සභා මොනවත්ම පත් නොකර වයස බලලා, "මේ වයසින් විශ්‍රාම යන්න ඕනෑ" කියලා වයස අඩු කරන්න. අද විශ්‍රාම යන වයස වැඩි කරලා අග්‍ර විනිශ්චයකාරතුමාව තියාගන්න දරන ආණ්ඩුවේ උත්සාහයේ ප්‍රතිවිරුද්ධ පැත්ත කරන්න තිබුණා. හැබැයි, ඔබතුමන්ලා ඒකාධිපතියෙක් ලෙස හඳුන්වන මහින්ද රාජපක්ෂවත් ඒ විධියට වයස අඩු කරලා අග්‍ර විනිශ්චයකාරතුමිය අයින් කරන්න උත්සාහ කළේ නැහැ. මෙතැනදී පැහැදිලිවම ඔබතුමන්ලා කුමක්දෝ වැඩකට සූදානම් වෙනවා. ඒ වැඩේ භයානකයි. මා දැක්කා නියෝජ්‍ය ඇමතිවරයෙකුත් ළඟදී කියා තිබෙන කාරණයක්. රාජ්‍යයේ ඔබට අත්පත් කර ගත නොහැකි, ඔබට පිටින් තිබෙන සියලු ස්වාධීන ආයතන ටික ඔබේ ග්‍රහණයට අරගෙන ඔබ මොකක්දෝ මනෝ මූලික ක්‍රියාවලියකට යන්න උත්සාහයක් දරනවා.

මේවා ඇත්තටම කළ යුතු වැඩ නම්, කළ යුතු විධියක් තිබෙනවා. උදාහරණයක් කියන්නම්, ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන්ම.

ඔබතුමන්ලා ත්‍රස්ත විරෝධී පනත වෙනස් කරන්න උත්සාහයක් දරනවා. මේ වෙද්දි 42 වතාවක් ඒ කමිටුව රැස් වෙලා තිබෙනවා, පොලීසිය, නීතිඥයන්, විනිසුරුවන් සියලුදෙනා ඇතුළුව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව පොඩි වෙලාවකින් අවසන් කරනවා.

යමක් හරියට කරනවා නම් ඒ කරන විධිය තියෙද්දි ලහි ලහියේ මොකක්දෝ වැඩක් කරන්න දැන් උත්සාහ කරනවා. ඔබතුමන්ලා දරන උත්සාහ ඇතුළේ පැහැදිලිවම අනාගතයේ බොහෝ නරක ප්‍රතිවිපාක ආණ්ඩුවට අත් විඳින්න සිද්ධ වෙනවා. මොකද, මහින්ද රාජපක්ෂ මැතිතුමාට ධුරයෙන් යන්න සිද්ධ වුණේ ඔය වාගේ කාරණාවලදී ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිව කටයුතු කිරීම නිසාමයි. ඒ නිසා මේක පිළිබඳව අවධානය යොමු කරන්න. ප්‍රජාතන්ත්‍රවාදය 1931 ඉඳලා මේ රටේ තිබිච්ච දෙයක්. ඡන්ද ක්‍රමය අවුරුදු 100කට කිට්ටුයි. ඔබතුමන්ලා නටන්න හදන නාඩගමේ කෙළවර මොකක්ද කියන එක ඔළුවේ තියාගෙන, මහින්දත් ගෙදර ගියා නම් අනුර ගෙදර යන එක සිම්පල් කියලා ඔළුවේ තියාගෙන වැඩ කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ විවාදය පැවැත්වෙන්නේ, මුදල් අමාත්‍යාංශය හරහා ණය හිමියන්ට ඩොලර් මිලියන 2.5ක් ගෙවීම සිදු කිරීමේදී තුන්වැනි පාර්ශ්වයකට ඒ මුදල් යැම සම්බන්ධව සිදු වෙච්ච වංචාව පිළිබඳව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පදනම් කරගෙනයි. ඒ පිළිබඳව ඒ වාර්තාවේ පැහැදිලිව සඳහන් කරනවා. මෙතැනදී සිද්ධියක් සිදු වෙලා තිබෙන බව කාටත් පැහැදිලියි. කවුරුත් ඒක නැහැයි කියන්නේ නැහැ. එහිදී විශේෂයෙන් ඊමේල්, ඒ වාගේම සයිබර් අවකාශය භාවිත කරමින් මැදිහත්වීමක් කර තිබෙනවා. ඒ අනුව මේ සිදු වෙච්ච පාඩුව පිළිබඳව වාගේම එහිදී මොකක්ද සිදු වුණේ කියන එක පිළිබඳව කරුණු එක්රැස් කිරීම, පරීක්ෂණ කිරීම සිදු කරනවා. ඒ අනුව ගත යුතු තීන්දු තීරණ ගත හැකි වන්නේ ඒ සියලු තොරතුරු ලැබුණාට පසුවයි.

විපක්ෂය මේ කාරණයේදී අපට කරන චෝදනාවල පෙනෙන්න තිබෙන දේ තමයි, ඔවුන් මේ පිළිබඳව පරීක්ෂණය කරලා ඉවරයි කියන එක. මීට කලින් අදහස් දක්වපු ගරු මන්ත්‍රීතුමාත් සඳහන් කළා, ඔවුන් නොදන්න, අපි දන්න ගිණුමකට සල්ලි දාලා කියලා. ඒ පිළිබඳ කිසිම යොමුවක් - reference එකක් - ඇත්තේ නැහැ. මෙයින් පෙනෙන එක්තරා පැහැදිලි කාරණයක් තිබෙනවා. අපේ ආණ්ඩුව එන්න කලින් තිබුණු ආණ්ඩුවලට චෝදනා විශාල ප්‍රමාණයක් තිබුණා. ඒ චෝදනා අතර වංචාව, දූෂණය, රාජ්‍ය මුදල් අවභාවිතය කියන චෝදනා තිබුණා. ඇත්තටම ඒවා මහජනතාවට කරන ලද පාඩු තමයි. මහජනතාවගේ මුදල් තමයි අවභාවිත වෙලා තිබෙන්නේ. හැබැයි ඒ අය උත්සාහ කරනවා, මේ වුණු පාඩුව, මේ සයිබර් අපරාධයට ලක් වූ ඩොලර් මිලියන 2.5හි පාඩුව තමයි ලංකාවේ ආණ්ඩුවක් යටතේ, නැත්නම් මුදල් ගනුදෙනුවකදී සිද්ධ වෙච්ච එකම පාඩුව, ඒක දේශපාලනය සම්බන්ධ වෙලා, මහා භාණ්ඩාගාරයේ ලේකම් සම්බන්ධ වෙලා කළ එකක් යනුවෙන් සමාජගත කරන්න. ඒ වාගේම, මේක තමයි ලොකුම වංචාව කියලාත් සමාජගත කරන්නත් උත්සාහ කරනවා. ඒ නිසා මා මුලින්ම මේ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්නම්.

දැන් අපි මේ කථා කරගෙන යන ඩොලර් මිලියන 2.5ක ගෙවීමට අදාළ සිදුවීම ගැන පරීක්ෂණ සිදුවෙමින් තිබෙනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විතරක් නොවෙයි, අභ්‍යන්තර කමිටු, ජාත්‍යන්තර පරීක්ෂණ සංවිධානත් මෙයට සම්බන්ධ වෙලා තිබෙනවා. පරීක්ෂණ සිදුවෙමින් තිබෙනවා. ඒ පරීක්ෂණ නිසි පිරිදි, නිසි වෙලාවට ආරම්භ කරලා තිබෙනවා. හැබැයි කලින් ආණ්ඩුවලදී යම් යම් කාරණාවලට පරීක්ෂණ කරලා, විගණන වාර්තාවලින් එළි දක්වපු තොරතුරු මත ගත්තු කිසිදු ක්‍රියාමාර්ගයක් නැහැ. අපි ඒවා ගැනත් ඉදිරියේදී පරීක්ෂණ කරනවා. මා ඉන් එකක්, දෙකක් පමණක් කියන්නම්. එකක් තමයි ඉතාම සුප්‍රසිද්ධ, ඔබ කවුරුත් දන්න hedging deal එක. එමඟින් සිදු කරපු ගනුදෙනුව හරහා - ඒවා තමයි විශාල අලාභ - ඩොලර් මිලියන ගණනක අලාභයක් ලැබුවා. විශේෂයෙන් තෙල් මිල පහළ යැමේ ප්‍රවණතාවක් තියෙද්දි hedging ගිවිසුමකට ගියා. එහිදී තෙල් මිල පහළ යාම නිසා ඇති වෙච්ච අලාභය පමණක්ම රුපියල් බිලියන 14.02ක්. ඊට පස්සේ, මේක නීත්‍යනුකූලව ඇති කරගත්තු ගනුදෙනුවක් නිසා ඒ ගනුදෙනුවට සම්බන්ධ විවිධ පාර්ශ්ව අධිකරණය ඉදිරියට ගියා. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවත් ගියා. ඒ වාගේම සමහර බැංකු දාපු නඩු තවමත් pending තිබෙනවා. ඒවාට ඩොලර් මිලියන 60ක් ගෙවලා තිබෙනවා. සමහර බැංකු negotiation level එකකට ඇවිල්ලා තිබෙනවා. මේ වාගේ පාඩු සිද්ධ වෙලා තිබෙනවා, ඒ ගනුදෙනුවේදී. ඊට අමතරව ප්‍රසිද්ධ ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කරලා තිබෙනවා. ඒක සාමාන්‍ය මූල්‍ය ආයෝජනයක් නොවෙයි. ග්‍රීසියේ බංකොලොත්භාවය ප්‍රදර්ශනය වෙමින් තිබෙද්දි, මූල්‍ය අර්බුදයකට යනකොට තමයි මේ ආයෝජනය කරන්නේ. එතැනින් වුණු පාඩුව රුපියල් බිලියන 1.84ක්. විගණන වාර්තාවලින් ඒක එළිදරව් වෙලා තිබෙනවා. ඒ වාගේම එහිදී ඒ බැඳුම්කර අවදානම් කියලා හිතලා කලින් විකුණලා - ඉක්මනින් විකුණලා - එතැනම ඩොලර් මිලියන 6.6ක් පාඩු සිදු කරගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා කරපු සමහර ගනුදෙනු ගත්තාම, ගිවිසුම් ඇති කර ගනිද්දීත් වංචා, දූෂණ කරලා තිබෙනවා, ගිවිසුම් අවලංගු කරද්දීත් වංචා දූෂණ කරලා තිබෙනවා. අප කවුරුත් දන්නා SriLankan Airlines එකේ සුප්‍රසිද්ධ ගනුදෙනුව ගත්තත් එහෙමයි. SriLankan Airlines එකට එයාර්බස් ගැනීමට කල් බදු - leasing - ගිවිසුමකට යන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා, කල්බදු ගිවිසුමක් කියන්නේ අවලංගු කරන්න බැරි එකක් බව, irrevocable agreement එකක් බව. හැබැයි, ඒ agreement එක ඇති කර ගන්න කොට ඩොලර් මිලියන ගණන් වංචා කළා කියලා දැන් ජාත්‍යන්තර මට්ටමිනුත් ඔප්පු වෙලා තිබෙනවා. ඒවායේ එකතුව ගත්තාම ඩොලර් බිලියන ගණනක් වෙන්න පුළුවන්. ඒ ගිවිසුම අවලංගු කිරීම නිසාත් ඩොලර් මිලියන 115.7ක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා; ගිවිසුම අවලංගු කිරීමේ දඩ මුදල් ගෙවන්නත් සිද්ධ වෙලා තිබෙනවා. අප ලබා දුන් අත්තිකාරම් ද හම්බ වෙලා නැහැ. මේවා එකින් එක ගත්තොත්, විගණන වාර්තාවෙන් පැහැදිලිව ඔප්පු වෙලා, සමහර ඒවා උසාවියට - අධිකරණයට - ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත්, ඒවා අය කර ගෙන තිබෙන්නේ කොහෙන්ද, ඒවාට වග කියන කණ්ඩායම් කවුද කියන එක ගැන කරුණු ඉදිරිපත් කරලා නැහැ. ඒ කිසිවක් කරලා නැහැ.

මෑතකදී අපේ ආණ්ඩුවට තීන්දුවක් ගන්න සිදු වුණා, අත්හැර තිබුණු ව්‍යාපෘති, අතරමඟ නවත්වපු ව්‍යාපෘති, ප්‍රමාද වෙච්ච ව්‍යාපෘති නැවත පටන් ගැනීම සම්බන්ධයෙන්. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියත් ඒ වාගේ එකක්. 2015 - 2019 කාලයේදී මධ්‍යම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම්වලට අදාළ කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම අත්සන් කර තිබෙන්නේ ඉතාම අවාසිදායක විධියට. ඒ කාල පරිච්ඡේදයේදී කිසිම වියදමක් කරලා නැහැ. හැබැයි, 2015දී තිබුණු විදේශ විනිමය අනුපාතයට තමයි අපි 2020න් පස්සේ වියදම් කළාමත් bills settle කරන්න ඕනෑ. ඒවා නීත්‍යනුකූලව ගිවිසුම්වලට ඇතුළත් කරලා තිබෙනවා. ඒවා ගැන බැලුවේ නැද්ද? ඒවායෙන් තමයි විශාල වශයෙන් පාඩු සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ, වගවීම් විරහිතභාවය නිසයි. ඒ කාල පරිච්ඡේදයේදී වියදම් කරලා නැහැ. ඒ අනුව, විදේශ විනිමය අනුපාතයේ වෙනස නිසා අපට දැනටමත් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා, රුපියල් බිලියන 18කට ආසන්න මුදල් ප්‍රමාණයක්. දැන් අපට ගන්න තිබෙන තීන්දුව මොකක්ද? එක්කෝ ඒගොල්ලෝ එක්ක නඩු කියන්න වෙනවා. හැබැයි, නඩු කිව්වත් මෙහි තිබෙන නීතිමය තත්ත්වයේදී දිනන්න තිබෙන ඉඩ කඩ අඩුයි. එම නිසා අපට ඒ මුදල්වල පාඩුව දරාගෙන ඉදිරියට යන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම මහ බැංකු බැඳුම්කර වංචාව

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

පිළිබඳව ගත්තොත්, ඒවා ඔප්පු වෙලා තිබෙන විගණන වාර්තා තිබෙනවා. ඒවා පිළිබඳ පරීක්ෂණ කටයුතු සිදු වෙමින් යනවා. මම මේ කිහිපයක් පමණයි සඳහන් කළේ.

ඊළඟට, මම මේ ප්‍රස්තුත කාරණය පිළිබඳව අදහස් ටිකක් ඉදිරිපත් කරන්නම්. මෙහිදී අපි විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් කියැවුණා වෙනත් සංවිධානයක් තමයි - තුන්වැනි පාර්ශ්වයේ සංවිධානයක් තමයි - පළමුවරට මේ ගැන සමාජයට කිව්වේ කියලා. ඒක පට්ටපල් බොරුවක්. එහි පසුබිම් කථාව ගත්තාම, ඒ තුළ සිද්ධි ජාලයක් ගැට ගැහිලා තිබෙනවා. ඒ සිද්ධි ජාලය ගැන මා කියන්නම්. පළමුවැනි වතාවට මෙවැනි සැක සහිත ගනුදෙනු වාර්තා වෙන්න ගන්නවා ජනවාරි මාසයේ 09වැනි දා, ඉන්දියාවට ගෙවන්න ඕනෑ ණයක් සම්බන්ධයෙන්, ජර්මනියට ගෙවන්න ඕනෑ ණයක් සම්බන්ධයෙන්. ඒ මොහොතේදී තමයි මහා භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට හසු වෙන්නේ, ඔවුන් දැනුවත් වෙන්නේ ඊමේල් එකක් වැරැදි ආකාරයට භාවිත කරනවා කියලා. ඒ අනුව ඔවුන් වහාම මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාව දැනුවත් කළා. ඒ සැනින් මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා අදාළ ක්‍රියාමාර්ග ගත්තා. SLCERT එක, CID එක දැනුවත් කරලා මේ පිළිබඳව පරීක්ෂණ කරනවා. එතැනදී කිසිදු ගෙවීමක් සිද්ධ වුණේ නැහැ. එතැනදී ඔප්පු වුණා, අප භාවිත කරන ඊමේල් පද්ධතියේ; තාක්ෂණයේ ගැටලු ගණනාවක් තිබෙනවා කියලා. ඒ කියන්නේ, දශක ගණනාවක් කරගෙන ආපු මේ ක්‍රමවේදයේ; මේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයේ ගැටලු තිබුණා. ඒ ගැටලුවලට අපි තාවකාලික ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ඒ වාගේම, අලුත් ක්‍රමවේදයක් ගෙනැල්ලා system එක වෙනස් කරමින් යනවා. ඒ මොහොතේදී ක්ෂණිකව passwords වෙනස් කරලා අදාළ ක්‍රියාමාර්ග ගත්තා. ඒකේ දෙවැනි පියවරක් විධියට තමයි භාණ්ඩාගාරයේ ලේකම්තුමා නියෝගයක් ලබා දෙමින් අභ්‍යන්තර කමිටුවක් පත් කළේ, 2025 වර්ෂයේ ඉඳලා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ණය ගිවිසුම්වල මේ විධියට ගෙවීම් සිද්ධ වෙලා තිබෙනවාද කියා පරීක්ෂා කර බලන්න කියලා. ඒ සම්බන්ධව පරීක්ෂණ කරගෙන යනවා. ඒ පරීක්ෂණ කාලය තුළදී අපි ඊමේල් පද්ධතියට අදාළ වෙනස්කම් සිදු කළාට, Export Finance Australia කියන company එකට ඩොලර් මිලියන 2.5ක මුදලක් ගෙව්වා කියා ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලය හරහා අපට ඇත්තටම දැන ගන්න ලැබෙන්නේ හරියටම මාර්තු මාසයේ 23වන දා. එහෙම නම්, ඔය කියන සංවිධානය ඒ ගැන මාර්තු මාසයේ 23වන දා කිව්වාද? මාර්තු 23වන දා කිව්වේ නැහැ. හැබැයි මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා මාර්තු 23වන දා ඒ සැනින්ම - ඒ මොහොතේම - පරීක්ෂණ කිරීම සඳහා CID එකට ලිඛිතව දැනුම් දුන්නා, SLCERT එකට දැනුම් දුන්නා, ඒ වාගේම FIU එකට දැනුම් දුන්නා, මේ කටයුත්ත සිද්ධ කරන්න කියලා. 24වන දාම CID එකට දැනුම් දුන්නා. අභ්‍යන්තර කමිටුව 23වන දා පත් කළා. ඒ වාර්තාවේ ප්‍රතිඵල විධියට තමයි යම් යම් සේවකයන්ගේ සේවය තාවකාලිකව අත්හිටුවීම කළේ. ඇත්තටම ඔය කියන තොරතුරු එළියට ආවේ අප්‍රේල් 10වන දා ලැබුණු වාර්තාවට අනුව 17වන දා ඒ සේවකයන්ගේ සේවය තාවකාලිකව අත්හිටෙව්වාට පසුව එන තොරතුරක් නිසා. එහෙම නම්, විපක්ෂය මේ සම්බන්ධයෙන් සමාජගත කරන කරුණු ඉතාම වැරැදියි කියන කාරණය කියන්න ඕනෑ.

ඒ වාගේම එතැනදී සිද්ධ වෙච්ච දේ මොකක්ද? අපි කවුරුත් දන්නවා, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියත් එක්කම මේ ණය කලින් ගෙවාගෙන ගියේ මහ බැංකුවේ Public Debt Department එක බව. ඒ වාගේම එය සම්බන්ධීකරණය කළේ මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ Department of External Resources. මුදල් ගෙවීම් නිදහස් කළේ Department of Treasury Operations. මේ විධියට ණය ආපසු ගෙවීම; විශේෂයෙන්ම බහුපාර්ශ්වීය සහ ද්විපාර්ශ්වීය ණය ආපසු ගෙවීම සම්බන්ධීකරණය සහ ගෙවීමේ කටයුතු විසිරිලා තිබුණේ; වගකීම් එක් එක් තැන්වල තිබුණේ. ඒ නිසා තමයි ඒ මූල්‍ය කළමනාකරණයේ විධිමත්භාවය ගෙන එන්න විශේෂ පනතක් - 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත - ගෙන ආවේ.

මේ වගකීම් එක් තැනකට ගෙනෙන්න ඕනෑ. අපි කවුරුත් දන්නවා, දශක ගණනාවක් තිස්සේ යම් යම් ක්‍රමවේද තිබිලා අපි එක් තැනකට මේ වගකීම් ගෙනැල්ලා ඒකාග්‍ර කරන්න යන කොට සියල්ල එකවර කරන්න බැරි වන බව. මේ වගකීම් ස්ථාපිත කර ගන්න කොට යම් යම් වැරැදි අඩුපාඩු සිද්ධ වෙන්න පුළුවන්. තවමත් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට සියලුම කටයුතු ගෙනැල්ලා නැහැ. මොකද, External Resources Department එකෙනුත් යම් වැඩ කටයුත්තක් කරනවා. අපි වේගයෙන් මේ කටයුතු වෙනස් කරන්න බලාපොරොත්තු වෙනවා. මෙන්න මේ අවස්ථාවේදී තමයි අප මේ කියන ඩොලර් මිලියන 2.5ක ගනුදෙනුව සිද්ධ වෙන්නේ. එතැනදීත් ඉතාම වැදගත් විධියට සුපරීක්ෂාකාරීව බලන්න වෙනවා, මොකක්ද මේ වුණේ කියලා. ඒ ගැන මාර්තු 23වන දා වාර්තා වුණාට පසුව මුදල් අමාත්‍යාංශය වේගයෙන් ඒ තොරතුරු පිළිබඳව සොයා බලනවා. එසේ සොයා බැලුවාට පසුව දැනෙනවා, ඊමේල් එකක් භාවිත කරලා වැරැදි තොරතුරු ලබා දීලා, වැරැදි ගිණුම් අංකයක් ලබා දීලා මේ මුදල් ගෙවීම සිද්ධ වෙලා තිබෙනවා කියලා. ඒ ගෙවීමේදීත් ඉතාම වැදගත් සිද්ධි ගණනාවක් වෙනවා. External Resources Department එකෙන්, ඒ අදාළ නිලධාරියා අතින් ඒ තොරතුර රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට යනවා. එය ඔහුගේ අතපසුවීමක්ද නැද්ද, ඔවුන් මෙයට සම්බන්ධ ද කියන කාරණය අපි පරීක්ෂණවලදී සොයා ගනිමු. ඒ කාර්යාලයෙනුත් එය නිවැරැදි බව තහවුරු කරමින්, අදාළ මුදල තහවුරු කරමින් මහ බැංකුවට යනවා. එතැනදී මේ ගෙවීම්, අලුත් ක්‍රමවේදය යටතේ ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ කියන්නේ, Standard Settlement Instructions යටතේ. Non-Reserve Management - ඒ කියන්නේ, සංචිත නොවන දේ කළමනාකරණය කිරීම - සඳහා මේ Standard Settlement Instructions යටතේ ගිණුමක් විවෘත කරන්න ඕනෑ. මේ ණය ප්‍රතිව්‍යුහගතකරණය කරලායි තිබුණේ, Export Finance Australia කොම්පැනියෙන්. ඒ ණය ප්‍රතිව්‍යුහගතකරණය කර තිබුණු නිසා මෙන්න මේ අලුත් අංකය ඉදිරිපත් කිරීමේදී කණ්ඩායම් දෙක තුනක් ඒකාබද්ධවයි මේ වැඩ කටයුතු කරන්නේ. මුදල් අමාත්‍යාංශයත් සම්බන්ධ වෙනවා, මහ බැංකුවත් සම්බන්ධ වෙනවා. අර පරිවර්තනීය කාලයකදී තමයි මේ ගැටලුව ඇති වන්නේ. කුමක් හෝ හේතුවක් නිසා මූලික ගිවිසුමේ තිබෙන අංකය වෙනුවට අර email hacker විසින් ඉදිරිපත් කරන ලද අංකය මේ SSI එක හරහා system එකට ඇතුළත් වෙනවා. ඒක තමයි ගිණුම් අංකය. ඒක ඇතුළත් වුණාට පස්සේ- *[බාධා කිරීමක්]* විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙකුත් ඒ ගැන සඳහන් කළා. ඔබතුමන්ලා ඒක මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමාගේද කාගේද ගිණුම් අංකයක් කියලා කිව්වේ. එහෙම නම්, ඔබතුමන්ලා හොයාගත්තු ඒ තොරතුරු ඉදිරිපත් කරන්න. ඉතින් ඒක තැන්පත් වුණාට පස්සේ එය ස්වයංක්‍රියව ඇමෙරිකාවේ TD Bank ගිණුම හරහා තමයි ගිහින් තිබෙන්නේ; ඒ බැංකුව හරහා තමයි ගිහින් තිබෙන්නේ. ඒ ගිණුම හරහා ගියාට පස්සේ අදාළ මුදල් ගත් පුද්ගලයාත්, ඔහුගේ ගිණුම් අංකයත් සමපාත වෙනවා. ඒ නිසා තමයි මහ බැංකුවෙන් නිදහස් කරපු සල්ලි එතැනින් ගිහින් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. පරිවර්තනීය කාලයකදී ගෙවීමේ ක්‍රමවේදයේ අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. හැබැයි, මේ සිද්ධි දාමය ඇතුළේ

ඉතාම පැහැදිලිව තහවුරු වෙනවා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා, අදාළ නිලධාරීන් ක්ෂණිකව මැදිහත් වෙලා මේ ක්‍රියාමාර්ග ගත්තා කියලා. දැන් එතැනින් විතරක්, ඒ පරීක්ෂණවලින් විතරක් මේක නතර වෙන්නේ නැහැ. මොකද, අපි සියලුම දේ, අතීතයේ තිබෙන වැරැදි අඩුපාඩු එකවරම දකින්නේ නැහැ නේ. දැකපු පළමු මොහොතේ ඉඳලාම අපි ඒක නිවැරැදි කර ගන්නවා. අතීත අඩුපාඩු විතරක් නොවෙයි, ඉදිරියේදීත් මේ විධියට නැවත අඩුපාඩුවක් නොවන ආකාරයකට අභ්‍යන්තර පාලන ක්‍රමවේදය අපි සකස් කරමින් ඉන්නවා. Commonwealth Secretariat එකේ තිබෙන ගෙවීම් පාලනය කිරීම, වාර්තා කිරීම සහ ණය කළමනාකරණය කිරීමේ පද්ධතිය තමයි දැන් අප සතුව තිබුණේ. ඒක තමයි Back Office operation එක පාවිච්චි කළේ. අපි ඒකෙන් එහාට ගිහිල්ලා නව මිල දී ගැනීමක් කරනවා. ඒ තමයි, Commonwealth Meridian software system එක. ඒක මේ අගෝස්තු මාසයේ ඉඳලා implement වෙනවා. මේ කෙටි කාලය ඇතුළේ මේ කටයුතු සිද්ධ වෙලා තිබෙනවා. අපි සහතික කරලා කියනවා, ඉදිරියේදී මේ පරිපාලන ක්‍රමවේද අපි ක්‍රමිකව ශක්තිමත් කරලා, මේ මූල්‍ය වගවීම නිසි ආකාරයට සිද්ධ වන විධියට අවශ්‍ය වෙනස්කම් ටික සිද්ධ කරනවා කියලා. ඒ නිසා අපේ කාලයේ සිද්ධ වෙච්ච ගනුදෙනුවක් ද, අතීතයේ සිද්ධ වෙච්ච ගනුදෙනුවක් ද කියන එක අපට අදාළ වෙන්නේ නැහැ. අපි මේ පරීක්ෂණ ඉහළින්ම සිද්ධ කරනවා. පරීක්ෂණ ඉහළින්ම සිද්ධ කරනවා විතරක් නොවෙයි, මේ පරීක්ෂණවල ප්‍රතිඵල අනුව කවුරුන් හෝ වැරැදිකරු බවට පත් වෙලා තිබෙනවා නම්, ඒ අයට අදාළ නීති රීති රාමුව ඇතුළේ දඬුවම් විඳින්න සිද්ධ වෙනවා.

මම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ටත් යෝජනා කරනවා, ඇත්තටම මේ වාර්තාවෙන් ඉදිරිපත් කරන්නේ මොකක්ද, මෙහි සිද්ධ වුණේ මොකක්ද යනාදි වශයෙන් මේ සිද්ධි ගැන අධ්‍යයනය කරලා මේ පිළිබඳ පරීක්ෂණවලට සහාය දෙන්න කියලා. එහෙම නැතිව ඔබ අධිකරණයෙන් එළියේ ඉඳගෙන වෙනත් පරීක්ෂණ කණ්ඩායම් විධියට නිගමනවලට ගිහින්, අරයා වැරැදියි, මෙයා වැරැදියි කියන්න එපා. ඉදිරියේදී අපි ඒ තොරතුරු මේ ගරු සභාවටත්, මහ ජනතාවටත් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කරනවා වාගේම, ජනතාවට සහතික වෙනවා අපි මේ මූල්‍ය විනය මේ ආකාරයෙන්ම ආරක්ෂා කරමින්, ඔබ ගෙවන සෑම සතයක්ම, රුපියලක්ම ඔබේ බදු මුදල් නිසියාකාරයෙන් මහජන යහපත වෙනුවෙන් භාවිත කරනවා කියලා. ඒ අදහසත් ඉදිරිපත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

ගරු ෆස්මින් ෂරීෆ් මහතා
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද අපි කථා කරනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් වංචා කරපු ඔස්ට්‍රේලියාවේ හිටපු හැකර්ලා පිළිබඳව. ඒ වුණාට, විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අද අමතක වෙලා තිබෙනවා, මහ දවාලේ මහ බැංකුව කඩලා කෝටි ගණන් හොරකම් කරපු එක ගැන. ඒ වාගේම, footnotes දමපු එක ගැන අමතක වෙලා තිබෙනවා. ඒ වාගේම, මහින්දානන්දලා ගෙනාපු අසූචි පොහොර ගැනත් ඇත්තටම අමතක වෙලා තිබෙනවා. ඇත්තම කියනවා නම්, විරුද්ධ පක්ෂයේ ඉන්න මේ මන්ත්‍රීවරු අද කලබල වෙලා, බය වෙලා ඉන්නේ අපේ විනිශ්චයකාරතුමන්ලාගේ විශ්‍රාම යන වයස අවුරුදු දෙකකින් දික්කරන එක සම්බන්ධවයි.

ඒ වාගේම, ගම්පොළ ගැනත් මම කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම මම මේ අවස්ථාව ඉල්ලා ගත්තේ ඒ හින්දා. ඔබතුමන්ලාත් දන්නවා, "දිට්වා" නිසා ගම්පොළ ජනතාව ආපදාවට ලක් වෙලා මාස 7ක්, 8ක් යනකොට තව පාරක් ගංවතුර ඇවිල්ලා ඇත්තටම පවුල් හත්අටසීයක් ආපදාවට ලක් වුණු බව. "දිට්වා" එනකොට ඇත්තටම අපට ඒ ගැන පෙර අවබෝධයක් තිබුණේ නැහැ; experience එකක් තිබුණේත් නැහැ. ඒ නිසා ඒ හානිය අවම කර ගන්න ලොකුවට මැදිහත් වෙන්න බැරි තත්ත්වයකට අපි පත් වුණා. ඒ වුණාට, මේ පාර අපි සැලසුමක් හදලා තිබෙනවා. ඒ ගැන අපි අපේ ගරු ලාල් කාන්ත ඇමතිතුමාටයි, මහවැලි අධිකාරියේ නිලධාරින්ටයි ස්තුති කරන්න ඕනෑ. ඒ වාගේම Kotmale Dam එකේ ධාරිතාව සම්පූර්ණ වෙන්න කලින්; මීටර් 2ක්, 3ක් තිබියදී වාන් දොරටු ඇරපු නිසා ජනතාවට වන හානිය අවම කර ගන්න අපිට පුළුවන් වුණා.

நான் எனது முன்னைய பாராளுமன்ற உரையில், எதிர்க்கட்சியிலுள்ள முஸ்லிம் MPs மஹர சிறைச்சாலை வளாகத்திலுள்ள பள்ளிவாசல் சம்பந்தமாகவும், அல்-குர்ஆன் மொழிபெயர்ப்புப் பிரதிகள் தடுத்து வைக்கப்பட்டுள்ளமை சம்பந்தமாகவும்தான் எந்தநேரமும் கதைப்பதாகச் சொன்ன தற்கு, றஸ்மின் என்று சொல்லப்படுகின்ற YouTuber மிகவும் கடுமையான வார்த்தைகளைப் பிரயோகித்து, என்மீதும் ஆளும் தரப்பிலுள்ள ஏனைய முஸ்லிம் MPsமீதும் வீண்பழி சுமத்தியுள்ளார். நான் அவருக்கு முக்கியமாக ஒரு விடயத்தைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். எதிர்க்கட்சியினரின் எலும்பைச் சூப்பக்கூடிய நீங்கள், அவர்களின் பணத்துக்கு அடிமையாகிக்கொண்டு இருக்கின்ற நீங்கள், ஆளும் தரப்பிலுள்ள முஸ்லிம் MPsஐப் பற்றி இனிமேலும் இவ்வாறு கதைப்பீர்கள் என்றால், உங்களுக்கு எதிராக எங்கள் அரசாங்கத்தின்மூலம் சட்ட நடவடிக்கை எடுப்போம். எங்களுடைய அரசாங்கம் இனவாதமில்லாத அரசாங்கம்! மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய ஆட்சிக் காலத்தில் இந்த எதிர்க்கட்சி MPs எங்கே இருந்தார்கள்? எங்கே இருக்கிறார்கள் என்று தெரியாத அளவுக்கு வாயைப் பொத்திக்கொண்டு இருந்த இவர்கள், நாங்கள் மஹர சிறைச்சாலை வளாகத் திலுள்ள பள்ளிவாசல், அல்-குர்ஆன் மொழிபெயர்ப்புப் பிரதிகளை விடுவிப்பது தொடர்பில் நடவடிக்கை எடுக்கும் போது, அந்த pointsஐ தாங்கள் எடுத்துக்கொள்வதற்கான முயற்சிகளைத்தான் எப்பொழுதும் மேற்கொள்கின்றார்கள்.

கம்பளை நகர சபையை முன்னர் நிருவகித்த UNP மற்றும் இப்போது நிருவகிக்கின்ற SJBஇன் பிழையான தீர்மானங்கள் மூலம்தான் இப்பொழுது கம்பளைப் பிரதேசம் வெள்ளத்தால் அடிக்கடி பாதிக்கப்படுகின்றது. இதனால் நாங்கள் பல்வேறு கஷ்டங்களை அனுபவிக்கின்றோம். இந்த நகர சபையின் முன்னாள் உறுப்பினரும் - அவர் பிரதி நகர பிதாவாக இருந்தவர் - ஒருசில வியாபாரிகளும் கான்களை மறித்து கட்டடங்களைக் கட்டியிருப்பதன் காரணமாகத்தான் பெபில்ல பிரதேசம் இன்று அடிக்கடி வெள்ளத்தால் பாதிக்கப்பட்டுக் கொண்டு இருக்கின்றது. நாங்கள் இது சம்பந்தமாக சட்டப்படி நடவடிக்கைகளை எடுத்து, அந்தக் கான்களைத் துப்புரவு செய்து, மக்களுக்கு ஏற்படுகின்ற வெள்ளப் பிரச்சினையை நிச்சயமாக நிவர்த்தி செய்வோம்.

நான் இங்கு இன்னுமொரு விடயத்தைக் குறிப்பிட்டாக வேண்டும். இந்தத் தடவை எங்களுடைய பிரதேசத்தில் வெள்ளம் ஏற்பட்டபோது, பள்ளிவாசல்கள், கோயில்கள், 'பன்சலை'கள் என அனைத்து மதம் சார்ந்த நிறுவனங்களும்

[ගරු ෆස්මින් ෂරීෆ් මහතා]

சேர்ந்து உதவி செய்தன. குறிப்பாக, அங்கு இருக்கக்கூடிய இளைஞர்கள் எல்லா வகையிலும் உதவி செய்தார்கள். அதேபோன்று, மாண்புமிகு சனாதிபதி அவர்களும் அரசாங்கமும் எங்களுக்குத் தேவையான அனைத்து உதவிகளையும் செய்கிறார்கள். இலங்கை வரலாற்றில் முதற் தடவையாக 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட 57 தமிழ் குடும்பங்களுக்கு முகவரியை ஏற்படுத்திக் கொடுத்து, அவர்களுக்குக் காணிகளைக் கொடுத்து, வீடுகளை அமைப்பதற்காக முதலில் 20 இலட்சம் ரூபாயை எங்களால் கொடுக்க முடிந்துள்ளது. மிகுதி 30 இலட்சம் ரூபாயை அவர்கள் வீடுகளை அமைக்கும்போது கொடுக்கக்கூடியதாக இருக்கும்.

இன்னொரு முக்கியமான விடயத்தைக் கூற விரும்புகின்றேன். கம்பளைப் பிரதேசத்தில் இந்தத் தடவை ஏற்பட்ட வெள்ளத்தால் சேர்ந்த ஊத்தையைக் கொட்டுவதற்குக் கூட நகர சபையால் ஓர் இடத்தைத் தெரிவுசெய்ய முடியாமல் இருக்கின்றது. அவ்வாறானதொரு ஒரு நகரபிதாதான் அங்கே இருக்கிறார். வாகனங்களை அனுப்புவதற்காக நடைமுறைப் படுத்தப்பட்டுள்ள முறையற்ற திட்டத்தின்மூலம் கம்பளை நகரத்தில் பாரிய போக்குவரத்து நெரிசல் ஏற்படுகின்றது. நாங்கள் சொல்வதைக்கூட கேட்காத நகரபிதா நடந்துகொண்ட விதத்தைப் பார்க்கும்போது அங்கேயும் ஊழல் நடைபெற்றுள்ளதா? என எண்ணத் தோன்றுகின்றது. அவர் எந்தவித அனுமதியையும் பெறாமல் அந்த boardsஐ அடித்து இருக்கிறார். கடைசியில் அந்த boardsஐ நகர சபையின் குப்பையில் போட்டு வைத்திருக்கக்கூடிய நிலைமைதான் இருக்கின்றது. நாங்கள் இது சம்பந்தமாக எதிர்வருகின்ற காலங்களில் சட்ட நடவடிக்கை எடுக்கவுள்ளோம். குறிப்பாக, அங்கு ஊழல் நடைபெற்றுள்ளதா என்பதை அறிவதற்கான முயற்சிகளை மேற்கொண்டுள்ளோமெனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.24]

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අස්ථානගත ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක මුදල සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ, කමිටුවේ සභාපති ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා අද මේ ස්ථානයේ නැහැ, එතුමාගේ පියාණන් වන හරිස් ද සිල්වා මැතිතුමාගේ අභාවය නිසා. ඒ පියතුමාට අපි නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

මෙම වාර්තාව සකස් කිරීම පිළිබඳව ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාට ආණ්ඩු පක්ෂයේ ස්තුතියත් ලැබුණා. එතුමා මෙන්ම කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරු සහ කාර්ය මණ්ඩලයත් මේ සඳහා විශාල වශයෙන් මහන්සි වුණා. කාරක සභාවේ සාමාජිකයකු විධියට මමත් ඒක දැක්කා. එම නිසා ඒ සියලුදෙනාට ස්තුතිවන්ත වෙන්නට මමත් මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙහි ඇති සියලු තාක්ෂණික කාරණා පිළිබඳව කථා වුණා. එම නිසා මම නැවත ඒවා කියන්නට යන්නේ නැහැ. මොකද, මේ වෙනකොට සියලුදෙනා ඒ පිළිබඳව දැනුවත්. හැබැයි, මට කියන්නට තිබෙන්නේ, සල්ලිවලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් නැතිවෙලා බවයි. අපේ රටේ බදු ගෙවන මිනිසුන්ගේ සල්ලිවලින් ඒ ප්‍රමාණය නැතිවෙලා. Technical කාරණා කෙසේ වෙතත්, මේකෙන් අපට අන්තිමට ගන්නට තිබෙන්නේ එච්චරයි. ඊමේල් මෙහෙමයි, හැකර්ලා මෙහෙමයි, account numbers මෙහෙමයි කිව්වත්, අන්තිමට කියන්න තිබෙන්නේ, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් නැහැ කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා අපි අහගෙන සිටියා. මේ වෙලාවේ එතුමන්ලා විපක්ෂයේ හිටියා නම්, ඩොලර් මිලියන 2.5ක් නොවෙයි, ඩොලර් 10,000කට මේ වාගේ දෙයක් වුණත් එතුමන්ලා හැසිරෙන විධිය අපට බලාගන්නට තිබුණා. හැබැයි, අපි එහෙම කළේ නැහැ, මේ කාරණය නීත්‍යනුකූල විධියට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට අරගෙන ගියා. මේ පිළිබඳව ඒ කාරක සභාවේත් වාද විවාද වුණා. අවසානයේ සියලුදෙනාගේම එකඟත්වයෙන් වාර්තාවක් හදලා අද අපි ඒ ගැන කථා කරනවා. ඒක තමයි මේ කරන්නේ. හැබැයි, මේ වෙනකොට මේ ආණ්ඩුවේ පිරිස විපක්ෂයේ සිටියා නම්, කොහොම දඟලයිද කියලා මට හිතාගන්නට පුළුවන්. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජික මන්ත්‍රීවරු ඇතුළුව අද කථා කරපු බොහෝ මන්ත්‍රීවරු මේ subject එක දන්නවා. ඒ මන්ත්‍රීවරුන්ට මේක හොඳට තේරෙනවා. සාමාන්‍යයෙන්, PDD, PDMO, MoF, CBSL, ERD, KPI, ToR, MoU, AML වාගේ දේවල් ගැන තමයි අද මෙතැන වැඩියෙන්ම කථා වුණේ. දැන් මේ වාගේ දේවල් කිව්වාට ඒවා අහගෙන ඉන්න එළියේ මිනිසුන්ට ඒ මොකක්වත් තේරෙන්නේ නැහැ. ඒකයි මම කියන්නේ, ජනතාව අවසාන වශයෙන් තේරුම් ගන්න ඕනෑ තමන් අමාරුවෙන් ගෙවපු බදු මුදල්වලින් ඇමෙරිකානු ඩොලර් මිලියන දෙකහමාරක් නැති වෙලා කියලා. දැනුම් තේරුම් නැතිකමින් මේ අහිමි වෙන්නේ ජනතාවගේ බදු මුදල් කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

විශේෂයෙන් මම පටන් ගන්නම් ලක්මාලි හේමචන්ද්‍ර මැතිනිය කරපු කථාවෙන්. එතුමිය කථාව පටන් ගත්තේම අද කථා කරපු කිසිම මන්ත්‍රීවරයෙක් මේ වාර්තාව කියවලා නැහැ කියලායි. එතුමියගේ හැටි එහෙම තමයි. එතුමිය විතරයි සියලු දේ දන්නේ, අනෙක් කවුරුවත් කිසිම දෙයක් දන්නේ නැහැ කියන මානසිකත්වයෙන් නේ, එතුමිය ඉන්නේ. ඉතින් මට කියන්න තිබෙන්නේ මේකයි. ඔය මානසිකත්වයෙන් ඉඳලා එතුමියත් එතුමියගේ පක්ෂයත් අමාරුවේ වැටෙන කාලය වැඩි ඈතක නොවෙයි. මෙතැන ඉන්නවා, මේ වාර්තාව කියවලා ආපු අය. ඒක අපි දන්නවා. මහන්සි වෙලා කියවලා ආවේ. හැබැයි එතුමිය කියනවා, මේකේ තිබෙන එකක්වත් කියවලා නැහැ කියලා. එතුමිය කියනවා, මේකේ cybercrime කියලා විතරයි තිබෙන්නේ, වංචාවක් කියලා එකක් නැහැ කියලා. එහෙම නේද නිශාන්ත නියෝජ්‍ය ඇමතිතුමා? අප රණ්ඩු වෙලා නේ ඔය වචන දෙකම දමාගත්තේ. ඒක නැහැ කියන්නේ කොහොමද? මේ තිබෙන්නේ, "A fraud linked to cybercrime". මේ "fraud" කියන කොටස අතහැරලා. ඒ මොකක් නිසාද දන්නේ නැහැ. මම ඒකට සුදුසු වචනය කියන්නේ නැහැ. එතුමියගේ මොකක් හරි quality එකක් හින්දා ඒක අතහැරලා කියනවා, "A cybercrime has clearly taken place" කියලා. නමුත් මේ "fraud" කියන වචනය දමන්න අපි මහන්සි වුණා. අපි ඒක දන්නවා. මම මෙතැන කියන්නේ නැහැ, කාරක සභාවේ වෙච්ච දේවල්. හැබැයි, මේ විධියට නම් කථා කරන්නේ, කාරක සභාවේ සිදුවෙච්ච දේවල් අපට කියන්න සිද්ධ වෙනවා. ඒ නිසා "cybercrime" කියන එක විතරක් නොවෙයි, "fraud" කියලාත් ඉතාම පැහැදිලිව මේකේ තිබෙනවා. වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා. වංචාව කියන එක මම ආයෙත්

අර්ථ දක්වන්න ඕනෑ නැහැ නේ. ඒකෙ තේරුම වංචාව, හොරකම. ඒක නිසා ඒක ඒ වාර්තාවේ තිබෙනවා. ඒ, ඔබතුමන්ලාත් එකඟ වෙච්ච කාරණයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)

ආණ්ඩුව උත්සාහ කරන්නේ, "cybercrime" කියන එක ඉස්සරහට දමලා "fraud" කියන එක අයින් කරගන්න. අපට ඒක තේරෙනවා. මම ඒකයි කිව්වේ. මේක කියන්න ආසා නැහැ. නමුත්, කමිටුව ඇතුළේ එහෙමයි සිද්ධ වුණේ. මේ "fraud" කියන වචනය දමනවාට විශාල වශයෙන් විරුද්ධ වුණා; රණ්ඩු සරුවල් වෙන්න සිද්ධ වුණා. ගරු සභාපතිතුමාට විශාල පීඩනයක් එල්ල වුණා. මම දැක්කා, චතුරි ගංගානි මන්ත්‍රීතුමිය කියනවා, CoPF එකේ එහෙම බෙදීමක් වුණේ නැහැ කියලා. එහෙම නොවෙයි, පීඩනයක් එල්ල කරනවා, නැත්තේ නැහැ. ඇවිල්ලා බලන්න පුළුවන් නම් අනෙක් මන්ත්‍රීවරුත් එතැනට ඇවිල්ලා බලන්න. විශාල පීඩනයක් එල්ල කරනවා, සභාපතිතුමාට සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට. ලොකු සටනකින් පස්සේ තමයි "fraud" කියන වචනය දමන්න කැමැති වුණේ. දවසක් සිද්ධ වුණා dictionary එකකුත් ගේන්න. මොකද, කියන කියන වචනය වෙනුවට තව වචනයක් කියනවා. මොකද, ඒ වචනය දාපුවාම ආණ්ඩුවට හොඳ නැහැ කියලා හිතන නිසා. ඒ තමයි දේශපාලනය. ඒක නිසා ඒවා කථා කරන්න මෙතැනට එන්න ඕනෑ නැහැ. ඒ පීඩනය එල්ල කළාය කියන එක මම කියනවා. හැබැයි, අවසාන වශයෙන් අපි දෙගොල්ලන්ම එකතු වෙලා වාර්තාවක් දීලා තිබෙනවා. ඒකේ "වංචාව" කියලා තිබෙනවා. ඇස් ඇරලා බලන්න, ඇවිල්ලා අනෙක් අයට කෑ ගහන්නේ නැතිව. මේක නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි වැඩේ. එතුමිය ඇවිල්ලා ඔය වාගේ දේවල් හැමෝටම කියනවා; කියලා යනවා. අපි පිරිමි විධියට මෙතැනදී කාන්තාවකට මොනවා හරි කියපු ගමන් මේ ඉදිරි පෙළේ ඉන්න සභානායකතුමා හරි කවුරුහරි නැඟිටලා කියනවා, කාන්තාවකට වැරදි විධියට කථා කළා කියලා. මේක කවදා වෙනකල් කරන්න දෙන්නද? අපි හොඳයි. අපි මෙහෙම හරි කථා කරනවා. අර්චුනා මන්ත්‍රීතුමාට වාගේ අහුවුණා නම් හොඳට ලුණු ඇඹුල් ඇතිව අහගන්නවා. ඊට පස්සේ බිමල් රත්නායක ඇමතිතුමාත් නැඟිටලා ඒකට එල්ලෙනවා. ඉතින්, මටත් අහන්න තිබෙන්නේ, එහෙම නම් මොකටද මේ විවාද කරන්නේ කියලායි. ඒ නිසා එහෙම කරන්න එන්න එපා. කථා කරනවා නම් හරියට කථා කරන්න. නැත්නම් විවේචන ඉවසා ගන්න. ඒ වෙලාවට කාන්තා අයිතිවාසිකම් ගැන කියන්න එන්න එපා. මගේ ඉල්ලීම එච්චරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "වංචාව" කියන වචනය මේ වාර්තාවේ තිබෙනවා.

ඊළඟට කියනවා, අපේ මේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට හොරකම් ගැන හොයන්න අයිතියක් නැහැ කියලා. කවුද ඉතින් එහෙම කිව්වේ? මුදල් කාරක සභාවට එහෙම අයිතියක් නැහැ. ඒක මේ වාර්තාවේ තිබෙනවා. ඒකට තමයි CID, අරවා මේවා තිබෙන්නේ. බය නැතුව කියනවා නේ දැන් CID යන්න කියලා. ලජ්ජයි නේ. CID එකට තමන්ගේම පක්ෂයේ හෙංචයියෝ දමාගෙන අපට කියනවා CID යන්න කියලා. ඊට වඩා හොඳයි පැලවත්තට ගිහිල්ලා පැමිණිල්ල දමන්න කිව්වා නම්. ඉතින්, ඒක කියන්න ඕනෑ නැහැ. අපි දන්නවා CID එකට තමයි යන්න ඕනෑ කියලා. CID එකට පැමිණිලිත් කරලා තිබෙනවා නේ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන් හෙව්වේ නැහැ, කවුද හොරු කියලා. අපට ඒක හොයන්න අයිතියකුත් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඒක නිසා මේ ආයතන දෙක අතර - ශ්‍රී ලංකා මහ බැංකුවත්, Treasury එකත් - තිබෙන සම්බන්ධතාව ගැන ප්‍රශ්නයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. ඒ ආයතන දෙකේ ප්‍රධානීන් දෙන්නාත් මේ කමිටුවට ඇවිල්ලා මතවාදීව ගැටුණා. සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා මෙතැනදී කිව්වා, CoPF එකේ Chairmanට ගොඩක් ස්තුතියි කියලා. මොකද, එතුමා දාලා තිබෙන නිර්දේශවලට කාටවත් විරුද්ධ වෙන්න බැහැ. ඒ වාගේම එතුමා කියනවා, මේ වාගේ වංචාවක් නැවත නොවෙන්න timeline එකක් එක්ක වාර්තාවක් දෙන්න කියලා. ඔව්, අපි දෙනවා. අපි දැන් කිව්වා එවැනි නිර්දේශ ලැයිස්තුවක්. මේ විධියටම ජනවාරිවල ඉල්ලා තිබෙනවා නේ, මේ දෙගොල්ලන්ගේ coordination එක ගැන අපට සාකච්ඡාවක් දෙන්න කියලා. දුන්නාද? එතකොට, "Please, එපා" කියන මානසිකත්වයෙන් තමයි ඒකට උත්තර දුන්නේ.

2026 අප්‍රේල් 26වන දා දෙදෙනාම අත්සන් කරලා ලියුමක් එවනවා නේ. මම ඒක සභාගත කරන්න අවශ්‍ය නැහැ. මම හිතන විධියට, ඒක මේ වාර්තාවට අමුණලා තිබෙනවා. මොකක්ද ඒකේ කියන්නේ? It states I quote:

> "… 'A policy-level discussion with the officials of the Ministry of Finance, Planning and Economic Development (MoF) and the CBSL to address concerns regarding coordination between fiscal and monetary authorities' are adequately addressed …"

"Please එපා" කියලා කියන්නේ; "අපි ඒක කරගන්නම්, ඒ ඔක්කොම හරි" කියලා කියන්නේ.

It further states, I quote:

> "Accordingly, given several well-functioning mechanisms in already place to ensure effective and timely coordination, we are of the view that there are no such concerns regarding coordination requiring deliberation at this juncture."

දැන් ඔය කළේ! ජනවාරි මාසයේ මේක කිව්වාම තිබෙන උද්ධච්චකමට මොකක්ද කළේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්කෝ උද්ධච්චකම; එක්කෝ තක්කඩිකම: එක්කෝ මේ වෙද්දි වැඩේ වෙලා කියලා දන්නවා. ඒක නිසා මේ සාකච්ඡාව දෙන්න බැහැ. එහෙම නැත්නම්, තිබෙන උද්ධච්චකම. හැබැයි දැන් ඇවිල්ලා කියනවා, ඉල්ලන ඕනෑ වාර්තාවක් අපි දෙන්නම් කියලා. ඔය නිහතමානීකම ජනවාරි මාසයේ තිබුණා නම්, මම හිතන විධියට මේක මීට වඩා හොඳ විධියට විසඳෙනවා. ඒක තමයි මට කියන්න තිබෙන්නේ. ඒ වෙලාවේ කිව්වේ නැහැ. දැන් අපට මේවා ගැන කියන්න එනවා.

අපේ චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු කථා කරපු බහුතරයක් ඩොලර් මිලියන 2.5 ගැන නොවෙයි කථා කළේ. මහ බැංකු බැඳුම්කර සිද්ධියේ ඉඳලා ඉතිහාසයේ සිදුවුණු සියලුම වංචා ගැන කථා කරන්න මේ විවාදය යොදා ගත්තා. එච්චර නේ දන්නේ. ඉතිරි අවුරුදු තුනත් ඕක තමයි කරන්නේ. වෙන කරන්න ඇති දෙයක් නැහැ. රාජසිංහ රජ්ජුරුවන්ගේ කාලයේ ඉඳන් දේවල් ගැන කථා කරනවා. එතුමා කිව්වා, නොවැම්බර් මාසයේ ගෙවීම් හයකින් දෙකක් reject වෙද්දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තා නම් මේක

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

වෙන්නේ නැහැ කියලා. ක්‍රියාමාර්ග ගත්තේ නැත්තේ ඇයි? Coordination එකක් තිබුණේ නැහැ; leadership එකක් තිබුණේ නැහැ. ඒ ගැන තමයි අර සාකච්ඡාව ඉල්ලුවේ. සාකච්ඡාවක් ඉල්ලුවට දුන්නේ නැහැ. එතකොට අර කනිෂ්ඨ නිලධාරින් හතර දෙනෙක් විතරක් වගකියන්නේ කොහොමද? අපි කියන්නේ ඒක නේ. මේ Report එකේ ඉතාම පැහැදිලිව තිබෙනවා නේ, මහ බැංකුවේ අධිපතිතුමා සහ Secretary to Treasury යන දෙදෙනාම මේකට වගකියන්න ඕනෑ කියලා. ඒකත් නැහැ කියලා කිව්වා, ලක්මාලි මැතිනිය. ඒ කාරණය ඉතාම පැහැදිලිව මේ වාර්තාවේ තිබෙනවා නේ. It states, I quote:

> "… senior officials at the level of Secretary to Treasury and Governor of the Central Bank bear responsibility for several lapses."

ඇස් කටේ දාගෙන ද බලලා තිබෙන්නේ? කොච්චර කිව්වත්, මේක නැහැම කියනවා නේ. අපට මෙහෙම කියලා වැඩක් නැහැ. පරණ email server එක update කරගන්න බැහැ, ඒක 2016දී ඉවර වෙලා. 2025දී technical support එකත් ඉවර වෙලා. ඒක update කරගන්න බැහැ, අවුරුදු දෙකක් තිස්සේ. හැබැයි, පොරොන්දු වුණේ, මොකක්ද? Sir, what they promised in their Manifesto was a digitalized State well-aligned with international standards. That is what they promised in their Manifesto. But, what do we have now? The key institution that handles foreign debt does not even have a centralized IT system or a verified database of creditors. So, what is this? This is not a digitalized State; this is a digitally exposed State. ඒක තමයි කියන්න තිබෙන්නේ. මේ email server එක update කරගන්න බැරිව මොන digitalization ද? Clean Sri Lanka, digitalization, ඕවා නේ කියාගෙන ආවේ. හැබැයි, අද වෙනකොට එළියට පෙනෙන්නට තිබෙනවා, මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා.

අපේ අනිල් ජයන්ත ඇමතිතුමනි, ඔබතුමා ඉතාම හොඳ කථාවක් කළා. දැන් ඔබතුමා කියනවා, මාර්තු මාසයේ 24වැනි දා CID එකට මේක කිව්වා කියලා. මැයි මාසයේ අහද්දී ඔබතුමා කිව්වා, අප්‍රේල් අන්තිම සති දෙකේ පාර්ලිමේන්තුව රැස්වුණේ නැති නිසා අපි මේක පාර්ලිමේන්තුවේ කිව්වේ නැහැ කියලා. එදා අපි නැඟිටලා ඇහුවා, "අප්‍රේල් පළමුවැනි සතියේ පාර්ලිමේන්තුව රැස්වුණා නේද?" කියලා. පසුගිය වතාවේ ඔබතුමා කියපු එක මතකද? *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔබතුමා දීපු උත්තරේ තමයි, "ඒ වෙනකොට අවශ්‍ය තොරතුරු අපි ළඟ තිබුණේ නැහැ" කියන එක. හැන්සාඩ් වාර්තාව බලන්න. එහෙම තමයි කිව්වේ. අද ඇවිල්ලා කියනවා, කවුරුත් කියන්න කලින් අපි මාර්තු මාසයේ මේක SLCERT එකට දුන්නා කියලා. SLCERT එකට දෙන්න ඇති. අපි කිව්වා, මේක පාර්ලිමේන්තුවට දිය යුතුයි කියලා. රටේ ජනතාවට මේක කිව යුතුයි. එහෙම කටයුතු කරන්න බැහැ. ඔබතුමන්ලා හංගාගෙන SLCERT එකට දෙන්න බැහැ නේ. එහෙම නම් මොකටද පාර්ලිමේන්තුවක් තිබෙන්නේ? අද ඇවිල්ලා ඔබතුමා ඕක කියනවා. මම ඕක අල්ලාගන්න තමයි හිටියේ. ඒක වැරදියි. ඔබතුමා එහෙමයි කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාවේ කාරණා තුනක් තිබෙනවා. ඒ තමයි, නොදැනුවත්කම, නොසැලකිල්ල සහ අකාර්යක්ෂමතාව කියන ඒවා. මේ වචන තුන තමයි මේ Report එක පුරා කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, NPP ආණ්ඩුව ගැන ප්‍රගති වාර්තාවක් ලිව්වත් ලියන්න තිබෙන්නේ ඔය වචන තුනෙන් තමයි. පොඩි එකෙකුට රචනාවක් ලියන්න කිව්වොත්, ලියන්න තිබෙන්නේ ඔය වචන තුනෙන් තමයි. ඒ නිසා මට කියන්න තිබෙන්නේ, අද බේරාගන්න හැදුවාට මේ Report එකෙන් ආණ්ඩුවේ තරම පෙනෙනවා කියන එකයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් විමර්ශන කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ අවස්ථාව යොදා ගන්නවා පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙලේදී රනින් සහ රිදියෙන් ලක් මව සැරසූ රුමේෂ් තරංග සහ උපුල් බණ්ඩාර කියන ක්‍රීඩකයන්ට සුබ පැතුම් එක් කරන්නට. ඒ දෙදෙනාට මම පණිවුඩයක් දෙන්න කැමැතියි. පරිස්සමින් මේ ආණ්ඩුවත් එක්ක තමන්ගේ ක්‍රීඩා ජීවිතය සැලසුම් කරගන්න. නැත්නම් යුපුන් අබේකෝන්ට වෙච්ච වැඩේ තමයි වෙන්නේ. පොඩ්ඩක් කථා කරගෙන ඉදිරි කටයුතු කරගන්න. ඒ දෙදෙනාට මුදල් තෑගි ලබා දෙන්න කියලා මම ආණ්ඩුවට යෝජනා කරනවා. බත්තරමුල්ලෙන් ඉඩම් කැබැල්ලක් ලබා දෙන්න; දෙමටගොඩ ප්‍රදේශයෙන් ඉඩම් කැබැල්ලක් ලබා දෙන්න; මහල් නිවාසයක් හදලා දෙන්න, නවීන කාර් රථ ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා. මොකද, ඒ encouragement එකට. එහෙම වරප්‍රසාද ගත්ත අය අද ක්‍රීඩාව පාලනය කරනවා. එහෙම වරප්‍රසාද අරගෙන තමයි, යුපුන් අබේකෝන් ක්‍රීඩකයාට සල්ලි ගෙවන්න බැහැ කියලා එළවලා දැම්මේ. මේගොල්ලන්ටත් ඒ පහසුකම් අනිවාර්යයෙන්ම ලබා දිය යුතුයි. ඔවුන් කරන දේ ලෙහෙසි වැඩක් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මට තව පොඩි වේලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ දිස්ත්‍රික්කයේ තොඩුවාව ඉරණවිල තාරක මධුෂාන් කියන ධීවරයා සෙනසුරාදා ඉඳලා පැය 24කට වඩා මුහුදේ ඔට්ටු වෙලා ජීවිතක්ෂයට පත් වුණා. කොල්ලුපිටිය වෙරළෙන් තමයි ඔහුගේ මිනිය ගොඩට ගත්තේ. මේ දවස් ටිකේ ලංකාව වටේ ධීවරයන් පස්දෙනෙක් නැති වෙලා තිබෙනවා. මේක කවදාද ඉවර වෙන්නේ කියලා අපි අහන්න කැමැතියි. සුළං සහ මුහුදේ රළ ගැන call එක එද්දී රෑ හතයි. සවස හතර වෙනකොට ඒගොල්ලන් මුහුදට ගිහිල්ලා ඉවරයි. මේක මෙහෙම කරන්න බැහැ. පසුගිය Budget එකේ ධීවර අමාත්‍යාංශ වැය ශීර්ෂය වෙලාවේදී මම කථා කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම පෞද්ගලිකව ගිහිල්ලා ඉන්දියානු මහ කොමසාරිස්තුමාගෙන් උදවු ඉල්ලුවා. ඉන්දියාවේ අභ්‍යවකාශ මධ්‍යස්ථානයෙන් - ISRO එකෙන් - මේකට උදව් කරන්න කැමැතියි. ඔවුන් ළඟ තිබෙනවා, DAT-SG තාක්ෂණය, NavIC තාක්ෂණය. ඔවුන් මුළු ඉන්දියානු මුහුදු සීමාවම ආවරණය කරනවා නම් ඔවුන්ට ශ්‍රී ලංකාවේ මුහුදු තීරය කියන්නේ පොඩි දෙයක්. හැබැයි, මට කිව්වා, "ඔබතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ගිහිල්ලා අමාත්‍යතුමාට කථා කරන්න, අමාත්‍යතුමා මේකට එකඟ කරගන්න. අපි මේකට උදවු කරන්නම්" කියලා. ඇමතිතුමා ඔළුව හොල්ල හොල්ල ඉඳලා ගියා. අද වෙනකල් ඒක කෙරිලා නැහැ. මම නැවත ඒ යෝජනාව කරනවා. මුහුදු යන ධීවරයන්ගේ ජීවිත බේරා ගන්න. කරුණාකරලා මේකට අත තියන්න. ඉන්දියාවෙන් මේකට උදවු කරන්න ලැහැස්තියි. මම පෞද්ගලිකව ඒ ගැන කථා කළා. නමුත් මට බලයක් නැහැ. කරුණාකරලා මේ සම්බන්ධයෙන් ධීවර අමාත්‍යවරයා දැනුවත් කරන්න කියලා ඉල්ලා සිටිමින්, මා නිහඬ වෙනවා.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.38]

ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේදී මේ විවාදය මූලික වශයෙන්ම තිබෙන්නේ මහ බැංකුවේ transactionsවලදී සිදු වෙච්ච ඩොලර් මිලියන 2.5ක පාඩුවක් පිළිබඳව. මම පැහැදිලිව කියන්න කැමැතියි, එතැන පාඩුවක් වෙලා තිබෙන බවත්, ඒ පාඩුව වෙලා තිබෙන්නේ වංචනික කටයුත්තක් නිසා බවත් කියලා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. නමුත් අපි උදේ ඇසුවා, මේ "වංචාව", "fraud" කියන වචනය. ඔව්, fraud එකක් වෙලා තිබෙන්නේ. කවුද ඒක කළේ? කවුද වගකියන්නේ? ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු විධියට කබීර් හෂීම් මන්ත්‍රීතුමා උදේ එතුමාගේ කථාවේදී ඒක සහමුලින්ම ආණ්ඩුව මත පටවන්න ඉතාම බාල වර්ගයේ උත්සාහයක් ගත් එක ගැන ඇත්තටම අපි කනගාටු වෙනවා.

ලක්මාලි මන්ත්‍රීතුමිය ඇතුළු හැම කෙනාම ප්‍රශ්න කරන්නේ, ඒක. මෙතැන වැරැද්දක් වෙලා තිබෙන බව පිළිගන්නවා. මේ සිද්ධිය වෙලා තිබෙන්නේ ජනවාරි මාසයේ. ආණ්ඩුව ඇවිල්ලා එතකොට මාස 14ක්, 15ක්. ලංකාවේ දැනට හදලා තිබෙන නීති-රීති පසුගිය අවුරුදු ගණනේදී හදපුවා. ඒවා එකපාර වෙනස් කරන්න බැහැ. Procurement එකක් කරගන්නවත් එච්චර කාලයක් නැහැ. අවුරුදු 70 ගණනක් රට පාලනය කරපු ජනාධිපතිලා පත් කරපු කට්ටිය තමයි හිතන්න ඕනෑ. ලංකාව සහමුලින්ම අන්ත පසුගාමී තත්ත්වයක තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, expressway එකට බැංකු ණය කාඩ් පතෙන් සල්ලි ගෙවන්න ක්‍රමයක් තිබුණේ නැහැ. 80 ගණන්වල ඉඳලා ATMs තිබෙන්නේ. එහෙමයි මේගොල්ලන් රට කළේ. මම හිතුවේ නැහැ, එතුමා එච්චර පහළ මට්ටමට වැටෙයි කියලා, මේ මන්ත්‍රීවරුන්ගේ නම් කිය කියා කථා කරන්න තරම්. අපටත් තිබුණා, Standing Ordersවලින් mark කරන්න. මෙතැන තිබෙන දේ තමයි desperate බව. අපි හොරකම් කරන්නේ නැහැ; වංචා කරන්නේ නැහැ; නාස්ති කරන්නේ නැහැ. කොහේ හරි මොකක් හරි එකක් වුණාම ඒක ආණ්ඩුව පිට දාලා දවස ගෙවා ගන්නවා. දැන් මාස 22ක් ගත වෙලා තිබෙනවා. නිශ්චිත චෝදනාවක් ඉදිරිපත් කරලා, ඒක ගැඹුරක් ඇතුව ඉදිරියට යන්න පුළුවන් වෙලා තිබෙනවාද? අපි මේක ගැන අවංකවම මහන්සි වෙනවා. මෙතැන අඩුපාඩුවක්, වැරැද්දක් සිද්ධ වෙලා තිබෙනවා කියලා අපි පිළිගන්නවා. කාගෙන්ද වැරැද්ද සිද්ධ වෙලා තිබෙන්නේ?

පොඩි එකාගේ රචනාවක් ගැන කිව්වා. මගේ කාලය ඒකට නොවෙයි ගන්න හිතාගෙන ඉන්නේ. විපක්ෂයේ seriously කල්පනා කරන මන්ත්‍රීවරුන් හැම කෙනාම කියන දෙය අපට වැදගත්. ලංකාව ගැන වාර්තා දීලා තිබෙන්නේ කවුද? ලංකාව ගැන වාර්තා දීලා තිබෙනවා, the Global Democracy Index එක. ඒ අනුව අපි මාස 18ක් තුළ ස්ථාන හතක් උඩට ගිහිල්ලා තිබෙනවා. Corruption Perceptions Index එකෙන් ස්ථාන 14ක් උඩට ගිහිල්ලා තිබෙනවා. Global Peace Index එකෙන් අපි අවුරුද්දට ස්ථාන 33ක් උඩට ගිහිල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ලෝක බැංකුව කිව්වා, අපි මැදි වැඩි ආදායම් ලබන රටක් බවට පත් වුණා කියලා. ඒවා තමයි රචනා. මේගොල්ලන් ලියන්නේ මඩ. ඒක පිළිගන්නේ නැහැ. මේ අයට හීනමානයක් තිබෙනවා. මම මේක කියන්නමයි හිටියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මානසික රෝගී තත්ත්වයක් තිබෙනවා, status anxiety කියලා. තමන් මෙච්චර කාලයක් භුක්ති විඳගෙන හිටපු වරප්‍රසාද අහිමි වුණාම, ඒක anxiety එකක් වෙලා තිබෙනවා.

අද මේ ගොඩක් අයට වෙලා තිබෙන්නේ ඒක. ලංකාවේ මිනිස්සු නේ, මේවා කරන්නේ. දැන් අපේ රටේ වැඩියෙන්ම වැඩ කරපු, සාර්ථක ප්‍රතිඵල පෙන්වපු අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශය. නැත්නම් ලංකාව මෙවැනි මට්ටමක නැහැ. "දිට්වා" සුළි කුණාටුවත් ඇවිල්ලා, oil crisis එකකුත් තියෙද්දි අපට මෙහෙම ඉන්න පුළුවන්ද? එහෙම නම් අපි පාකිස්තානයේ, බංග්ලාදේශයේ වාගේ lights off කරගෙන මොකුත් කර ගන්න බැරිවයි ඉන්නේ. එතකොට මුදල් අමාත්‍යාංශය ඒ ජයග්‍රහණයට ගෙනයන්න හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමා ඇතුළු නිලධාරින්, මහ බැංකුව ඒක කළා කියලා කියන්න බැරි ඇයි? ඇයි, මේ හර්ෂණ සූරියප්පෙරුමට ගහන්නේ? ඔබතුමන්ලාට තිබෙන්නේ හීනමානය. රනිල් වික්‍රමසිංහගේ බයිලයක් අහලා ඔයගොල්ලන් හිතාගෙන හිටියා, අපි "L" board කියලා. ඔයගොල්ලන් ඒ නිසා කොහේ හරි ඈත යන රොඩ්ඩක් අරගෙන පෙන්වන්න හදනවා, අපි "L"board කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ ලංකාවේ ඉතාම ගැඹුරු දේවල් වැඩියෙන්ම කරපු අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශයයි. රාජපක්ෂ පවුලේ ඔක්කෝටම නඩු වැටෙයි කියලා කවුද හිතුවේ? රටේ බලවත්, ධනවත් පුද්ගලයන්ට හොයා ගන්න බැරි නඩු තිබුණා. එයාර්බස්, ක්‍රිෂ් වැනි නඩු ඉතාම බලගතු පුද්ගලයෝ සහ ධනවත් ව්‍යාපාරිකයෝ හොරකම් කරපු ඒවා පිළිබඳ නඩු. ඒවාට නඩු දාන්න ලංකා ඉතිහාසයේ කවුද කටයුතු කළේ? ඒවා එක්සත් ජාතික පක්ෂයෙන් කළේ නැහැ. ඒ එකක්වත් ඒ මට්ටමට ගියේත් නැහැ. අධිකරණ අමාත්‍යාංශය ඒ කටයුත්ත කරලා තිබෙනවා. පොලීසිය භාර අමාත්‍යාංශය ඒ කටයුත්ත කරලා තිබෙනවා. ප්‍රවාහන අමාත්‍යාංශයත්, තවත් අමාත්‍යාංශත් තිබෙනවා, ඒ අමාත්‍යාංශ එච්චර දුරට වැඩ කරලා නැහැ. අපි ඒක අවංකව කියන්න ඕනෑ. නමුත්, මුදල් අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය, මහජන ආරක්ෂක අමාත්‍යාංශය කියන අමාත්‍යාංශ තුන ගුණාත්මකව - qualitatively - විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. මේ රට කාපු, හොරකම් කරපු රාජපක්ෂලා - ඒ අන්ත දූෂිත team එක - මේකට බණින එක මට තේරුම් ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කාටද මේ පහර දෙන්නේ? මේ අය වැඩියෙන් පහර දෙන්නේ කාටද? පොහොට්ටුවේ ලේකම් කියලා තිබුණා, "පොලිස්පතිට පාරේදි ගහලා මරන්න ඉඩ තිබෙනවා" කියලා. ඒ කියන්නේ වැඩියෙන්ම වැඩ කරපු ආයතනයක් තමයි, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව. එතුමන්ලාටත් ගහනවා. ඒකේ තවත් නිලධාරින් දෙන්නෙක් ඉන්නවා. එක්කෙනෙක් අමාත්‍යාංශයේ ලේකම් රවී සෙනෙවිරත්න මහතා. එතුමාට ගහනවා, පාස්කු ප්‍රහාරයේ පරීක්ෂණ කරන කෙනා නිසා. මේ මන්ත්‍රීතුමන්ලා CID එක ගැනත් කිව්වා. CID එකේ ප්‍රධානියා කවුද? CID එකේ ප්‍රධානියා පැලවත්තේ හිටපු කෙනෙක් නොවෙයි. ඒ කියන්නේ දැන් මේ අර පොහොට්ටුවේ හොරු තක්කඩි කියන ටිකම කියනවා. පට්ට මෝඩයි. පොහොට්ටුවෙන් වෙන් වෙලා පෙනෙන්න එපායැ. ආණ්ඩුවක් ගන්න හිතනවා තියා සමුපකාරයක බලයක් හෝ ගන්න නම් මොකක්ද කරන්න ඕනෑ? ඡන්ද ප්‍රතිශතය 2.5ට බැස්සෙව්වා. එදා පස්ස දොරෙන් නොවෙයි,

[ගරු බිමල් රත්නායක මහතා]

කොයි දොරෙන් ත්‍රිකුණාමලයට දිව්වාද කියලා අපි තවම දන්නේ නැහැ. හිටපු රාජපක්ෂලාගේ වල්ගයේ එල්ලෙන්නේ නැතිව ඒකෙන් වෙන් වෙලා පෙනෙන්න එපායැ. නමුත්, ඒක මත්තෙම නැහෙනවා. දැන් පාස්කු ප්‍රහාරයේ පරීක්ෂකයන්ට ගහන එකට කැමැති කවුද? සලේයි, සලේට උපදෙස් දුන් සෙට් එකයි විතරයි. ඒකම කියනවා. CID එකට ගිහින් පොහොට්ටුවේ ඒ වචන ටිකම කියනවා. ඉතින් මම thank-you letter එකක් එවන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පස්සේ තව කාටද ගහන්නේ? අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමාට ගහනවා. ලංකා ඉතිහාසයේ වංචා, දූෂණ සම්බන්ධව වැඩිම පරීක්ෂණ කරන දෙපාර්තමේන්තුවක් තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව. ඒකේ කටයුතු කරන්නේ එක්කෙනෙක් නොවෙයි. හැබැයි, ගහන්නේ කාටද? මම මේ තර්කයට එනවා. අධ්‍යක්ෂ ජෙනරාල්ට ගහනවා. දැන් කාටද ගහන්නේ? දැන් ගහනවා, අග්‍ර විනිශ්චයකාරතුමාට. අර කවිරත්න මන්ත්‍රීතුමිය කෙළින්ම අග්‍ර විනිශ්චයකාරතුමාගේ නම කියලා ගැහුවා. මම හිතන විධියට, ඒක තමයි සජබයේ ඇත්ත අදහස. මොකද, මේ අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව අවුරුදු දෙකකින් වැඩි කරනවා කියන එක ගැන මහා බිල්ලෙක් මවලා තිබෙනවා නේ. ඒ විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම වයස් සීමාව අවුරුදු දෙකකින් වැඩි කළාම මොකක්ද වෙන්නේ? එක්කෙනෙකුගේ වැඩි කරනවා නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා. දෙන්නෙකුගේ වැඩි කරනවා නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, private bar එකෙන් CJsලා පත් කළා නේ. මාර්ක් ප්‍රනාන්දු මහතාව ගෙනාවා නේ, ජේ.ආර්. ජයවර්ධන මහතා private bar එකෙන්. ජේ.ආර්. ජයවර්ධන මහතා මාර්ක් ප්‍රනාන්දු විනිශ්චයකාරතුමා ශ්‍රේෂ්ඨාධිකරණයට ගෙනාවේ කොහෙන්ද? පිටින් ගෙනාවේ. තවත් කී දෙනෙක් එහෙම ගෙනැල්ලා තිබෙනවාද? මම කියන්නේ පිටින් ගෙනෙන අය නරකයි කියලා නොවෙයි. හැබැයි, මේ මොකක්ද වෙන්නේ? මේ කරන්නේ, දැනට වැඩ කරගෙන යන සියලු විනිශ්චයකාරවරුන්ගේ විශ්‍රාම යන කාලය වැඩි කරන එක; මහෙස්ත්‍රාත්වරුන්ගේ ඉඳලා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් දක්වා. ඉතින් ඒකෙන් කොහොමද අධිකරණයේ ස්වාධීනත්වය නැති වෙන්නේ? ඒකෙන් කොහොමද අධිකරණයේ මහා විශාල විනාශයක් වෙන්නේ? කිසිම තර්කයක් නැහැ. දැනුවත්කමකට හරි, මෝඩකමට හරි මොකක් හරි එකකට අර මන්ත්‍රීතුමිය කිව්වා, අග්‍ර විනිශ්චයකාරවරයාගේ උප්පැන්න සහතිකයත් වැරදියි කියලා. ඊට පස්සේ කිව්වා, එතුමා නඩුකාරයෝ මාරු කරලා තිබෙනවා කියලා. මේ රටේ අභ්‍යන්තර තොරතුරු දන්නේ නැති සාමාන්‍ය මිනිස්සුන්ට මේ උසාවිය මොන වාගේද පෙනෙන්නේ? මේ උසාවිය මීට කලින් පොඩි මිනිස්සුන්ට විතරක් දඬුවම් දීපු උසාවියක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හරියටම කියන්නම්, එහෙම වෙන්නේ ඇයි කියලා. නීති තිබුණාට නීතිවලට පණ එන්නේ කොහොමද? ජන වරමෙන් එන්නේ. ඔය පොලීසිය, ඔය උසාවි, ඔය නීති කියන ඔක්කෝම තිබුණා, අපි එන්න කලින්. ඔය ඔක්කෝම තිබුණා. ඔය විනිශ්චයකාරතුමන්ලාත් හිටියා; ඔය අධිකරණ පද්ධතියත් තිබුණා; ඔය පොලීසිත් තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අධිකරණය තුළ නඩු කටයුත්තක් කරන්න තවත් ආයතන රාශියක් අවශ්‍ය බව. පොලීසියේ සහයෝගය අවශ්‍යයි; නීතිපති දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම අවශ්‍යයි; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මැදිහත්වීම අවශ්‍යයි. ඊයේද, පෙරේදාද ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු මන්ත්‍රීතුමාගේ නඩුව ඉල්ලා අස් කරගෙන තිබුණේ කොහොමද? අල්ලස් කොමිසමේ කොමසාරිස්වරු තුන්දෙනාගෙන් එක්කෙනෙක් අත්සන් කළේ නැහැ. හරි, අත්සන් කළේ නැති එක technical වැරැද්දක් නම් ඊට පසු දවසේ අත්සන යොදා ආයෙත් දෙන්න පුළුවන් නේ. එහෙම නොවුණේ ඇයි? ආ! එතැන දේශපාලනය තිබෙනවා. ඒක තමයි එහෙම වුණේ. ඒ නිසා නීති තිබුණාට, ආයතන තිබුණාට ආයතනවලට පණ එන්නේ එක පැත්තකින් ජන වරමෙන්; අනෙක, ඒ ආණ්ඩුව කරන විධියෙන්; ඊට පසුව එහි සිටින පුද්ගලයන්ගෙන්.

අද පොලිස්පතිට ගහනවා, මරනවා කියනවා, පාරෙදී. අද නොවෙයි, දැන් දිගටම මේගොල්ලනුත් ගහනවා, අරගොල්ලනුත් ගහනවා, ශානි අබේසේකරටයි, රවී සෙනෙවිරත්නටයි. ඊට පසුව මේගොල්ලන් රංග දිසානායකට ගහන්න පටන් ගත්තා. හර්ෂණ සූරියප්පෙරුමට ගහන්න ගත්තා, ආර්ථිකය ගොඩ දමපු නිසා. දැන් ගහනවා, අග්‍ර විනිශ්චයකාරතුමාට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙයක් හරියට කෙරෙන්න නම්, ජන වරමක් අවශ්‍යයි. ඒ වාගේම එය ජනතාවට අවශ්‍ය වෙන්නත් ඕනෑ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු ප්‍රධාන කොමසාරිස්වරියක් ඉල්ලා අස් වුණා, මීට අවුරුදු හත-අටකට කලින්. මම එතුමියට call කරලා ඇහුවා, ඇයි ඔබතුමිය අස් වුණේ කියලා. මම මේ කියන්නේ ගෝඨාභය රාජපක්ෂ දිනපු ගමන් වුණු සිදුවීමක් ගැන. එතකොට එතුමිය කිව්වා, මානව හිමිකම් රකින්න ඕනෑ නැහැ කියලා ජන වරමෙන් කියා තිබෙනවා කියලා. එතුමිය අස් වෙන්න හේතුව වශයෙන් එතුමිය කිව්වේ ඒකයි. මානව හිමිකම් රකින්න මිනිස්සුන්ට ඕනෑ නැත්නම්, අමු පට්ට මිනී මරුවෝ, තක්කඩියෝ නැවත පත් කරනවා නම් ඒ ජන වරමට මානව හිමිකම් රකින්න ඕනෑ නැහැ. නමුත් මේ ජන වරම වෙනස්. මේ ජන වරමෙන් තමයි අධිකරණය, පොලීසිය කියන හැම තැනකටම පණ ඇවිල්ලා තිබෙන්නේ. එක, ජන වරමෙන්; දෙක, ආණ්ඩුවෙන්; තුන, පුද්ගලයන්ගෙන්. මෙහිදී පුද්ගලයාත් යම් කාර්යභාරයක් කරනවා.

මම හිතන විධියට, මේගොල්ලන් ඇතුළේ කථා කරපු එක තමයි අර මන්ත්‍රීතුමිය හිතලා හෝ නැතුව හෝ මෙතැන කිව්වේ. එතුමිය ලස්සනට කිව්වා, අග්‍ර විනිශ්චයකාරතුමාගේ උප්පැන්න සහතිකයත් බොරු, අග්‍ර විනිශ්චයකාරතුමා නඩුකාරයෝත් මාරු කරලා කියලා. ඩොලර් මිලියන 2.5 ගැන අපට හැඟීමක් තිබෙනවා. අපි ඒ ගැන ගොඩක් worry වනවා. අපි ඒ ගැන කථා කරලාත් තිබෙනවා. පක්ෂයක් විධියටත් අපට ඒක දැනෙනවා. ඒක අපෙන් නොවිය යුතු දෙයක්, අපේ පාලන කාලය තුළ අපි කරපු දෙයක් නොවුණාට. පසුගිය කාලයේ රුපියල් බිලියන ගණන් හොරකම් කරපු තක්කඩියෝ අල්ලන්න නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, විනිශ්චයකාරවරුන් දැන් කටයුතු කරනවා. ඒ මිනිස්සු සාමාන්‍ය මිනිස්සු. ඊගොල්ලන්ට ආරක්ෂා කරන්න පක්ෂ නැහැ. වයස අවුරුදු 65න් හෝ 67න් pension ගියාට පසුව ඒ අයට පවුලේ අය විතරයි ඉන්නේ. ඒක අගය කරන්න බැහැ නේ, මේ පුදුම පිරිසක් නේ. එසේ වැරදි කරපු අය අල්ලන්නේ අග්‍ර විනිශ්චයකාරතුමා ආ පසු තමයි. එතකොට කවුද මේ අග්‍ර විනිශ්චයකාරතුමා? ඒ, අපි පත් කරපු කෙනෙක් නොවෙයි. Constitutional Council එකෙන් unanimously පත් වුණේ. මට මතක විධියට එතුමා තමයි ඒ වෙලාවේ හිටපු ජ්‍යෙෂ්ඨතම ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමා. එතුමා පත් කරන්න කියලා එතුමා සම්බන්ධ වාර්තාව Constitutional Council එකට එව්වේත් ඊට කලින් හිටපු අග්‍ර විනිශ්චයකාරතුමිය. ඒ අස්සේ දැන් සජබයට අහු වෙලා තිබෙනවා, අග්‍ර විනිශ්චයකාරතුමාගේ වැරදි උප්පැන්න සහතිකයක්.

දැන් මේ රටේ අග්‍ර විනිශ්චයකාරවරයාගේ නමට ගහන්නේ ඇයි? මොනවා කළාටද? රාජපක්ෂලා, ජොන්ස්ටන්ලා, මිනී මරුවෝ, සලේලා අත්අඩංගුවට ගන්න බය නැතුව අධිකරණය

මෙහෙයවන නිසාද? මම කියන්නේ මෙහිදී එතුමා විතරක් නොවෙයි, මේකට අදාළ වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙයක් හරියට වෙන්න නම් ජන වරමෙන් ජනතාවටත් එය අවශ්‍ය වෙන්න ඕනෑ. ඒ, එක. දෙක, ආණ්ඩුවටත් එය අවශ්‍ය වෙන්න ඕනෑ. පසුගිය කාලයේ පොලීසිය, පරීක්ෂණ ආයතන යනාදී ඔක්කෝම හරවා තිබුණේ අපරාධ හොයන්න නොවෙයි, අපරාධකාරයා බේරන්නයි. ඒ නිසා තමයි අත්සන නැහැ කියලා අස් කරගත් නඩු එකක්වත් අල්ලස් කොමිසම නැවත නොදැම්මේ. ඔය අල්ලස් කොමිසමේ එදා හිටපු නිලධාරින්ම තමයි සියයට 99ක් විතර තවම ඉන්නේ. අපි දමපු අය නැහැ නේ. ඒ හිටපු අයම තමයි තවම ඉන්නේ. ඒගොල්ලන් කැමති නිසා හෝ අකැමති නිසා හෝ ඕක කළේ නැහැ. ඒකයි ඇත්ත. ඒ නිසා ඒක realize වෙන්න නම්, ඒක ඉෂ්ට වෙන්න නම්, ඊට පස්සේ පුද්ගලයා වැදගත් වනවා. හර්ෂණ සූරියප්පෙරුම වැදගත්, පොලිස්පතිවරයා වැදගත්. එතුමන්ලා නිශ්චිත, විශේෂ කාර්යභාරයක් කරනවා. අග්‍ර විනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් වැදගත්. ඒ නිසා තමයි අපි මෙහෙම කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් මේ කාරණයත් කියන්නම්. ජී.එල්. පීරිස් තමයි, ශිරානි බණ්ඩාරනායක අයින් කරනකොට - දඬු කඳේ ගහනකොට - හිටපු ඇමති. ඔහු පත්තරයකට ලිපියක් ලියා තිබෙනවා, "Spectre of the “deep state”: Planned capture of the Judiciary by the Executive" කියලා. දැන් අපි අහන පළමුවැනි ප්‍රශ්නය මේකයි. එහෙම capture වෙන්න පුළුවන්, එක්කෙනෙකුගේ දෙදෙනෙකුගේ විශ්‍රාම යෑමේ වයස් සීමාව නම් වැඩි කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනිසුරුවරුන් සියලුදෙනාගේම විශ්‍රාම යෑමේ වයස් සීමාව වැඩි කළාම අධිකරණය capture වෙන්නේ කොහොමද? එතකොට අධිකරණය capture වෙන්නේ නැහැ, අධිකරණය continue වෙනවා. වැදගත්ම දේ මොකක්ද? දේශපාලන වශයෙන් ගත්තොත්, අපිට මේ ආණ්ඩුව ගෙනියන්න මේ සංශෝධනය ඕනෑ නැහැ. මේ සංශෝධනය නැතුවත් අපි හොරු අල්ලා තිබෙනවා. රාජපක්ෂලා ඔක්කොම දැන් උසාවි යමින් සිටිනවා. ඉතින්, තව අල්ලන්න තිබෙන්නේ කවුද? මේගොල්ලන් හොරකම් කරපු ඒවා විතරයි දැන් හොයන්න තිබෙන්නේ. ඒ නිසා මේ සංශෝධනය නොකළා කියලා මේ ආණ්ඩුවට කිසි ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. හැමදාම සංශෝධන කළේ මොකටද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? හැමදාම සංශෝධන කළේ එක්කෝ තමන්ගේ දේශපාලන කාලය දීර්ඝ කර ගන්න, එහෙම නැත්නම් තමන් මැරකමින් මැතිවරණයක් පවත්වන්න යනවා නම් අන්න ඒ ජනාධිපතිවරණය හෝ මහ මැතිවරණය සම්බන්ධයෙන් ඡන්ද දූෂණ නඩුවක් එනකොට ඒක බේරා ගන්න. අපි කියන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ගේ විශ්‍රාම යෑමේ වයස අවුරුදු 67 දක්වා දීර්ඝ කරන්න කියන එකයි. විශ්‍රාම යෑමේ වයස තව අවුරුදු දෙකක් දීර්ඝ කරන්න කියන එකයි අපි කියන්නේ. ඒ අවුරුදු දෙක ඉවර වෙන්නේ කවදාද? දැනට වයස අවුරුදු 65ක් වන විනිශ්චයකාරවරුන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉන්නවා නම් ඒගොල්ලන් ඔක්කොම අයගේ සේවා කාලය 2028 අවුරුද්ද වනකොට ඉවරයි. ඊළඟට මැතිවරණයක් තිබෙන්නේ 2029දී. අපිට පුළුවන් නේ, ඒගොල්ලන් විශ්‍රාම යන වයස අවුරුදු තුනකින් වැඩි කරන්න කියලා කියන්න. ඇයි, අපි අවුරුදු තුනකින් වැඩි කරන්නේ නැත්තේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිට ඇත්තටම කරන්න ඕනෑකම තිබුණේ මොකක්ද? මේගොල්ලන් කරන විධියේ සෙල්ලමක් නම් අපේ ඔළුවේ තිබෙන්නේ අපිට කරන්න තිබුණේ මේගොල්ලන්ව ඉක්මනින් විශ්‍රාම යවන එකයි. ඉක්මනින් බැරි නම් මේ යන විධියට යන්න දෙන්න තිබුණේ. ඊට පස්සේ හිස්තැනක් එනවා, අපිට ඒක පුරවන්න පුළුවන්. මේගොල්ලන් හිතන්නේ එහෙමයි. අපි මොකක්ද කරන්න යන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිස් අවුරුද්දක් - 1994 සිට 2024 දක්වා - මේ රටේ විනිශ්චයකාරවරුන් පත් කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, පොදුජන පෙරමුණේ ජනාධිපතිවරුන්ගේ එකඟතාවෙන් සහ අනුමැතියෙන්. ඒක තමයි set කරලා තිබෙන පෝලිම. ඒවායේ තක්කඩි විනිශ්චයකාරවරුන් එක්කෙනෙක් දෙදෙනෙක් බිහි වුණා, "පිස්සු පූසා කොමිසම" වාගේ ඒවා. ඒගොල්ලන් අමු දූෂ්ට විනිශ්චයකාරවරු පවා හැදුවා. ඒගොල්ලන් seniority ඔක්කොම set කළා. අපි ඒක දන්නවා. එහෙම නම් අපිට කරන්න තිබුණේ මොකක්ද? අපිට කරන්න තිබුණේ මේ විනිශ්චයකාරවරුන්ට කිසිම ගරුත්වයක් නැතුව, ඔබතුමන්ලා ඉක්මනට විශ්‍රාම යන්න කියලා කියන්න.

අර මාධ්‍ය ප්‍රකාශක කිව්වා නේ, රාජපක්ෂට, ශිරානි බණ්ඩාරනායක මැතිනියගේ වයස අඩු කරලා යවන්න තිබුණා, රාජපක්ෂ ඒක කළේ නැහැ, ඒ නිසා රාජපක්ෂ මේකටත් වඩා හොඳයි කියලා. ඔය පොහොට්ටුවේ set එක ශිරානි බණ්ඩාරනායක මැතිනිය මෙතැනින් කනෙන් අල්ලා එළියට දමනකොට එතුමියගේ වයස අවුරුදු 54යි. දෙවියන්ගේ පිහිටයි, සජිත් ප්‍රේමදාස මහත්මයාට. පට්ට මාධ්‍ය ප්‍රකාශක. එතුමා කිව්වේ එහෙම නේ. රාජපක්ෂට තිබුණාලු, ශිරානි බණ්ඩාරනායක අයින් කරන්න ඕනෑ නම් වයස අඩු කරලා යවන්න. එතුමිය අගවිනිසුරු ධුරයෙන් අස් කරනකොට එතුමියගේ වයස අවුරුදු 54යි. අපි මොකක්ද මේ කරන්නේ? අපිට දූෂ්ට වුවමනාවක් තිබෙනවා නම්, අපිට අධිකරණය capture කරන්න ඕනෑ නම්, අපි කරන්න ඕනෑ මොකක්ද? ජී.එල්. පීරිස්ලාගෙන්, මහින්දලාගෙන්, රනිල්ලාගෙන් ඉගෙන ගන්න එක. අපේ set එකක් ඔබන එක. Private bar එකෙනුත් දමන්න පුළුවන් නේ. එහෙම නැතුව මේ කරන්නේ මොකක්ද? ඒ පත් වෙලා හිටපු අයම දිගටම තියා ගත්තාම රටට වන වාසිය තමයි, සියලු නඩු එක දිගටම continue වන එක. ආයතනික දැනුම තිබෙනවා. නඩු කල් යන්නේ නැහැ. නඩු අහන අයටම පුළුවන්, නඩු අහලා ඉවර කරන්න. ඒ නිසා මේකේ කිසිම capture එකක් නැහැ.

ඊට පස්සේ මම දැක්කා, “*ad hoc*” කියලා කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ විවාදය මේ ගැන කථා කරන්න පෙරළා ගන්න හිතුවේ නැහැ. නමුත්, මම මේ කාරණයත් කියන්න කැමැතියි. මම සොයා බලපු විධියට Commonwealth system එකේ තිබෙනවා, එංගලන්තය, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය වැනි රටවල විශ්‍රාම ගිය විනිශ්චයකාරවරු *ad hoc* ලෙස නඩු අහන්න ගන්නවාය කියලා. මම ඉක්මනින් ඒ ගැන කියන්නම්. කොවිඩ් වසංගතය තිබුණු කාලයේ, 2021 හා 2026 අතර වෙච්ච දේවල් විතරයි මම කියන්නේ. එක්සත් රාජධානියට අයත් එංගලන්තයේ සහ වේල්ස්වල විතරක් අධිකරණවල නඩු 60,000ක් විතර ගොඩගැහිලා තිබෙන නිසා විශ්‍රාමික විනිසුරුවරුන් 65ක් එකවර කැඳවා තිබෙනවා. ඒ, විශ්‍රාමික අය. ඒ වාගේම පළපුරුදු විනිසුරුවරුන්ගේ හිඟයට England සහ Walesවල මොකක්ද කරලා තිබෙන්නේ? 2022 අගෝස්තු මාසයේදී නිල විශ්‍රාමික වයස අවුරුදු 70 සිට 75 දක්වා වැඩි කිරීමට පනතක් සම්මත කරලා තිබෙනවා. ඕස්ට්‍රේලියාවේත් එහෙමයි. ඒක තමයි *ad hoc*. "*Ad hoc*" කියන්නේ ඒක. අපි මුකුත් *ad hoc* විධියට කරලා නැහැ. ඇත්තටම ගත්තොත්, අවුරුදු 65න් විශ්‍රාම යන විනිශ්චයකාරතුමන්ලා විශාල විශ්‍රාම වැටුපක් ලබන අය නොවෙයි. විශ්‍රාම ගියාට පස්සේ ඒගොල්ලන් කාටවත් මම හිතන්නේ නැවත practice එකක් හදා ගන්න බැහැ, නීතියෙන් ඉඩකඩ තිබුණත්. මොකද, අවුරුදු 25ක්, 30ක් උසාවියේ හිටියාට පස්සේ ආයෙත් practice එකක් හදා ගන්න එක ලෙහෙසි නැහැ. එතකොට ඇත්තටම අවුරුදු 65න් විශ්‍රාම ගිය කට්ටිය *ad hoc* විධියට ගන්න පුළුවන්, නඩු clear කරන්න. අපි එහෙම යෝජනාවක් ඉදිරිපත් කරලා නැහැ. ඔබතුමන්ලා තමයි private bar එකෙන් ගෙනැල්ලා, අරහෙන් මෙහෙන් ගෙනැල්ලා කළේ.

[ගරු බිමල් රත්නායක මහතා]

මේකෙන් මොකක්ද වෙන්නේ? මේකේ කිසිම *ad hoc* බවක් නැහැ. තිබෙන system එකේ විනිසුරුවරුන් ඔක්කෝගේම විශ්‍රාම යාමේ වයස අවුරුදු දෙකකින් වැඩි වෙනවා.

ඊට පස්සේ තවත් තර්කයක් එනවා. ඒ මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා අහනවා අලුතින්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනැල්ලා මේක කළාට නම් කමක් නැහැ, ව්‍යවස්ථා සංශෝධනයකින් මේක කරන්නේ ඇයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ජන වරමක් තිබෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන්නත්, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන්නත්. ඔබතුමා දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙනවාය කියන එක අවුරුදු ගණනාවක් යන වැඩක් බව. ඒක හදිසියේ කරන්න බැරි දෙයක්. ඒකට විශාල දේශපාලන ශ්‍රමයක් අවශ්‍යයි. එතකොට අපි ආණ්ඩුවක් වශයෙන් කෙටියෙන්, ඉක්මනින් සහ සාධාරණව කළ යුතු දෙයක් නොකර සිටීම වැරැද්දක් නොවෙයිද? ළිඳෙන් වතුර අරගෙන ගින්න නිවන්න පුළුවන්කම තිබියදී ගිනි නිවන හමුදාව වාගේ ලොකු කණ්ඩායමක් ගෙනෙනවාද, ගින්න නිවන්න? නැහැ. ඒ නිසා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකින් කරන්න ඕනෑ දේවල් එහෙම කරන අතරේ අලුත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන එකත් අපි කරන්න ඕනෑ. එහෙම නැතුව සමස්ත දේවල් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනෙන තුරු කල් දමනවාද? ඒක මොන මෝඩ තර්කයක්ද? අපට කඩෙන් කිරි පැකට් එකක් ගන්න පුළුවන්කම තිබියදී එළදෙනුන් පට්ටියක් ගන්න කියනවා වාගේ වැඩක් නේ මේක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එළදෙනුන් පට්ටියක් අරගෙන ඇති කරලා, කිරි දොවලා බොනවා වාගේ එකක් නේ මේ කියන්නේ. වෙනම එහෙම හදා ගත්තාට කමක් නැහැ. නමුත් කඩෙන් කිරි පැකට් එක ගන්න පුළුවන් වෙලාවේදී ඒක ගන්න ඕනෑ. ඒ නිසා ඒකේ කිසිම තර්කයක් නැහැ.

අන්තර්ජාතික ආයතන රවට්ටලාද කියන්න මම දන්නේ නැහැ, IAJ එකෙන් නිවේදන නිකුත් කරලා තිබෙනවා මම දැක්කා. ඒ IAJ එක ලංකාවේ ඉතාම දූෂිත දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව කොච්චර නිවේදන නිකුත් කරලා තිබෙනවාද කියලා මම අහන්න කැමතියි. තවත් දවසක මේ ගැන පුළුල් වශයෙන් කථා කරන්න අපි බලාපොරොත්තු වෙනවා. නමුත් අපි කියන්න කැමැතියි, මෑත ඉතිහාසයේ ලෝකයේ හැම රටකම විනිශ්චයකාරවරුන්ගේ - judgesලාගේ - විශ්‍රාම යාමේ වයස වැඩි කරලා තිබෙන බව. මගේ ළඟ ඊට අදාළ සම්පූර්ණ වාර්තා තිබෙනවා. ඒවාට ඒ රටවල විනිශ්චයකාරවරුන් කැමැති වෙලා තිබෙනවා. විනිශ්චයකරුවන්ගේ විශ්‍රාම වයස අවුරුදු 70, 75 කරන්න පවා බහුතරයක් විනිශ්චයකාරවරු කැමැති වෙලා තිබෙනවා. ලංකාවේ විතරක් විනිශ්චයකාරවරුන්ගෙන් සුළු පිරිසක්, - තුනෙන් එකක වාගේ පිරිසක් - තමයි විශ්‍රාම යාමේ වයස වැඩි කරන්න එපාය කියලා කියන්නේ. මෙතැන වෙන මුකුත් නොවෙයි තිබෙන්නේ. ඇත්තටම ගත්තාම මෙතැන මොකක්ද තිබෙන්නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකදී ගැඹුරු තර්ක එනවා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන අපි ඇති වෙන්න තර්ක කළා. ඒවායේ weight එකක් තිබුණා, දෙපැත්තෙන්ම. මේකේ මුකුත් නැහැ. මේකේ තිබෙන්නේ අර මන්ත්‍රීතුමිය කිව්වා වාගේ, උසාවිය කෙළින් කරලා, උසාවිය ස්වාධීන කරලා, අත තියන්න බැරි තැනකට අද නීතියේ පාලනය ගෙනැල්ලා තිබීම, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අනෙක් උසාවි විසින්. ඒකට පොහොට්ටුවේත්, සජබයේත් ඉන්න ඔක්කෝම දූෂිතයෝ භයයි. ඒක තමයි ඇත්ත.

මට තව විනාඩි දෙකක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කොහොමත් කාලය ඉක්මවා ගිහිල්ලා තිබෙන නිසා.

ඊළඟට මම කියන්න කැමැතියි, මෙන්න මේ කාරණයත්. අද මේ කාරණය සම්බන්ධයෙන් විශාල ඝෝෂාවක් හදලා තිබෙනවා. සියලුම විනිශ්චයකරුවන්ගේ විශ්‍රාම යාමේ වයස අවුරුදු දෙකකින් වැඩි කළාම දෙවියනේ, උසාවියේ ස්වාධීනත්වය නැති වෙන්නේ කොහොමද? එහෙම logic එකක් තිබෙන්නේ කොහේද? මෙහිදී ඔක්කොගේම විශ්‍රාම යාමේ වයස වැඩි වෙනවා; it is a blanket. මේ තිබෙන්නේ status anxiety, වෙන මොකක්වත් නොවෙයි.

ජනතාව මේ රටේ පාලනය වෙනස් කළා. ඒ නිසා දේශපාලනඥයෝ අතිබහුතරයකට ස්ථාන නැති වෙලා අනාථ වුණා. හැබැයි, දේශපාලනඥයෝ නැති වුණාට ඒ දේශපාලනඥයන්ගෙන් යැපුණු පිරිසකුත් හිටියා.

ඉතාම ජ්‍යෙෂ්ඨ නීතිඥයන් ගණනාවක්ම මට කිව්ව කාරණයක් තිබෙනවා. ඒ මොකක්ද? මේකට මේ සමහර නීතිඥවරු වැඩිපුරම මෙච්චර විරුද්ධ වෙන්නේ වෙන මොකුත් නිසා නොවෙයි, ඒ තමයි ඒගොල්ලන්ට හැදිච්ච status quo එකක් තිබෙනවා. නීතිඥයන් සුළු පිරිසකට උසාවිවල හරි පොලීසිවල හරි හැදිච්ච status quo එකක් තිබෙනවා. Embassy partiesවලට එන්න කියනවා. ජනාධිපතිවරු එක්ක වයින් බොන්න එන්න කියනවා. IGPට කථා කළාම, IGP නැඟිටලා කථා කරන්නේ, සමහර lawyersලාට. නඩුවලින් සියයට 50ක්, 60ක්ම යන්නේ ඒ lawyerට. ඔන්න ඔහොම හදා ගත්ත setup එකක් තිබෙනවා.

පසුගිය කාලයේ මොකක්ද වුණේ? අපි ආවාට පස්සේ මොකක්ද වුණේ? මට සමහරු කියලාත් තිබෙනවා, නීතිඥවරු නොවෙයි. අපි ආපු නිසා ඒ status quo එක නැති වෙලා තිබෙනවා; රාජපක්ෂලාගේ, වික්‍රමසිංහලාගේ, ප්‍රේමදාසලාගේ සිට විතරක් නොවෙයි, ඒකෙන් යැපිච්ච විවිධ වෘත්තීන් කරන, විවිධ ව්‍යාපාර කරන, විවිධ මාධ්‍යවල ඉන්න ඒ වළල්ලම දැන් අනාථ වෙලා තිබෙනවා. ඉස්සර embassy partiesවල අනිවාර්යයෙන් හිටපු කෙනෙක් මට කිව්වා, "ඇමතිතුමා, අපට අඩු ගාණේ දැන් invitation එකක්වත් එන්නේ නැහැ. කරුණාකරලා අපට invitation එකක්වත් එවන්න" කියලා. ඕකට තමයි කියන්නේ status anxiety කියලා. ඒ කියන්නේ, status නැති වුණාම ඇති වන තත්ත්වය. ඇත්තටම අපි ඒගොල්ලන්ට අසාධාරණයක් කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාල් මාක්ස් කියලා තිබෙන දෙයක් තිබෙනවා. නමුත් මම මාක්ස් කියපු දේ උපුටන්නේ නැතුව ඉංග්‍රීසි ප්‍රස්තාව පිරුළක් තිබෙනවා, ඒක කියන්නම්. ඒක තමයි "When you are accustomed to privilege, equality feels like oppression" කියන එක. එහි අදහස සරලව කිව්වොත්, වරප්‍රසාදවලටම පුරුදු වෙලා හිටියාම ඒ වරප්‍රසාද නැති වුණාම ඒක තමන්ට කරන පීඩනයක් ලෙස, තමන්ට කරන අසාධාරණයක් ලෙස දැනෙනවා කියන එක. අද වෙලා තිබෙන්නේ ඒකයි. රාජපක්ෂලා, ප්‍රේමදාසලා, වික්‍රමසිංහලා මේ රටේ හදාගෙන ගිය අන්ත දූෂිත ක්‍රමයක් තිබුණා. ඒ දූෂිත ක්‍රමය තුළ කවදාවත් බලවත්, ධනවත් අය උසාවිවල නඩුවලට ආවේ නැහැ. ඒ අය විත්තිකරුවෝ වෙලා හිටියාට කවදාවත් වැරදිකරුවෝ වුණේ නැහැ. එහෙම තමයි. අද ඒක වෙනස් වෙලා තිබෙනවා. ඒ, ජන වරමයි, ආණ්ඩුවයි, තනි තනි අධිකරණ නිලධාරින්ගේ විශේෂ මැදිහත්වීමයි මත, පොලීසියේ මැදිහත්වීම මත. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සලේව හොයන්න පුළුවන්ද පරීක්ෂණ අංශ මහන්සි වුණේ නැත්නම්? ඉතින් අද වෙලා තිබෙන්නේ මොකක්ද? ජනතාව දේශපාලන වශයෙන් අර සෙට් එක අතු ගෑවා. දැන්

වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ සෙට් එකත් එක්ක යැපිච්ච ඉතිරි වළල්ලට දැන් වදිනවා. ඒ වළල්ලෙන් පිරිසක් සමහර විට නීතිඥයන් අතරත් ඇති. ඒ අයට status anxiety තිබෙනවා. ඕක American Civil War එකේදීත් වුණා. American Civil War එකේදී ලින්කන්ලා North and South එකතු කරලා democracy ගෙනාවාම, අර බදු ගෙවන්නේ නැතුව හිටපු තක්කඩි ඉඩම් හිමියෝ ටික කිව්වා, ප්‍රාන්තවල ස්වෛරීත්වය නැති වුණා කියලා. ඒගොල්ලන් ඇත්තටම Lost Cause Myth කියලා එකක් හැදුවා. කවුරුත් බදු ගෙවන්න කියලා හැදුවාම ඒගොල්ලෝ කිව්වා, ප්‍රාන්තවල තිබිච්ච ස්වෛරීත්වය නැති වුණා කියලා. නමුත් ඇත්ත කථාව තමන්ට බදු ගෙවන්න වෙච්ච එක. ඒකට ලොකු නමක් දැම්මා, Lost Cause Myth කියලා. නමුත් ඇත්ත අරමුණ මොකක්ද? තමන්ට බදු ගෙවන්න වුණා, ලින්කන්ගේ ප්‍රතිසංස්කරණවලින්. ඒකට විරුද්ධව මතයක් හැදුවා, මේකෙන් අපේ ප්‍රාන්තවල බලය නැති වෙනවා කියලා. ප්‍රංශ විප්ලවයෙත් එහෙම වුණා. ඒ aristocratsලාට බලය නැති වුණාට පස්සේ ඒගොල්ලෝ හැදුවා, ප්‍රංශයේ සංස්කෘතිය ප්‍රංශ විප්ලවයෙන් නැති වුණා කියලා මතයක්. අද මේ අධිකරණයේ ස්වාධීනත්වය ගැන කිඹුල් කඳුළු හෙළන, කෑ ගසන වැඩි පිරිසකගේ තිබෙන්නේ status anxiety. තමන්ට තිබිච්ච වරප්‍රසාද රාජපක්ෂලාට ජනතාව 2024දී නැති කළා. රනිල්ලාට නැති කළා. අනික් අයට නැති වෙලා තිබෙනවා. දැන් ඒක වටේ හිටපු වළල්ලට නැති වේගෙන එන කාලේ. මේකේ වෙන කිසිම දෙයක් නැහැ. ඒකයි කිසිම බර තර්කයක් විපක්ෂයේ කාගෙන්වත් නැත්තේ. හැබැයි, කවිරත්න මැතිනිය විපක්ෂය ඒ හංගාගෙන හිටපු ඇත්ත කාරණය කිව්වා. ඒ නිසා එතුමියට ස්තුතිවන්ත වෙනවා, සජබය ඇතුළේ කථා කරපු ටික කියපු එක ගැන.

මේ සංශෝධනයෙන් අධිකරණයට කිසිම ප්‍රශ්නයක් එන්නේ නැහැ. ඉන්න විනිශ්චයකාරතුමන්ලාම continuation එකක් එක්ක institutional memory එක රැකගෙන ඉස්සරහට යනවා. ඒක කියන්න ඕනෑකම තිබෙනවා. ඉතින්, අර ප්‍රංශ විප්ලවයේදී හැංගුණා වාගේ, American Civil War එකෙන් පස්සේ හැංගුණා වාගේ, ලින්කන්ගේ ප්‍රතිසංස්කරණවලට විරුද්ධව බොරු තර්ක හැදුවා වාගේ "අධිකරණයේ ස්වාධීනත්වය", "ප්‍රජාතන්ත්‍රවාදය" වාගේ ඉතාම වැදගත්, ඉතාම වටිනා උත්තරීතර සටන් පාඨවලින්, පරමාදර්ශී සටන් පාඨවලින් තමන්ගේ status anxiety හංගාගෙන, තමන්ට නැති වෙච්ච ඒවා බේරා ගන්න හදන්න එපා කියන එක විතරයි අපට කියන්න තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ජන වරම අනුව මේ ගමන මේ විධියටම යනවා.

බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.07ට, 2026 අගෝස්තු 06වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 6.07க்கு, பாராளுமன்றம் 2026 ஓகஸ்ட் 06, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 6.07 p.m. until 9.30 a.m. on Thursday, 06th August, 2026.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.